# දෙවැනි කොටස

## දෙවැනි කොටස

## ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් හා කටයුතු


| | | පිටුව |
|---|---|---|
| 1. | ගිණුම්කරණ සහ මූල්‍ය | 1 |
| 2. | බැංකු අධීක්ෂණ | 56 |
| 3. | බැංකු විද්‍යා පියෙස | 59 |
| 4. | සංනිවේදන | 60 |
| 5. | ව්‍යවහාර මුදල් | 62 |
| 6. | දේශීය කටයුතු | 64 |
| 7 | ආර්ථික පර්යේෂණ | 67 |
| 8. | සේවක අර්ථසාධක අරමුදල | 70 |
| 9. | විනිමය පාලන | 75 |
| 10. | පහසුකම් කළමනාකරණ | 77 |
| 11. | මූල්‍ය කටයුතු | 78 |
| 12. | මූල්‍ය බුද්ධි ඒකකය | 79 |
| 13. | මූල්‍ය ස්ථායිතා අධ්‍යයන | 81 |
| 14. | අධිපති ලේකම් | 82 |
| 15. | මානව සම්පත් කළමනාකරණය | 83 |
| 16. | තොරතුරු තාක්ෂණ | 90 |
| 17. | ජාත්‍යන්තර මෙහෙයුම් | 92 |
| 18. | කළමනාකාරිත්ව විගණන | 94 |
| 19. | ගෙවීම් සහ පියවීම් | 95 |
| 20. | ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ | 97 |
| 21. | පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු | 98 |
| 22. | රාජ්‍ය ණය | 99 |
| 23. | ප්‍රාදේශීය සංවර්ධන | 101 |
| 24. | ලේකම් | 107 |
| 25. | ආරක්ෂක සේවා | 108 |
| 26. | සංඛ්‍යාන | 108 |
| 27. | බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ | 111 |
| 28. | සුභසාධන | 116 |

**කළමනාකාරිත්ව ප්‍රකාශය**

**ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය**

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මූල්‍ය නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහබැංකුව සතු බැවින් එය ලාභදායිත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික හා මිල ස්ථායිතා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මූල්‍ය නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No. : එෆ් බි/කේ/සීබිඑස්එල්/එෆ්ඒ/2012 | ඔබේ අංකය / உமது இல / Your No. : | දිනය / திகதி / Date : 2013 මාර්තු 15 දින |

**ශ්‍රී ලංකා මහ බැංකුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සවිස්තරාත්මක ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ මුදල් නීති පනතේ (422 අධිකාරිය) 42 (2) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිතීන්වලට අනුකූලවීම පිළිබඳව වූ විගණනය මා විසින් පත් කරන ලද ප්‍රසිද්ධ වෘත්තීයෙහි නියැලී වරලත් ගණකාධිකාරී සමාගමක් විසින් සිදු කරන ලදී.

**මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

**විගණකගේ වගකීම**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්‍ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම ද විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**මූල්‍ය ප්‍රකාශන**

**මතය**

2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරන ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

අ/කඃ එච්.ඒ.එස්.සමරවීර
විගණකාධිපති.

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව
இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை
No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
දුරකථනය / தொலைபேசி / Telephone : 112887028-34
ෆැක්ස් අංකය / பக்ஸ் இல / Fax No. : 112887223
ඉලෙක්ට්‍රොනික් තැපැල් / ஈ - மெயில் / E-mail : oaggov@sltnet.lk

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2012 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශනය

| | සටහන | 2012 රු. 000 | 2011 රු. 000 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | |
| මුදල් සහ මුදල් සමානයන් | | **235,278,133** | 303,551,702 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 5 | **3,989,701** | 2,794,334 |
| මූදල් වත්කම් | | | |
| - ලාභ හෝ අලාභ මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත් | 6 | **169,312,604** | 106,006,361 |
| - විකුණුම් සඳහා වූ ආයෝජන | 6 | **386,761,690** | 270,664,801 |
| අනිකුත් විදේශීය ලැබිය යුතු මුදල් | | **8,243,512** | 19,361,831 |
| ජා.මු.අ. සම්බන්ධ වත්කම් | 7 | **81,352,282** | 73,090,517 |
| **මුළු විදේශීය මූල්‍ය වත්කම්** | | **884,937,922** | 775,469,546 |
| **දේශීය මූල්‍ය වත්කම්** | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | **175,251,772** | 183,885,564 |
| රජයට දෙන ලද අත්තිකාරම් | 8 | **111,291,843** | 94,743,013 |
| අනිකුත් ආයතනවලට දෙන ලද ණය | 9 | **1,884,237** | 2,313,533 |
| අනිකුත් දේශීය ලැබිය යුතු මුදල් | | **2,970,099** | 2,924,028 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන | 10 | **41,095** | 41,211 |
| අනිකුත් වත්කම් | 11 | **5,578,483** | 4,695,913 |
| **මුළු දේශීය මූල්‍ය වත්කම්** | | **296,977,529** | 288,603,262 |
| **මුළු මූල්‍ය වත්කම්** | | **1,181,915,451** | 1,064,072,808 |
| **විදේශීය මූල්‍ය නොවන වත්කම්** | | | |
| රන් | | **77,688,838** | 43,819,156 |
| **අනෙකුත් මූල්‍ය නොවන වත්කම්** | | | |
| තොගය | 12 | **2,942,193** | 2,484,681 |
| අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම් | | **2,296,826** | 1,980,518 |
| දේපල පිරියත සහ උපකරණ | 13 | **13,913,077** | 9,996,697 |
| අස්පෘශ්‍ය වත්කම් | 14 | **24,153** | 13,723 |
| විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් | 41 | **964,379** | 991,571 |
| **මුළු මූල්‍ය නොවන වත්කම්** | | **97,829,466** | 59,286,346 |
| **මුළු වත්කම්** | | **1,279,744,917** | 1,123,359,154 |
| **බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය** | | | |
| **විදේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු මුදල් | 15 | **2,219,847** | 937,712 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | 5 | **3,257,119** | 1,041,597 |
| ආසියානු නිශ්කාෂණ ආයතනයට ගෙවිය යුතු මුදල් | 16 | **28,953,955** | 90,032,085 |
| ජා.මු.අ. සම්බන්ධ බැරකම් | 17 | **467,642,196** | 328,772,419 |
| අනිකුත් විදේශීය ගෙවිය යුතු මුදල් | 18 | **64,520,662** | 58,621,764 |
| **මුළු විදේශීය මූල්‍ය බැරකම්** | | **566,993,779** | 497,405,577 |
| **දේශීය මූල්‍ය බැරකම්** | | | |
| බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු | 19 | **166,288,378** | 146,269,185 |
| රාජ්‍ය හා රාජ්‍ය නියෝජිත ආයතන ශේෂයන් | 20 | **699,628** | 1,799,030 |
| ප්‍රතිමිලදී ගැනීම් ගිවිසුම් යටතේ විකුණන ලද සුරැකුම්පත් | 21 | **7,015,000** | 14,089,000 |
| සේවක සුභ සාධන යෝජනා ක්‍රමවල ශේෂයන් | 22 | **1,548,447** | 904,478 |
| අනිකුත් ගෙවිය යුතු මුදල් | 23 | **31,939,398** | 28,041,215 |
| **මුළු දේශීය මූල්‍ය බැරකම්** | | **207,490,851** | 191,102,908 |
| **මුළු මූල්‍ය බැරකම්** | | **774,484,630** | 670,508,485 |
| **අනිකුත් බැරකම්** | | | |
| සංසරණයෙහි පවතින මුදල් | 24 | **318,060,142** | 293,233,361 |
| විලම්භිත ප්‍රදාන | 25 | **2,389** | 3,468 |
| විවිධ බැරකම් සහ උපචිතයන් | 26 | **143,916** | 884,048 |
| **මුළු අනිකුත් බැරකම්** | | **318,206,447** | 294,120,877 |
| **මුළු බැරකම්** | | **1,092,691,077** | 964,629,362 |
| **හිමිකම් ප්‍රාග්ධනය** | | | |
| ප්‍රාග්ධන අරමුදල | | **35,000,000** | 25,000,000 |
| සංචිත | | **152,053,840** | 133,729,792 |
| **මුළු හිමිකම් ප්‍රාග්ධනය** | | **187,053,840** | 158,729,792 |
| **මුළු බැරකම් සහ හිමිකම් ප්‍රාග්ධනය** | | **1,279,744,917** | 1,123,359,154 |

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2013 පෙබරවාරි 28 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

අජිත් නිවාඩ් කබ්රාල් - අධිපති

එම්. අයි. සුහියාන් - ප්‍රධාන ගණකාධිකාරී

පිටු අංක 07 සිට 55 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
### ආදායම් ප්‍රකාශනය

| | සටහන | 2012 රු. 000 | 2011 රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම** | | | |
| **විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 29 | **11,505,174** | 14,435,116 |
| උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය / (පාඩුව) | | **296,049** | 4,884,031 |
| මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය / (පාඩුව) | | **16,770,494** | 33,113,886 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම** | | **28,571,717** | 52,433,033 |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්** | | | |
| පොළී වියදම | 30 | **(3,702,966)** | (3,910,831) |
| **විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම** | | **(3,702,966)** | (3,910,831) |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය / (පාඩුව) | | **25,181,713** | 3,576,999 |
| **විදේශීය මූල්‍ය ආයෝජන ආදායම / (පාඩුව)** | | **50,050,464** | 52,099,201 |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම** | | | |
| පොළී ආදායම | 29 | **25,957,602** | 4,768,769 |
| පොළී වියදම | 30 | **(1,091,540)** | (4,541,973) |
| **දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත මුළු ආදායම** | | **24,866,062** | 226,796 |
| අනිකුත් ආදායම් | 31 | **976,019** | 669,399 |
| **මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම / (පාඩුව)** | | **75,892,545** | 52,995,396 |
| **මෙහෙයුම් වියදම් :** | | | |
| සේවක මණ්ඩල වියදම් : | 32 | **(2,865,544)** | (2,274,045) |
| - වැටුප් සහ වේතන | | **(426,622)** | (334,593) |
| - නිශ්චිත දායක සැලසුම් පිරිවැය | | **(344,328)** | 358,609 |
| - පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය සඳහා වූ අතිරේක දායකත්වය | | **(3,636,494)** | (2,250,029) |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | | **322,622** | (314,063) |
| තොග පිරිවැය | | **(1,816,933)** | (1,707,443) |
| පරිපාලන වියදම් | 33 | **(1,378,295)** | (1,227,710) |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන ශුද්ධ අලාභය | | **(3,963)** | - |
| විවිධ කපා හැරීම් | | **-** | (64,352) |
| **මුළු මෙහෙයුම් පිරිවැය** | | **(7,158,307)** | (5,563,597) |
| **ආදායම් බදු වලට පෙර ලාභය** | | **68,734,238** | 47,431,799 |
| ආදායම් බද්ද | 34 | **(2,525,694)** | (601,593) |
| **වර්ෂය සඳහා ශුද්ධ ලාභය** | | **66,208,544** | 46,830,206 |

පිටු අංක 08 සිට 52 දක්වා ඇති ගිණුම්තරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
### 2012 දෙසැම්බර් 31 න් අවසන් වූ කාලපරිච්ඡේදය සඳහා
### විස්තීරණ ආදායම් ප්‍රකාශනය

| | 2012 රු. 000 | 2011 රු. 000 |
|---|---|---|
| වර්ෂය සඳහා ශුද්ධ ලාභය/පාඩුව | **66,208,544** | 46,830,206 |
| **අනෙකුත් විස්තීරණ ආදායම්** | | |
| විකුණුම් සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම ලාභ/(පාඩුව) | **1,835,087** | 11,677,923 |
| දේපළ පිරියත - උපකරණ ප්‍රත්‍යාගණන ලාභය | **3,280,575** | - |
| මුළු විස්තීරණ ආදායම | **71,324,206** | 58,508,129 |

පිටු අංක 07 සිට 55 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

## ශ්‍රී ලංකා මහ බැංකුව
## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා
## ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශනය

| | අයක ප්‍රාග්ධනය | ප්‍රාග්ධන ලෙස විසර්ජනය කළ සංචිතය | ප්‍රත්‍යාගණන සංචිතය | අනිකුත් සංචිතය (සටහන 27) | සමුච්චිත ලාභ | එකතුව |
|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු.000 |
| 2011 ජනවාරි 01 දිනට | 15,000 | 24,985,000 | 2,706,067 | 62,320,525 | 32,195,098 | 122,221,690 |
| ශුද්ධ ලාභය | - | - | - | - | 46,830,206 | 46,830,206 |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන් අරමුදලට පැවරීම | - | - | - | 113,381 | (113,381) | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | 6,573,559 | (6,573,559) | - |
| වෙළඳපල අගයකිරීමේ සංචිතයට පැවරීම | - | - | - | (3,484,968) | 3,484,968 | - |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම | - | - | - | 3,576,999 | (3,576,999) | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | 113,561 | (113,561) | - |
| මධ්‍ය කාලීන සහ දිගු කාලීන සංචිතයට පැවරීම | - | - | - | 2,000,000 | (2,000,000) | - |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - | 11,677,923 | - | 11,677,923 |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදයක සහ විශ්‍රාම ආපද සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | - | (27) | (27) |
| 2010 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | - | - | - | - | (5,000,000) | (5,000,000) |
| 2011 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | - | (17,000,000) | (17,000,000) |
| **2012 ජනවාරි 01 දිනට** | **15,000** | **24,985,000** | **2,706,067** | **82,890,980** | **48,132,745** | **158,729,792** |
| ශුද්ධ ලාභය | - | - | - | - | **66,208,544** | **66,208,544** |
| තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන් අරමුදලට පැවරීම | - | - | - | **153,751** | **(153,751)** | - |
| පොදු සංචිතයට පැවරීම | - | - | - | **10,142,076** | **(10,142,076)** | - |
| වෙළඳපල අගයකිරීමේ සංචිතයට පැවරීම | - | - | - | **4,884,031** | **(4,884,031)** | - |
| ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරුකිරීම | - | - | - | **25,181,686** | **(25,181,686)** | - |
| ශ්‍රී.ලං.ම.බැ. විශේෂ සංචිතවලට මාරු කිරීම | - | - | - | **93,084** | **(93,084)** | - |
| ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතයට මාරුකිරීම | - | - | **3,280,575** | - | - | **3,280,575** |
| අනෙකුත් විස්තීරණ ආදායම් | - | - | - | **1,835,087** | - | **1,835,087** |
| ශ්‍රී ලංකා මහ බැංකු සේවාදයක සහ විශ්‍රාම ආපද සහන අරමුදලට අරමුදල් මාරු කිරීම | - | - | - | - | **(158)** | **(158)** |
| 2011 වර්ෂය සඳහා වූ ඉතිරි ලාභය රජයට පැවරීම | - | - | - | - | **(10,000,000)** | **(10,000,000)** |
| 2012 වර්ෂයට අදාළ අන්තර් ලාභයන් රජයට පැවරීම | - | - | - | - | **(33,000,000)** | **(33,000,000)** |
| විශ්‍රාම අරමුදල් සංචිතයට මාරු කිරීම | - | - | - | **1,000,000** | **(1,000,000)** | - |
| සංචිත ප්‍රාග්ධනිත කිරීම | - | **10,000,000** | - | **(10,000,000)** | - | - |
| 2012 දෙසැම්බර් 31 දිනට | **15,000** | **34,985,000** | **5,986,642** | **116,180,695** | **29,886,503** | **187,053,840** |

පිටු අංක 07 සිට 55 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් වේ.

# ශ්‍රී ලංකා මහ බැංකුව

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | සටහන | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්:** | | | |
| ලැබුණු පොළිය - විදේශීය මුදල් | | **8,920,505** | 15,836,021 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත් | | **485,687** | 473,847 |
| ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම් | | **16,770,494** | 33,113,886 |
| උපලබ්ධි වූ විනිමය වාසිය / (පාඩුව) | | **(2,713,634)** | (10,121,791) |
| ලැබුණු අනිකුත් ආදායම් | | **967,667** | 668,262 |
| | | **24,430,719** | 39,970,225 |
| **විය පැහැදම්** | | | |
| ගෙවන ලද පොළිය - විදේශීය මුදල් | | **3,236,655** | 3,885,126 |
| ගෙවන ලද පොළිය - දේශීය මුදල් | | **1,095,513** | 4,404,445 |
| සේවකයින්ට ගෙවීම් | | **3,017,754** | 2,350,760 |
| සැපයුම්කරුවන්ට ගෙවීම් | | **483,137** | 1,940,048 |
| ගෙවන ලද ආදායම් බදු | | **2,525,694** | 607,900 |
| | | **10,358,753** | 13,188,279 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | 35 | **14,071,966** | 26,781,946 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම් :** | | | |
| අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ (වැඩිවීම) / අඩුවීම | | **(1,252,418)** | (757,436) |
| අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම් | | **1,466,198** | 745,632 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණය / මුදාහැරීම | | **117** | 24 |
| දේපළ, පිරියත සහ උපකරණ විකිණීම් | | **74,343** | 124 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන ආශ්‍රිත ආදායම | | **-** | 4,124 |
| ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම | | **(7,074,000)** | (99,365,891) |
| | | **(6,785,760)** | (99,373,423) |
| **විය පැහැදම්** | | | |
| විදේශ මුදල් සුරැකුම්පත්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **95,692,569** | (181,397,956) |
| අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **(266,442)** | 190,664 |
| අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **80,569,162** | (87,450,517) |
| අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **130** | 1,312 |
| දේපළ, පිරියත සහ උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩුකිරීමෙන් පසු) | | **957,284** | 961,494 |
| රන් තොගයේ ශුද්ධ වැඩිවීම / (අඩුවීම) | | **29,842,972** | 8,663,832 |
| අනෙකුත් ආයතන වෙත ලබා දුන් ණයපත් අත්තිකාරම් | | **996,902** | 599,318 |
| | | **207,792,577** | (258,431,853) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(241,578,337)** | 159,058,430 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්** | | | |
| **ලැබීම්** | | | |
| සංසරණ මුදල් නිකුතුව | | **(357,381,088)** | (335,393,178) |
| සංසරණ මුදල් ආපසු ගැනීම් | | **382,207,833** | 372,974,278 |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව | | **24,826,825** | 37,581,100 |
| **අඩුකිරීම් :** | | | |
| රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 36 | **(16,427,265)** | 177,259,097 |
| බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | 37 | **(19,325,888)** | (41,477,740) |
| සංසරණ මුදල් ශුද්ධ නිකුතුව / (ආපසු ගැනීම්) | | **(35,753,153)** | 135,781,357 |
| **සංසරණ මුදල් ශුද්ධ වැඩිවීම/(අඩුවීම)** | | **60,579,978** | (98,200,257) |
| **විය පැහැදම් :** | | | |
| විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම | | **(97,544,268)** | (46,114,023) |
| අනිකුත් අරමුදල් සඳහා ගෙවීම | | **158** | 27 |
| රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම | | **43,000,000** | 22,000,000 |
| | | **(54,544,110)** | (24,113,996) |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **115,124,088** | (74,086,261) |
| **මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම / අඩුවීම** | | **(85,382,283)** | 111,754,115 |
| මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන් බලපෑම | | **17,108,714** | 2,109,928 |
| වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන් | | **303,551,702** | 189,687,659 |
| **දෙසැම්බර් 31 දිනට ශුද්ධ මුදල් සහ මුදල් සමානයන්** | 38 | **235,278,133** | 303,551,702 |

## 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

### 1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්‍ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මූල්‍ය නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මෙම මූල්‍ය ප්‍රකාශනයන්, මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2013 පෙබරවාරි 28 වැනි දින අනුමත කරන ලදී.

### 2. ගිණුම්කරණ ප්‍රතිපත්ති

#### 2.1 පිළියෙල කිරීමේ පදනම

පහත සඳහන් නිශ්චිත ගණකාධිකරණ ප්‍රතිපත්තිවලින් හඳුන්වා දී ඇති පරිදි සාධාරණ වටිනාකමට අගය කරන ලද ඉඩම්, ගොඩනැගිලි, සහ ඇතැම් මූල්‍ය වත්කම් හැර, ඓතිහාසික පිරිවැය පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන ලදී.

#### 2.1.1 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේ දී පුළුල් වශයෙන් එක් එක් වර්ගය යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙලට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 4 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

#### 2.1.2 අනුකූලතා ප්‍රකාශනය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මූ.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ. මුදල් නීති පනත අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති අතර විගණකාධිපති විසින් විගණනය කර නීතිමය අවශ්‍යතා මත ගැසට් කර ඇත. ජා.මූ.වා.ප්‍ර. වල සමහර අවශ්‍යතා මත ගැසට් කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශනවල, ඒවායෙහි වර්ගීකරණය සහ එම නිසා අගයන් මෙම මූල්‍ය ප්‍රකාශන සමග වෙනස් විය හැකිය.

#### 2.1.3 වාර්තා කිරීමේ මුදල් ඒකකය

වෙනත් අන්දමකට දක්වා නොමැති නම්, සියළුම සංඛ්‍යා ආසන්නතම ශ්‍රී ලංකා රුපියල් දහස් වලින් දැක්වේ.

#### 2.2 වැදගත් ගිණුම් නිශ්චයන් සහ ඇස්තමේන්තු

ගිණුම් ප්‍රතිපත්ති සකස් කිරීමේ දී බැංකුව විසින් ඇස්තමේන්තුවලට අමතරව පහත දැක්වෙන නිශ්චයන් කර ඇති අතර, මෙම ගිණුම් ප්‍රකාශනයන්හි අගය හඳුනා ගැනීම් මත ඒවා සැලකිය යුතු අන්දමින් බලපා ඇත.

#### 2.2.1 විකිණීමට ඇති ආයෝජන හානිකරණය

සැලකිය යුතු ලෙස සහ අඛණ්ඩව සාධාරණ අගය එහි පිරිවැයට වඩා පහළට යනවිට, විකිණීම සඳහා ඇති ආයෝජන අගය හානි වී ඇති බව බැංකුව තීරණය කරයි. සැලකිය යුතු බව හා අඛණ්ඩව යන කරුණු තීරණය කිරීමේ දී නිශ්චය කිරීමක් අවශ්‍ය වේ.

#### 2.2.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 41 හි දැක්වේ.

#### 2.3 ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස්වීම හා අනාවරණය කිරීම්

මූල්‍ය වාර්තාකරණයට භාවිතා කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පසුගිය වසරේ භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් වෙනසක් නොපෙන්වයි.

#### 2.4 ප්‍රකාශිත කර ඇති නමුත් මේ වන තෙක් බල සහිත නොවූ ප්‍රමිතීන්, අර්ථ නිරූපණයන් සහ සංශෝධනයන්

ප්‍රකාශිත නමුත් බැංකු මූල්‍ය වාර්තා ප්‍රකාශයට පත් කරන දිනය වන තෙක් බල සහිත නොවූ ප්‍රතිත්තීන් පහත පරිදි වේ. මෙම ප්‍රමිතීන් සහ අර්ථ නිරූපණයන් අනාගත දිනක දී අදාළ වන බවට බැංකු බලාපොරොත්තු වේ. මෙම ප්‍රමිතීන් බල සහිත වූ විට ඒවා අදාළ කරගැනීමට බැංකුව අපේක්ෂා කරයි.

#### 2.4.1 ජා. මූ.වා.ප්‍ර.7 අනාවරණ - මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම් හිලව් කිරීම - ජා.මූ.වා.ප්‍ර. 7 සඳහා වූ සංශෝධන

ආයතනයක මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කිරීමේ හිමිකම සහ ඊට අදාළ විධිවිධාන (උදාහරණ ලෙස ඇපකර ගිවිසුම්) සම්බන්ධයෙන් හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මෙම සංශෝධන තුළින් ඇති කරයි. තවද මෙම සංශෝධන මගින් හිලව් කිරීමේ විධිවිධාන, ආයතනයක මූල්‍ය තත්ත්වය මත ඇති කරන බලපෑම ඇගයීම සඳහා වූ තොරතුරු මූල්‍ය ප්‍රකාශ පරිහරණය කරන්නන්ට ලබාදීමද අපේක්ෂා කරයි. ජා.ගි.ප්‍ර. 32 මූල්‍ය උපකරණ : ඉදිරිපත් කිරීමට අනුව හඳුනාගත් මූල්‍ය මෙවලම් හිලව් කිරීම් සියල්ල සඳහා ද මෙම නව හෙළිදරව් කිරීම් අවැසි වේ.

මීට අමතරව ජා.මු.ප්‍ර.ග. 32 යටතේ වූ හිලව් කිරීම් සියල්ල නොසලකා බලාත්මක කළ හැකි ප්‍රධාන හිලව් කිරීමේ විධිවිධාන හෝ සමාන ගිවිසුම්වලට යටත් වන්නාවූ හඳුනාගත් මූල්‍ය සියල්ලට මෙම හෙළිදරව් කිරීම බලපැවැත්වේ.

මෙම සංශෝධන 2013 ජනවාරි 01 වැනි දින හෝ පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා බලපැවැත්වෙන අතර එය බැංකු මූල්‍ය තත්ත්වයට හෝ කාර්යසාධනයට බලපෑමක් ඇති නොකරයි.

**2.4.2 ජා. මූ. වා. ප්‍ර. 9 මූල්‍ය උපකරණ**

ක්‍රියාත්මක වන දිනය ජා. ගි. ප්‍ර. 39 ප්‍රතිෂ්ඨාපනය කිරීම සම්බන්ධ IASB ආයතනයේ නිරාවරණ කෙටුම්පතට යටත් වුවත්, ජා.මු.වා.ප්‍ර. 9 IASB ආයතනයේ පළමු අදියරේ ක්‍රියාකාරකම් පිළිබිඹු කරන අතර එය ජා. ගි. ප්‍ර. 39 හි නිර්වචනයකර ඇති පරිදි මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය හා මිනුම් කිරීම සඳහා අදාළ වේ.

ආරම්භයේ දී මෙම ප්‍රමිතිය 2013 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා බලපවත්වනු ලැබුවද 2011 දෙසැම්බර් මස නිකුත් කරනු ලැබූ ජා.ගි.වා.ප්‍ර. 9 සඳහා වූ සංශෝධනයන් වන ජා.ගි.වා.ප්‍ර. 9 අනිවාර්ය බලාත්මක දිනය සහ සංක්‍රාන්ති හෙළිදරව් මඟින් මෙම අනිවාර්ය බලාත්මක දිනය 2015 ජනවාරි 01 දින දක්වා කල් දමන ලදී. පසු අදියරයන්හිදී මණ්ඩලය විසින් අපනයනය හා ඉදිරි රැකුම් ගිණුම්කරණය සම්බන්ධයෙන් සලකා බලනු ලබයි. වඩාත් විස්තීරණ තත්ත්වයන් ඉදිරිපත් කරනු පිණිස බැංකුව විසින් ජා.ගි.වා.ප්‍ර. 9 හි පළමු අදියර හා අනෙකුත් අදියරයන් නිකුත් කිරීමෙන් අනතුරුව එය ක්‍රියාත්මක කිරීමෙන් වන බලපෑම අගය කරනු ඇත.

**2.4.3. ජා. මූ. වා. ප්‍ර. 13 සාධාරණ අගය මිනුම්කිරීම**

ජා.මු.වා.ප්‍ර. 13 මඟින් සාධාරණ අගය අවශ්‍ය සහ අනුමත කරන අවස්ථාවලදී එය මිනුම් කරන්නේ කෙසේද යන්න පිළිබඳ මඟ පෙන්වීමක් ලබාදෙන අතර, කුමන අවස්ථාවකදී ආයතනයක් විසින් සාධාරණ අගය යොදාගත යුතු ද යන්න පිළබඳ කරුණු ජා.මු.වා.ප්‍ර. 13 මඟින් ලබාදීම සිදු නොකරයි. මේ හා සම්බන්ධ අතිරේක හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්ද පවතී.

මෙම ප්‍රමිතිය අදාළ කරගැනීමෙන් බැංකුවේ මූල්‍ය තත්ත්වය හෝ කාර්ය සාධනය මත ප්‍රමාණාත්මක බලපෑමක් ඇති නොකරන අතර මෙම ප්‍රමිතිය 2013 ජනවාරි 01 දින හෝ පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා බලපැවැත්වෙනු ඇත.

**2.4.4 ජා. ගි. ප්‍ර. 1 - අනෙකුත් විස්තීර්ණ ආදායම් (අ.වි.ආ.) ප්‍රකාශනයේ අයිතිමයන් ඉදිරිපත් කිරීම - ජා.ගි.ප්‍ර. 1 සඳහා වූ සංශෝධන**

ජා.ගි.ප්‍ර. 01 සඳහා වූ සංශෝධන මඟින් අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ අයිතිමයන් සමූහනය කිරීම වෙනසකට භාජනය කොට ඇත. ඒ අනුව කිසි දිනෙක නැවත වර්ගීකරණය කිරීමකට ලක් නොවන අයිතමයන් (උදාහරණ ලෙස සේවා ප්‍රතිලාභ සැලසුම් මත වූ ආයුගණන ලාභ අලාභ) අනාගත අවස්ථාවකදී ලාභ හෝ අලාභ ප්‍රකාශනයට නැවත වර්ග කිරීමට (හෝ ප්‍රතිචක්‍රීයකරණය කිරීමට) ලක්විය හැකි අයිතමයන්ගේ (උදාහරණ ලෙස ඉදිරි රැකුම් ශුද්ධ ආයෝජන මත වූ ලාභ, විදේශ මෙහෙයුම් පරිවර්තනය කිරීම තුළින් ඇතිවන්නා වූ විනිමය අන්තරය, මූල්‍ය ප්‍රවාහ ඉදිරි රැකුම් මත ඇතිවන්නා වූ ශුද්ධ සංචලන සහ අලෙවිය සඳහා වූ මූල්‍ය වත්කම් මත වූ ශුද්ධ ලාභය හෝ අලාභය) වෙන්කර ඉදිරිපත් කළ යුතු වේ. (මෙම සංශෝධනයන් ඉදිරිපත් කිරීම සඳහා පමණක් බලපාන අතර බැංකුවේ මූල්‍ය තත්ත්වයට සහ කාර්යසාධනය සඳහා බලපෑමක් මෙමගින් ඇති නොකරයි.) මෙම සංශෝධන 2012 ජූලි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදයන් සඳහා බලපවත්වනු ලබයි.

**2.4.5 ජා.ගි.ප්‍ර. 19 සේවක ප්‍රතිලාභ (සංශෝධිත)**

ආයුගණන ලාභ අලාභ හඳුනාගැනීම කල් දැමීම සඳහා වූ විකල්ප ක්‍රමවේදය ජා.ගි.ප්‍ර. 19 සඳහා වූ සංශෝධන මඟින් ඉවත් කොට ඇත. වෙනත් වචනවලින් කිවහොත් පරාස යාන්ත්‍රණය (Corridor Machanism), ඉවත් කොට ඇත. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල අගයෙහි ඇතිවන සියලු වෙනස්කම් ලාභ අලාභ ප්‍රකාශනයේ සහ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත යුතුය. මෙම සංශෝධන 2013 ජනවාරි 01 වැනි දින සිට බලපැවැත්වෙනු ඇත.

එකී සංශෝධන අදාළ කර ගැනීම හේතුවෙන් බැංකුව විසින් පහත අයිතමයන් හඳුනාගනු ලබනු ඇත.

- සේවා පිරිවැය සහ ශුද්ධ පොළී ආදායම හෝ වියදම ලාභ අලාභ ගිණුම තුළ;
- විශ්‍රාම වත්කම් හා වගකීම්වල නැවත ඇගයීම්. වෙනත් වචනවලින් කිවහොත් ආයුගණන ලාභ හෝ අලාභ අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ;

ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කළ සැලසුම් වත්කම්වල අපේක්ෂිත ප්‍රතිලාභය, නිශ්චිත ප්‍රතිලාභ වගකීම් වට්ටම් කිරීම සඳහා යොදා ගන්නා වූ වට්ටම් අනුපාතිකය මත පදනම්ව ගණනය කළ ප්‍රතිලාභ මඟින් ප්‍රතිෂ්ඨාපනය කිරීම ඉහත පළමු කරුණින් අපේක්ෂා කරන බලපෑම වනු ඇත. 2012 දෙසැම්බර් 31 දිනට හඳුනා නොගත් අලාභ රුපියල් මිලියන 4,797.067 වූ අතර එය 2013 වර්ෂයේ දී අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ ගැලපීමක් ලෙස වාර්තා කරනු ඇත.

## 3. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සාරාංශය

### 3.1 විදේශීය මුදල් පරිවර්තනය

බැංකුවේ කෘත්‍යාත්මක සහ ඉදිරිපත් කිරීමේ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල වේ. විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර කෘත්‍යාත්මක මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, ශේෂ පත්‍ර දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

| ව්‍යවහාර මුදල් | 2012 රු. | 2011 රු. |
|---|---|---|
| ඕස්ට්‍රේලියානු ඩොලර් 1 | **132.2409** | 115.5813 |
| කැනේඩියානු ඩොලර් 1 | **127.8255** | 111.5750 |
| යුරෝ 1 | **168.1257** | 147.4225 |
| ජපන් යෙන් 1 | **1.4799** | 1.4669 |
| විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1 | **195.3110** | 174.4479 |
| ස්ටර්ලින් පවුම් 1 | **205.4728** | 175.4479 |
| ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1 | **127.1608** | 113.9013 |
| චීන යුවාන් (අක්වෙරළ) | **20.4373** | 17.9457 |

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

### 3.2 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

සියළු මූල්‍ය වත්කම්, මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිෂ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. මෙම මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මිනුම් පදනම්, පහත විස්තර කරනු ලැබේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් වෙළෙඳාම් දිනයේ දී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වු කලි සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

#### 3.2.1 ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, ලාභය හෝ පාඩුව මත සාධාරණ අගයට ඇති වත්කම් යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මෙම සුරැකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරැකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/අවාසිය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ඇත.

සුරැකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාල වාසිය/අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/අවාසිය ලෙස වාර්තා කරනු ලැබේ. සුරැකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/අවාසිය ලෙස වාර්තා කරනු ලැබේ.

#### 3.2.2 අලෙවිය සඳහා ඇති විදේශ විනිමය සුරැකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශ විනිමය සුරැකුම්පත් පසුව වෙළෙඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ විකිණීමට ඇති සුරැකුම්පත්වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

වෙළෙඳාම සඳහා ගැනෙන විදේශීය මුදල් සුරැකුම්පත්වල වෙළෙඳපොළ අගය වෙනස්වීමෙන් උද්ගතවන වාසිය හෝ අවාසිය, එම ආයෝජන විකුණා, ප්‍රතිග්‍රහණය කර හෝ වෙනත් අයුරකින් අපහරණය කරන තෙක් හෝ එම ආයෝජනය දුබල බවට නිරීක්ෂණය කරන තෙක් හෝ හිමිකරු ප්‍රාග්ධනයේ වෙන ම සංරචකයන් (මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වෙනත් සංචිත ලෙස දක්වා ඇති) ලෙස හඳුන්වනු ලබන අතර, එවැනි අවස්ථාවක් උද්ගතවීමේ දී හිමිකරු ප්‍රාග්ධනය ලෙස මුලින් වාර්තා කළ වාසිය හෝ අවාසිය ආදායමට එකතු කරනු ලැබේ.

#### 3.2.3 මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි

මූල්‍ය ව්‍යුත්පන්න ලියවිලි පිළිබඳව බැංකුවේ සම්බන්ධතාවය ප්‍රධාන වශයෙන් ඉදිරි විදේශ විනිමය කොන්ත්‍රාත්වලට අදාළ වේ. එවැනි ව්‍යුත්පන්න මූල්‍ය ලියවිලි සාධාරණ වටිනාකමින් ප්‍රකාශිතය. ඒවා සමාන පරිණත නියමයන් සහිත කොන්ත්‍රාත්වලට අදාළව පවත්නා ඉදිරි විනිමය අනුපාතයන්ට යොමු කරමින් ගණනය කර ඇත. ලාභ හෝ පාඩු තත්ත්වයේ පවතින මිල ගිවිසගත් ලියවිලි තිබේ නම්, ශේෂ පත්‍රයෙහි විදේශීය මුදල් වෙළෙඳාම හෝ විකිණීමට තිබෙන සුරැකුම්පත් ශේෂය යටතේ වාර්තා කරනු ලැබේ.

#### 3.2.4 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මූ.අ. සමග සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මූ.අ. සමග වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මූ.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මූ.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත වි.ගැ.හි. ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මූ.අ. විසින් ශේෂ පත්‍ර දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මූ.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය එසැනින් ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.2.5 මුදල් සහ මුදල් සමානයන්**

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල් සහ කෙටිකාලීන තැන්පතු මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල ආයක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, අපහරණයන් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් 35 සහ සටහන් 36 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මූල්‍ය නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මත හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මත නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සමග වන ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

**3.2.6 ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු**

ප්‍රතිමිලදී ගැනීම සඳහා ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරැකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරැකුම්පත්) බැරකමක් ලෙස හෙළිදරව් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදී ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර ,එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරැකුම්පත් (නැවත විකිණීම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්) වත්කම් ලෙස ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු නිසා උපචිත ආදායමක් හෝ උපචිත වියදමක් උද්ගත වුයේ නම්, එය ද ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු වටිනාකම සමග වාර්තා කරනු ලැබේ.

**3.2.7 ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත්**

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් නිකුත් කරනු ලබයි.

නිකුත් කරනු ලබන සුරැකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරයි. මුහුණත අගය සහ නිකුතු මිල අතර වෙනස ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස වාර්තා කරනු ලබයි.

**3.2.8 ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්**

ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවලින් සමන්විත වේ. ඒවායින් බැංකුව විසින් ශ්‍රී ලංකා රජයට සපයන ලද ණය නියෝජනය කෙරෙන බැවින්, එම කළඹ ක්‍රමක්ෂය පිරිවැයට සටහන් කරනු ලැබේ.

**3.2.9 රජයට දෙන ලද අත්තිකාරම්**

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත සෘජුව දෙන ලද තාවකාලික අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ.

**3.2.10 අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ආරම්භයේ දී ප්‍රදානය කළ මුදලින් අයකරගත නොහැකි ප්‍රමාණයක් සඳහා වූ මුදල් අඩුකර, හඳුනාගෙන දක්වා ඇත. අයකරගත යුතු සියළු මුදල් බැංකුවට අයකරගත නොහැකි බවට නිශ්චිත සාක්ෂි තිබේ නම්, ඒ සඳහා (ණය අඩාලවීම) අඩමාන ණය ප්‍රතිපාදනයන් සලසනු ලැබේ. එම ප්‍රතිපාදනයේ ප්‍රමාණය ධාරණ මුදල් සහ ඇස්තමේන්තු හා අයකරගත හැකි මුදල අතර වෙනස වේ. බොල් ණය හඳුනාගත් අවස්ථාවේ දී කපාහරිනු ලැබේ.

**3.2.11 සුරැකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම**

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරැකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරැකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරැකුම්පත් ණයට ගැනීම යනු නැවත භාරදීම අතපසු වන විටක දී, සුරැකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරැකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරැකුම්පත් අසම්භව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වර්තාකරණු ලබයි.

### 3.2.12 මූල්‍ය වත්කම් හානිකරණය

කිසියම් මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇත්දැයි බැංකුව විසින් මූල්‍ය තත්ව ප්‍රකාශන දිනයන්හි දී තක්සේරු කරනු ලැබේ.

### 3.2.13 ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට ධාරණය කළ ණයක් හෝ ලැබිය යුතු මුදලක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි ඇත්නම්, එම අලාභය ගණනය කරනු ලබන්නේ වත්කමේ ධාරණ අගය සහ ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහයන්ගේ (මෙතෙක් දරා නොමැති අනාගත ණය අලාභ හැර) වත්කමේ මුල් සඵල පොළී අනුපාතයත් වට්ටම් කළ අගයත් අතර වෙනසය. වත්කමක ධාරණ අගය සෘජුව හෝ දීමනා ගිණුමක් මගින් හෝ අඩුකරනු ලැබේ. පාඩු වූ ප්‍රමාණය ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ලැබේ.

බැංකුව ප්‍රථමයෙන් තනිව වැදගත් හා තනිව හා සාමූහිකව නොවැදගත් මූල්‍ය වත්කම් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි තිබේදැයි විමර්ෂණය කරනු ලබයි. එසේ වැදගත් හෝ නොවැදගත් තනිව විමර්ෂණය කළ මූල්‍ය වත්කමක් හානිකරණය වී ඇති බවට සාධාරණ සාක්ෂි නොමැති යැයි තීරණය කළහොත් එම මූල්‍ය වත්කම සමාන ණය අවදානමක් ඇති මූල්‍ය වත්කම්වලට ඇතුළත් කර එම වත්කම් හානිකරණය සඳහා සාමූහිකව විමර්ෂණය කරනු ලැබේ. තනිව හානිකරණ පාඩු සඳහා තක්සේරු වටිනාකමට අදාලව හානිකරණ පාඩු පවතී නම් හෝ ඒ බව අඛණ්ඩව හඳුනාගෙන තිබේ නම් ඒවා සාමූහික තක්සේරුවකට ඇතුළත් කරනු නොලැබේ.

පසුකාලයේ දී හානිකරණ අලාභයේ අගය අඩුවන්නේ නම් සහ හානිකරණය හඳුනාගැනීමෙන් පසු සිදු වූ සිදුවීමකට විෂයානුබද්ධව අදාල කර ගතහැකි නම් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ආපසු ගලපයි. පසුකාලයක දී ආපසු ගලපන ලද ඕනෑම හානිකරණ අලාභයක් ආපසු ගලපන ලද දිනට වත්කමේ ධාරණ අගය එහි ක්‍රමක්‍ෂය පිරිවැය නොඉක්මවන ප්‍රමාණයක් දක්වා ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

### 3.2.14 විකිණීමට ඇති ආයෝජන

විකිණීමට ඇති වත්කමක් හානිකරණය වී ඇත්නම් එහි පිරිවැය (මූලික ගෙවීම සහ ක්‍රමක්ෂය අතර ශුද්ධ අගය) හා එහි වර්තමාන සාධාරණ අගය, මීට පෙර ලාභය හෝ අලාභය යටතේ හඳුනාගත් හානිකරණ අලාභයක් වේ නම් එය අඩුකර හිමිකරු ප්‍රාග්ධනයෙන් ආදායම් ප්‍රකාශනයට මාරුකරනු ලැබේ. විකිණීමට ඇති ලියවිලි ලෙස වර්ගකර ඇති හිමිකම් ප්‍රාග්ධන ලියවිලි නැවත ගැලපීම් ලාභය සඳහා හඳුනාගන්නේ නැත. ණය ලියවිලිවල හානිකරණ අලාභ, ලියවිල්ලෙහි සාධාරණ අගයෙහි වැඩිවීම, හානිකරණ පාඩුව හඳුනා ගැනීමට පසුව වූ සිද්ධියකට අදාල වන බවට නිශ්චිත සාක්ෂි තිබේ නම් පමණක්, එය ලාභ හෝ පාඩු හරහා නැවත ගැලපිය හැකිය.

### 3.2.15 විදේශීය මුදල් කාලීන බැරකම්

විදේශීය මුදල් කාලීන බැරකම්, බැරකම්වල ක්‍රමක්ෂය පිරිවැයට පසුව වාර්තා කරනු ලැබේ. මෙම බැරකම්වල අගය වෙනස්වීම කාලීන බැරකම්වල වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස ශේෂ පත්‍රයෙහි දක්වනු ලැබේ. විදේශීය මුදල් කාලීන බැරකම්වල වෙනස්වීම් වලින් උද්ගතවන වාසි සහ අවාසි වහාම ආදායම් ප්‍රකාශනයෙහි වියදමක් ලෙස හඳුනාගනු ලැබේ. බැරකමේ අයිතිය තවදුරටත් පවතී නම් වාසිය හෝ අවාසිය උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ. වාසිය හෝ අවාසිය උපලබ්ධි වූ (බැරකම ආපසු ගෙවීම් මගින්) අවස්ථාවන්හිදී එය මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වූ වාසිය/(අවාසිය) ලෙස වාර්තා කරනු ලැබේ.

### 3.2.16 මූල්‍ය ඇපකර

මූල්‍ය වාර්තාවලදී, මූල්‍ය ඇපකර මූලික වශයෙන් සාධාරණ අගය මත අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ හඳුනාගනු ලැබේ. ආරම්භක හඳුනා ගැනීමෙන් අනතුරුව එක් එක් ඇපකරය යටතේ බැංකුවේ වගකීම ගණනය කිරීම, ඇපකරය හේතුවෙන් උද්ගතවන මූල්‍ය බැඳීම් බේරුම් කිරීම සඳහා වන හොඳම ඇස්තමේන්තුව ප්‍රකාර සිදුකරනු ලැබේ.

### 3.2.17 වෙනත් මූල්‍ය වත්කම් සහ බැරකම්

මුදල්, තැන්පතු සහ කෙටිකාලීන අත්තිකාරම් වශයෙන් වූ දේශීය සහ විදේශීය මුදල් වෙළෙඳ දිනයේ දී හඳුනාගනු ලැබේ.

## 3.3 අනිකුත් වත්කම් සහ බැරකම්

### 3.3.1 රන්

ජාත්‍යන්තර සංචිතයේ සංයුතිය මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රන්, මෙම සංචිතයේ කොටසක් ලෙස දැරිය හැක. එම නිසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස දරා සිටි රන්වල අගය 2012 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 85.9 කි. රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය හෝ අලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

### 3.3.2 සේවක ණය

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. ජා.ගි.ප්‍ර. 39 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් මෙම ණය පහසුකම ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

වට්ටම් අනුපාතය - මෙම අනුපාතය ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් ඉලක්ක කරගත් දිගුකාලීන උද්ධමනය පදනම් කොට ශ්‍රී ලංකා මහ බැංකු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සම්පාදනය කරන ලදී. විගණන කමිටුව මගින් එකඟ

වී ඇති පරිදි වාණිජ්‍ය පොළී නිර්දේශිත අනුපාතය (CIRR) සඳහා සියයට 1 ක අවදානම් අධිකයක් ද එකතු කරමින් වට්ටම් අනුපාතය ලෙස භාවිත කොට ඇති අතර එය ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරන ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම් බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක් අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

**සාධාරණ අගයකරන ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන් :**

- 2008 වර්ෂයේ සිට ලබාදුන් සේවක ණය සලකා බලන ලදී.
- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ පියවීමක් සිදුවී නොමැත.

ණය කළමනාකරණ පද්ධතිය වඩාත් සරල කිරීමේ අභිප්‍රායෙන් මහ බැංකුව විසින් පරිගණක ණය සහ B ප්‍රභේදය යටතේ වූ තවත් ණය වර්ග දෙකක් රුපියල් ලක්ෂ 3 ක ණය සීමාවකට සහ වසර 10 ක නැවත ගෙවීමේ කාලයකටද යටත්ව ඒකාබද්ධ කිරීමකට හා නැවත සැලසුම් කිරීමකට ලක් කොට ඇත. එමගින් ඉහත ප්‍රභේද ත්‍රිත්වය එක් ණය ගැතියකුට අයිති තනි ණයක් ලෙස ඒකාබද්ධ කෙරෙනු ඇත. ඒ අනුව මෙම ප්‍රභේදය යටතේ නව ණය මුදලක් ප්‍රධානය කරන ඕනෑම අවස්ථාවක එකී මුදල සහ හිඟ ණය මුදල් ප්‍රමාණය යන අයිතිමයන් දෙකම නැවත සැලසුම් කිරීමකට ලක් කරනු ඇත.

### 3.3.3 තොග

තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ. සෙමින් වැයවන තොග සඳහා වෙන් කිරීමක් සලසා ඇත.

### 3.3.4 දේපළ, පිරියත සහ උපකරණ

දේපළ, පිරියත සහ උපකරණ එදිනෙදා සේවා වියදම් හැර, සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වු නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ගොඩනැගිලි සඳහා වු ක්ෂය සහ ප්‍රත්‍යාගණන දිනයට පසුව අඩුකළ හානිකරණ පාඩු අඩුකර, ඉඩම් සහ ගොඩනැගිලි ගණනය කර ඇත.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

| වත්කම් වර්ගය | ජීවකාලය |
|---|---|
| සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | වර්ෂ 50 ක් තුළ |
| කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි | කල්බදු කාල පරිච්ඡේදය තුළ |
| පිරියත සහ පිරියත කොටස් | වර්ෂ 20 ක් තුළ |
| ලී බඩු සහ උපකරණ | වර්ෂ 10 ක් තුළ |
| මෝටර් රථ | වර්ෂ 5 ක් තුළ |
| පරිගණක දෘඪාංග | වර්ෂ 4 ක් තුළ |
| වෙනත් | වර්ෂ 3 ක් තුළ |

ධාරණ අගයක් අයකරවාගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක යන්ත්‍ර හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය. පළමුව පිරිවැය මත හඳුනා ගැනීමෙන් අනතුරුව ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කළ වටිනාකම පවත්වා ගෙන යනු ලබන අතර, එය වු කලි පසුකාලීන සමුච්චිත ක්ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකළ සාධාරණ අගය වේ.

ප්‍රත්‍යාගණනය කළ වත්කම්වල සාධාරණ අගය, ඒවායේ ධාරණ අගයෙන් විශාල ලෙස වෙනස්වීම මගහරවා ගැනීමට නිරතුරුව අගය කිරීම් කරනු ලැබේ.

ප්‍රත්‍යාගණන අතිරික්ත ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, ශේෂ පත්‍රයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මිට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක්, එම වත්කම සම්බන්ධයෙන්ම වු පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම් ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් අපහරණයේ දී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

### 3.3.5 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඪාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග අස්පෘශ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ.

මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘශ්‍ය වත්කම්, වර්ෂ 4 ක ජීවකාලයක් පදනම් කළ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

**3.3.6 ලැබිය යුතු ගිණුම්**

ලැබිය යුතු ගිණුම්, නිශ්චිත සාක්ෂි මත අඩමාන ණය සඳහා වෙන්කිරීම් පිළිබඳ පසුව අපේක්ෂිත උපලබ්ධි වටිනාකම මත දක්වනු ලැබේ.

**3.3.7 විවිධ වත්කම්**

අනෙකුත් විවිධ වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

**3.3.8 මූල්‍ය නොවන වත්කම් හානිකරණය**

කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සලකුණු දක්වන්නේ නම් හෝ පවත්නා සිද්ධීන් හෝ වෙනත් තත්ත්වයක් හේතුවෙන් ධාරණ අගය හානි වියහැකි බව පෙන්නුම් කරන්නේ නම් බැංකුව විසින් ඒවා එක් එක් වාර්තා කිරීමේ දිනයේ දී සමාලෝචනය කරනු ලැබේ. එවැනි සලකුණක් පවතී නම්, බැංකුව විසින් වත්කමෙන් අයකර ගත හැකි මුදල් ප්‍රමාණය ඇස්තමේන්තු කරනු ලැබේ. වත්කමක ධාරණ අගය අයකරගත හැකි මුදල් ප්‍රමාණය ඉක්මවන්නේ නම් වත්කම හානිකරණය වූ ලෙස සලකා, අයකර ගත හැකි වටිනාකමට ගිණුම් තබනු ලැබේ.

**3.3.9 ප්‍රතිපාදන**

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීම මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

**3.3.10 සංසරණයේ පවතින මුදල්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

**3.3.11 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනාක්‍රම**

බැංකුව විසින් මෙහෙයවනු ලබන විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ යෝජනා ක්‍රම 41 වැනි සටහනෙහි හෙළිදරව් කර ඇත.

**3.3.12 නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම**

බැංකුව විසින් විශ්‍රාම වැටුප්, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ. ආයුගණන අගය කිරීම් වර්ෂ තුනකට වරක් බැගින් සිදු කරනු ලැබේ.

විශ්‍රාම සේවා වියදම්, ප්‍රතිලාභ හා අත්පත් කරගන්නා තෙක් සාමාන්‍ය කාල සීමාව තුළ සරල මාර්ග ක්‍රමය ප්‍රකාර වියදම් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිලාභ, හඳුන්වා දුන් අවස්ථාවේ ම එය අත්පත් කරගෙන තිබේ නම් හෝ වෙනස් වී ඇත්නම් හෝ විශ්‍රාම සේවා වියදම එසැණින් ම හඳුනාගනු ලැබේ.

අනුභූති ගැලපීම් සහ ආයුගණන උපකල්පනයන් වෙනස්වීම් මත උද්ගත ආයුගණන ලාභ සහ පාඩු නිශ්චිත ප්‍රතිලාභ වගකීමේ සහ සැලසුමේ වත්කම්වල සාධාරණ අගය හෝ වැඩි සංඛ්‍යාව සියයට 10 ඉක්මවන අවස්ථාවල දී ආයුගණන ආදායම් හෝ වියදම් ලෙස හඳුන්වනු ලැබේ. එකී ලාභ හෝ අලාභ, මෙම යෝජනා ක්‍රම සඳහා සහභාගිවන සේවකයන්ගේ අපේක්ෂිත ඉදිරි වැඩ කරන කාලය මත ආයුගණන ලාභ හා අලාභ ක්ෂණිකව හඳුනා ගැනීමට පහසු වන ලෙස විධිමත් ක්‍රමයක් ප්‍රකාර සටහන් කරනු ලැබේ.

**3.3.13 නිශ්චිත දායක යෝජනා ක්‍රම**

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් ලෙස වෙනම ම පරිපාලනය කරනු ලැබේ.

**3.3.14 ප්‍රදානයන්**

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භිත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශනයට මුදාහරිනු ලැබේ.

**3.3.15 සේවක මණ්ඩල වියදම්**

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම් අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

**3.3.16 ක්‍රියාත්මක කල්බදු**

බැංකුව කල්බදු ගැනුම්කරු වන අවස්ථාවන්හි දී, කල්බදු ගත් වත්කම්වලින් අපේක්ෂිත ප්‍රතිලාභ පදනම් කරගෙන, ක්‍රියාත්මක කල්බදු සඳහා ගෙවිය යුතු කුලිය එය බල පවත්නා කාල පරිච්ඡේදය තුළ ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

**3.3.17 බදුකරණය**

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 118 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ.

**3.3.18 ආදායම සහ වියදම**

බැංකුව වෙත ආර්ථික ප්‍රතිඵල ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් වියදම් හැඳින්වීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීමේ උපමානයන් ද සපුරාලිය යුතුය.

**3.3.19 පොළිය**

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව සඵල ඵලදායිත්ව ක්‍රමයට උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන සහ සුරැකුම්පත් මත උපයන කූපන් සහ භාණ්ඩාගාර බිල්පත් සහ අනිකුත් වට්ටම් සහ අධිමිල පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

**3.3.20 ලාභාංශ**

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

**3.3.21 විවිධ**

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ අපහරණයේ දී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, වත්කම් ධාරණ අගය සහ විකුණුම් වියදම් අපහරණයෙන් ලද වියදම් අඩුකොට ආදායම් ප්‍රකාශනයෙහි ගිණුම්ගත කර ඇත. ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

**3.3.22 මූල්‍ය තත්ව ප්‍රකාශනයෙන් බාහිර විෂයයන් ඇතුලු අසම්භාව්‍යයන් සහ බැඳීම්**

ශේෂ පත්‍රයෙහි බාහිර විෂයයන් නියෝජනය කෙරෙන ණය ගැතිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල ශේෂ පත්‍රයෙන් බාහිර විෂයයන් ලෙස හඳුනාගෙන අදාල ශීර්ෂ යටතේ දක්වා ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

## 4. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

1949 අංක 58 දරන මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවරෙන අතර, බැංකුවේ කළමනාකාරිත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- මූල්‍ය පද්ධතියෙහි නිදහස් තරගකාරිත්වය සහ ස්ථායීතාවය සැලසීම.
- සුදුසුකම්ලත් මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබාදීම සහ අධීක්ෂණය.
- අන්තර් බැංකු බේරුම් කිරීමේ පද්ධතිය සංවිධානය හා කළමනාකරණය සහ ගෙවීම් පද්ධතියෙහි නිසි ක්‍රියාකාරීත්වය ප්‍රවර්ධනය කිරීම.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතනවලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජය සහ රජය වෙනුවෙන් ක්‍රියාකරන නියෝජිත ආයතන සමග නිශ්චිත විධිවිධාන යටතේ සුරක්ෂිතාගාරයක් ලෙස ක්‍රියාකිරීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සපුරාගැනීම සඳහා පවත්වා ගෙනයන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම්වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාළව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

**4.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල්වලින් පවත්වනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන්, නවසීලන්ත ඩොලර් සහ චීන යුවාන් (අක්වෙරළ) වලින් හඳුන්වා ඇත.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් ඝෛවරී සුරැකුම්පත් ප්‍රතිවර්තිත මිලදී ගැනීමේ ගනුදෙනු යටතේ දරනු ලබන සුරැකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන වෙත වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

### 4.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම් හිලව් කරනු ලැබේ. මෙම කටයුතු බොහොමයක් දෛනික වෙළෙඳපොළ මෙහෙයුම් මගින් සිදුකරනු ලැබේ.

(ii) සංසරණයෙහි පවත්නා මුදල් නියෝජනය කෙරෙන බැරකමට ආධාරකව ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් පවතිවා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

### 4.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාර සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන මුදල්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ගෙන් අන්තර්ගත කොටසක් නොවන බැවින් ඒවා මෙම මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර නොමැත.

### 5. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමේ නිර්දේශ අනුපාතයේ හෝ දර්ශකයේ අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිගව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවධානම හෝ ණය අවධානම නොහැඟ වේ.

| ව්‍යුතපන්න මූල්‍ය උපකරණ | වත්කම් 2012 රු. 000 | බැරකම් 2012 රු. 000 | කාල්පනික අගය 2012 රු. 000 | වත්කම් 2011 රු. 000 | බැරකම් 2011 රු. 000 | කාල්පනික අගය 2011 රු. 000 |
|---|---|---|---|---|---|---|
| මුදල් හුවමාරු Currency SWAPS | **3,989,701** | **3,250,937** | **250,552,318** | 2,794,334 | 1,041,597 | 310,813,574 |
| ඉදිරියෙහි වූ හුවමාරු (Forward_ Forex) | - | **6,182** | **1,027,364** | - | - | - |
| | **3,989,701** | **3,257,119** | **206,579,682** | 2,794,334 | 1,041,597 | 310,813,574 |

ස්වල්ප වශයෙන් වටිනාකම මාරු කිරීම හෝ වටිනාකම මාරු කිරීමකින් තොරව, අන්‍යොන්‍ය ප්‍රතිඥා හුවමාරු කිරීම මගින් පමණක් ව්‍යුත්පන්න උපකරණයන්ගේ ආරම්භය සිදු වේ. කෙසේ වුවත් නිතර ඉහළ තෝලන මට්ටමක් ඇති මෙම උපකරණ චංචල උපකරණයන් වේ. ව්‍යුත්පන්න ගිවිසුමක ගැබ් ව ඇති වත්කමක වටිනාකම, අනුපාතය හෝ දර්ශකයක සිදුවන්නා වූ සුළු සංචලනයක් මගින් බැංකුවේ ලාභය හෝ අලාභය කෙරෙහි සැලකිය යුතු මට්ටමේ බලපෑමක් සිදු කරයි.

අත්පිට ව්‍යුත්පන්න උපකරණයක් මගින් විවෘත තත්ත්වයන් සංවෘත කිරීම සඳහා හුවමාරු වෙළඳපොළක් නොමැතිවීම හා සම්බන්ධ අවදානමක් බැංකුව වෙත ඇතිකරනු ලැබේ. බැංකුවේ වෙළඳපොල අවධානම කළමණාකාරණය කිරීමේ කාර්යයේ කොටසක් ලෙස බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් තුළින් පැනනගින්නා වූ අනාවරණයවීම් පරීක්ෂා කරයි.

#### හුවමාරුකරණය (SWAPS)

පොළී අනුපාත, විදේශ මුදල් අනුපාත හෝ ප්‍රාග්ධන දර්ශක වැනි විශේෂ දර්ශකයන්ගේ වෙනස්වීම් හා සම්බන්ධ කාල්පනික අගයන් කාල පදනම මත ගෙවීම් ප්‍රවාහයන් හුවමාරු කර ගැනීම සඳහා පාර්ශවයන් දෙකක් අතර ඇතිකර ගන්නා ගිවිසුමකි.

### 6. මූල්‍ය වත්කම්

| | 2012 රු. 000 | 2011 රු. 000 |
|---|---|---|
| ලාභ/අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **169,312,604** | 106,006,361 |
| විකිණීම සඳහා ඇති ආයෝජන | **386,761,690** | 270,664,801 |
| මුළු මූල්‍ය වත්කම් | **556,074,294** | 376,671,162 |

**7. ජා.මූ.අ. සම්බන්ධ වත්කම්**

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| විශේෂ ගැනුම් හිමිකම් දැරීම | **491,322** | 502,112 |
| ජා.මූ.අ. පංගුව | **80,741,567** | 72,290,845 |
| ජා.මූ.අ. තැන්පතුව | **119,393** | 137,934 |
| කලින් ගෙවූ බැඳීම් ගාස්තුව | - | 159,626 |
| මුළු ජා.මූ.අ. සම්බන්ධ මුළු වත්කම් | **81,352,282** | 73,090,517 |

**විශේෂ ගැනුම් හිමිකම් දැරීම**

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා වි.ගැ.හි. හුවමාරු කරගත හැකිවීමය. එකී සාමාජිකයන් එම මුදල් වි.ගැ.හි. දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාලව විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම නිසා සංචිත වත්කමක් ලෙස වි.ගැ.හි. වල ඇති විශේෂත්වය ඇති වේ. ආබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.ගි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

**ජා.මූ.අ. පංගුව**

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) වූ කලී සාමාජික රටවල් 187 කින් සමන්විත ජාත්‍යන්තර සංවිධානයකි. ජාත්‍යන්තර මුදල් සහයෝගිතාවය, විනිමය ස්ථායීතාවන් සහ විධිමත් විනිමය සැලසුම් ප්‍රවර්ධනය කිරීමටත්, ආර්ථික වර්ධනය සහ රැකියා තත්ත්වය ඉහළ මට්ටමකට ගෙනඒම අභිවර්ධනය කිරීමටත් ගෙවුම් ශේෂ ගැලපීම් පහසු කරලීම සඳහා රටවලට තාවකාලික ආධාර සැපයීමටත් එය පිහිටුවන ලදි. ජා.මූ.අ. මූලික ප්‍රභවය වන්නේ ප්‍රාග්ධන දායකය නොහොත් පංගුය. ජා.මූ.අ. සම්පත් එහි සාමාජික රටවලින් ලැබේ. පුළුල් වශයෙන් රටක ආර්ථික තත්ත්වය, ඒ හා සමාන රටවල පංගු ද ගණනයට ගෙන එක් එක් රටෙහි දායකය නොහොත් පංගුව නිශ්චය කරනු ලැබේ. ජා.මූ.අ. අරමුදලට බැඳෙන අවස්ථාවේ දී රටක් විසින් එයට අදාල පංගුවෙන් සියයට 25 ක් පුළුල්ව පිළිගත් විදේශීය මුදල්වලින් ගෙවිය යුතු අතර, ඉතිරි සියයට 75 ස්වකීය මුදල්වලින් ගෙවිය යුතු වේ.

යම් සාමාජිකයකුගේ පංගුවෙන්, ජා.මූ.අ. සමග වන මූල්‍ය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය පිළිබඳ මූලික අංගයන් නිරූපනය වන අතර, මේවා ද ඇතුළත් ය.

**දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ මුදල්වලින් ගෙවිය යුතුය.

**ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්ද 250 ක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. මිලියන 0.1 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් බැගින් ද හිමි වේ.

**මූල්‍යකරණය පිවිසීම** - සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම්වලින් (පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව පදනම් වේ. සම්පස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට ප්‍රවර්තනය වාර්ෂිකව පංගුවෙන් සියයට 100 ක් ද සමුච්චිත වශයෙන් සියයට 300 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී සහ නිශ්චිත ගැටළු විසඳා ගැනීම සඳහා ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

**වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ.

එබැවින් වි.ගැ.හි. පංගුව වත්කමක් වේ. බැංකු විසින් ජා.මූ.අ. සමග සිදුකරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා ආණ්ඩුවේ නියෝජිතයකු වශයෙන් නොව, තම බලතල අනුව සිදුකරන බැවින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස එහි මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වයි. ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල් ප්‍රමාණය 16 වැනි සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

**PRGF - HIPC භාර ගිණුම**

දැඩි දිළිඳු භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම අඩුකරලීමේ පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788.783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්භිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු

ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව (act as an out right grant) 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි.

**8. රජයට දෙන ලද අත්තිකාරම්**

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| චක්‍රීය ණය | **111,291,843** | 94,743,013 |
| රජයට දෙන ලද මුළු අත්තිකාරම් | **111,291,843** | 94,743,013 |

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වැනි වගන්ති ප්‍රකාර දෙන ලද සෑම අත්තිකාරකමක් මාස හයකට නොවැඩි කාලයකින් ආපසු ගෙවන්නේ නම් සහ ඕනෑම අවස්ථාවකදී පරිශේෂව තිබෙන එම අත්තිකාරම් ප්‍රමාණය අත්තිකාරම් දෙනු ලබන වර්ෂයේ ශ්‍රී ලංකා රජයේ ඇස්තමේන්තුගත ආදායමින් සියයට 10 ක් නොඉක්මවන්නේ නම්, ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අනුමාන වියදම් මූල්‍යයනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජයට (ශ්‍රීලංර) සෘජු තත්කාලීන අත්තිකාරම් දීමට මහ බැංකුවට හැකිය. බැංකුව විසින් එසේ දෙන ලද අත්තිකාරම් ඉහත ශේෂයෙන් දැක්වේ.

**9. අනිකුත් ආයතනවලට දෙන ලද ණය**

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| මධ්‍යකාලීන හා දිගුකාලීන ණය | | |
| **යෝජනා ක්‍රමය යටතේ ලැබිය යුතු** | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **39,510** | 41,644 |
| - අනෙකුත් | **607** | 668 |
| ***සුසහන සුනාමි යෝජනා ක්‍රමය යටතේ ලැබිය යුතු මුදල්*** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **191,982** | 314,388 |
| - අනෙකුත් | **63,301** | 129,472 |
| **ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය යටතේ ලැබිය යුතු දෑ** | | |
| - සම්බන්ධිත පාර්ශවයන් | **1,576,139** | 1,854,663 |
| **ලැබිය යුතු පොළිය** | | |
| **අඩුකළා** | | |
| අඩමාණ ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීම | **(27,302)** | (27,302) |
| **ශුද්ධ ලැබිය යුතු මුදල** | **1,844,237** | 2,313,533 |

අඩමාණ ලැබිය යුතු මුදල් සඳහා වෙන්කිරීමේ චලනය මෙසේය.

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| අත්හිට වූ පොළිය | **27,302** | 1,963,796 |
| අඩමාන ණය සඳහා වෙන්කිරීම් | - | (1,936,494) |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **27,302** | 27,302 |

**10. මූල්‍ය සහ අනිකුත් ආයතන වල ආයෝජන**

(i) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාණිජ, කාර්මික හෝ වෙනත් ආයතනයක සෘජු සම්බන්ධකම් ඇතිවන පරිදි වෙළෙඳ හෝ වෙනත් කටයුතුවල නිරතවීම හෝ සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී වෙනත් බැංකුවල කොටස් මිලදී ගැනීම හෝ 1949 අංක 58 දරන මුදල් නීති පනත (සංශෝධිත) ප්‍රකාර නිශ්චිත වශයෙන් තහනම් කරනු ලැබේ. කෙසේ වුවද, මුදල් මණ්ඩලයේ මතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර දැරීමට පනත මගින් බලතල පවරා තිබේ.

(ii) ඉහත සඳහන් අවශ්‍යතාවයන් පදනම්ව බැංකුව විසින් ශේෂ පත්‍ර දිනට පහත සඳහන් ආයෝජන දරනු ලැබේ.

| ආයෝජනය කළ සමාගම | ව්‍යාපාර කටයුතු | දරණ ප්‍රතිශතය | |
|---|---|---|---|
| | | **2012** | 2011 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය | **19.66** | 19.66 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා සමාගම | ණය ශ්‍රේණිගත කිරීම | **10.00** | 10.00 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව | **7.50** | 7.50 |
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | ණය තොරතුරු සම්පාදනය | **19.30** | 19.68 |

(iii) අදාළ ආයතනවල වූ ආයෝජනයන්ගේ ධාරණ වටිනාකම මෙසේය:

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය | **5,845** | 5,961 |
| සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම | **29,500** | 29,500 |
| සීමාසහිත ෆිච් රේටිංස් ලංකා සමාගම | **3,500** | 3,500 |
| ලංකා ෆයිනෑන්ෂල් සර්විස් බියුරෝ ලිමිටඩ් | **2,250** | 2,250 |
| මූල්‍ය සහ අනිකුත් ආයතන වල මුළු ආයෝජනය | **41,095** | 41,211 |

**11. අනෙකුත් වත්කම්**

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| අරමුදල්හි ආයෝජන | **1,799,394** | 1,493,045 |
| කාර්ය මණ්ඩල ණය | | |
| ක්‍රමක්ෂය පිරිවැයට | **3,771,816** | 3,202,868 |
| ණයකරවල ආයෝජන | | |
| ක්‍රමක්ෂය පිරිවැයට | **7,273** | - |
| | **5,578,483** | 4,695,913 |

ණයකර ආයෝජනවලින් නියෝජනය වන්නේ මර්කන්ටයිල් ක්‍රෙඩිට් සමාගමට ලබාදී තිබූ 2011 දී ලියාහරින ලද ප්‍රතිමූල්‍ය ණය වලින් කොටසක් වෙනුවෙන් ශ්‍රී ලංකා ඉතිරිකිරීමේ බැංකුව නිකුත් කරන ලද ණයකරවේ. වටිනාකම රු. 10,839,500 යුත් ණයකර වර්ෂ 10 ක් සඳහා අනාරක්ෂිත යටත්, නිදහස් කල හැකි හා 5% වාර්ෂික පොළි හිමිකමක් හෝ එක් අවුරුදු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිලාභ අනුපාතයන් අතුරින් අඩු අගයට වාර්ෂිකව උපචිත කරයි.

**12. තොග**

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| සංසරණයේ ඇති නෝට්ටු | **2,171,534** | 1,895,335 |
| සංසරණයේ ඇති කාසි | **706,071** | 427,137 |
| මාර්ගස්ථ නෝට්ටු | **51,564** | 51,564 |
| මාර්ගස්ථ කාසි | **-** | 98,963 |
| | **2,929,169** | 2,472,999 |
| අඩුකළා : සෙමින් චලනය වන විෂයයන් සඳහා වෙන්කිරීම් | **(25,000)** | (25,000) |
| | **2,904,169** | 2,447,999 |
| ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග | **37,908** | 36,682 |
| වෛද්‍ය මධ්‍යස්ථානය | **116** | - |
| පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි වටිනාකම යන දෙකෙන් අඩු වටිනාකමට මුළු තොගය | **2,942,193** | 2,484,681 |

**13. දේපළ පිරියත සහ උපකරණ**

| | ඉඩම් සහ ගොඩ නැගිලි | පිරියත සහ පිරියත උපකරණ | ලී බඩු සහ උපකරණ | මෝටර් වාහන | පරිගණක | අනිකුත් කියවීම් උපකරණ | නොනිම් ඉදිකිරීම් | එකතුව 2012 | එකතුව 2011 |
|---|---|---|---|---|---|---|---|---|---|
| පිරිවැය | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| සමුච්චිත ක්ෂය අඩුකර ජනවාරි 01 දිනට අගය | **8,749,381** | **1,100,507** | **731,822** | **320,771** | **713,137** | **47,473** | **751,744** | **12,414,835** | 11,460,279 |
| ප්‍රත්‍යාගණනය | **2,746,379** | - | - | - | - | - | - | **2,746,379** | **-** |
| එකතු කිරීම් | **841,319** | **43,754** | **48,780** | **98,199** | **30,721** | **1,574** | **645,203** | **1,709,550** | 1,247,490 |
| අපහරණයන් මාරු කිරීම් | **(5,000)** | **-** | **(15,837)** | **(18,251)** | **(23,484)** | - | **(763,041)** | **(825,613)** | (292,934) |
| සමුච්චිත ක්ෂය අඩුකර දෙසැම්බර් 31 දිනට අගය | **12,332,079** | **1,144,261** | **764,765** | **400,719** | **720,374** | **49,047** | **633,906** | **16,045,151** | 12,414,835 |
| ක්ෂය | | | | | | | | | |
| ජනවාරි 01 දිනට | **509,175** | **480,305** | **524,560** | **234,938** | **640,699** | **28,461** | **-** | **2,418,138** | 2,115,939 |
| ප්‍රත්‍යාගණනය | **(541,949)** | - | - | - | - | - | - | **(541,949)** | - |
| වර්ෂය සඳහා ක්ෂය | **158,210** | **56,957** | **33,795** | **31,999** | **29,900** | **1,209** | **-** | **312,070** | 303,380 |
| අපහරණයන් | - | - | **(14,805)** | **(18,251)** | **(23,129)** | - | - | **(56,185)** | (1,181) |
| දෙසැ 31 දිනට අගය | **125,436** | **537,262** | **543,550** | **248,686** | **647,470** | **29,670** | **-** | **2,132,074** | 2,418,138 |
| ශුද්ධ පොත් අගය | **12,206,643** | **606,999** | **221,215** | **152,033** | **72,904** | **19,377** | **633,906** | **13,913,077** | 9,996,697 |

ඉඩම් සහ ගොඩනැගිලි සඳහා පොත් වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2012 මාර්තු 31 දිනට වරලත් තක්සේරුකරුවකු වන පී.බී. කළුගලගෙදර මහතා විසින් සිදු කරන ලද අතර 2012 අප්‍රේල් 30 දින වාර්තා ගත කර තිබුණි.

**ඉඩම් සහ ගොඩනැගිලි සංයුතිය පහත සඳහන් පරිදිය.**

| | ධාරණ වටිනාකම 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| සින්නක්කර ඉඩම් | **5,180,100** | 2,943,278 |
| සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි | **6,939,096** | 5,229,793 |
| කල්බදු ඉඩම්වල ගොඩනැගිලි | **87,447** | 67,135 |
| | **12,206,643** | 8,240,206 |

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වූයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රුපියල් මිලියන 9,464.544 ක් වේ. (2011 දී එය රුපියල් මිලියන 6,609.783 කි).

## 14. අස්පෘෂ්‍ය වත්කම්

| | 2012 | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| **පරිගණක මෘදුකාංග** | | |
| **පිරිවැය -** | | |
| ජනවාරි 01 දිනට | **595,731** | 590,097 |
| එකතුකිරීම් | **19,266** | 5,634 |
| දෙසැම්බර් 31 දිනට | **614,997** | 595,731 |
| **ක්‍රමක්ෂය සහ හානිකරණය -** | | |
| ජනවාරි 01 දිනට | **582,008** | 572,344 |
| වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව | **8,836** | 9,664 |
| දෙසැම්බර් 31 දිනට | **590,844** | 582,008 |
| **ශුද්ධ පොත් වටිනාකම -** | | |
| ජනවාරි 01 දිනට | **13,723** | 17,753 |
| දෙසැම්බර් 31 දිනට | **24,153** | 13,723 |

## 15. බැංකු සහ මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල්

| | 2012 | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් | **1,485,466** | 387,250 |
| අනිකුත් විදේශීය ආයතනයන්ට ගෙවිය යුතු මුදල් | **1,134,381** | 550,462 |
| **බැංකු සහ මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුළු මුදල්** | **2,619,847** | 937,712 |

## 16. ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල්

| | 2012 | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| වර්ෂය අවසානයට | | |
| ගෙවිය යුතු මුදල | **28,953,955** | 90,032,085 |
| ශුද්ධ ලැබිය යුතු මුදල | **90,953,955** | 90,032,085 |

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ අනුග්‍රහය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව එක් සහභාගිවන්නකි. බංගලාදේශය, ඉරාන ඉස්ලාම් සමූහාණ්ඩුව, නේපාලය, පකිස්ථානය, ඉන්දියාව, භූතානය සහ මියන්මාරය එහි අනිකුත් සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ප්‍රවර්තන ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. ශුද්ධ ණයගැතියන් විසින් සියයට 0.01 ක සිට සියයට 0.17 ක් දක්වා වූ පොළියක් එ.ජ. ඩොලර් සඳහා ද (2011 දී එය සියයට 0.00 ක් සහ සියයට 0.20 ක් විය) යුරෝ සඳහා සියයට 0.00 ක සිට සියයට 0.01 දක්වා වූ පොළියක් (2011 - සියයට 0.06 සහ සියයට 1.11) මෙම පහසුකම් සඳහා ගෙවනු ලැබේ. එය බේරුම් කිරීමේ දිනයන් අතර ශුද්ධ ණය හිමියන්ගේ දෛනික පරිශේෂ ශේෂයන්ට මාරු කරනු ලැබේ. ඉහත ශේෂයන්ගෙන් අදාල මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දිනට ආ.නි.ස. වෙත ගෙවිය යුතු ප්‍රමාණය නියෝජනය වේ.

## 17. ජා.මූ.අ. සම්බන්ධ බැරකම්

| | 2012 | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| පොළිය දරන ණය - ප්‍රවර්තන නොවන | **260,727,978** | 189,229,942 |
| පොළිය දරන ණය - ප්‍රවර්තන | **58,278,166** | 6,463,246 |
| වි.ගැ.හි. වෙන්කිරීම් | **77,237,728** | 69,153,731 |
| ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල් | **48,432,045** | 40,510,385 |
| පංගු බැරකම් | **22,966,279** | 23,415,115 |
| | **206,914,218** | 139,542,477 |
| **ජා.මූ.අ. සම්බන්ධ මුළු බැරකම්** | **467,642,196** | 328,772,419 |

පොළිය දරන ණයවලට, ජා.මූ.අ. සමග වූ දුගීබව අඩුකරලීමේ සහ ආර්ථික වර්ධන පහසුකම සහ වැඩිකරන ලද පොළිය දරන ණයවලට, ජා.මූ.අ. සමග වූ දුගීබව අඩුකරලීමේ සහ ආර්ථික වර්ධන පහසුකම සහ වැඩිකරන ලද ව්‍යුහාත්මක ගැලපුම් පහසුකම් මෙන්ම හදිසි ආධාර පහසුකම් ද ඇතුළත් වේ.

### දිළිඳුකම අඩුකිරීමේ සහ ආර්ථික වර්ධන පහසුකම (PRGF)

මෙම පහසුකම, අඩු ආදායම් ලබන සාමාජිකයන්ට ජා.මූ.අ. විසින් සපයනු ලබන දිගුකාලීන මූල්‍යකරණ පහසුකමකි. මෙම පහසුකම, මීට ඉහත දී වැඩි දියුණු කළ ව්‍යුහගත ගැලපීම් පහසුකම ලෙස හඳුන්වන ලදී. දුගීබව අඩුකර තිරසාර පදනමක් මත වැඩි වර්ධනයක් ප්‍රවර්ධනය කිරීම මගින් උසස් ජීවන තත්ත්වයක් කරා පිවිසීම මෙම වැඩසටහනේ ඉලක්කය වේ. මෙම පහසුකම යටතේ අය කරන පොළී අනුපාතය වර්ෂයකට සියයට 0.5 ක් වේ. මෙය යටතේ ජා.මූ.අ. විසින් ප්‍රදානය කරනු ලබන ණය ආපසු ගෙවීමේ කාල පරිච්ඡේදය උපරිම වශයෙන් වර්ෂ 10 කි.

**දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම (EFF)**

මෙය, සාර්ව ආර්ථික අසංතුලනය සහ ව්‍යුහගත ගැටළු මගින් උද්ගත වන ගෙවුම් ශේෂ අපහසුතාවන් මැඩ පැවැත්වීම සඳහා මධ්‍යකාලීන වැඩසටහන්වලට ආධාර කෙරෙන මූල්‍ය පහසුකමකි. මෙය වැඩිදියුණු කළ ව්‍යුහගත ගැලපීම් පහසුකම්වල ව්‍යාප්තියකි. මේ යටතේ ණය සඳහා අය කෙරෙන පොළී අනුපාතය වර්ෂයකට සියයට 0.5 කි. ජා.මූ.අ. විසින් මේ යටතේ ලබාගත් ණය ආපසු ගෙවීමට සලසා ඇති කාල පරිච්ඡේදය වර්ෂ 4 1/2 ක අනුග්‍රහ කාල පරිච්ඡේදයක් සහිත වර්ෂ 10 කි.

**සම්පස්ථ ණය පහසුකම (SBA)**

මාස 20 ක මෙම ණය පහසුකම ශ්‍රී ලංකාවට ලබාදීම සඳහා 2009 ජූලි 24 වන දින ජා. මූ. අරමුදලේ විධායක කමිටුව විසින් අනුමත කරන ලද අතර එය වි.ගැ.හි. බිලියන 1.65 ක් එනම් (එ.ජ. ඩොලර් බිලියන 2.6) ප්‍රමාණය වේ. මෙය ශ්‍රී ලංකාවේ ගෙවුම් ශේෂ කටයුතු වලට සහය දීම සඳහා සපයන ලදී. මුළු ණය පහසුකමෙන් වි.ගැ.හි. මිලියන 413.4 ක් එනම් (එ.ජ. ඩොලර් මිලියන 651.36) ක ප්‍රමාණයක් වාරික දෙකක් ලෙස 2009 ජූලි 28 හා 2009 නොවැම්බර් 10 වන දිනවල ශ්‍රී ලංකාවට ලැබුණි.

තුන්වන හා හතරවන වාරික ලෙස වි.ගැ.හි. මිලියන 275.6 ක එනම් එ.ජ. ඩොලර් මිලියන 407.78 ක මුදලක් 2010 ජුනි 30 වන දින ශ්‍රී ලංකාවට හිමි විය.

පසුව පස්වන, හයවන හා හත්වන වාරික, එක් වාරිකයක් වි.ගැ.හි. මිලියන 137.8 ක් එනම් පිළිවෙලින් එ.ජ. ඩොලර් මිලියන 212.46, 216.61 සහ 218.48 වශයෙන් 2010 සැප්තැම්බර් 28, 2011 පෙබරවාරි 07 සහ 2011 අප්‍රේල් 06 යන දිනයන්හි ශ්‍රී ලංකාවට ලැබුණි.

2012 අප්‍රේල් 04 වන දින අටවන ණය වාරිකය වන වි.ගැ.හි. මිලියන 275.6 ක එනම් එ.ජ. ඩොලර් මිලියන 233.64 ක් හා යූරෝ මිලියන 144.98 ක් ශ්‍රී ලංකාවට ලැබුණු අතර අවසාන වාරිකය වන වි.ගැ.හි. මිලියන 275.6, එනම් එ.ජ. ඩොලර් මිලියන 337.53 හා යූරෝ මිලියන 63.31 ක මුදලක් 2012 ජූලි 24 වන දින ලැබිණි.

මෙම ණය මුදල ආපසු ගෙවීම සඳහා වර්ෂ 4 ක කාලසීමාවක් හිමිවන අතර එය 2012 ඔක්තෝබර් මසින් ආරම්භ වේ. 2012 ඔක්තෝබර් 25 වන දින වි.ගැ.හි. මිලියන 25.8 ක් එනම් යූරෝ මිලියන 30.6 ක මුදලක් ප්‍රථම ආපසු ගෙවීම ලෙස පියවන ලදී. මෙම ණය පහසුකම සඳහා අයකරන පොළී අනුපාතය, සේවා ගාස්තු හා ස්ථාවර අනුපාතය යන කොටස් දෙකකින් සමන්විතය. සේවා ගාස්තුව, විශේෂ ගැනුම් හිමිකම් අනුපාතයට යටත්ව සතිපතා ගණනය කරනු ලැබේ. ස්ථාවර අනුපාතය, නියමිත ණය මුදලින් ගෙවිය යුතු ණය මුදල සියයට 300 දක්වා වර්ෂයකට 1%කි. නියමිත ණය මුදලින් සියයට 300 ඉක්මවන විට වර්ෂයකට 2% ක් වූ අමතර ගාස්තුවක් අයබදු ලෙස ගෙවිය යුතුය.

**සම්පස්ථ ණය පහසුකමේ ප්‍රධාන අරමුණු**

- රටේ ආර්ථික ප්‍රතිසංස්කරණ වැඩපිළිවෙලට සහාය වීම.
- යුධමය තත්ත්වයට පසු ප්‍රතිසංස්කරණ සහ සහන සැලසීමේ ව්‍යායාමයන් සඳහා ප්‍රමාණවත් සම්පත් ඇති බව තහවුරු කරන අතරතුර රටේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීම.
- ලංකාවේ දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීම හා විදේශ සංචිත නැවත පිහිටුවීමේ අභිප්‍රාය.
- යුධ වාතාවරණයට පසුව සිදුකරන ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ජාත්‍යන්තර ප්‍රජාවගේ මූල්‍ය සහයෝගය ලබාගැනීමට පාලකයන්ට සහාය වන ශක්තිමත් සාර්ව ආර්ථික පදනමක් ඇති කිරීම.
- රාජ්‍ය අයවැය පරතරය අවම කිරීම
- වර්තමාන නීති රාමුව හා බැංකු සුපරීක්ෂණය වැඩිදියුණු කිරීම තුළින් බැංකු ක්‍රමය ශක්තිමත් කිරීම.

පොළී දරණ ණය සඳහා මාස 12 කට පෙර සහ පසු බේරුම් කිරීමට අපේක්ෂිත මුදල් පහත සඳහන් පරිදි වේ.

| | බලපවතින පොළී අනුපාතික % | පරිණත | **2012 රු.000** | 2011 රු. 000 |
|---|---|---|---|---|
| ප්‍රවර්තන | | | | |
| දීර්ඝ කරන ලද - අරමුදල් පහසුකම (EFF) | | | **336,423** | 602,424 |
| දිළිඳුකම අඩුකිරීමේ ආර්ථික වර්ධන පහසුකම 2 (PRGF 2) | 0.5 | | **749,799** | 1,342,644 |
| සම්පස්ථ ණය පහසුකම (SBA) | | | **57,191,944** | 4,518,178 |
| | | | **58,278,166** | 6,463,246 |
| ප්‍රවර්තන නොවන | | | | |
| සම්පස්ථ ණය පහසුකම (SBA) | | 2017 | **260,727,978** | 188,257,408 |
| දිළිඳුකම් අඩුකිරීමේ හා ආර්ථික වර්ධන පහසුකම 2 (PRGF 2) | 0.5 | 2013 | - | 671,322 |
| දීර්ඝ කරන ලද අරමුදල් පහසුකම (EFF) | 1.08 | 2013 | **-** | 301,212 |
| | | | **260,727,978** | 189,229,942 |
| පොළී දරණ මුළු ණය මුදල | | | **319,006,144** | 195,693,188 |

**විශේෂ ගැනීම් හිමිකම් වෙන් කිරීම (වි.ගැ.හි.)**

වි.ගැ.හි. යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අ. වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි) සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන්ට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන

අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 7 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. එහි ශුද්ධ වෙන්කිරීමට සමාන මුදල් සහ එය වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගීවීමේ හේතුවෙන් ජා.මූ.අ., වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කළ හෝ ඇවර කළ අවස්ථාවේ දී ගෙවිය යුතු අනිකුත් යම් මුදලක් වෙතොත් ඒවා ජා.මූ.අ. වෙත ගෙවීමට සාමාජිකයන් බැඳී සිටී.

**ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්**

මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

**පංගු බැරකම**

අංක 7 දරන සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

## 18. අනෙකුත් විදේශීය ගෙවිය යුතු මුදල්

| | 2012 රු. 000 | 2011 රු. 000 |
|---|---|---|
| චීන සංවර්ධන බැංකු අරමුදල | - | 2,847,532 |
| එස්කෝරුව ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය | **43,324,799** | 53,359,431 |
| EIB/DFCC ගෝලීය ණය II | **35,268** | - |
| මූල්‍ය කටයුතු අමාත්‍යාංශය (මොරගහකන්ද) | **19,056,691** | - |
| අනෙකුත් විදේශීය බැරකම් | **2,103,904** | 2,414,801 |
| | **64,520,662** | 58,621,764 |

**එස්කෝරුව ගිවිසුම (Escrow Agreement) යටතේ චීන සංවර්ධන බැංකුවට ගෙවිය යුතු ප්‍රමාණය.**

එ.ජ. ඩොලර් මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී.ල. රජය හා චීන සංවර්ධන බැංකුව (CDB) අතර පහසුකම් එකඟතාවක් සඳහා අත්සන් තබන ලදී. එම එකඟතාව අනුව ලැබෙන ණය තැන්පත් කිරීමේ හුදු අරමුණ ඇතුව එස්කෝරු නියෝජිතයා වශයෙන් කටයුතු කරන ශ්‍රී.ල. මහ බැංකුවේ එස්කෝරු ගිණුමක් විවෘතකරන ලදී. එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා හා ණය ගැනුම්කරු යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බල පවත්වනු ලබයි.

මෙම ණය පහසුකම් යටතේ එ.ජ. ඩොලර් මිලියන 326 මුදලක් ප්‍රථම වාරිකය ලෙස 2011 ජූනි 29 දින ලංකාවට ලැබුණු අතර දෙවන වාරිකය වූ එ.ජ. ඩොලර් මිලියන 174 ප්‍රමාණය 2011 ඔක්තෝබර් 28 දින ලංකාවට ලැබුණි.

වැය අනුමත විඥාපනය එස්කෝරු නියෝජිතයා වෙත එවීම මගින් ණයහිමියා විසින් එස්කෝරු ගිණුමේ ඇති මුදල් වැය ඉල්ලුම් පත්‍රයේ සඳහන් ගිණුම් වෙත වැය කිරීම සඳහා උපදෙස් ලබාදේ.

ඒ අනුව 2011 ඔක්තෝබර් 18 දින එ.ජ. ඩොලර් මිලියන 1.768 ප්‍රමාණයක් මේ යටතේ ප්‍රථමයෙන් බෙදා හරින ලදී.

චීන සංවර්ධන බැංකුවෙන් ලද වියදම් අනුමැතියට අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 වර්ෂය තුළ එ.ජ. ඩොලර් මිලියන 127.76 ක මුදලක් බෙදා හැර ඇත.

**EIB/DFCC ගෝලීය ණය II**

යුරෝපීය ආයෝජන බැංකුවෙන් යුරෝ මිලියන 50 ක ණය ගිවිසුම් ප්‍රකාරව ක්ෂුද්‍ර මූල්‍යනය සඳහා ණය ලැබී ඇත. කෙසේ වුවත් පසුව ලද කොටස ඇමරිකානු ඩොලර්වලින් ලැබී ඇත. භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙන් කරන ලද ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විශේෂ ඩොලර් ගිණුමක් පොදු ලෙජරයේ ගිණුම් අංක 4897 යටතේ ගෝලීය EIB/DFCC ගෝලීය ණය II යටතේ DFCC බැංකුවට අරමුදල් රැස් කිරීම සඳහා විවෘත කර ඇත. 2012 පෙබරවාරි 3 වන දින එ.ජ. ඩොලර් මිලියන 12.7 ක ණය මුදලක් යුරෝපීය ආයෝජන බැංකුවෙන් ලැබී ඇත. පළමු බෙදාහැරීම 2012 මාර්තු 01 වන දින එ.ජ. ඩොලර් 4,002,299.29 ලෙස ද, තව බෙදාහැරීම් දෙකක් එ.ජ. ඩොලර් 6,573,500 හා 2,142,170.71 ලෙස ද 2012 මාර්තු 3 සිදුකර ඇත. 2012 අගෝස්තු 04 දින භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි එ.ජ. ඩොලර් 12,342,500 හා එ.ජ. ඩොලර් 6,171,250 ක වටිනාකමින් යුත් බෙදාහැරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකර ඇත. ඒ අනුව ඉතිරි වූ ශේෂය එ.ජ. ඩොලර් 750,720 කි.

**මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘතිය**

මෙම ණය ගිවිසුම චීන සංවර්ධන බැංකුව (ණය දායකයා) සහ මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශය (ණය ගැනුම්කරු) අතර අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව අතරමැදි බැංකුව ලෙස කටයුතු කරයි. මෙම ණය ගැනීමේ අරමුණ වන්නේ මොරගහකන්ද ජල වාෂ්ප විදුලි බලාගාරය ඉදිකිරීම සඳහා පහසුකම් සැපයීමයි. විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව පොදු ලෙජරයේ ගිණුම් අංක 4898 - මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශය - CDB මොරගහකන්ද සංවර්ධන ව්‍යාපෘති ගිණුම විවෘත කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන ඇත. ජල සම්පාදන හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ උපදෙස්වලට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව එකඟ වී ඇති පරිදි අදාළ මුදල් බැර කිරීම සිදු කරයි. 2012 ජුනි 29 එ.ජ. ඩොලර් මිලියන 214.2 ක ණය මුදලක් CDB හා චීන සංවර්ධන බැංකුවෙන් ලැබී ඇත. 2012 අගෝස්තු 24 දින ප්‍රථම බෙදාහැරීම ලෙස එ.ජ. ඩොලර් 64,337,066.36 ක ගෙවීම් කර ඇති අතර ඉතිරි ශේෂය එ.ජ. ඩොලර් 149,862,933.64 කි.

## 19. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පත් කිරීම්

තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගිවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ සේවක අර්ථසාධක අරමුදල යන ආයතනවලට පොළී රහිත, සම්පූර්ණයෙන් ම සුරකුම් සහිත දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම් යටතේ අවශ්‍ය අරමුදල් ලබාගැනීමේ හැකියාව ඇත. එම දිනක් තුළ සපයනු ලබන ද්‍රවශීල පහසුකම යටතේ ලබාගත් අත්තිකාරම්, විකුණුම් කළ හැකි රජයේ සුරැකුම්පත්වල ඔඩපන කළ යුතුයි. මෙම පහසුකම යටතේ ලබාගත් අත්තිකාරම්, විකුණුම් කළ හැකි රජයේ සුරැකුම්පත්වලට එරෙහිව ලබාගත් අත්තිකාරම් නියෝජනය කරනු ලබන අතර දෙවර්ෂය අවසානයේ දී ශුන්‍ය වටිනාකමක් දැක්විය.

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| බැංකුව විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **84,679,924** | 75,337,875 |
| - අනිකුත් | **81,572,604** | 70,925,920 |
| | **166,252,528** | 146,263,795 |
| මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම් | | |
| - සම්බන්ධිත පාර්ශ්වයන් | **242** | 117 |
| - අනිකුත් | **35,608** | 5,273 |
| | **35,850** | 5,390 |
| බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු | **166,288,378** | 146,269,185 |

## 20. රජයේ සහ රජයේ ඒකක සමග වූ ශේෂයන්

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| රජයේ තැන්පතු | **340,506** | 342,906 |
| රජයේ නියෝජිතයන් සහ අරමුදල් | **359,122** | 1,456,124 |
| | **699,628** | 1,799,030 |

## 21. නැවත මිලදී ගැනීමේ එකගතාවය මත අලෙවි කළ සුරැකුම්පත්

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| රජයේ තැන්පතු | **7,015,000** | 14,089,000 |
| | **7,015,000** | 14,089,000 |

## 22. සේවක ප්‍රතිලාභ සැලසුම් සමග වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැංකුකරු ලෙස ක්‍රියාකරනු ලැබේ. වෙනම පරිපාලනය කරන සේවක ප්‍රතිලාභ සැලසුම්වල බැරට රඳවා ගෙන ඇති මුදල් ප්‍රමාණයන් මෙසේය.

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| සේවක අර්ථසාධක අරමුදල | **150,895** | 4,396 |
| සේවක විශ්‍රාම යෝජනා ක්‍රමය | **(397,808)** | (481,216) |
| වැන්දඹු/ වැන්දඹු හා අනත්දරු අරමුදල | **1,258,264** | 723,969 |
| විශ්‍රාම පාරිතෝෂිකය වෙනුවෙන් ගෙවිය යුතු | **24,369** | 10,007 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය වෙනුවෙන් ගෙවිය යුතු | **512,727** | 647,322 |
| **අනිකුත් තැන්පතු මුළු ප්‍රමාණය** | **1,548,447** | 904,478 |

## 23. අනෙකුත් ගෙවිය යුතු මුදල්

අනෙකුත් ගෙවිය යුතු දෑ තුල ඇතුලත් රුපියල් මිලියන 1,962.473 (2011-1,434.625) ක මුදල 2009 අංක 5 දරණ බැංකු පණත - බලපත්‍රලාභී බැංකුවල අත්හරින ලද දේපල හඳුනාගැනීම්, වාර්තා කිරීම්, මාරු කිරීම් හා පවත්වාගෙන යෑම් අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු හා මූල්‍ය ආයතන වල අත්හරින ලද දේපල එකතු කිරීම් සම්බන්ධවයි. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැම්පතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට වගකීමෙන් බැදේ. එම නිසා මුළු තැම්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

හුවමාරු පහසුකම (SWAP facility) වෙනුවෙන් වෙනත් මහ බැංකුවක් විසින් පවත්වාගෙන යනු ලබන තැන්පතුවක් අනෙකුත් ගෙවිය යුතු මුදල් හි අන්තර්ගත වන අතර එය රු. මිලියන 27,463 (2011 - රු.මි. 23,142) වේ.

## 24. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. අදාල මූල්‍ය ප්‍රකාශන දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| වර්ගය | | |
| කාසි | | |
| සත 1 | **3,631** | 3,631 |
| සත 2 | **5,702** | 5,702 |
| සත 5 | **23,245** | 23,245 |
| සත 10 | **39,209** | 39,209 |
| සත 25 | **120,732** | 121,267 |
| සත 50 | **185,378** | 185,505 |
| රුපියල් 1 | **702,536** | 660,639 |
| රුපියල් 2 | **998,102** | 920,287 |
| රුපියල් 5 | **2,981,784** | 2,776,439 |
| රුපියල් 10 | **1,275,959** | 848,538 |
| අනිකුත් සමරු කාසි | **572,256** | 568,403 |
| | **6,908,534** | 6,152,865 |
| නෝට්ටු | | |
| රුපියල් 1 | **4,981** | 4,981 |
| රුපියල් 2 | **26,698** | 26,698 |
| රුපියල් 5 | **37,198** | 37,201 |
| රුපියල් 10 | **1,735,340** | 1,821,370 |
| රුපියල් 20 | **3,350,440** | 3,012,681 |
| රුපියල් 50 | **3,779,318** | 3,688,011 |
| රුපියල් 100 | **14,978,744** | 14,317,220 |
| රුපියල් 200 | **144,531** | 165,719 |
| රුපියල් 500 | **23,317,647** | 21,390,779 |
| රුපියල් 1,000 | **101,046,102** | 105,362,876 |
| රුපියල් 2,000 | **109,370,204** | 105,717,340 |
| රුපියල් 5,000 | **53,360,405** | 31,535,620 |
| | **311,151,608** | 287,080,496 |
| සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය | **318,060,142** | 293,233,361 |

**25. විලම්භිත ප්‍රදානයන්**

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| ජනවාරි 01 වන දිනට | 3,468 | 4,605 |
| වර්ෂයතුල ක්‍රමක්ෂය | (1,079) | (1,137) |
| දෙසැම්බර් 31 දිනට | 2,389 | 3,468 |

විලම්භිත ආදායම, අදාළ වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට උචිත වන ආකාරයට අදාළ කාලච්ඡේදයට ක්‍රමක්ෂය කරන ලදී.

**26. විවිධ බැරකම් හා උපචිතයන්**

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂයන් තුළ ගෙවීමට ඇති ගිණුම්, කොන්ත්‍රාත් ධාරණයන්, නැවත ලබා දිය යුතු ටෙන්ඩර් තැන්පතු, බැංකු විදු පියස වෙනුවෙන් එකතු කරගන්නා ලද ශේෂයන්, සමරු කාසි වෙනුවෙන් කලින් ලද ආදායම් සහ රජයට ගෙවිය යුතු, විනිමය පාලන දෙපාර්තමේන්තුවෙන් රැස් කර ගන්නා ලද දඩ මුදල් අන්තර්ගතය.

**27. හිමිකරු ප්‍රාග්ධනය**

**හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය**

**ප්‍රාග්ධන අරමුදල්**

*දායක ප්‍රාග්ධනය :* මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි.

*ප්‍රාග්ධනය ලෙස විසර්ජනය කළ සංචිත :* MB/F/22/12/2008 දරණ මුදල් මණ්ඩල තීරණය පරිදි 2008 වර්ෂයේ පොදු සංචිතයෙන් රුපියල් මිලියන 24,985 ක් මාරු කිරීම මගින් මෙම සංචිතය සකසා ඇත. තවද, MB/F/5/17/2012 දරණ මුදල් නීති මණ්ඩල තීරණය පරිදි 2012 මාර්තු මස තුළ රුපියල් බිලියන 10 ක් පොදු සංචිතයෙන් මාරු කර ඇත.

**රඳවාගත් ඉපැයීම්වලට අමතරව, සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ.**

*ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (ජාප්‍රස)* - ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයක්ය. මෙම වගන්තිය ප්‍රකාර රන් සහ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

**වෙළඳපල අගය කිරීමේ සංචිතය හා අනෙකුත් සංචිත**

ජාත්‍යන්තර වෙළඳපල තුළ සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලය ලෙසද ජාත්‍යන්තර මූල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස් වීම් වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වල වෙළඳපලවල් අතර ඇති වන මිල ඇගැයීමේ ලාභ හෝ අලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල අගය කිරීමේ සංචිතය පිහිටුවන ලදී.

මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැඟීමට තීරණය කරන ලදී.

පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකාර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුල ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

**ශ්‍රී.ල. මහ බැංකුවේ විශේෂ සංචිත**

විශ්‍රාමිකයන්ගේ වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල හා පාරිතෝෂික අරමුදල ඇති මුදල් ආයෝජනයෙන් ලද ආදායම්. ශ්‍රී.ල. මහ බැංකුවේ විශේෂ සංචිත වල අන්තර්ගත වේ.

**විකිණීම සඳහා තිබෙන සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ අගය/(අලාභය)** විකිණීමට තිබෙන ලෙස නම් කර ඇති සුරැකුම්පත් ප්‍රත්‍යාගණනයෙන් 2012 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

**තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල** - තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල් ගොඩනගා ඇත. මෙම අරමුදල ශ්‍රී ලංකා රජයේ භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කරවල ආයෝජන සඳහා සීමාකර ඇත.

**විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බැංකුවේ ආදායම් ඉපැයීමේ වන උච්චාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා මෙය යොදාගැනීමට අපේක්ෂා කෙරේ.

**තාක්ෂණික අභිවර්ධන සංචිතය** - මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර මහ බැංකුවේ දැනට භාවිතා කරන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හෝ නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

**කලාපීය සංවර්ධන ණය යෝජනා ක්‍රමය** - 2010 වර්ෂය තුළ බැංකුවේ ලාභවලින් රුපියල් බිලියන 2.9 ක අරමුදලක් ගොඩනගා, එමගින් කලාපවල මධ්‍ය හා දිගුකාලීන සංවර්ධන අරමුණු සඳහා, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ආරම්භ කරන ලදී. එම ණය ප්‍රදානයන් ලංකා බැංකුව හා මහජන බැංකුව හරහා සිදුවිය.

අනිකුත් සංචිතවල චලනය පහත සඳහන් පරිදි විය.

| | මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිත | වෙළෙඳපල අගයකිරීමේ හා අනෙකුත් සංචිත | ශ්‍රී.ලං.ම.බැ නිශ්චිත සංචිත | තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල (RTGS) | ජාත්‍ය-න්තර ප්‍රත්‍යාග ණන සංචිතය (IRR) | විකිණීම සඳහා තිබෙන සුරැකුම්-පත්වල ශුද්ධ/ සාධාරණ අගය/ (අලාභය) | විශ්‍රාම අරමුදල් සංචිතය | තාක්ෂණික අභිවර්ධන සංචිතය | පළාත් සංවර්ධන ණය | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 | රු. 000 |
| 2012 ජනවාරි 01 දිනට | 11,425,000 | 16,181,033 | 731,898 | 518,847 | 42,411,491 | 4,722,711 | 3,000,000 | 1,000,000 | 2,900,000 | 82,890,980 |
| තත්කාලීන දළ පියවුම සංචිතයට මාරුකිරීම | - | - | - | 153,751 | - | - | - | - | - | 153,751 |
| වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමයට මාරු කිරීම | - | - | 87,039 | - | - | - | - | - | - | 87,039 |
| විශ්‍රාම පාරිතෝෂික අරමුදලට මාරු කිරීම | - | - | 6,045 | - | - | - | - | - | - | 6,045 |
| ලාභය පොදු සංචිතයට හා ගොඩනැගිලි සංචිතයට මාරුකිරීම | - | 10,142,076 | - | - | - | - | - | - | - | 10,142,076 |
| වෙළඳපොළ අගය කිරීමේ සංචිතයට මාරු කිරීම | - | 4,884,031 | - | - | - | - | - | - | - | 4,884,031 |
| විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ වාසිය මාරුකිරීම | - | - | - | - | 25,181,686 | - | - | - | - | 25,181,686 |
| විකිණීමට ඇති සුරැකුම්පත්වල හා රන් තොගයේ ශුද්ධ සාධාරණ අගය/(පාඩුව) | - | - | - | - | - | 1,835,087 | - | - | - | 1,835,087 |
| සංචිත ප්‍රාග්ධනිත කිරීම | - | (10,000,000) | - | - | - | - | - | - | - | (10,000,000) |
| පොදු සංචිතයෙන් විශ්‍රාම අරමුදලට මාරුකිරීම | - | - | - | - | - | - | 1,000,000 | - | - | 1,000,000 |
| 2012 දෙසැම්බර් 31 දිනට | 11,425,000 | 21,207,140 | 824,982 | 672,598 | 67,593,177 | 6,557,798 | 4,000,000 | 1,000,000 | 2,900,000 | 116,180,695 |

## 28. ශුද්ධ ලාභ මාරු කිරීම

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 39 (ඇ) වගන්තිය ප්‍රකාර, නිශ්චය කරන ලද ශුද්ධ ලාභ, මුදල් නීති පනතේ 38 වැනි වගන්තිය ප්‍රකාර අවශ්‍ය පරිදි සංචිතවලට විසර්ජනය කිරීමෙන් අනතුරුව රජයට ගෙවිය යුතුය. බැංකුව විසින් මෙම කාලය තුළ 2011 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 10 ක් සහ 2012 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 33 ක් රජයට මාරු කරන ලදී.

## 29. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| මුදල් හා මුදල් සමානයන් | 1,934,021 | 1,681,786 |
| මූල්‍ය වත්කම් | 9,566,537 | 12,733,199 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වත්කම් | 4,616 | 20,131 |
| **විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම** | 11,505,174 | 14,435,116 |
| **දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම** | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | 25,441,705 | 4,280,118 |
| අනිකුත් ණය සහ අත්තිකාරම් | 515,897 | 488,651 |
| **දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු ශුද්ධ පොළී ආදායම** | 25,957,602 | 4,768,769 |
| **මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ සම්පූර්ණ මුළු පොළී ආදායම** | 37,462,776 | 19,203,885 |

## 30. මූල්‍ය බැරකම් මත පොළී වියදම

| | 2012 | 2011 |
|---|---|---|
| | රු. 000 | රු. 000 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල | 36,919 | 22,339 |
| ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම් | 4,639,495 | 3,123,782 |
| ශුද්ධ හුවමාරු පිරිවැය (Net SWAP cost) | (1,093,795) | 620,598 |
| වෙනත් විදේශ ගෙවිය යුතු මුදල් | 120,347 | 144,112 |
| **විදේශීය මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම** | 3,702,966 | 3,910,831 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම** | | |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරැකුම්පත් | 897,233 | 1,592,397 |
| අලෙවිකරණ ලද බැඳුම්කර | - | 2,645,210 |
| ණයට ගත් බැඳුම්කර වෙනුවෙන් ගෙවූ ගාස්තු | - | 105,483 |
| ශ්‍රී ලංකා මහ බැංකු සුරැකුම්පත් | - | 42,073 |
| අත්හල දේපල | 194,307 | 156,810 |
| **දේශීය මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම** | 1,091,540 | 4,541,973 |
| **මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම** | 4,794,506 | 8,452,804 |

බැංකුව වෙනත් රටක මහ බැංකුවක් සමග එ.ජ. ඩොලර් මිලයන 200 ක මුදල් හුවමාරු පහසුකම් ගිවිසුමකට (SWAP Facility) එළඹ ඇත. ඒ සඳහා වූ රුපියල් මිලියන 824.574 (2011 රුපියල් මිලියන 727.245) ක් SWAP පිරිවැය තුළ අන්තර්ගත ඇත.

නිවාරණ ශුද්ධ පිරිවැය ලෙස රුපියල් මිලියන 1,695.884 (2011 රුපියල් මිලියන 4,372.856) අතිරික්ත ද්‍රවශීලතාවය උරාගැනීමට බැංකුව දරා ඇත. නිවාරණ පිරිවැය සමන්විත වන්නේ ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් යටතේ සුරැකුම්පත් විකිණීම, බැඳුම්කර ණය ගැනීමේ ගාස්තු හා එ.ජ. ඩොලර් /රුපියල් හුවමාරු (SWAP) පිරිවැය අන්තර්ගතව ඇති ශුද්ධ හුවමාරු අගයෙන්, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් පොළී ආදායමෙහි ඇතුළත් වන නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත් පොළී ආදායම් ඉවත් කළ පසු අගයන් වේ. එය පහත පරිදි දැක්විය හැක.

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත විකුණුම් සුරැකුම්පත් වෙනුවෙන් දරණ ලද පොළී වියදම් | **897,233** | 4,237,607 |
| බැඳුම්කර ණයට ගැනීම වෙනුවෙන් | | |
| ගෙවූ ගාස්තු | **-** | 105,483 |
| ශ්‍රී ල.ම.බැ. සුරැකුම්පත් | **-** | 42,073 |
| ඇ.එ.ජ.ඩො.(USD)/ශ්‍රී.ල.රු. (LKR) ශුද්ධ හුවමාරු පිරිවැය/(ලාභය) (SWAP Cost/(Gain) | **(1,454,050)** | 39,220 |
| අඩු කළා - | | |
| ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත් වෙනුවෙන් ලද පොළී | **(1,139,067)** | (51,527) |
| | **(1,695,884)** | 4,372,856 |

### 31. අනෙකුත් ආදායම්

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| ලාභාංශ ආදායම | | |
| අනිකුත් | **14,792** | 12,534 |
| දේපළ, පිරියත සහ උපකරණ අපහරණයෙන් ලාභය | **17,287** | 116 |
| මූල්‍ය සහ අනිකුත් ආයතනවල ආයෝජන අපහරණයෙන් උද්ගත වූ ලාභය | **3,793** | 541 |
| විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම | **929** | 1,137 |
| විවිධ ආදායම් | **939,218** | 655,071 |
| **සම්පූර්ණ අනිකුත් ආදායම්** | **976,019** | 669,399 |

### 32. සේවක මණ්ඩල වියදම්

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| සේවායෝජක විසින් ගෙවන ලද උපයනවිට ගෙවීම් බදු ඇතුළුව වේතන සහ වැටුප් | **2,860,792** | 2,274,045 |
| නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **426,622** | 334,593 |
| පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය | **344,328** | (358,609) |
| සේවක ණය නැවත ලැයිස්තුගත කිරීමේ හානිකරණ අලාභය | **4,752** | - |
| **මුළු සේවක මණ්ඩල වියදම්** | **3,636,494** | 2,250,029 |

### 33. පරිපාලන වියදම්

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| අලූත්වැඩියා සහ නඩත්තු | **575,873** | 486,052 |
| රොයිටර්, බ්ලූම්බර්ග්, වෙනුවෙන් මෙහෙයුම් වියදම් | **133,642** | 81,904 |
| ගමනාගමන වියදම් | **87,628** | 85,006 |
| බදුකුලී වියදම් | **8,015** | 2,460 |
| මුද්‍රණ වියදම් | **30,999** | 30,589 |
| විගණන ගාස්තු - | | |
| මෙම වර්ෂයට | **7,658** | 8,000 |
| පෙර වසරේ වෙන් කිරීම් යටතේ | **-** | 86 |
| මුදල් මණ්ඩලයේ සාමාජිකයිනට පාරිශ්‍රමිකය | **900** | 980 |
| ශ්‍රී ලංකා මහ බැංකු අර්ථසාධක අරමුදල් පොළී වියදම් | **147,174** | - |
| විවිධ වියදම් | **386,406** | 532,633 |
| **සම්පූර්ණ අනිකුත් මෙහෙයුම් වියදම්** | **1,378,295** | 1,227,710 |

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට එදිරිව Deutsche Bank AG විසින් පවරන ලද ඉදිරි රැකුම් (Hedging) නඩුව වෙනුවෙන් එය බේරුම්කරණය ක්‍රියාපිපාටිය සඳහා පෙනී සිටින විදේශ නීතිඥයින් සඳහා ගෙවන ලද නෛතික ගාස්තු වූ රු. මිලියන 27.674 (2011 දී රුපියල් මිලියන 324.370) විවිධ වියදම්හි අන්තර්ගත වේ.

**34. ආදායම් බදු**

දේශීය ආදායම් (සංශෝධන) 2006 අංක 10 දරණ 7b (xvi) පණත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව ආදයම් බදු ගෙවීම සඳහා වගකීමෙන් බැඳී නොමැති හෙයින් එමගින් ගෙවනු ලබන රඳවා ගත් බද්ද අවසාන බද්ද ලෙස දේශීය ආදායම් දෙපාර්තමේන්තුව සළකනු ලබයි. 2013 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව ආර්ථික සේවා බද්දෙන් නිදහස් වී ඇත.

2007 අංක 10 ආදායම් බදු (සංශෝධිත) පනතට අනුව ලාභාංශ සහ පොළී ආදායම් ගෙවීමේ හෝ බැර කිරීමේ අවස්ථාවේ දී සියයට 10 ක රඳවා ගැනීමේ බද්දකට යටත් වේ. රජයේ සුරැකුම්පත් සඳහා සාමාන්‍ය බර තබන ලද ඉපැයීම් අනුපාතය මත පොළිය සඳහා රඳවා ගැනීමේ බද්ද නියමිත කල්පිරීමේ කාල වකවානුව ඇතිව ප්‍රාථමික වෙන්දේසිය පදනම් විය.

වර්ෂය තුළ දී රුපියල් මිලියන 25,441.705 (2011 රුපියල් මිලියන 4,280.118) ක පොළී ආදායම හා ලාභාංශ ආදායම වන රුපියල් මිලියන 14.792 (2011 රුපියල් මිලියන 12.534) ක ආදායම මත රඳවා ගැනීමේ බදු ලෙස රුපියල් මිලියන 2,405.694 (2011 රුපියල් මිලියන 481.593) ක වියදමක් දරා ඇත. ඊට අමතරව 2012 වර්ෂය තුළ රුපියල් මිලියන 120 (2011 දී රුපියල් මිලියන 120) ක ආර්ථික සේවා ගාස්තුවක් ගෙවා ඇත.

**35. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම**

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්** | | |
| **වාර්තා කෙරුණු ශුද්ධ ලාභය** | **66,208,544** | 46,830,206 |
| **මුදල් නොවන විෂයයන්** | | |
| **එකතුකළා / (අඩුකළා)** | | |
| ක්ෂයවීම් හා ක්‍රමක්ෂය | **322,622** | 314,063 |
| ලැබුණු පොළිය | | |
| - දේශීය මුදල් | **(25,441,705)** | (4,280,118) |
| බොල් ණය සහ වෙනත් විවිධ කපා හැරීම් | **-** | 64,352 |
| උපලබ්ධි නොවූ දළ විදේශ | | |
| විනිමය (ලාභය) / පාඩුව | **(27,895,347)** | (13,698,790) |
| ණයකර ක්‍රමක්ෂය | **(7,273)** | - |
| අනෙකුත් වෙන් කිරීම් | **4,426,262** | 246,201 |
| විලම්භිත ප්‍රදාන | **(929)** | (1,137) |
| ප්‍රත්‍යාගණන අලාභ | **3,963** | - |
| PRGF තැන්පතු ක්‍රමක්ෂය | **35,527** | - |
| මාණ්ඩලික ණය නැවත | | |
| ලැයිස්තුගත කිරීමේ හානිකරණ | **4,752** | - |
| නොනිම් ඉදිකිරීම් ක්‍රමක්ෂය | **313** | - |
| අලෙවි කරන ලද ප්‍රධාන වත්කම් | | |
| ඉවත් කිරීම් | **(150)** | - |
| **එකතුකළා / (අඩුකළා) අනෙකුත්** | | |
| **කාරක ප්‍රාග්ධන විෂයන්ගේ චලනය** | | |
| තොගවල (වැඩිවීම) / අඩුවීම | **(457,512)** | 330,103 |
| ලැබිය යුතු පොළිය (වැඩිවීම)/අඩුවීම | **(2,623,493)** | 1,381,977 |
| විවිධ බැරකම්වල වැඩිවීම / (අඩුවීම) | **(597,744)** | 584,346 |
| ගෙවිය යුතු පොළිය | **426,811** | 6,422 |
| අනෙකුත් ලැබීම් | **(45,240)** | (115,773) |
| **එකතුකළා / (අඩුකළා) ආයෝජන සහ** | | |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| ආයෝජන වලින් ලද ආදායම | **8,614** | 4,125 |
| වෙළෙඳපොළ අගය වෙනස්වීම | **(296,049)** | (4,884,031) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින්** | | |
| **ශුද්ධ මුදල් ප්‍රවාහය** | **14,071,966** | 26,781,946 |

**36. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් නිකුතු (ආපසු ගැනීම්)**

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | | |
| මිලදී ගැනීම | **(10,868,300)** | 160,658,139 |
| ලැබුණු පොළිය - දේශීය මුදල් - | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **(23,207,197)** | (1,550,509) |
| ශ්‍රී ලංකා රජයට දෙන ලද | | |
| ණය සහ අත්තිකාරම් | | |
| වැඩිවීම / (අඩුවීම) | **16,548,830** | 16,864,190 |
| රජය සහ රජයේ ඒකක සමග | | |
| ශේෂ (වැඩිවීම) / අඩුවීම | **1,099,402** | 1,287,277 |
| | **(16,427,265)** | 177,259,097 |

**37. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුතු/(ආපසු ගැනීම්)**

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ | | |
| තැන්පතු (වැඩිවීම) / අඩුවීම | **(19,325,888)** | (41,477,740) |
| | **(19,325,588)** | (41,477,740) |

**38. පියවීම් මුදල් සහ මුදල් සමානයන්**

| | 2012<br>රු. 000 | 2011<br>රු. 000 |
|---|---|---|
| **විදේශීය මූල්‍ය වත්කම්** | | |
| **අනිකුත් විදේශීය බැංකු** | | |
| **සමග මුදල් ශේෂ** | **235,278,133** | 303,551,702 |
| **අවසාන මුදල් සහ** | | |
| **මුදල් සමානයන්** | **235,278,133** | 303,551,702 |

**39. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම**

වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත සඳහන් පරිදි ය.

| | 2012 එකතුව රු. 000 | ශ්‍රී ලංකා රජය රු. 000 | ශ්‍රී ලංකා මහජනයා රු. 000 | ශ්‍රී ලංකා වාණිජ බැංකු රු. 000 | අධි ජාතික මූල්‍ය ආයතන රු. 000 | අනිකුත් රු. 000 |
|---|---|---|---|---|---|---|
| 2012 දෙසැම්බර් 31 දිනට විදේශීය මුදල් බැරකම් | | | | | | |
| බැංකු සහ මූල්‍ය ආයතනවලට | | | | | | |
| ගෙවිය යුතු මුදල් | **2,619,847** | - | - | - | **839,009** | **1,780,838** |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **3,257,119** | - | - | **3,207,000** | - | **50,119** |
| ආසියානු නිශ්කාෂණ සංගමයට | | | | | | |
| ගෙවිය යුතු මුදල් | **28,953,955** | - | - | - | - | **28,953,955** |
| ජා.මූ.අ. සම්බන්ධ බැරකම් | **467,642,196** | - | - | - | **467,642,196** | - |
| අනිකුත් විදේශීය ගෙවිය යුතු මුදල් | **64,520,662** | **62,381,490** | - | **1,547,781** | **551,034** | **40,357** |
| | 2012 රු. 000 | 2011 රු. 000 |
|---|---|---|
| වට්ටම් අනුපාතිකය | **10.0%** | 10.0% |
| වත්කම් මත අපේක්ෂිත | | |
| ප්‍රතිලාභ අනුපාතිකය | **10.0%** | 10.0% |
| අනාගත වැටුප් වැඩිවීම් | **8.5%** | 8.5% |
| අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම | **7.5%** | 7.5% |
| ඉතිරි සාමාන්‍ය සේවා කාලය | | |
| ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් | අවුරුදු 2 | අවුරුදු 2 |
| වැන්දඹු හා අනත්දරු | අවුරුදු 4 | අවුරුදු 4 |
| වැන්දඹු පුරුෂ හා අනත්දරු | අවුරුදු 4 | අවුරුදු 5 |
| පාරිතෝෂික විශ්‍රාම වැටුප් | අවුරුදු 14 | අවුරුදු 14 |
| වෛද්‍ය ප්‍රතිලාභ | අවුරුදු 7 | අවුරුදු 8 |
| විශ්‍රාමික වයස | අවුරුදු 60 | අවුරුදු 60 |

## 42. මූල්‍ය ලියවිලි

### (අ) මූල්‍ය ලියවිලිවල සාධාරණ වටිනාකම

මූල්‍ය ලියවිලි වල සාධාරණ අගය වන්නේ අවබෝධය සහ කැමැත්ත ඇති පාර්ශවයන් අතර, සිදුවන සමීප ගනුදෙනුවක දී වත්කමක් හුවමාරු කිරීමට හෝ බැරකමක් බේරුම් කිරීමට අදාළ වන මුදල් ප්‍රමාණයන් වේ. මූල්‍ය ලියවිල්ලක් විකුණන්නාට එරෙහිව මිල චලනයක් සිදු නොවන පරිදි සැලකිය යුතු ගනුදෙනුවක්, ග්‍රහණය කරගත හැකි ලෙස සංවිධාන වූ සහ ද්‍රවශීලතාවය ඇති වෙළෙඳපොළක මූල්‍ය ලියවිල්ලක් විකිණීම කළ විට එහි ප්‍රකාශිත මිල සාධාරණ අගය වේ.

**සාධාරණ අගය නිශ්වය හා සාධාරණ අගය ධූරාවලිය**

ඇගයුම් ක්‍රමයන්ට වන මූල්‍ය මෙවලම් වල සාධාරණ අගය නිශ්වය කිරීමට සහ අනාවරණය කිරීමට බැංකුව විසින් පහත ධූරාවලිය උපයෝගී කරගනු ලැබේ.

**පළමුවන මට්ටම :** අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොසැකසූ) මිල ගණන්.

**දෙවන මට්ටම :** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි සියළුම යෙදවුම් සඳහා සෘජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කලහැකි යෙදවුම් භාවිතා කරන අනෙකුත් ක්‍රම.

**තෙවන මට්ටම :** වාර්තා කරන ලද සාධාරණ අගය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් කළ හැකි යෙදවුම්, නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ යෙදවුම් භාවිතා කරනු ලබන ක්‍රම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද මූල්‍ය උපකරණයන්හි විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

**2012 දෙසැම්බර් 31**

| | පළමුවන මට්ටම රු. 000 | දෙවන මට්ටම රු. 000 | තෙවන මට්ටම රු. 000 | එකතුව රු. 000 |
|---|---|---|---|---|
| **මූල්‍ය වත්කම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **-** | **3,989,701** | **-** | **3,989,701** |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | **169,312,604** | **-** | **-** | **169,312,604** |
| විකුණුම් සඳහා වන ආයෝජන | **386,761,690** | **-** | **-** | **386,761,690** |
| | **556,074,294** | **3,989,701** | **-** | **560,063,995** |
| **මූල්‍ය වගකීම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **-** | **3,257,119** | **-** | **3,257,119** |
| | **-** | **3,257,119** | | **3,257,119** |
| **2011 දෙසැම්බර් 31** | | | | |
| **මූල්‍ය වත්කම්** | | | | |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 2,794,334 | - | 2,794,334 |
| ලාභ හෝ අලාභ මත සාධාරණ වටිනාකමට ඇති සුරැකුම්පත් | 106,006,362 | - | - | 106,006,362 |
| විකුණුම් සඳහා වන ආයෝජන | 270,664,801 | - | - | 270,664,801 |
| | 376,671,163 | 2,794,334 | - | 379,465,497 |
| මූල්‍ය වගකීම් | - | 1,041,597 | - | 1,041,597 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | - | 1,041,597 | - | 1,041,597 |

**ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම්**

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රුපියල් මිලියන 7,015 ක් විය (2011 දී එය රුපියල් මිලියන 14,089) ශ්‍රී.ලං.ම.බැ සුරැකුම්පත් අගය රුපියල් ශුන්‍යකි. (2011 - ශුන්‍යකි.) 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්වල ධාරණ වටිනාකම රැපියල් මිලියන 26,579 (2011 දී එය රුපියල් මිලියන 19,464) කි.

**සංසරණයේ ඇති මුදල්**

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, ශේෂ පත්‍රයෙහි වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

**තැන්පතු වටිනාකම**

ඉල්ලු විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

**(ආ) සාධාරණ වටිනාකම තීරණය කිරීම හා සාධාරණ වටිනාකම් ධූරාවලිය**

පහත දැක්වෙන්නේ බැංකුවේ මූල්‍ය වත්කම් හා වගකීම් හි පන්ති ලෙස ධාරණ අගයන් හා සාධාරණ අගයන් අතර සංසන්දනාත්මක තොරතුරු වේ.

| සාධාරණ වටිනාකම් | ධාරණ වටිනාකම් | | සාධාරණ වටිනාකම් | |
|---|---|---|---|---|
| | **2012** | 2011 | **2012** | 2011 |
| | **රු. 000** | රු. 000 | **රු. 000** | රු. 000 |
| **විදේශීය මූල්‍ය වත්කම්** | | | | |
| මුදල් හා මුදල් සමානයන් | **235,278,133** | 303,551,702 | **235,278,133** | 303,551,702 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **3,989,701** | 2,794,334 | **3,989,701** | 2,794,334 |
| විදේශීය විනිමය විකුණුම් /විකිණීම සඳහා ඇති සුරැකුම්පත් | **556,074,294** | 376,671,162 | **556,074,294** | 376,671,162 |
| ජා.මූ.අ. සම්බන්ධ වත්කම් | **81,352,282** | 73,090,517 | **81,352,282** | 73,090,517 |
| වෙනත් විදේශීය ලැබිය යුතු දේ | **8243,512** | 19,361,831 | **8243,512** | 19,361,831 |
| මුළු විදේශීය මූල්‍ය වත්කම් | **884,937,922** | 775,469,546 | **884937,922** | 775,469,546 |
| දේශීය මූල්‍ය වත්කම් | | | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **175,251,772** | 183,885,564 | **175,251,772** | 183,885,564 |
| රජයට දෙනු ලැබූ අත්තිකාරම් | **111,291,843** | 94,743,013 | **111,291,843** | 94,743,013 |
| අනිකුත් ආයතනවලට දෙනු ලැබූ ණය | **1,844,237** | 2,313,533 | **1,844,237** | 2,313,533 |
| අනිකුත් දේශීය ලැබිය යුතු දේ | **2,970,099** | 2,924,028 | **2,970,099** | 2,924,028 |
| මූල්‍ය හා අනෙක් ආයතනවල ආයෝජන | **41,095** | 41,211 | **41,095** | 41,211 |
| අනිකුත් වත්කම් | **5,578,483** | 4,695,913 | **5,578,483** | 4,695,913 |
| මුළු දේශීය මූල්‍ය වත්කම් | **296,977,529** | 288,603,262 | **296,977,529** | 288,603,262 |
| මුළු මූල්‍ය වත්කම් | **1,181,915,451** | 1,064,072,808 | **1,181,915,451** | 1,064,072,808 |
| මූල්‍ය නොවන විදේශ වත්කම් රන්වලින් කරන ලද ආයෝජන | **77,688,838** | 43,819,156 | **77,688,838** | 43,819,156 |
| විදේශීය මූල්‍ය නොවන වත්කම් | **77,688,838** | 43,819,156 | **77,688,838** | 43,819,156 |
| විදේශීය මූල්‍ය වගකීම් | | | | |
| බැංකු හා මූල්‍ය ආයතනවලට ගෙවිය යුතු දේ | **2,619,847** | 937,712 | **2,619,847** | 937,712 |
| ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ | **3,257,119** | 1,041,597 | **3,257,119** | 1,041,597 |
| ජා.මූ.ආ. සම්බන්ධ වගකීම් | **467,642,196** | 328,772,419 | **467,642,196** | 328,772,419 |
| ආසියානු නිෂ්කාශන සංගමයට ගෙවිය යුතු මුදල | **28,953,955** | 90,032,085 | **28,953,955** | 90,032,085 |
| වෙනත් විදේශීය ගෙවියයුතු දේ | **64,520,662** | 58,621,764 | **64,520,662** | 58,621,764 |
| මුළු විදේශීය මූල්‍ය වගකීම් | **566,993,779** | 479,405,577 | **566,993,779** | 479,405,577 |
| දේශීය මූල්‍ය වගකීම් | | | | |
| වානිජ බැංකු හා අනිකුත් මූල්‍ය ආයතන | **166,288,378** | 146,269,185 | **166,288,378** | 146,269,185 |
| රජය හා රජයේ ඒකක සමග ශේෂයන් | **699,628** | 1,799,030 | **699,628** | 1,799,030 |
| ප්‍රතිමිලදී ගැනීම ගිවිසුම යටතේ විකුණන ලද සුරැකුම්පත් | **7,015,000** | 14,089,000 | **7,015,000** | 14,089,000 |
| සේවක ප්‍රතිලාභ සැලසුම් සමග ශේෂය | **1,548,447** | 904,478 | **1,548,447** | 904,478 |
| අනෙකුත් බැරකම් | **31,939,398** | 28,041,215 | **31,939,398** | 28,041,215 |
| මුළු දේශීය මූල්‍ය වගකීම් | **207,490,851** | 191,102,908 | **207,490,851** | 191,102,908 |
| මුළු මූල්‍ය වගකීම් | **774,484,630** | 670,508,485 | **774,484,630** | 670,508,485 |

**43. සන්සන්දනාත්මක තොරතුරු**

| | 2011 |
|---|---|
| | රු. 000 |
| පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට | |
| විදේශීය | |
| මුදල් හා මුදල් සමානයන් | 303,538,372 |
| අනෙකුත් විදේශීය | |
| ලැබිය යුතු දෑ | 19,375,161 |

| | **2012** | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| **වත්මන් ඉදිරිපත් කිරීම** | | |
| **විදේශ මුදල් මූල්‍ය වත්කම්** | | |
| මුදල් හා මුදල් සමානයන් | **2,35,278,133** | 303,551,702 |
| **අනෙකුත් විදේශීය** | | |
| ලැබිය යුතු දෑ | **8,243,512** | 19,361,831 |

**ඉදිරිපත්කිරීමේ හා වර්ගීකරණයේ වෙනස් වීමට හේතු :**

වඩා සාර්ථක ආකාරයෙන් මූල්‍ය තොරතුරු ඉදිරිපත් කිරීමක් සඳහා ඉහත සඳහන් කරන ලද වර්ගීකරණයෙන්, මූල්‍ය වාර්තා තුළ සිදු කරන ලදී.

**44. සම්බන්ධිත පාර්ශවයන්**

**44.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු**

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, සම්බන්ධිත පාර්ශවයන් සමග ගණුදෙනුවලට

පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්) විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන ද සම්බන්ධිත පාර්ශවයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශවයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී එකී ගණුදෙනු තනි වශයෙන් නොව සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ එළැඹී ගණුදෙනු සහ විධිවිධානයන් පහත සඳහන් පරිදි වේ.

| | 2012 | 2011 |
|---|---|---|
| **ගනුදෙනු වල ස්වභාවය** | | |
| **ගනුදෙනු** | රු. 000 | රු. 000 |
| ශ්‍රී ලං.ම.බැ. විසින් දරන ලද | | |
| ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (අ) | **148,672,772** | 164,421,564 |
| එක්වර විකිණූ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **260,000** | - |
| ප්‍රතිවිකිණීමේ හා මිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් | | |
| ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් | **1,550,252,513** | 7,792,273,174 |
| දෙසැම්බර් 31 දිනට මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (ආ) | **1,205,091** | 1,222,901 |
| දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලං.ම.බැ. විසින් සපයන ලද ඇපවීම් (සටහන 45.2) | **2,306,711** | 2,152,831 |
| දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු සහ බදු (ඉ) | **1,167,992** | 400,057 |
| වර්ෂය තුළ දී අතිරික්තය රජයට ගෙවීම (සටහන 28) | **33,000,000** | 22,000,000 |
| රජයට දෙන ලද අත්තිකාරම් (සටහන 8) | **111,291,843** | 94,743,013 |
| නිශ්චිත අරමුණු සඳහා රඳවාගත් රජයේ සුරැකුම්පත් | **1,201,292** | 1,232,281 |
| වර්ෂය තුළ දළ විදේශ විනිමය ගනුදෙනු (උ) | | |
| - විකුණුම් | **209,530,618** | 347,065,137 |
| - මිලට ගැනීම් | **32,975,250** | 30,734,653 |
| - ශ්‍රී ලංකා රුපියල් / ඇ.එ.ජ. ඩොලර් ගැනුම් විකිණුම් | **110,783,700** | 11,593,125 |
| ප්‍රතිමූල්‍ය පහසුකම් (එ) | **5,452,617** | 4,506,581 |
| සුසහන අදියර 1 හා 2 හා පළාත් සංවර්ධන යෝජනා ක්‍රම යටතේ දෙන ලද ණය | **1,711,019** | 2,052,734 |
| බාහිර නෛතික වියදම් (ඔ) (සටහන 33) | **-** | 324,371 |
| වර්ෂය තුළදී අත්හල දේපළ වෙනුවෙන් ලද අරමුදල් | **136,500** | - |
| ලංකා ක්ලියර් හා CRIB වලින් ලද ලාභාංශ ආදායම් | **14,267** | 11,851 |
| ලංකා ක්ලියර් පුද්ගලික සමාගමට කරන ලද ගෙවීම් | **667** | 613 |
| **ශේෂයන්** | | |
| බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් ක්‍රමයේ (RTGS) ශේෂයන් | **84,679,924** | 75,130,539 |
| ලංකා බැංකුව ලන්ඩන් නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය | **72,320** | 34,385 |
| භාණ්ඩාගාරයෙන් හා අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ | **2,403,335** | 2,399,849 |
| ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු ශේෂය (ඔ) | **480,814** | 480,814 |
| මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට කළ යුතු ගෙවීම් (සටහන 18) | **43,324,799** | 53,359,431 |
| දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතනවල ජංගම ගිණුම් ශේෂයන් | **393,691** | 1,643,525 |
| ලංකා ක්ලියර් හි ආයෝජන | **29,500** | 29,500 |
| ණය තොරතුරු කාර්යංශයෙහි ආයෝජන | **5,844** | 5,961 |
| අනෙකුත් ගණුදෙනු හා ශේෂයන් (ඕ) | **1,142,497** | 937,270 |

(අ) දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2012 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් 19 හා 20 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 29 සටහනෙහි දැක්වේ.

(ආ) මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර ශ්‍රී ලංකා මහ බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු විධිමත් කිරීම හා සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය තුළ දී රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ වැදගත් බලපෑමක් ඇති බලපත්‍රලාභී විශේෂිත බැංකු 8 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි මූල්‍ය සමාගම්වල විධිමත්භාවය සහ සුපරීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි. ඒ අනුව රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුයේ සුපරීක්ෂණය යටතට පැවරේ.

(ඇ) මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා, දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

(ඇ) මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්ගලික) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

(ඉ) බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ වැදගත් බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමග ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

(ඊ) බැංකුව භාරකරුවන් සහ අන් විශ්වාසතා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් 4 සටහනේ පැහැදිලි කර ඇති පරිදි රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

(උ) බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල ඉකුත් රාත්‍රි විවෘත විදේශ විනිමය තත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි අංශ දෙකෙහි ම නියැලෙන්නේය. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම සුපරීක්ෂණයේ ප්‍රතිඵල නියෝජනය කෙරේ.

(ඌ) රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුන අතර, ඒ සඳහා ගාස්තුවක් අය නොකෙරුණි.

(එ) සටහන් අංක 45.2 දක්වා ඇති පරිදි ණය ඇප වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව අරමුදල් සැපයූ ප්‍රතිමූල්‍යකරණ ණය ප්‍රමාණය රුපියල් මිලියන 5,452.617 (2011 රුපියල් මිලියන 4,506.581) ක් වන අතර රජය මූල්‍යකරණය කළ ප්‍රමාණය රුපියල් මිලියන 2,879.460 (2011 - රුපියල් මිලියන 2,974.412) ක් වේ.

(ඒ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයට අනුව, කෘෂිකර්මාන්තය සඳහා අවම අත්තිකාරම් සීමාව වූ 10% පවත්වාගෙන යනු නොලබන බැංකු විසින්, එම හිඟ මුදල ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක ප්‍රතිමූල්‍ය අරමුදලට ආයක කළ යුතුය. මේ යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මහජන බැංකුව (රු. මි. 367.835), ලංකා බැංකුව (රු. මි. 72.7), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (රු. මි. 265.64) හා ලංකාපුත්‍ර බැංකුව (රු. මි. 36.664) හරහා රු. මි. 742.839 ණය ප්‍රතිමූල්‍ය කර ඇත. එමගින් රු. මි. 29.728 පොළියක් උපයා ඇත.

(ඔ) ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාව වෙනුවෙන් පෙනී සිටින විදේශ නීතිඥයන් සඳහා ගරු නීතිපතිතුමන්ගේ ඉල්ලීම මත ශ්‍රී.ලං.ම.බැ. විසින් නීතිඥ ගාස්තු ගෙවනු ලැබේ. එම නීතිඥ ගාස්තු වූ රු. මිලියන 480.814 මුදල ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු මුදල් ලෙස සලකන ලදී.

තවද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට එරෙහිව Deutsche Bank AG විසින් පවරන ලද ඉදිරි රැකුම් නඩුව (Hedging Case) වෙනුවෙන් එය බේරුම්කරණ ක්‍රියාපටිපාටිය සඳහා පෙනී සිටින විදේශ නීතිඥයන් සඳහා වර්ෂය තුළ රු. මිලියන 27.674 මුදලක් නීතිඥ ගාස්තු වශයෙන් ශ්‍රී.ලං.ම.බැ. ගෙවන ලදී. (සටහන් 33)

(ඕ) රජය හා රජයේ දෙපාර්තමේන්තු, රජය මගින් පාලනය කෙරෙන ආයතන සමග සිදුකළ තනිව ගත්මිල සැලකිය යුතු මට්ටමේ නොවන ගනුදෙනු හා ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් තුළ අන්තර් ගත වේ. ශ්‍රී.ලං.ම.බැ. විසින් සපයන ලද ඇපවීම රු.මි. 178,548 (2011-රු.මි. 120,607) ද විනිමය පාලන කටයුතු සඳහා රැස් කළ අරමුදල් ලෙස රු. මි.14,172 (2011 - රු. මි. 25,031) ද නිශ්චිත අරමුණු සඳහා රඳවාගත් රජයේ සුරැකුම්පත් රු.මි. 76,235 (2011 රු.මි. 69.535) ද ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමණාකරණ ආයතනයේ තත්කාලීන දළ පියවුම් පද්ධති ශේෂය වන රු. මි. 0.242 (2011 - රු. මි. 0.177) ද සුසහන ණය යෝජනා ක්‍රමය 01 හා 02 පළාත් සංවර්ධන යෝජනා ක්‍රමය යටතේ ලබාදුන් ණය රු.මි. 77.468 (2011 - රු.මි. 120.481) ද 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ හා සේවා සඳහා ගෙවූ ගාස්තු හා බදු රු.මි. 249.309 (2011 රු.මි. 334.437) ද රජයේ හා රජයේ ආයතන වල ජංගම ගිණුම් ශේෂ ලෙස රු.මි. 305.937 (2011 රු.මි. 155.505) ද අත්හළ දේපළ වෙනුවෙන් ලද අරමුදල් රු.මි. 55.805 (2011 රු.මි. 74.0762) හා බාහිර නඩු ගාස්තු වශයෙන් රු.මි. 27.674 ක මුදලක් ද අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් තුළ ඇතුළත් වේ.

බැංකු විසින් 2011 වර්ෂය තුළදී ඇමරිකානු එක්සත් ජනපදයේ නිව්යෝර්ක් නුවර පිහිටි දේපලක් අත්පත් කර ගන්නා ලදී. එය 2012 ජුනි 01 දින සිට ආරම්භ වන තුන් අවුරුදු කාලපරිජේදයක් සඳහා මසකට ඇ.එ.ජ.ඩො 68,000 ක මුදලකට විදේශ කටයුතු අමාත්‍යාශයට බදු පදනම් මත ලබාදෙනු ලැබූ අතර ඒ වෙනුවෙන් ලැබූ පස් මාසික බදු කුලිය වන රුපියල් මිලියන 43,235 ක මුදල අයවිය යුතු උපචිත බදු කුලී ලෙස විවිධ වත්කම් හි ඇතුළත් කොට ඇත. විවිධ වත්කම් හි ඇතුළත් රුපියල් මිලියන 88 ක මුදල, නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු මුදල් ලෙස සටහන් කොට ඇත. මෙය කොළඹ 01, ට්‍රාන්ස්වර්ක් චතුරශ්‍රයේ පිහිටි බදු දේපළක් වන ශ්‍රී ලංකා මහ බැංකුව රථගාල පිහිටි භූමිය සඳහා අදාළ බදු මුදල නියෝජනය කරයි. ඉහත බදු දේපළ වෙනුවෙන් ගෙවූ මූලික මුදලේ කොටසක් වන මෙය, බදු දීමනාකරු වන නාගරික සංවර්ධන අධිකාරිය විසින් බදු කාලය නිම වීමට ප්‍රථමයෙන් නැවත ලබාගැනීම හේතුවෙන් ඔවුන්ගෙන් ලැබිය යුතු අයිතමයක් ලෙස සටහන් කොට ඇත.

දෙපාර්ශවයේම ප්‍රයෝජනය උදෙසා වනජීවී කාර්යාලයක්, පිරික්සුම් බංගලාවක් සෝමාවතිය ප්‍රදේශය තුළ ඉදිකිරීම, ස්ථාපනය කිරීම හා නඩත්තු කිරීම සම්බන්ධයෙන් වූ අවබෝධතා ගිවිසුමකට 2008 නොවැම්බර් 20 වන දින ශ්‍රී ලංකා මහ බැංකු මූල්‍ය මණ්ඩලය හා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව ප්‍රවිෂ්ඨ වන ලදී. ශ්‍රී.ලං.ම.බැ. විසින් ප්‍රයෝජනයට ගනු ලබන පිරික්සුම් බංගලාව දේපළ, පිරියත හා උපකරණ යටතේ වාර්තා කොට අවබෝධතා ගිවිසුම් කාලපරිජේදය (වසර 30 ක්) තුළ ක්ෂය කරනු ලැබේ. මීට අමතරව, අවබෝධතා ගිවිසුම් 3 (C) වගන්තිය යටතේ, ඉදිකරනු ලබන වනජීවී කාර්යාලය ඉදිකිරීම් වලින් අනතුරුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බාරදීම සඳහා බැංකුව එකඟ වී ඇත. වනජීවී කාර්යාලය ඉදිකිරීම් සඳහා ශ්‍රී.ලං.ම.බැ විසින් දරනු ලැබූ පිරිවැය වූ රු.මි. 6.2 ක මුදල පිරික්සුම් බංගලාව භාවිත කිරීමට ඇති හිමිකමෙහි වටිනාකම ලෙස සලකා විවිධ වත්කම් හි සටහන් කර ඇති අතර එය අවබෝධතා ගිවිසුම් කාලපරිච්ඡේදය තුළ ක්‍රමක්‍ෂය කරනු ඇත.

**44.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමග ගනුදෙනු**

අධිපති, නියෝජ්‍ය අධිපතිවරුන්, සහකාර අධිපතිවරුන් හා කළමනාකරණ විගණන අංශයේ අධ්‍යක්ෂක ඇතුළත්ව මුදල් මණ්ඩලයේ සාමාජිකවරුන් ප්‍රධාන කළමනාකරණ මණ්ඩලයට ඇතුළත් වේ (මෙම තනතුරු සඳහා අධ්‍යක්ෂ නිලධාරීන්, සේවක හෝ කිසිදු බැංකු ආයතනයක් කොටස් හිමියා ලෙස හැඳින්වීම මුදල් නීති පනතේ සීමා කර තිබේ).

**ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ගෙවීම් :**

| | **2012** | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| කෙටිකාලීන සේවක ප්‍රතිලාභ | **58,189** | 44,012 |

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්ය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම් යටතේ මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

**44.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමග වූ වෙනත් ගණුදෙනු**

| | **2012** | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලයේ සාමාජිකයන්ට දුන් ණය | **45,458** | 29,835 |

ණය වර්ගය සියයට 2 සිට සියයට 19 දක්වා ණය පොළී පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

**44.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමග ගනුදෙනු**

| | **2012** | 2011 |
|---|---|---|
| | **රු. 000** | රු. 000 |
| ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය | **33,805** | 23,288 |

සටහන් 41 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම්වලට විවිධ මුදල් ප්‍රමාණයන් දායක විය. මෙම 2011 වර්ෂයේ දී පොළී සහනාධාර ලෙස සේවක අර්ථසාධක අරමුදලට දායකත්වයක් නොවූ අතර අතිරික්ත ප්‍රතිලාභයක් වාර්තා කරන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් වලට බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 22 සටහනෙහි දක්වා ඇත.

**45. අසම්භාව්‍ය වගකීම් සහ ප්‍රාග්ධන බැඳීම්**

**45.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්**

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2012 දෙසැම්බර් 31 දිනට පරිශේෂ එවැනි ඇප කිසිවක් නොවීය.

**45.2 ණය ඇප**

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්ය වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගි වන ණය දෙන ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ව්‍යවසායකයින් සඳහා ණය ඇපවීම් නිකුත්කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා ණය ඇපකරු අරමුදල් පරිපාලනය, පශ්චාත් ණය සුපරීක්ෂණය ඇතුළත් වේ. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට එරෙහිව විය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සැපයීම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය, ණය පැහැර හැරීම මත ආවරණයන් නොවූ පාඩු සඳහා සහභාගි වන ණය දෙන ආයතනවලට ඇතිවන්නා වූ අලාභ සඳහා කරනු ලබන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

**දේශීය වාණිජ බැංකු - ණය ඇප සඳහා :**

| ණය ඇප | නොපියවා පැවැති ඇප ප්‍රමාණය | |
|---|---|---|
| | **2012 රු. 000** | 2011 රු. 000 |
| **සම්බන්ධිත පාර්ශ්වයන්** | | |
| ශ්‍රී.ලං.ම.බැ. යෝජනාක්‍රම | **318,421** | 490,556 |
| ශ්‍රී.ලං. රජයේ යෝජනා ක්‍රම | **2,166,839** | 1,782,882 |
| **අනිකුත්** | | |
| ශ්‍රී.ලං.ම.බැ. යෝජනාක්‍රම | **584,615** | 410,629 |
| ශ්‍රී.ලං. රජයේ යෝජනා ක්‍රම | **2,997,200** | 576,177 |
| මුළු ණය ඇප ප්‍රමාණය | **6,067,073** | 3,260,244 |

**45.3 විශ්වස්ත ක්‍රියාකාරකම්**

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා වත්කම් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

**45.4 නෛතික හිමිකම්**

අදාළ ආයතනවල අයිතීන් දරන්නන් විසින් නෛතික පොළීය ද සමග රුපියල් මිලියන 36 ක් සඳහා හිමිකම්පාමින් නීති කෘත්‍යයන් 2 ක් බැංකුව විත්තිකරු ලෙස ගොනු කර ඇත. මෙම නීති කෘත්‍යයන්ට එරෙහිව බැංකුව අභියෝග කරන බැවින් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොමැත. එසේම නෛතික පොළියද සමග රු. මි. 14.495 සඳහා හිමිකම් පාමින් නීති කෘත්‍යයන් 4ක් වෙනුවෙන් බැංකුව පැමිණිලිකරු ලෙස ඉදිරිපත් වී ඇත. තවද බැංකුවට එරෙහිව නීති කෘත්‍යයන් ගණනාවක් 2012 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණි. මේ සම්බන්ධයෙන් සැළකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

**45.5 බැඳීම්**

(අ) 2012 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් රුපියල් මිලියන 710.887 (2011 රුපියල් මිලියන 128.907 ක් හා යූරෝ මි. 0.195) ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට කැපීපෙනෙන ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

| | 2012 | 2011 |
|---|---|---|
| | **000** | 000 |
| **ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු** | | |
| ඉදිරි විනිමය විකුණුම් - ඕස්ට්‍රේලියානු ඩොලරය | - | 265,000 |
| එක්සත් රාජධානි පවුම | **35,000** | 170,000 |
| ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය | **1,368,000** | 213,000 |
| ඉදිරි විනිමය මිලදී ගැනීම් - ඕස්ට්‍රේලියානු ඩොලරය | - | 567,800 |
| එක්සත් රාජධානි පවුම | - | 766,500 |
| ඇමෙරිකා එක්සත් ජනපද ඩොලරය | - | 25,000 |
| ශ්‍රී ලංකා රුපියල | **25,432,160** | 23,142,000 |

**45.6 වත්කම් ඔඩපන කිරීම**

සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලිය පහසුකරලීම සඳහා එක්සත් රාජධානි පවුම් මිලියන 25 ක් (ධාරණ අගය එක්සත් රාජධානි පවුම් මිලියන 25.434 ක්) (2011 දී ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 55 ක් ධාරණ අගය ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 55.176) හා බැංකුව විසින් යුරෝ ක්ලියර් බැංකුවේ ඔඩපන කර ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 35 (2011 ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 35) ණය පහසුකම් ලබා ගෙන ඇත. එම ඔඩපන කරන ලද සුරැකුම්පත් යුරෝ ක්ලියර් හි වෙනම ගිණුමක රඳවා ඇත.

එම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශනය තුළ 'විකිණීම සඳහා වූ මූල්‍ය වත්කම්' ලෙස ඉදිරිපත් කර තිබේ. "Collateral Agreement Governing Secured Borrowings by participants in the Euroclear System" හා "General Conditions Governing Extensions of credit to participants in the Euroclear System" යන මාර්ග නිර්දේශයන් මත පදනම් වී එකී ගණුදෙනු බැංකුව විසින් හසුරවනු ලැබේ.

**45.7 සවරින් රෙසිඩන්සි සඳහා වූ අසම්භාව්‍ය වගකීම**

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය හා එස්.ඩබ්.ආර්.ඩී. බණ්ඩාරනායක ජාතික අනුස්මරණ පදනම විසින් සවරින් රෙසිඩන්සි පාලනය කිරීම සඳහා වූ බදු කුලී ගිවිසුමකට එළඹ තිබුණු අතර එහි දී බදු ගැනුම්කරු විසින් කරනු ලබන ආයෝජන/වැඩිදියුණුකිරීම් දෙපාර්ශවයම විසින් සටහන් කළ යුතු බවට එකඟ වී ඇත. ඒ ගිවිසුම අනුව යම් හෙයකින් ශ්‍රී ලංකා මහ බැංකුව එම බදු ගිවිසුමෙන් ඉවත් වුවහොත් එම ආයෝජනය සඳහා එම පවත්නා වර්ෂයේ එකඟ වූ අනුපාතිකයන්ට වූ ගෙවීමක් බදු ගැනුම්කරුට ගෙවිය යුතුය. ඒ අනුව 2012 වර්ෂයේ දී සිව්වන මෙහෙයුම් වර්ෂය සඳහා සියයට 35ක් වූ රුපියල් මිලියන 15.352 (2011 - රුපියල් මිලියන 17.546) අසම්භාව්‍ය වගකීමක් ඇස්තමේන්තු කර ඇත.

**46. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්**

බැංකුව සාමාන්‍යයෙන් භාරකරුවන් ලෙස සහ අන් විශ්වසනීය තත්ත්වයන්හි කටයුතු කිරීම මඟින්, රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

(අ) ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ර) වෙනුවෙන් විවිධ විදේශීය ණය, විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වැය පියවීම් සහ ආපසු ගෙවීම් බැංකුව විසින් කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිරූපක අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

(ආ) බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල්, අධිභාර, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පැවැත්වීම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

(ඇ) ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍ර ලත් බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිතිවලට විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්‍ෂණය යෝජනා ක්‍රමයක් වන තැන්පතු රක්‍ෂණ යෝජනා ක්‍රමය බැංකුව විසින් පරිපාලනය කරනු ලැබේ. 2010 ඔක්තෝබර් 01 දා සිට එම අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දාතම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට පවරා ඇත.

(ඈ) ලියාපදිංචි මූල්‍ය සමාගම් විධිමත් කිරීම හා සුපරීක්ෂණ කිරීම බැංකුව විසින් කරගෙන යනු ලබයි. එහිදී මුදල් මණ්ඩලය විසින් නියෝජනය කරන ලද බලතල ප්‍රකාර, අදාල විෂය කරුණුවලට සම්බන්ධව සොයා බලනු ලැබේ. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

(ඉ) 2010 සැප්තැම්බර් 28 දාතම වූ 1673/11 අංක දරණ ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය නමින් පාලිත තැන්පතු රක්ෂණ ක්‍රමයක් පිහිටුවා ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ගැසට් පත්‍රයේ 5.2 වගන්තිය අනුව විශේෂිත අතහැරීම් සේ රක්ෂණය කර ඇති සියලුම ණය හැර සමාප්ත ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් රක්ෂණය කෙරේ.

රුපියල් මිලියන 331.653 ක් වූ ස්වේච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රුපියල් මිලියන 282.337 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල නිමවා ඇත. තැන්පතු වටිනාකම රුපියල් මිලියන 0.2 ඉක්මවුවත්, තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල රුපියල් මිලියන 0.2 හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම ශ්‍රී ලංකා මහ බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර, පවතින අරමුදල් ප්‍රමාණයට වන්දි මුදල සීමාවේ. නැතහොත් අවසරලත් ණය ගැනීම් හා ලැබුණු දායක මුදල්වලින් තැන්පතු රක්ෂණ අරමුදල ඉහළ දැමිය හැකිය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා ශ්‍රී ලංකා මහ බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ පිහිටුවා ඇති ඒකකය මගින් සිදුකරන අතර, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවලින් වෙන්වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

(ඊ) බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද චක්‍රලේඛනය අනුව, කෘෂිකාර්මික කටයුතු සඳහා මුළු අත්තිකාරම්වලින් 10% ක අවමය පවත්වාගෙන නොමැති බැංකු එම හිඟ මුදල ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (ප්‍රා.සං.දෙ.) විසින් පවත්වාගෙන යනු ලබන ප්‍රතිමූල්‍ය අරමුදලට දායක කළ යුතු වේ. ප්‍රා.සං.දෙ. එසේ එකතු කළ මුදල් ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව, ලංකා බැංකුව, මහජන බැංකුව තුළින් කෘෂිකාර්මික කටයුතු සඳහා "විස්කම්" ප්‍රතිමූල්‍ය ක්‍රමය යටතේ ප්‍රතිමූල්‍ය පහසුකම් සපයනු ලැබේ. 2012 දෙසැම්බර් 31 දිනට එසේ රැස්කළ මුළු මුදල රුපියල් මිලියන 641.433 (2011 - 1,111.574) කි. වර්ෂය අවසන් දින ප්‍රාදේශීය සංවර්ධන දෙපා. විසින් රු. මි. 742.839 මුදලක ණය ලබා දී ඇති අතර එමගින් රු. මි. 29,728 පොළී ආදායමක් උපයන ලදී. වර්ෂය අවසන් දිනට ප්‍රා.සං.දෙ. ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය යටතේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, රුපියල් මිලියන 4.117 (2011 - 879.5) ක රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇත. තවද රුපියල් මිලියන 188.067 (2011 රු.මි. 12.966) ක් එම ආයෝජනවල ආදායම ලෙස උපයා ඇත.

(උ) ඇ. ඩො. මිලියන 500 ණය පහසුකමක් ලබා ගැනීම සඳහා 2011 මාර්තු 31 දින ශ්‍රී. ල. රජය හා චීන සංවර්ධන බැංකුව අතර පහසුකම් එකඟතාවක් සඳහා අත්සන් තබන ලදී. එම එකඟතාව අනුව ලැබෙන ණය මුදල තැන්පත් කිරීමේ හුදු පරමාර්ථය ඇතුව එස්කොරු නියෝජිතයා වශයෙන් කටයුතු කරන ශ්‍රී. ලංකා. මහ බැංකුවේ, එස්කෝරු ගිණුමක් විවෘත කරන ලදී. එකී ගිවිසුම ප්‍රකාරව ණයහිමියා හා ණය ගැණුම්කරු යන දෙපාර්ශවයම එම එස්කෝරු ගිණුම හවුලේ බලපවත්වනු ලැබේ. (සටහන 18)

(ඌ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, විදේශීය දායකයන්ගේ හා ශ්‍රී ලංකා රජය අරමුදල් සපයන ව්‍යාපෘති සඳහා ශ්‍රී ලංකා රජයේ විශේෂිත නියෝජිතයෙකු ලෙස කටයුතු කරයි තවද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් අරමුදල් සපයන ව්‍යාපෘති ද ක්‍රියාවට නැංවීම ඉටු කරයි.

## නිමකර අවසන් ව්‍යාපෘති

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| තේ සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 24.50 | කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති ස්වභාවික පරිසරය සංවර්ධනය | 2,550.90 | | | | |
| බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය | 1,453.11 | | | | |
| වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 40.00 | ශ්‍රී ලංකාවේ තේ භෝග කර්මාන්තයේ තේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම | 5,200 | | | | |
| සුසහන මූල්‍ය හා කල්බදු සමාගම | රුපියල් | 352.69 | සුනාමියෙන් බලපෑමට ලක්වූ ව්‍යාපාරිකයන් නැවත නගා සිටුවීම | 351.06 | | | | |
| කුඩා ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන | රුපියල් | 2,656.00 | සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් නැවත නගා සිටුවීම | 2,663.40 | | | | |
| කුඩා ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන නගා සිටුවීමේ චක්‍රිය අරමුදල | රුපියල් | 150.00 | සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් නැවත ආරම්භ කිරීම | 122.72 | | | | |
| හැකියා සංවර්ධන ව්‍යාපෘතිය | රුපියල් | 94.31 | ගුණත්වයෙන් අනුන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය තත්වය වැඩිදියුණු කිරීම හා හැකියා නොගැලපීම ආමන්ත්‍රණය කිරීම | 94.59 | | | | |
| නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ.ඩොලර් | 4.00 | නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම | 369.15 | | | | |
| නිවාස ණය ඇපකර අඩු ආදායම් නිවාස ආවරණ ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 25.00 | රටේ අඩු ආදායම්ලාභී ජනතාවට ආධාර කිරීමට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන ව්‍යාප්ත කිරීම. | 1,3.62.00 | | | | |
| නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය | වි.ගැ.හි | 15.10 | අඩු ආදායම් කුටුම්භ වල නිවාස සංවර්ධනයට ආධාර කිරීමක් වශයෙන් ප්‍රාග්ධනය සපයා දීම | 1,915.76 | | | | |
| වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 1.80 | ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශවල මිනිසුන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ ශුභ සාධනය වැඩි දියුණු කිරීම. | 102.76 | | | | |
| මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 2.00 | කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් වර්ධනය ස්ථිරකිරීම හා චිරස්ථායි කිරීම | 249.06 | | | | |

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 11.56 | රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදනය නගා සිටුවීමට ණය පහසුකම් සැලසීම | 642.00 | | | | |
| කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය. | වි. ගැ. හි. | 17.05 | සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පවතින මිනිස් ජීවිත හා දේපළ නැවත නගා සිටුවීම | 843.00 | | | | |
| කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති | ඇ. ඩොලර් | 12.60 | කුඩා තේ වතු හිමියන් සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම | 645.93 | | | | |
| දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය | ජපන් යෙන් | 1,368.00 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම | 1,402.45 | | | | |
| ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය | ඇ. ඩොලර් | 17.40 | අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් පිරිවැය ඵලදායී සහ ශක්තිමත් ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම | 345.69 | | | | |
| කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 1.50 | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම | 148.00 | නියමිත දිනට සහභාගිත්ව මූල්‍ය ආයතනවලින් ප්‍රතිමූල්‍ය එක්රැස් කිරීම සහ අවසානයේදී නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් වෙත මාරු කිරීම | | | |
| දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය | වි. ගැ. හි. | 27.90 | දකුණු පළාත් මිනිසුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 564.00 | | | | |
| EIB ගිවිසුම් B | යූරෝ | 10.00 | සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායනයන් නැවත නගා සිටුවීම | 1,553.27 | | | | |
| සුසහන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 3,000.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රතිසංස්කරණය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 2,750.00 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය දෙපාර්තමේන්තුවට මාරු කල යුතුය | | | |
| සුසහන II | රුපියල් | 500.00 | සුනාමියෙන් හානි වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ණය පහසුකම් ප්‍රතිපාදනය | 105.54 | | | | |
| පිබිදෙන උතුර | රුපියල් | 2.000.00 | උතුරු පළාත් තුළ කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සහ අංශ සඳහා ණය පහසුකම් දීර්ග කිරීම | 2.000.00 | සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අදාල ගිණුම්වලට මාරු කිරීම | | | |

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම මිලියන | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු පුනරාරම්භය | රුපියල් | 1,000.00 | නැගෙනහිර පළාත තුළ වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් ප්‍රධානය කිරීම | 1,000 | | | | |
| දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘති චක්‍රීය අරමුදල | රුපියල් | 1,200.00 | රට තුළ බහුවාර්ෂික භෝග අංශයට ණය පහසුකම් සපයා දීම | 1,198.26 | | | | |
| තේ සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 1,100.00 | තේ අංශය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයා දීම | 856.99 | | | | |
| මාතලේ ප්‍රාදේශිය ආර්ථික වැඩිදියුණු කිරීමේ චක්‍රීය අරමුදල | රුපියල් | 77.00 | ග්‍රාමීය ගොවි පවුල් වල ආදායම වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා මාතලේ දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය | 77.00 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 100.00 | සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩිදියුණු කිරීම | 100.00 | | | | |
| ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය | රුපියල් | 9.00 | පසු සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු වලදී ඉදිකිරීමේ හා රජයේ කටයුතු සඳහා සක්‍රියව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාර වල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම. | 1,399.73 | | | | |
| කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධන කිරීමේ ව්‍යාපෘතිය | වි.ගැ.හි | 1.75 | නුවරඑළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්ක වල අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම | 82.74 | | වගකීම් හා සහතිකවීම් නැත | මූල්‍ය ප්‍රකාශන භාහිර විගණකයින් විගණනය කළයුතුය | අදාල සියලුම පාර්ශවයන්ගේ එකගතාව ගිවිසුමේ අයිතිවාසිකම්, බැළීම්, පැවරීම්, සංශෝධනය, අහෝසි කිරීම හෝ අතපාර දැමීම සිදුකරනු නොලැබේ |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධනී) | ජපන් යෙන් | 2,575.00 | ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රු. 15,000 ට වඩා අඩු පවුල් වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම | 2,678.54 | | | | |
| සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය (අදියර II) | රුපියල් | 70.00 | සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම | 70.00 | | | | |
| ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය | රුපියල් | 115.90 | රට තුළ පිළිගත් වෘත්තිය පුහුණු ආයතන වලින් සමත් පුහුණු තරුණ, තරුණියන්ට ඔවුන්ගේ ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම | 112.04 | | | | |
| පසු සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය | | 2.09 | සුනාමියේ බලපෑමට ලක්වූ ජනතාවගේ වත්කම් නැවත ලබාගැනීම, ඔවුන්ගේ දෛනික ආර්ථික කටයුතු සඳහා වූ පදනම දැමීම හා ආදායම් උත්පාදන මාර්ග විවිධාංගිකරණය කිරීම සඳහා සහාය වීම | 109.96 | | | | |

| ව්‍යාපෘතියේ නම | මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන) | | ණය මුදලේ අරමුණ | සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන) | වැදගත් ලක්ෂණ | වගකීම් හා සහතික වීම් | පොදු කොන්දේසි | විශේෂ කොන්දේසි |
|---|---|---|---|---|---|---|---|---|
| විස්කම් (කෘෂිකර්මික අංශය සංවර්ධනය සඳහා වූ විශේෂ ණය යෝජනා ක්‍රමය) | රුපියල් | 1,325.60 | ආයෝජන සඳහා ණය පැවැතීම තහවුරු කර ගැනීම, විවිධාංගිකරණය සහ වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම (වාණිජ කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් සංවර්ධනය) | 880.00 | සහභාගීත්ව බැංකු විසින් අනිවාර්යය අවශ්‍යතා සම්පූර්ණ කල පසු අරමුදල් නැවත ලබාදීම | | | |
| පළාත්බද සංවර්ධන ණය යෝජනා ක්‍රමය | රුපියල් | 2,900.00 | රට තුල කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක අංශයේ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැලසීම | 2,645.71 | සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නැවත අයකරගත් අරමුදල් නියමිත දිනට මූල්‍ය දෙපාර්තමේන්තුවට මාරු කල යුතුය. | | | |
| සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල | රුපියල් | 207.29 | සුළු ගොවියන් කෘෂිභාණ්ඩ සැපයීම වේගවත් කිරීමට අනුබල දිම හා කුඩා පරිමාණ ග්‍රාමීය කෘෂි නොවන ව්‍යාපාර ඇති කිරීම | 776.17 | නියමිත දිනට සහභාගීත්ව මූල්‍ය ආයතන වලින් අරමුදල් එක්රැස් කිරීම හා අවසානයේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත මාරු කිරීම. | | | |
| වියළි කලාපීය ජීවන වියන සහයෝගීතා හා හවුල්කාර වැඩසටහන | රුපියල් | 252.95 | අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල යන දිස්ත්‍රික්ක වල ආදායම් ජනිත කිරීමේ කටයුතු සඳහා පහසුකම් සැලසීම | 252.92 | | | | |
| දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය චක්‍රීය අරමුදල | රුපියල් | 325.00 | අඩු ආදායම්ලාභී පවුල් වල ආර්ථික අවශ්‍යතා ශක්තිමත් කිරීම | 1,794.33 | | | | |
| සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය | රුපියල් | 4,720.00 | කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර හා ව්‍යසනයන්ගෙන් හානි වූ කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 4,482.56 | | | | |
| පිබිදෙන උතුර - අදියර II | රුපියල් | 2,154.25 | උතුරු පළාත් තුල කෘෂිකර්මික, පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර යන අංශ සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 668.36 | | | | |
| නැගෙනහිර පළාත් තුල ආර්ථික කටයුතු ප්‍රතිශ්ඨාපනය කිරීම අදියර - II | රුපියල් | 1,078.27 | නැගෙනහිර පළාත තුල කෘෂිකාර්මික හා පශු සම්පත් ක්ෂුද්‍ර ව්‍යාපාර හා කුඩා ව්‍යාපාර සඳහා ණය පහසුකම් දීර්ඝ කිරීම. | 528.12 | | | | |
| උතුර හා නැගෙනහිර පළාත් තුල හානි වූ නිවාස පිළිසකර කිරීම | රුපියල් | 100.00 | උතුරු හා නැගෙනහිර පළාත් තුල යුද්ධයෙන් හානි වූ නිවාස පිළිසකර කිරීම සඳහා ණය පහසුකම් සැලසීම | 84.10 | | | | |
| ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන | ඇ.ඩොලර් | 32.90 | වෙළෙඳපොල තුල / වටිනාකම්දාම සංවර්ධනය තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදයම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වුවන් විශේෂයෙන් යෞවනයන්ට සපයාදීම හා ආදායම් ඉහල නැංවීම සඳහා අවශ්‍ය මූල්‍ය යෙදවීම් හා සේවා නියුක්ති පුහුණු පහසුකම් විශේෂයෙන් යෞවන පරපුරේ සිටින ඉඩම් අහිමි වුවන් සඳහා ලබාදීම. | - | | | | |

## 2. බැංකු අධීක්ෂණ

ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු අඛණ්ඩව අධීක්ෂණය කිරීම සහ කාලීනව පරීක්ෂා කිරීම යන අරමුණු මුල් කර ගෙන මුදල් නීති පනතේ 28 වැනි වගන්තියට අනුව බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කර ඇත. මීට අමතරව, බැංකු ශාඛා විවෘත කිරීම, ප්‍රතිස්ථානය කිරීම, පාලිත සමාගම් පිහිටුවීම, වාණිජ බැංකුවක කොටස් ප්‍රාග්ධනයෙන් සැළකිය යුතු ප්‍රතිශතයක් අත්පත්කර ගැනීම, බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය සංශෝධනය කිරීම, නාමක කොටසක් වශයෙන් වෙනත් ආයතනයක් "බැංකුව" යන වචනය භාවිතා කිරීම, අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරීන්ගේ, ලේකම්වරුන්ගේ සහ අනෙකුත් විධායක නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය අනුමත කිරීම වැනි කටයුතු සඳහා බැංකු පනතේ විධිවිධානයන්ට අනුව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් මුදල් මණ්ඩලයේ සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය කෙරේ. බැංකු පද්ධතියේ ශක්තිමත්භාවය තහවුරු කිරීම සඳහා බැංකුවල ව්‍යාපාරික කටයුතු සිදු කළ යුතු ආකාරය දක්වන විචක්ෂණ විධානයන් නිකුත් කිරීමේ බලය ද මුදල් මණ්ඩලය සතුව පවතී. තවද, මුදල් මණ්ඩලය විසින් කාලීන අවශ්‍යතා පදනම් කර ගෙන පනවනු ලබන අනෙකුත් විචක්ෂණ නියාමනයන්ට ද සියලු බැංකු අනුකූල විය යුතුය.

2012 වසර අවසන් වන විට, ශ්‍රී ලංකාවේ බැංකු අංශය, බලපත්‍රලාභී වාණිජ බැංකු 24 කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 09 කින් සමන්විත විය. මෙම බැංකුවල නම්, ඇමුණුම II-1 හි සපයා ඇත. 2012 වසර තුළදී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ ප්‍රධාන ක්‍රියාකාරකම් පහත දැක්වේ.

### 2.1 විචක්ෂණ නියාමනයන් නිකුත් කිරීම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද විචක්ෂණ නියාමනයන් මෙම වාර්තාවේ III වැනි කොටසෙහි දක්වා ඇති අතර, ප්‍රධාන විචක්ෂණ නියාමනයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.

(අ) **බලපත්‍රලාභී බැංකුවල ණය වර්ධනය සීමා කිරීම:** අපේක්ෂිත මට්ටමට වඩා බලපත්‍රලාභී බැංකුවල ණය දීමෙහි පැවති අධික වර්ධනය සීමා කිරීමේ අරමුණින්, 2012 මාර්තු මාසයේදී, 2012 වසරේ රුපියල් ණය දීමෙහි වර්ධනය, 2011 වසර අවසානය වන විට ලබා දී තිබූ ණය ශේෂයෙන් සියයට 18 ක් හෝ රුපියල් මිලියන 800 යන දෙකෙන් වැඩි අගයට සීමා කරන ලදී. එසේ වුවද, විදේශීය අරමුදල් යොදා ගනිමින් ණය දෙනු ලබන්නේ නම්, සියයට 23 ක් හෝ රුපියල් මිලියන 1,000 යන දෙකෙන් වැඩි අගය දක්වා වූ ඉහළ ණය සීමාවක් ලබා දෙන ලදී.

(ආ) **බලපත්‍රලාභී වාණිජ බැංකුවල විදේශ විනිමය වෙළෙඳාම් කටයුතු:** ශ්‍රී ලංකාවේ විදේශ විනිමය වෙළෙඳාම් කටයුතුවල මනා පැවැත්ම උදෙසා ඊට අදාළ ව්‍යාපාර කටයුතු සහ වෙළෙඳපොළ පරිචයන් ඉහළ ප්‍රමිතියකට පත් කිරීමේ අරමුණින්, අනුගමනය කළ යුතු වෙළෙඳපොළ පරිචයන්, ආචාරධර්ම, චර්යාවන් සහ ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රමිතීන් ද පවත්වා ගත යුතු දැනුම් මට්ටම් මෙන්ම අනුගත නොවීම සඳහා පැනවෙන දණ්ඩනයන් ද ආවරණය වන පරිදි විධානයක් නිකුත් කරන ලදී.

(ඇ) **ද්‍රවශීල වත්කම් නිර්වචනය පුළුල් කිරීම:** බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීල වත්කම් අනුපාතය ගණනය කිරීමේදී, රජයේ සුරැකුම්පත් යටතේ සිදු කරන ප්‍රතිවිකුණුම් ගිවිසුම් ද්‍රවශීල වත්කම් ලෙස සැළකිය හැකි බව නිර්ණය කරන ලදී.

(ඈ) **ව්‍යාපාර මෙහෙයුම් සඳහා බාහිරින් සේවා ලබා ගැනීම:** අභ්‍යන්තර විගණනය හා තොරතුරු තාක්ෂණ කටයුතු ද ඇතුළත්ව බැංකුවකට බාහිරින් සේවා ලබා ගත හැකි කටයුතු ඇතුළත් නව විධානයක් නිකුත් කරන ලදී.

(ඉ) **බැංකු සේවා ස්ථාන වර්ගීකරණය:** බැංකු ශාඛා අනුමත කිරීමේ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා දැනට පවත්නා බැංකු සේවා ස්ථාන, බැංකු ශාඛා සහ ශිෂ්‍ය ඉතුරුම් ඒකක යන දෙවර්ගයට වර්ගීකරණය කරන ලෙස බැංකුවලට දන්වන ලදී. ඒ අනුව, 2013 ජනවාරි 01 වන දින සිට ශිෂ්‍ය ඉතුරුම් ඒකක හැර අනෙකුත් සියලු බැංකු සේවා ස්ථාන බැංකු ශාඛා මට්ටමට උසස් කළ යුතුය. කිසියම් ශාඛාවක් තෝරා ගත් බැංකු සේවාවන් පමණක් ලබා දෙන්නේ නම්, එම සේවාවන්හි ලැයිස්තුවක්, ගනුදෙනුකරුවන්ගේ දැන ගැනීම පිණිස, එම පරිශ්‍රය තුළ පැහැදිලිව ප්‍රදර්ශනය කරන ලෙසට ද බලපත්‍රලාභී බැංකුවලට නියම කරන ලදී.

(ඊ) **අයිසීආර්ඒ ලංකා ලිමිටඩ් බාහිර ණය තක්සේරු කිරීමේ ආයතනයක් ලෙස පිළිගැනීම:** බලපත්‍රලාභී බැංකුවලට අදාළ සියලුම නියාමන අවශ්‍යතාවයන් සඳහා බාහිර ණය තක්සේරු කිරීමේ ආයතනයක් ලෙස යොදා ගත හැකි වන පරිදි ඉන්දියාවේ අයිසීආර්ඒ ලිමිටඩ් වෙත පූර්ණ හිමිකාරීත්වය ඇති පාලිත සමාගමක් වන අයිසීආර්ඒ ලංකා ලිමිටඩ් සමාගම පිළිගන්නා ලදී.

(උ) **බාසල් II සම්මුතියෙහි ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා රාමුව යටතේ 2 වන ආධාරකය, අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම:** බැංකුවල ප්‍රාග්ධන අවශ්‍යතාවයන් ඇස්තමේන්තු කිරීම හා අවදානම් කළමනාකරණය වඩාත් ශක්තිමත් කිරීමේ අරමුණින් බැංකුවල අදහස් විමසීමේ ලියවිල්ලක් නිකුත් කරන ලදී.

(ඌ) **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 32, 39 සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 7 ක්‍රියාත්මක කිරීම:** ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 32, 39 සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති අංක 7 ක්‍රියාත්මක කිරීමට අදාළව උපදෙස් මාලාවක් හා බැංකුවල ත්‍රෛමාසික සහ වාර්ෂික ගිණුම් ප්‍රකාශයට පත් කිරීමට අදාළ ආකෘතීන්ද නිකුත් කරන ලදී.

(එ) **ණයපත් හා නිවාස ණය මත අය කෙරෙන පොලී අනුපාතයන්:** වෙළෙඳපොළ පොලී අනුපාතිකයන්ගේ කාලීන උපනතීන් සැළකිල්ලට ගෙන බලපත්‍රලාභී බැංකු විසින් නිවාස ණය සහ ණයපත් අත්තිකාරම් මත අය කළ හැකි වාර්ෂික පොලී අනුපාතයන්, පිළිවෙලින් සියයට 16 සහ සියයට 28 දක්වා ඉහළ නංවන ලදී.

(ඒ) **විශ්‍රාම යෑමේදී අධ්‍යක්ෂවරුන් හට ලබා දෙන විශේෂ ගෙවීම්/ප්‍රතිලාභ:** මනා යහපාලනයක් පවත්වා ගැනීමේ අරමුණින්, අධ්‍යක්ෂවරුන් විශ්‍රාම ගැනීමේදී සාමාන්‍යයෙන් සිදු කරන ගෙවීම් සහ ප්‍රතිලාභවලට අමතරව බැංකු විසින් සිදු කරනු ලබන, විශේෂ ගෙවීම් සහ ප්‍රතිලාභ සඳහා කොටස්කරුවන්ගේ පූර්ව අනුමැතිය ලබාගන්නා ලෙස මෙරට සංස්ථාපිත බලපත්‍රලාභී බැංකුවලට දැනුම් දෙන ලදී. තවද, එම විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන් හට දෙන විශේෂ ගෙවීම් සහ ප්‍රතිලාභ බැංකුවෙහි පාරිතෝෂික ප්‍රතිපත්තියට අනුකූලව සිදු කරන ලෙසටත්, එසේ අදාළ මූල්‍ය වර්ෂය තුළ විශ්‍රාම යන අධ්‍යක්ෂවරුන්ට සිදු කරන විශේෂ ගෙවීම් සහ ප්‍රතිලාභවල මුළු වටිනාකම වාර්ෂික වාර්තාව මගින් වෙනමම හෙළිදරව් කරන ලෙසටත් බැංකුවලට දන්වා සිටින ලදී.

## 2.2 බැංකු, බැංකු ශාඛා සහ වෙනත් බැංකු සේවා ස්ථාන සඳහා අවසර ලබා දීම

(අ) 2012 වසර තුළදී නව ශාඛා 89 ක්, ව්‍යාප්ති කාර්යාල 73 ක් සහ ශිෂ්‍ය ඉතුරුම් ඒකක 256 ක් විවෘත කිරීමටද, ශාඛා 79 ක් හා ව්‍යාප්ති කාර්යාල 58 ක් ප්‍රතිස්ථාපනය කිරීමටද, ව්‍යාප්ති කාර්යාල 46 ක් බැංකු ශාඛා බවට උසස් කිරීමටද, ශාඛා වලින් පරිබාහිරව පිහිට වූ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 57 ක් විවෘත කිරීමටද අවසර ලබා දෙන ලදී. උතුරු සහ නැගෙනහිර පලාත්වල ආරම්භ කිරීමට අවසර ලබා දුන් බැංකු ශාඛා 15 ක් ද මේ අතර වේ. මීට අමතරව, මූල්‍ය අන්තර්ගතකරණය ඉහළ නැංවීම සඳහා වූ 2012 අයවැය යෝජනාවලට සමගාමීව, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර බැංකු ඒකක 41 ක් ස්ථාපිත කිරීම සඳහා ද වසර තුළ අවසර දෙන ලදී. 2012 වසර අවසන් වන විට බැංකු ශාඛා 2,203 ක්, අනෙකුත් බැංකු සේවා ස්ථාන 4,171 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 2,390 ක් ක්‍රියාත්මක වෙමින් පැවතින.

(ආ) බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ආරම්භ කිරීමට තාවකාලික අවසර ලිපියක් 2012 වසරේදී නිකුත් කළ අතර, 2011 වසරේදී නිකුත් කළ එවන් අවසර ලිපියක වලංගු කාලය දීර්ඝ කරන ලදී.

## 2.3 බැංකු අඛණ්ඩව අධීක්ෂණය කිරීම

බැංකුවල පවතින යථා තත්ත්වය තක්සේරු කිරීම, එක් බැංකුවකට හෝ සමස්ත බැංකු පද්ධතියට අයහපත් ලෙස බලපෑ හැකි ප්‍රවණතාවන් හඳුනා ගැනීම සහ අවශ්‍ය වැඩිමනත් පරීක්ෂණ සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් බැංකු අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. ව්‍යවස්ථාපිත පරීක්ෂණයන් මගින් හඳුනා ගත් දුර්වලතාවයන් නිවැරදි කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය පසුවිපරම් කිරීම සහ අනෙකුත් නියාමන අනුමැතියන් ලබා දීම ද අඛණ්ඩ අධීක්ෂණයේ කොටසක් ලෙස සිදු කරන ලදී. බැංකුවල දෙවන පෙළ ප්‍රාග්ධනය සඳහා යටත් ණයකර ඇතුළත් කිරීම, සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කිරීම, විදේශීය මූලාශ්‍රවලින් ණය ගැනීම, උපරිම ණය සීමා ඉක්මවා ණය පහසුකම් ලබා දීම, උකස් කටයුතු සහ ජංගම බැංකු කටයුතුවල යෙදීම සහ විදේශීය රටවල්වලට බැංකු කටයුතු ව්‍යාප්ත කිරීම සඳහා ද වසර තුළ අවසරයන් ලබා දෙන ලදී.

මීට අමතරව, අඛණ්ඩ පරීක්ෂණ ක්‍රියාවලියට පහසුවක් වශයෙන් අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමක් ද සිදු කර ගෙන යනු ලැබේ. පරීක්ෂණවලින් අනාවරණය කර ගත් ගැටළු ඵලදායක ලෙස විසඳීමේ අඛණ්ඩ පරීක්ෂණ යාන්ත්‍රණයට පහසුකම් සැලසීම සඳහා බැංකුවල ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සහ බාහිර විගණකයන් සමග රැස්වීම් කිහිපයක් ද වසර තුළ පවත්වන ලදී.

බැංකු අංශයේ කාර්තුමය කාර්යසාධනය පිළිබඳ වාර්තාවන්ට අමතරව, ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට පහසුවන පරිදි ශ්‍රී ලංකාවේ බැංකුවල පොලී පරතරය හා පොලී ආන්තික විශ්ලේෂණය කිරීම්, නිවාස ණය සහ ණයපත් මත පොලී අනුපාත සමාලෝචනය වැනි විශේෂිත කරුණු පදනම් කර ගත් වාර්තා කිහිපයක්ද 2012 වසර තුළදී පිළියෙල කරන ලදී.

## 2.4 බැංකු පරීක්ෂණ සිදු කිරීම

බැංකුවල අවදානම් හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය සහ අවදානම් පහත හෙළීම සඳහා පවතින සම්පත් ප්‍රමාණය තක්සේරු කිරීම යන කාරණා සළකා බැලීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව අවදානම් පාදක ප්‍රවේශයක් බැංකු පරීක්ෂණ සඳහා අනුගමනය කරන ලදී. මේ සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය වසරේදී ආරම්භ කළ බැංකු පරීක්ෂණ 12 ක සහ 2012 වසරේදී ආරම්භ කළ බැංකු පරීක්ෂණ 20 ක කටයුතු සිදුකරන ලදී. ඒ අනුව, අදාළ බැංකුවල කළමනාකාරීත්වය සමග විධිමත් සාකච්ඡා පවත්වමින් හා අදාළ වාර්තා මුදල් මණ්ඩලයට යොමු කිරීම මගින් බැංකු 21 ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ 2012 වසර තුළදී අවසන් කරන ලද අතර, තවත් බැංකු 11 ක පරීක්ෂණ අවසන් වෙමින් පවතී. මෙම පරීක්ෂණවලදී, ණය අවදානම් කළමනාකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, මෙහෙයුම් අවදානම් කළමනාකරණය, ඒකාබද්ධ අවදානම් කළමනාකරණය, අනුකූලතා කාර්යය, සාංගමික යහපාලනය සහ ව්‍යවස්ථාපිත නියමයන් කඩ කිරීම් යනාදිය කෙරෙහි ප්‍රධාන අවධානය යොමු කරන ලදී. මීට අමතරව, කාලානුරූපීව පැන නැගි කරුණු සම්බන්ධයෙන් සීමිත විෂය පථයකින් යුත් පරීක්ෂණ කිහිපයක්ද පවත්වන ලදී. හඳුනාගත් ප්‍රධාන ගැටළු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග එකඟ වූ පරිදි ගෙන ඇත්දැයි තහවුරු කිරීම සඳහා කාර්තුමය පදනමක් මත ප්‍රගතිය විමසා බලන ලදී.

## 2.5 බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම්

මහ බැංකු අධිපතිතුමා සහ බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් අතර පැවැත්වෙන මාසික රැස්වීම්වල ලේකම් කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරයි. මහ බැංකුව සහ බැංකු ක්ෂේත්‍රය අතර අදහස් හුවමාරු කර ගැනීමේ වේදිකාවක් ලෙස මෙය ක්‍රියා කරයි.

තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා බැංකු පද්ධතියේ කාර්යසාධනය හා ආර්ථික සහ මූල්‍ය අංශවල වර්ධනයන් පිළිබඳව මෙම රැස්වීම්වලදී ප්‍රධාන විධායක නිලධාරීන් දැනුවත් කරනු ලැබේ. විධිමත් මාර්ග හරහා විදේශීය විනිමය ප්‍රේෂණ කටයුතු ප්‍රචලිත කිරීම සඳහා බැංකු සේවා ස්ථාන තුළින් විදේශ විනිමය මාරු කිරීමේ ක්‍රියාවලියට පහසුකම් සැපයීම, විදේශ විනිමය වෙළෙඳාම් කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කිරීම සඳහා විදේශ විනිමය වෙළෙඳාම් කටයුතු පිළිබඳ ඉහළ ව්‍යාපාර ප්‍රමිතීන් ප්‍රවර්ධනය, නව ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුගත වීම සහ පවත්නා විචක්ෂණශීලි නියාමයන්ට අනුකූල වීම, යහපාලනය පිළිබඳව නිකුත් කරන ලද විධානයන් යටතේ සිදු කිරීමට නියමිත හෙළිදරව් කිරීම් සහ විගණනය කරන ලද වාර්ෂික ගිණුම් වාර්තා යොමු කිරීම සහ ප්‍රකාශනය, කළමනාකාරීත්ව ලිපිය නියමිත වේලාවට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීම, බාසල් II ප්‍රාග්ධන ප්‍රමාණාත්මතාව පිළිබඳ රාමුවට අනුකූල 2 වැනි ආධාරකය වන අධීක්ෂණ විමසුම් ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම පිළිබඳ කෙටුම්පත නිකුත් කිරීම, ප්‍රයෝජනයට ගත නොහැකි අඩු වටිනාකමක් දරන මුදල් නෝට්ටු පාලනය, මහජනතාව වෙනුවෙන් සිදු කරන මුදල් සම්බන්ධ සේවාවන්, මුදල් තේරීමේ ප්‍රමිති ඉහළ දැමීම සහ ව්‍යාජ මුදල් නෝට්ටු අනාවරණය කර ගැනීම, වැනි මුදල් කළමනාකරණය පිළිබඳ කරුණු ද, ණයපත්, නිවාස ණය, උකස් අත්තිකාරම් මත සහ තැන්පතු මත පොලී අනුපාත විමර්ශනය, සහ බැංකු විසින් අය කරන ඉහළ ගාස්තු පිළිබඳ පාරිභෝගික පැමිණිලි යනාදිය ඉහත රැස්වීම්වලදී සාකච්ඡාවලට බඳුන් වූ කරුණු අතර වේ.

## 2.6 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පරිපාලනය කිරීම

2010 අංක 1 දරන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය පිළිබඳ රෙගුලාසි යටතේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ තැන්පතු රක්ෂණ ඒකකයේ වගකීම වනුයේ රටේ සමස්ත මූල්‍ය පද්ධතියෙහි ස්ථායිතාවය උදෙසා පිහිටුවා ඇති අනිවාර්ය තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු ඉටු කිරීමය.

සාමාජික ආයතන වන බලපත්‍රලාභී බැංකු සහ මූල්‍ය සමාගම් වලින් වාරික එකතු කිරීම සහ එම මුදල් නිසි ලෙස රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කිරීම තැන්පතු රක්ෂණ ඒකකය විසින් සිදු කර ගෙන යන ලදී. 2012 වසර තුළදී වාරික සහ දඩ මුදල් වශයෙන් රුපියල් බිලියන 3.5 ක් ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට ලැබුණි. ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයේ ක්‍රමානුකූල පැවැත්ම තහවුරු කිරීමට අමතරව, තැන්පතු රක්ෂණ ඒකකය එහි මෙහෙයුම් යාන්ත්‍රණය ශක්තිමත් කරන ලදී.

2012 දෙසැම්බර් 31 වන දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය, සාමාජික ආයතන 78 කින්ද, රුපියල් බිලියන 8.8 ක වටිනාකමකින් යුත් මූල්‍ය වත්කම්වලින් සහ රුපියල් බිලියන 9.7 ක ආසන්න වටිනාකමකින් යුත් තැන්පතු අරමුදලකින්ද සමන්විත විය.

## 2.7 වෙනත් ක්‍රියාකාරකම්

### (අ) නඩු කටයුතු පවත්වා ගෙන යාම

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හා නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයන්හි සහාය ඇතිව ආයතනික යහපාලනය, පැහැර හැරි ප්‍රමුඛ ඉතිරි කිරීමේ හා සංවර්ධන බැංකුවේ කටයුතු, විනිමය පාලනය විවාදගත හෙජින් ගනුදෙනුව, තහනම් යෝජනා ක්‍රම හා නුසුදුසු බැංකු පරිචයන්ට, අදාළව නඩු කටයුතු 19 ක් හසුරුවන ලදී.

### (ආ) අන්තර් නියාමන ආයතනික සභාව

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව මෙම සභාවෙහි රැස්වීම් සඳහා පහසුකම් සපයන ලදී. මෙම සභාව පිහිටුවීමේ මූලික පරමාර්ථ වූයේ මූල්‍ය ක්ෂේත්‍රයේ ක්‍රමානුකූල සංවර්ධනයක් සඳහා සුදුසු ප්‍රතිපත්තීන් සැකසීම හා වඩාත් පුළුල් වූ මූල්‍ය පද්ධති ස්ථායිතාවයක් සඳහා සියලු නියාමන ආයතනයන් අතර සම්බන්ධීකරණය සහ තොරතුරු හුවමාරු කර ගැනීම සහතික කිරීමය. මෙම සභාව විසින් "මූල්‍ය ක්ෂේත්‍රයේ නියාමන ආයතනයන් අතර තොරතුරු හුවමාරු කිරීම" සඳහා වන පනත් කෙටුම්පත, කොටස් තැරැව්කරුවන් සඳහා වන අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය, බලපත්‍රලාභී බැංකුවල කොටස් හිමිකාරත්වය පිළිබඳ සීමාවන්, සාංගමික ණය වෙළෙඳපොළේ සංවර්ධනය හා ප්‍රධාන මූල්‍ය සමූහයන් අධීක්ෂණය කිරීම වැනි කාරණා කෙරෙහි අවධානය යොමු කරන ලදී.

### (ඇ) දැනුම්වත් කිරීමේ වැඩසටහන්

අභියෝගවලට මුහුණ දීම සඳහා බැංකුවල හැකියාව තවදුරටත් ශක්තිමත් කිරීම පිණිස, ආර්ථිකයේ සහ නියාමන පරිසරය තුළ සිදු වන නව වර්ධනයන් පිළිබඳ තොරතුරු හුවමාරු කර ගැනීමේ හා යාවත්කාලීන කිරීමේ අරමුණින් යුතුව, බැංකු අධ්‍යක්ෂවරුන්ගේ පස්වන සම්මන්ත්‍රණය එ.ජ. ඩොලර් 4,000 න් පසු අවධිය සඳහා බැංකු ක්ෂේත්‍රය ස්ථානගත කිරීම යන තේමාව යටතේ, 2012 දෙසැම්බර් 12 වන දින පවත්වන ලදී. එහිදී බැංකුවල ද්‍රවශීලතාවය ශක්තිමත් කිරීම සහ මෙහෙයුම් අවදානම් කළමනාකරණය පිළිබඳව ද සාකච්ඡා කරන ලදී. අවදානම් කළමනාකරණ භාවිතාවන් හා වඩාත් යෝග්‍ය ප්‍රමිති සම්බන්ධ දැනුම වැඩිදියුණු කිරීම හා අත්දැකීම් හුවමාරු කර ගැනීමේ අරමුණින් යුතුව බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරුවන් සඳහා සැසියක් ද පවත්වන ලදී. විගණන කටයුතු පවත්වාගෙන යාමේදී විගණකවරුන්ගේ කාර්යභාරය සහ ඔවුන්ගේ වගකීම් පිළිබඳව දැනුවත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකුවල විගණකවරුන් සමග සාකච්ඡාවක් ද පවත්වන ලදී. මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු හා වෙනත් ආයතනයන් මගින් පවත්වන ලද බොහෝ පුහුණු වැඩසටහන් සඳහා සම්පත් දායකයන් ලෙස බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරී මඩුල්ල කටයුතු කොට ඇත.

ගනුදෙනුකරුවන් සහ බැංකු සතු අන්‍යෝන්‍ය බැඳීම් පිළිබඳ ප්‍රචාරක දැන්වීම් ද ඇතුළුව මහජනතාවගෙන් තැන්පතු භාරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර නිකුත් කොට ඇති බැංකු හා බැංකු නොවන මූල්‍ය ආයතන

ලැයිස්තුවක් ඇතුළත් පුවත්පත් නිවේදන ශ්‍රේණියක් පළ කරන ලදී. තහනම් යෝජනා ක්‍රමවල නියැලීමෙන් විය හැකි අවාසි සහගත තත්ත්වයන් හා බැංකු සමග ගනුදෙනු කිරීම සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම සඳහා විවිධ රූපවාහිනී සහ ගුවන් විදුලි නාලිකා උපයෝගී කර ගනිමින් වඩාත් ප්‍රබල දැනුවත් කිරීමේ ව්‍යාපාරයක් 2012 වසරේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලදී.

බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිය නියාමන රාමුවෙහි සිදු වන වෙනස්කම් පිළිබඳව තොරතුරු ව්‍යාප්ත කිරීම සඳහා මාධ්‍ය නිවේදන ශ්‍රේණියක් ද නිකුත් කරන ලදී.

බැංකුවල බිඳවැටීම් සහ අයථා පාලනය තුළින් මහජනතාවට සිදු වන හානිය අවම කිරීම සඳහා ඵකී බැංකු අධීක්ෂණය කිරීම උපකාරී වේ. ස්වකීය තැන්පත්කරුවන් හෝ ණය හිමියන් හෝ කෙරෙහි වන බැඳීම් අවදානමකට ලක් නොවන අයුරින් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු සිය බැංකු කටයුතු පවත්වා ගෙන යන වගට සහතික වීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2012 වසර තුළදී සිය නියාමන කටයුතු ඵලදායක ලෙස පවත්වා ගෙන යන ලදී.

**II-1 ඇමුණුම** **බලපත්‍රලාභී බැංකු ලැයිස්තුව**

**බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් ලිමිටඩ්
2. අයිසීඅයිසීඅයි බැන්ක් ලිමිටඩ්
3. ඇක්සිස් බැන්ක් ලිමිටඩ්
4. ඉන්දියන් ඕවර්සීස් බැංකුව
5. ඉන්දියන් බැංකුව
6. එම්සීබී බැන්ක් ලිමිටඩ්
7. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
8. ඩීඑෆ්සීසී වර්ධන බැන්ක් පීඑල්සී
9. ඩොයිෂ් බැංකුව ඒජී
10. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කින් කෝපරේෂන් ලිමිටඩ්
11. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
12. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
13. පබ්ලික් බැන්ක් බර්හාඩ්
14. පැන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පීඑල්සී
15. මහජන බැංකුව
16. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
17. ලංකා බැංකුව
18. සම්පත් බැන්ක් පීඑල්සී
19. ස්ටැන්ඩර්ඩ් චාර්ටර්ඩ් බැංකුව
20. ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
21. සිටි බැන්ක් එන් ඒ
22. සෙලාන් බැන්ක් පීඑල්සී
23. හබීබ් බැන්ක් ලිමිටඩ්
24. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**බලපත්‍රලාභී විශේෂිත බැංකු**

25. එම්බීඑස්එල් සේවින්ස් බැන්ක් ලිමිටඩ්
26. ජාතික ඉතිරි කිරීමේ බැංකුව
27. ඩීඑෆ්සීසී බැංකුව
28. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
29. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
30. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
31. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
32. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
33. ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්

## 3. බැංකු විදු පියෙස

නිරතුරුව වෙනස්වන පරිසරයක් තුළ ඇතිවන අභියෝගයන්ට සාර්ථකව මුහුණ දෙමින් මූල්‍ය ක්ෂේත්‍රයේ සහ අනිකුත් පාර්ශ්වයන්ට තම හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා අවශ්‍ය පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ හා වැඩමුළු සැලසුම් කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වගකීම බැංකු විදු පියෙසට පැවරී ඇත. 2012 වසර තුළ මූලික අවධානය යොමු වූයේ පවත්වනු ලබන පුහුණු වැඩසටහන් හා යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම තුළින් පුහුණු ආයතනයක් ලෙස බැංකු විදු පියෙසෙහි ගුණාත්මකභාවය ඉහළ නැංවීමයි. වේගයෙන් විකාශනය වන ජාත්‍යන්තර මූල්‍ය කටයුතු සඳහා අවශ්‍ය කාලීන දැනුම නව සොයා ගැනීම් සමගින් වඩාත් හිතකර පරිසරයක් තුළ ලබාදීමේ අවශ්‍යතාවය බැංකු විදු පියෙස විසින් මැනවින් හඳුනාගන්නා ලදී. එහි ප්‍රතිඵල 2012 වසරේ කාර්යසාධන අත්කර ගැනීම තුළින් මනාව ප්‍රත්‍යක්ෂ වේ.

බැංකු කටයුතු ක්‍රියාකාරිත්ව හා රෙගුලාසි, මූල්‍ය කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ග්‍රාමීය අංශයේ සංවර්ධනය, මානව සම්පත් හා පොදු කළමනාකරණය, තොරතුරු තාක්ෂණය, භාෂා හා සන්නිවේදන කුසලතා යන අංශවලට අදාළව බැංකු විදු පියෙස විසින් විවිධ පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පවත්වන ලදී. මූල්‍ය ආයතනවල ප්‍රධාන කටයුතු හා ආධාරක සේවා සුපිරි අන්දමින් ඉටු කර ගැනීමට අදාළ පුහුණු අවශ්‍යතා සපුරාලීමේ අභිප්‍රායෙන් පුළුල් පරාසයකට අදාළ පුහුණු වැඩසටහන් සම්පාදනය කරන ලදී. බැංකු විදු පියෙස විවිධ ජාත්‍යන්තර පුහුණු මධ්‍යස්ථාන සමග අත්වැල් බැඳ ගනිමින් එහි ක්‍රියාකාරිත්වය තවදුරටත් පුළුල් කර ගන්නා ලදී. ජාත්‍යන්තර අනුකූලතා සංගමය සහ මැන්චෙස්ටර් විශ්ව විද්‍යාලය සමග ඒකාබද්ධව ආරම්භ කරන ලද අනුකූලතාවය

පිළිබඳ ජාත්‍යන්තර ඩිප්ලෝමා පාඨමාලාව එබඳු සබඳතාවල වර්ධනයන් මැනවින් විදහාපාන්නකි.

2012 වසර තුළ දී, බැංකු විදු පියෙස විසින් පූර්ව සැලසුම්ගත පුහුණු වැඩසටහන් 61 ක්, මූල්‍ය ආයතනවල ඉල්ලුම මත සහ බැංකු විදු පියෙස විසින් හඳුනාගත් දැනුම් පරතරය පියවීම සඳහා වූ විශේෂ වැඩසටහන් 50 ක්, ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් 12 ක්, සහතික පත්‍ර පාඨමාලා 02 ක්, ඩිප්ලෝමා පාඨමාලා 02 ක් සහ බැංකු විදු පියෙසට සේවය සපයන්නාවූ සම්පත් දායකයින් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් 02 ක් පවත්වන ලදී. මෙයට අමතරව, දැනුම බෙදා හදා ගැනීමේ අරමුණෙන් යුතුව මහජන දේශන 09 ක්, සැඳෑ දේශන 04 ක් සහ පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වූ වැඩසටහන් 30 ක් ද 2012 වසර තුළ බැංකු විදු පියෙසෙහි පවත්වන ලදී. ඒ සඳහා සහභාගි වූ මුළු සංඛ්‍යාව 5,392 ක් වූ අතර, ඉන් 115 ක් විදේශිකයන් විය. එසේම, බැංකු විදු පියෙස විසින් අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ සිසුන් ඉලක්කකර සකසන ලද, "තක්ෂිලාව" රූපවාහිනී වැඩසටහන් මාලාව 2012 වසරේ දී ද විකාශ කරන ලදී.

තවද, බැංකු විදු පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ පළාත් කාර්යාල මෙහෙයුම් දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමග අත්වැල් බැඳ ගනිමින් ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් මාලාවක් ආරම්භ කරන ලදී. පළාත් කාර්යාල 05 සම්බන්ධ කර ගනිමින් 2012 වසර තුළ දී එබඳු වැඩසටහන් 16 ක් පවත්වන ලදී. මෙම වැඩසටහන්, ණයදීම හා ණය ඇගයීම වැනි ප්‍රධාන බැංකු කටයුතු මෙන්ම, උකස්කරණය වැනි විෂය ක්ෂේත්‍රයන් ද පාදක කර ගනිමින් සංවිධානය කරන ලදී.

"ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ සේවාදායකත්වයට වඩාත් ළඟාවීම" යන තේමාවට අනුගත වෙමින් බැංකු විදු පියෙස, කලාපය තුළ දැනුම උත්පාදනය කරන්නාවූ සහ බෙදාහරින්නා වූ විශිෂ්ඨ පුහුණු ආයතනයක් වීමේ අරමුණෙන් 2013 වසර සහ ඉන් ඔබ්බට සැලසුම්ගත පුහුණු වැඩසටහන් සහ විශේෂ වැඩසටහන් සංවිධානය කර ඇත.

# 4. සංනිවේදන

මහ බැංකුවේ කාර්යභාරය පිළිබඳ එයට සම්බන්ධ සියලු පාර්ශ්වයන් අතර අවබෝධය වර්ධනය කරනු පිණිස ඉහළම වෘත්තීය මට්ටමකින්, නිරවද්‍යතාවයකින් සහ අවංකභාවයකින් යුක්තව කාර්යක්ෂම සහ ඵලදායී සංනිවේදනයක් තහවුරු කිරීම සංනිවේදන දෙපාර්තමේන්තුවේ මූලිකම අභිප්‍රාය වේ. එසේ ම මහ බැංකුවේ උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගනුවස්, එහි ක්‍රියාකාරකම්, ප්‍රතිපත්ති සහ ඉහළ මට්ටමේ කළමනාකරණ සහ වෙනත් තොරතුරු පිළිබඳ ව මහ බැංකුවේ කාර්යමණ්ඩලය තුළ මනා දැනුමක් සහ අවබෝධයක් ඇති කිරීමත් එමගින් අදාළ සෑම පාර්ශ්වයක ම දැනුම් පරතරයන් පියවීමට කටයුතු කිරීමත් එහි අරමුණු අතර වෙයි.

මේ ඉලක්ක වෙත ළඟා වනු පිණිස, නවීන සංනිවේදන පහසුකම් කිහිපයක් ම හඳුන්වා දෙමින් මෙම වසරේ දී සංනිවේදන දෙපාර්තමේන්තුව සෑම තාරාතිරමක ම මහජනතාව සමඟ පැවැති සබඳතා තව දුරටත් ශක්තිමත් කර ගත්තේ ය. පොලී අනුපාත, රජයේ බැඳුම්කර වෙන්දේසිය, උද්ධමනය ආදිය පිළිබඳ වැදගත් තොරතුරු ලබා දෙන කෙටි පණිවිඩ සේවාව (SMS Alert service) එසේ හඳුන්වා දෙන ලද එක් සේවාවකි. මේ සේවාව හඳුන්වා දීමත් සමග එවැනි තොරතුරු පිළිබඳ උනන්දුවක් දක්වන පුරවැසියන්ට මහ බැංකුව විසින් නිකුත් කරන එම තොරතුරු සිය ජංගම දුරකථන වෙත ලබා ගැනීමේ පහසු මගක් දැන් විවර ව තිබේ.

මේ අතර, මහ බැංකුවේ ත්‍රෛභාෂික වෙබ් අඩවිය සහ සංනිවේදන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර වෙබ් අඩවියත් පවත්වාගෙන යෑම, දැන්වීම් ප්‍රචාරණය, බැංකු විදු පියෙස තුළ මෙන් ම ඉන් පිටත දිවයිනේ දුර බැහැර ප්‍රදේශයන්හිත් මහජනතාව දැනුම්වත් කරන වැඩසටහන් සංවිධානය, "සටහන", "කවුළුව", "නිව්ස් සර්වේ" ආදී මහ බැංකු ප්‍රකාශන අඛණ්ඩව ප්‍රකාශයට පත් කිරීම සහ මහ බැංකුවට අවශ්‍ය මුද්‍රණ කාර්යයන් ඉටුකර දීම ආදී වශයෙන් අභ්‍යන්තර සහ බාහිර පාර්ශ්වකරුවන් වෙත සංනිවේදන දෙපාර්තමේන්තුව විසින් නිතිපතා සලසන වෙනත් සේවාවන් නොකඩවා පවත්වාගෙන යන ලදී.

## 4.1 බාහිර සංනිවේදනය

බැංකුවේ නිල වෙබ් අඩවිය වන www.cbsl.gov.lk හි නිමාව වැඩි දියුණු කිරීමේ අරමුණින්, බැංකුව සහ එයින් ඉටු කරනු ලබන කාර්යයන් සම්බන්ධ වෘත්තීයමය ඡායාරූප එකතුවක් ලෙස සැලකිය හැකි ඡායාරූප ගැලරියක් එයට එක් කරනු ලැබීය. වසර මුල යම් තාක්ෂණික දුෂ්කරතා ඇති ව තිබියදීත් මහ බැංකුවේ මූලිකම සංනිවේදන දොරටුව වශයෙන් එහි වෙබ් අඩවියේ සාර්ථකත්වය තහවුරු කරලමින් 2012 වසර තුළ වෙබ් අඩවියට පැමිණීම් වාර මිලියන 72 ක් වාර්තා විය. මෙය 2011 වසරේ වාර්තා වූ පැමිණීම් වාර මිලියන 71 ඉක්මවමින්, සියයට 1.5 ක සුළු ප්‍රතිශතයකින් ඉහළ යෑමකි. කෙසේ වුව ද, 2012 වසර තුළ අවස්ථාවන් කීපයක දී ම වෙබ් අඩවියෙහි පැමිණීම වාර්තා කරන පද්ධතියේ තාක්ෂණික දෝෂ ඇති වීම නිසා වසරේ කාල සීමාවන් කීපයක් තුළ පැමිණීම් පිළිබඳ දත්ත වාර්තා වී නැති බැවින් වාර්තා වී ඇති සංඛ්‍යාවෙන් අඩවියට පිවිසුණු නිවැරදි සංඛ්‍යාව පෙන්නුම් නොකරයි.

තව ද, ශීඝ්‍රයෙන් ජනප්‍රිය වෙමින් පවතින සමාජ ජාල වෙබ් අඩවි ඉසව්වට මහ බැංකුව පසුගිය වසරේ තැබූ පියවර මෙම වසර තුළ වඩා ප්‍රසාදයට පත් විය. 2012 දී ෆේස්බුක් සහ ට්විටර් අඩවි තුළ බැංකුව විසින් තොරතුරු 734 ක් බැගින් පළ කළ අතර යූටියුබ් හි වීඩියෝ දර්ශන 45 ක් ඇතුළත් කරන ලදී. මෙම තොරතුරු සහ වීඩියෝ දර්ශන වෙත යොමු වූ පාඨක සහ ප්‍රේක්ෂක අවධානය පිළිබිඹු වූයේ ෆේස්බුක් හි කැමැත්ත පළ කිරීම් 1,229 ක්, ට්විටර්හි ලුහුබඳින්නන් 429 ක් සහ යූ ටියුබ් හි නැරඹුම් වාර 5,102 ක් මගිනි.

සංනිවේදන දෙපාර්තමේන්තුවේ සංනිවේදන මෙවලම් එකතුවට මෑත ම එක් වූ මෙවලම වූ කෙටි පණිවුඩ සේවාව

සඳහා ලියාපදිංචි වූ දායකයන් 496 ක් සිටී. නව සේවාව පිළිබඳ ජනතාවගේ දැනුම්වත් බව වැඩි යත් ම මෙම සංඛ්‍යාව අනාගතයේ දී තවත් ඉහළ යනු ඇතැයි දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

සම්ප්‍රදායික සංනිවේදන මාර්ග තුළින් කෙරෙන සංනිවේදන කටයුතු නොකඩවා පවත්වා ගත් දෙපාර්තමේන්තුව පුවත්පත් නිවේදන 1,792 ක් ගැසට් නිවේදන 19 ක් සහ මුද්‍රිත මාධ්‍ය දැන්වීම් 447 ක් 2012 වසර තුළ ප්‍රකාශයට පමුණුවනු ලැබී ය. දෙපාර්තමේන්තුව භාෂා තුනෙන් වීඩියෝ දැන්වීම් 10 ක් මෙම වසරේ නිෂ්පාදනය කර විවිධ රූපවාහිනී නාලිකාවල විකාශනය කළේ ය. මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ අදහස් මහජනතාව වෙත සංනිවේදනය කිරීම පිණිස දෙපාර්තමේන්තුව විසින් පුවත්පත් සාකච්ඡා 42 ක් සංවිධානය කරන ලදී. ඒ හැරුණ විට මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ සහ රාජගිරිය බැංකු විදු පියසේ පවත්වනු ලැබූ වැඩසටහන් 42 කට ද දෙපාර්තමේන්තුව විසින් මාධ්‍ය ආවරණය ලබා දෙනු ලැබී ය. අනුරාධපුරයේ ඔයාමඩුවේ පැවැති දැයට කිරුළ ප්‍රදර්ශනයට සහභාගි වෙමින් සංනිවේදන දෙපාර්තමේන්තුව එම ප්‍රදර්ශනයට සිය අඛණ්ඩ සහභාගිත්වය මේ වසරේ දී ද ලබා දුන්නේ ය. කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනය - 2012 හි සංනිවේදන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය ප්‍රදර්ශන කුටිය ද එහි පැමිණි නරඹන්නන් වැඩිපුර ම ආකර්ෂණය කළ ස්ථානයක් විය.

### 4.2 අභ්‍යන්තර සංනිවේදනය

වඩා සංවිධිත සැලැස්මක් තුළ නව පෙනුමක් ලැබූ සංනිවේදන දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර වෙබ් අඩවිය, "සීබීඑස්එල් ඩේලි" මේ වසර තුළ ශ්‍රී ලංකා අන්තර් බැංකු අර්පණ අනුපාත සහ විනිමය අනුපාත යාවත්කාලීන කිරීම් 440 ක්, පුවත්පත් නිවේදන 352 ක්, කොළඹ පාරිභෝගික මිල දර්ශක අගයන් 12 ක්, සංගම් සහ සමාජවල උත්සව ආවරණය කිරීම් 10 ක් ඇතුළු තොරතුරු සමුදායක් සිය පාඨක සමූහය වෙත ගෙන ගියේය. දිනක පැමිණීම් වල සාමාන්‍ය අගය 372 ක් වාර්තා කරමින් එය අභ්‍යන්තර වෙබ් අඩවියකට ලද හැකි දිරිමත් කරවන සුළු ජන ප්‍රසාදයක් ලබා ඇත. මහ බැංකු කාර්ය මණ්ඩලයට දැනුම සහ විනෝදය ගෙන එන "කවුළුව" - බැංකුවේ නිල අභ්‍යන්තර පුවත් හසුන, මෙම වසර තුළ වෙළුම් 6 ක් ප්‍රකාශයට පත් කරන ලදී.

මාධ්‍ය නිරීක්ෂණ ඒකකය භාෂා තුනට අයත් ජාතික පුවත්පත් 15 කින් රැස් කළ රටේ ආර්ථිකයට සහ මහ බැංකුවට අදාල වෙනත් කරුණුවලට සම්බන්ධ ප්‍රවෘත්ති වාර්තා, ලිපි, සහ මහජන අදහස් 1,611 ක් ඉහළ කළමනාකාරීත්වය වෙත ඉදිපත් කරමින් ඔවුන් ඒ කරුණු පිළිබඳ දැනුම්වත් කිරීමට කටයුතු කරනු ලැබී ය.

### 4.3 මහජනයා දැනුම්වත් කිරීම්

ආර්ථිකය, මූල්‍ය කටයුතු සහ මහ බැංකුවට අදාළ වෙනත් ක්‍රියාකාරකම් පිළිබඳව පොදු ජනතාව තුළ පවත්නා දැනුම්වත්බව වැඩි දියුණු කිරීම මේ වසරේ දී ත් දෙපාර්තමේන්තුවේ ඉහළ ම ප්‍රමුඛතාව හිමි වූ කරුණක් විය.

සංනිවේදන දෙපාර්තමේන්තුව මේ වසර තුළ මහ බැංකුව නියෝජනය කරමින් ප්‍රදර්ශන දෙකකට සහභාගි වෙමින් බැංකුව විසින් ප්‍රකාශයට පත් කළ පොත් පත් සහ නිකුත් කළ සමරු කාසි මිල දී ගැනීමේ අවස්ථාව පොදු ජනතාවට ලබා දෙන ලදී. මේවායේ, එනම් ඔයාමඩුවේ පැවැති දැයට කිරුළ ප්‍රදර්ශනයෙහි සහ බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැති කොළඹ ජාත්‍යන්තර පොත් ප්‍රදර්ශනයේ පවත්වාගෙන ගිය බැංකුවේ ප්‍රදර්ශන කුටි සමාජයේ සෑම තාරාතිරමක ම සහ සෑම වයස් කාණ්ඩයක ම පිරිස් අතර ජන ප්‍රසාදය හිමි කර ගනු ලැබී ය.

බැංකුවේ ප්‍රතිපත්ති දැක්ම සහ අදහස් පොදු ජනතාව වෙත, විශේෂයෙන් තරුණ කොටස් වෙත ගෙන යෑමේ දී බැංකුවේ ප්‍රකාශන වැදගත් මෙහෙයක් ඉටු කරයි. එනිසා, බැංකුවේ ප්‍රකාශනවල බෙදාහැරීම් සහ අළෙවි සංඛ්‍යාලේඛන, මහජන දැනුම්වත්බව වැඩි දියුණු කිරීමට බැංකුව දරන ප්‍රයත්නයෙහි සාර්ථකත්වයට සාක්ෂ්‍යයකි. 2011 මහ බැංකු වාර්තාව ද ඇතුළු ව විවිධ ප්‍රකාශන පිටපත් 12,000 ක් පාසැල් සිසු දරු දැරියන් සහ පාසැල් ගුරු භවතුන් අතර නොමිලේ බෙදා දෙනු ලැබූ අතරම, රු. මිලියන 5.4 ක අලෙවියක් ද වාර්තා කරමින් දෙපාර්තමේන්තුව මෙම වසරේ එහි ලා අති සාර්ථකත්වයක් ලැබී ය.

සංනිවේදන දෙපාර්තමේන්තුව මෙම වසරේ දී අ.පො.ස/උ.පෙ සිසු සිසුවියන්, ගුරු භවතුන්, ආරක්ෂක හමුදාවල අභ්‍යාසලාභීන් සහ නිලධාරීන් ඉලක්ක කර ගත් අධ්‍යාපන වැඩසටහන් 51 ක් සංවිධානය කළේ ය. මෙයින් 22 ක් පවත්වන ලද්දේ ත්‍රිකුණාමලය, මාතලේ, ගාල්ල, හම්බන්තොට, දෙහිඅත්තකණ්ඩිය, පොළොන්නරුව සහ මහනුවර වැනි කොළඹින් දුර බැහැර ස්ථානවල ය. මෙම වැඩ සටහන් වලට 7,523 දෙනෙකු සහභාගි වී තිබූ අතර එය පසුගිය වසර හා සසඳන විට සියයට 43 ක වැඩි වීමකි.

### 4.4 දෙමළ භාෂා පරිවර්තන සේවාව

දෙපාර්තමේන්තුවේ දෙමළ භාෂා පරිවර්තන ඒකකය මේ වසර තුළ ජාතික වැදගත්කමකින් යුත් කර්තව්‍යයක් ඉටු කරමින් ඉංග්‍රීසි පිටු 747 කින් යුත් උගත් පාඩම් සහ සංහිඳියා කොමිසමෙහි වාර්තාව දෙමළ බසට පරිවර්තනය කළේ ය. මේ අතර ම. එම ඒකකය මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට සපයන සිය සේවය නොපිරිහෙලා ඉටු කරමින් වසර තුළ පිටු 2,369 කින් යුත් පැවරුම් 279 ක් සම්පූර්ණ කරනු ලැබී ය.

### 4.5 මුද්‍රණාලය

මුද්‍රණාලය මෙම වසර තුළ මුද්‍රණ කාර්යයන් 215 ක් උසස් නිමාවකින් යුතුව සම්පූර්ණ කරන ලද අතර ඊට අතිරේක ව, බැංකුවේ නිලධාරීන් වෙනුවෙන් හැඳින්වීමේ කාඩ් 33,000 ක් ද මුද්‍රණය කරන ලදී.

මුද්‍රණාලය විසින් ඉටු කරනු ලැබූ වැදගත් කාර්යයන් අතර "මහ බැංකුවේ ප්‍රතිපත්ති පෙර දැක්ම 2012", "මාසික විවරණිකාව", "කවුළුව", "සටහන", "නිවිස් සර්වේ", "මූල්‍ය පද්ධති ස්ථායීතා

වාර්තාව-2011", "බැංකු විදු පියසේ වැඩසටහන් දිනදසුන", "මහ බැංකුවේ උපාය මාර්ගික සැලැස්ම", "රාජ්‍ය ණය විවරණිකාව", "අත්‍යාවශ්‍ය සංඛ්‍යාලේඛන ගණනය", "මානුෂික මෙහෙයුම", "පුනරුදය", "60 වැනි සංවත්සර දේශන මාලාව", "60 වැනි සංවත්සර ප්‍රකාශනය", "2012 ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත (පොත් පිංච)", "ආර්ථික සහ සමාජීය දත්ත", "විශේෂිත කල් බදු සමාගම් සහ ලියාපදිංචි මූල්‍ය සමාගම් සඳහා උපදෙස් පොත්" සහ "2012 මහ බැංකු දින පොත" ද වේ.

### 4.6 මහ බැංකුවේ විශේෂ අවස්ථා සඳහා ඡායාරූප සේවා සැලසීම

මහ බැංකුව විචිත්‍රවත් ලෙස සෙසු ලෝකය ඉදිරියට ගෙන යන සංනිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය බැංකුවේ විවිධ වැදගත් අවස්ථා 236 ක් නිශ්චල සහ වීඩියෝ ඡායාරූපයන්ට නැගූ අතර, ඒවා සංස්කරණය කිරීම, නිසල ඡායාරූප මුද්‍රණය කිරීම, ඇල්බම තැනීම, ඡායාරූප රාමු කිරීම, සංයුක්ත තැටි සැකසීම ආදී වූ සේවාවන් ද එම ඒකකය විසින් හැම විට ම පවත්වාගෙන ආ විශිෂ්ට තත්ත්වය රැක ගනිමින් සපයා ඇත.

### 4.7 පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය

පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය මේ වසර තුළ දී ද මහ බැංකුව වෙනුවෙන් දැනුම් වත්කම් රැස් කිරීම සහ බෙදා හැරීම තවදුරටත් සිදු කරන ලදී. මෙසේ මෙම වසර තුළ පුස්තකාලයේ එකතුවට අලුතින් එක් වූ වත්කම් අතර, පොත් 280 ක්, වාර්තා 88 ක්, ජර්නල 699 ක්, ජාත්‍යන්තර සඟරා 9 ක්, දේශ අධ්‍යයන 65 ක්, රජයේ ප්‍රකාශන 538 ක් විය. මේ එක් කිරීම් සමග පුස්තකාලය සතු සම්පූර්ණ එකතුව පොත් 26,743 ක්, වාර්තා 17,968 ක් සහ සංයුක්ත තැටි 1,806 කින් සමන්විත වන අතර ම, ආර්ථික විද්‍යාව, ආර්ථිකමිතිය සහ මූල්‍යය පිළිබඳ ජර්නල 80 කට වඩා වැඩි සංඛ්‍යාවකට මංගත පිවිසුම සලසන "සයන්ස් ඩිරෙක්ට්" මංගත දත්ත මූලයට එය දරන දායකත්වයට අමතරව තවත් පිළිගත් දේශීය සහ විදේශීය ජර්නල 182 කට ද දායකත්වය දරා ඇත.

බැංකුවේ සියලු ම අංශයන්ට අදාළව දැනුම බෙදා හදා ගැනීම සඳහා ප්‍රයෝජනවත් විය හැකි නව අදහස් සහ සේවාවන් පිළිබඳ විවාද කිරීමේ හුරුව මහ බැංකු කාර්යමණ්ඩලය තුළ රෝපණය කිරීම සඳහා වූ සිය අනවරත ප්‍රයත්නය පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය මේ වසරේ දී ද එසේම පවත්වා ගන්නා ලදී. තව ද, පුස්තකාලයට අලුතින් එක්වූ පොත් පත් දැක බලා ගැනීමට අවකාශ සැලසූ පොත් ප්‍රදර්ශනයක් සහ දිවයිනේ නමගිය පොත් ප්‍රකාශකයන් 06 දෙනෙකු සහභාගිවූ පොත් සල්පිලක් පවත්වමින් බැංකු කාර්යමණ්ඩලයට නවමු දැනුම කරා පහසු මංපෙත් විවර කර දීමට කටයුතු කරනු ලැබී ය.

පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය විසින් සලසන තෝරාගත් තොරතුරු බෙදා හැරීමේ සේවාව පරිශීලකයන්ගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන පරිදි සැකසීම පිණිස එයට වෙනස්කම් කීපයක් සිදු කෙරුණි. මේ අනුව, පුස්තකාලයට අලුතින් එක්වූ පොත් පත් පිළිබඳ දැනුම් දීමේ සේවය, පටුන සේවය, මහ බැංකු කටයුතු පිළිබඳ පණිවුඩ සේවය, ප්‍රවෘත්ති දැනුම් දීමේ සේවය, දේශීය ජන මාධ්‍යයන් පිළිබඳ දැනුම් දීමේ සේවය ආදී ඊමේල් ඔස්සේ සහ "සීබීඑස්එල් ඩේලි" වෙබ් අඩවිය ඔස්සේ ලබා දෙන තොරතුරු සේවාවන්වලින් පරිශීලකයන් වෙත විශිෂ්ට සේවාවක් සපයනු ලැබී ය.

පරිහරණය කරන්නන්ගේ සහභාගීත්වය ඇතිව සිය සේවාවන් වැඩි දියුණු කිරීම පිණිස ප්‍රයත්නයක් දරන පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය, ඔවුන්ගේ දැනුම් අවශ්‍යතාවන් පිළිබඳ සමීක්ෂණයක් දෙපාර්තමේන්තු දෙකක් ආශ්‍රයෙන් අරඹා එහි පළමු පියවර මේ වාර්තාවෙන් සලකා බැලෙන කාලය තුළ ක්‍රියාත්මක කරන ලදි.

බැංකු කාර්යමණ්ඩලය තුළ කියවීමේ පුරුද්ද වර්ධනය කිරීමේ අරමුණ ඇතිව, පොත් හඳුන්වා දීමේ සැසි තුනක් මේ වසර තුළ පවත්වන ලදී.

හැම විට වෙනස් වන ලෝකයට සමගාමී ව, මහ බැංකුවේ දැනුම් සම්පත සංරක්ෂණය කිරීම සඳහා වූ මහ බැංකු ඥාණ කෝෂය ගොඩ නැගීම සඳහා මුල පුරනු ලැබූ අතර, පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රයේ අභ්‍යන්තර වෙබ් අඩවිය ඔස්සේ එයට ප්‍රවේශය ලබා දෙනු ඇත.

මෙවන් ජාතික වැදගත් කමකින් හෙබි දැනුම් සම්පතක් වූ මහ බැංකුවේ පුස්තකාලය සහ තොරතුරු කේන්ද්‍රය, මහ බැංකු කාර්යමණ්ඩලයට පමණක් සීමා වී නොසිට, ඉල්ලීමක් කරනු ලැබුවහොත් පිටස්තර ආයතනයන්ට ද සිය සේවාව ලබා දෙයි.

## 5. ව්‍යවහාර මුදල්

ගෙවීම් මාධ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ අධිකාරිත්වය 1949 අංක 58 දරන මුදල් නීති පනතේ 48 සිට 59 (අ) දක්වා වගන්ති මගින් මුදල් මණ්ඩලය වෙත පවරා ඇත. මෙම විධිවිධාන තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවට, ගෙවීම් පද්ධතියේ පහසුව සඳහා මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම, ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වා ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම, සේවා අනිසි මුදල් නෝට්ටු හා කාසි සංසරණයෙන් ඉවත් කිරීම හා ව්‍යාජ මුදල් නෝට්ටු මුද්‍රණය ඇතුළු ව්‍යවහාර මුදල් සම්බන්ධ වැරදි වැළැක්වීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම යන වගකීම් පැවරී ඇත.

### 5.1 ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

2012 වසර තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී වාණිජ බැංකු හරහා නව මුදල් නෝට්ටු හා කාසි නිකුත් කිරීම හා සේවා නිසි මුදල් නැවත නිකුත් කිරීම යන ආකාර දෙක මගින් පහත වගුවෙහි දැක්වෙන ආකාරයට ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි ආර්ථිකයට නිකුත් කරනු ලැබීය. ඒ අනුව, 2012.12.31 දිනට සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසිවල වටිනාකම රුපියල් බිලියන 318.1 ක් වූ අතර

එය 2011.12.31 පැවති සංසරණයට සාපේක්ෂව සියයට 8.5 ක වාර්ෂික වර්ධනයකි.

**II-1 සංඛ්‍යා සටහන** **ව්‍යවහාර මුදල් නිකුතුව**

රුපියල්

| අයිතමය | නව මුදල් | සේවා නිසි මුදල් | මුළු මුදල් |
|---|---|---|---|
| නෝට්ටු | බිලියන 74.8 | බිලියන 280.6 | බිලියන 355.4 |
| කාසි | මිලියන 747.3 | මිලියන 1.4 | මිලියන 748.7 |

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, ලංකා බැංකුවේ පිටකොටුව ශාඛාවෙහි පවත්වා ගෙන යන ව්‍යවහාර මුදල් හුවමාරු කවුළු මගින් මහජනතාවට ව්‍යවහාර මුදල් නිකුත් කරනු ලැබීය. ඒ අනුව 2012 වසර තුළ දී මිලියන 3,925 ක් වටිනා ව්‍යවහාර මුදල් නෝට්ටු හා මිලියන 152.8 ක් වටිනා කාසි මෙම ශාඛාව හරහා මහජනතාව වෙත නිකුත් කෙරුණු අතර, මෙම කටයුතු කාර්තුමය පදනමින් නිරීක්ෂණය ද සිදු කෙරිණ.

ආර්ථිකයෙහි ව්‍යවහාර මුදල් නෝට්ටු හා කාසි සඳහා ඇති ඉල්ලුම සපුරාලීම සඳහාත්, උසස් තත්ත්වයේ නෝට්ටු සංසරණයේ යෙදවීම සහතික වීම සඳහාත් 2012 වසර තුළ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් නෝට්ටු මිලියන 215 ක් මුද්‍රණය කෙරුණු අතර කාසි මිලියන 197.5 ක් ටංකනය කෙරිණ.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, 2013 - 2015 සඳහා නව කාසි තොග සම්පාදනය සඳහා අන්තර්ජාතික මිල ගණන් කැඳවීමට කටයුතු සලසන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2012 වසර තුළ දී නව සමරු කාසි 02 ක් නිකුත් කරනු ලැබීය. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි ආරම්භයේ සිට නිකුත් කරනු ලැබූ මුළු සමරු කාසි ගණන 57 ක් විය.

**II-2 සංඛ්‍යා සටහන** **සමරු කාසි නිකුතුව**

| විස්තරය | මුහුණත වටිනාකම |
|---|---|
| ශ්‍රී ලංකාවේ බාලදක්ෂ ව්‍යාපාරයට වසර 100 පිරීම (සාමාන්‍ය සංසරණය සඳහා නිකුත් කරන ලද නිකල් ආලේපිත වානේ සමරු කාසිය) | රුපියල් 2 |
| ශ්‍රී ලංකාව හා ජපානය අතර රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතාවයේ 60 වන සංවත්සරය (විශේෂ රිදී සමරු කාසිය) | රුපියල් 1,000 |

## 5.2 ව්‍යවහාර මුදල් තැන්පතු භාර ගැනීම

ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වා ගැනීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සේවා නිසි හා සේවා අනිසි ව්‍යවහාර මුදල්, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ තැන්පත් කරනු ලැබීය. මෙසේ තැන්පත් කෙරුණු සේවා නිසි ව්‍යවහාර මුදල්, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් තෝරා, ගණනය කර නැවත එම බැංකුවලට නිකුත් කෙරිණ.

**II-3 සංඛ්‍යා සටහන** **ව්‍යවහාර මුදල් තැන්පතු**

රුපියල්

| අයිතමය | සේවා නිසි | සේවා අනිසි | එකතුව |
|---|---|---|---|
| නෝට්ටු | බිලියන 285.9 | බිලියන 45.3 | බිලියන 331.2 |
| කාසි | මිලියන 3.0 | - | මිලියන 3.0 |

වර්ධනය වී ඇති ව්‍යවහාර මුදල් තැන්පතු කාර්යක්ෂමව හා වේගවත් ලෙස තෝරා සකස් කිරීම සඳහා මුදල් පිරිසැකසුම් කටයුතු තවදුරටත් ස්වයංක්‍රීය කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත. කාර්යක්ෂමතාව ඉහළ නැංවීම, අවදානම අවම කිරීම හා පරිසර හිතකාමී ලෙස ව්‍යවහාර මුදල් විනාශ කිරීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ආරම්භ කරනු ලැබීය.

## 5.3 සේවා අනිසි නෝට්ටු සංසරණයෙන් ඉවත් කිරීම

බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් තැන්පත් කෙරෙන සේවා අනිසි මුදල් නෝට්ටු, නව හෝ සේවා නිසි නෝට්ටු නිකුත් කිරීම මගින් ප්‍රතිස්ථාපනය කරන ලදී. ඒ අනුව 2012 වසර තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මගින් බිලියන 38.9 ක වටිනාකමින් යුත් සේවා අනිසි මුදල් නෝට්ටු මිලියන 159.6 ක් විනාශ කරනු ලැබීය.

මුදල් භාවිතයේ යහපුරුදු හේතුවෙන් නෝට්ටුවල ආයු කාලය වැඩි වීමත් සමග නෝට්ටු මුද්‍රණය සඳහා වැයවන පිරිවැය අඩු වන බැවින් පහත දැක්වෙන ක්‍රියාමාර්ග මගින් පිරිසිදු මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාවට නැංවීමට ප්‍රමුඛත්වය දෙන ලදී.

(අ) නෝට්ටු තේරීමේ ප්‍රමිතීන් පිළිබඳව උපදෙස් මාලාවක් වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද අතර, මහජනතාව සඳහා සේවා අනිසි නෝට්ටු, සේවා නිසි නෝට්ටුවලට හුවමාරු කිරීමේ පහසුකම් සැලසීමට ද උපදෙස් සපයනු ලැබීය.

(ආ) සේවා නිසි මුදල් නෝට්ටු තේරීම පිළිබඳව හා ව්‍යවහාර මුදල් භාවිත කළ යුතු ආකාර පිළිබඳව මුදල් කළමනාකරුවන් සමග රැස්වීම් පවත්වනු ලැබීය.

(ඇ) නිකුත් කරන ලද උපදෙස් මාලාවන්ට අනුකූලව වාණිජ බැංකු කටයුතු කරන බවට සහතික වීම සඳහා වාණිජ බැංකු විසින් තැන්පත් කරන නෝට්ටු අහඹු ලෙස පරීක්ෂා කරන ලදී.

(ඈ) තමන් සතු සේවා අනිසි මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් හුවමාරු කර ගැනීමට මහජනතාව දැනුම්වත් කිරීම සඳහා රූපවාහිනී වැඩසටහන්, ගුවන් විදුලි වැඩසටහන්, පෝස්ටර් හා සම්මන්ත්‍රණ මගින් පුළුල් ප්‍රචාරක ව්‍යාපාරයක් ගෙන යන ලදී.

## 5.4 වලංගු මුදල් සම්බන්ධ වැරදි වැළැක්වීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

2012 වසර තුළ දී, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් ව්‍යවහාර මුදල් නෝට්ටු කොටස්වලට වෙන්කිරීම, විකෘති

කිරීම, අනුකරණය (ව්‍යාජ නෝට්ටු සැකසීම ඇතුළුව) ආදී මුදල් භාවිතය පිළිබඳ වැරදි වැළැක්වීම සඳහා විවිධ ක්‍රියාමාර්ග ගනු ලැබීය.

(අ) ව්‍යාජ මුදල් සැකසීමේ ප්‍රයත්නවලට අදාළව පොලීසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ, ව්‍යාජ මුදල් කාර්යාංශය හා නීති ක්‍රියාත්මක කරන නිලධාරීන් සමග සහයෝගයෙන් කටයුතු කරන ලදී. 2012 වසර තුළ දී හඳුනාගත් ව්‍යාජ මුදල් නෝට්ටු ගණන සංසරණයේ පවතින අව්‍යාජ නෝට්ටු මිලියනයකට ව්‍යාජ නෝට්ටු 6 ක් වූ අතර එය 2011 වසරේ හඳුනාගත් ව්‍යාජ නෝට්ටු ප්‍රමාණයට සමානය.

(ආ) ව්‍යාජ මුදල් නෝට්ටු අනුකරණය පිළිබඳව අධිකරණ කටයුතු සඳහා නිසැක සාක්ෂියක් වශයෙන් අධිපතිතුමාගේ අත්සන සහිත සහතික 177 ක් නිකුත් කෙරිණ.

(ඇ) ව්‍යාජ මුදල් සැකසීම පිළිබඳ අධිකරණ නඩු විභාගවල සාක්ෂිකරුවන් වශයෙන් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් 11 ක් පෙනී සිටිනු ලැබීය.

(ඈ) ව්‍යාජ මුදල් නෝට්ටු සංසරණයට එකතුවීම වැළැක්වීම සඳහා ව්‍යාජ මුදල් හඳුනාගත හැකි වන පරිදි ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු ශක්තිමත් කිරීමට සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත චක්‍රලේඛ නිකුත් කරන ලදී.

(ඉ) අවසර දෙනු ලබන කරුණු සඳහා, මුදල් මණ්ඩලය මගින් නියම කරනු ලබන කොන්දේසිවලට යටත්ව, විවිධ පාර්ශ්ව හා පුද්ගලයන් විසින් ශ්‍රී ලංකා ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය පිළිබඳව ප්‍රතිපත්තියක් සකස් කර ඒ සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය ලබා ගන්නා ලදී.

### 5.5 වෙනත් ක්‍රියාකාරකම්

#### (අ) මහජනතාව දැනුම්වත් කිරීම

නව මුදල් නෝට්ටු කාණ්ඩය, ව්‍යවහාර මුදල් නෝට්ටුවල අන්තර්ගත ආරක්ෂණ සළකුණු හඳුනාගැනීම, උසස් ප්‍රමිතියකින් නෝට්ටු භාවිතය හා මුදල් නෝට්ටු හා කාසි භාවිතයේ දී ඇති කර ගත යුතු යහපුරුදු පිළිබඳව මහජන අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව පහත සඳහන් අයුරින් විවිධාකාරයේ දැනුම්වත් කිරීමේ වැඩසටහන් දියත් කරන ලදී.

(i) සම්මන්ත්‍රණ හා වැඩමුළු 26 ක් පැවැත්වීම, ගුවන් විදුලි වැඩසටහන් 6 කට සහභාගිවීම, රූපවාහිනී දැන්වීම් 2 ක් හා මුද්‍රිත මාධ්‍ය ඔස්සේ ප්‍රචාරක දැන්වීම් ගණනාවක් පළ කිරීම සිදු කරන ලදී. බැංකු නිලධාරීන්, මුදල් අයකැමිවරුන්, පොලිස් නිලධාරීන්, පාසල් සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික අංශ සේවකයන් සහ මහජනතාව වෙනුවෙන් මෙම වැඩසටහන් පැවැත්විණ.

(ii) මුදල් කව පිහිටුවා ගෙන ඇති පාසල්වල ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා වැඩසටහන් පවත්වන ලදී.

(iii) 2012 පෙබරවාරි 4 සිට 10 දක්වා අනුරාධපුර පැවති දැයට කිරුළ 2012 ජාතික සංවර්ධන ප්‍රදර්ශනය සඳහා ජංගම මුදල් කෞතුකාගාරය සමග සහභාගි වීම හා වසර පුරා තවත් ප්‍රදර්ශන 4 කට සහභාගිවීමෙන් දායකත්වය ලබා දෙන ලදී.

(iv) නරඹන්නන් 6,893 ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් කෞතුකාගාරය නැරඹීමේ පහසුකම් සපයන ලදී.

#### (ආ) දිස්ත්‍රික්කවල ලක්ෂණ ඇතුළත් වන පරිදි රුපියල් 10 කාසි නිර්මාණය කිරීම

එක් එක් පරිපාලන දිස්ත්‍රික්කවල විශේෂ ලක්ෂණ පිළිබිඹු කිරීම සඳහා රුපියල් 10 කාසි කාණ්ඩයක් නිකුත් කිරීමට සැලසුම් කරන ලදී.

#### (ඇ) කාසි එකතු කිරීමේ වැඩසටහන

ඉල්ලුම සපුරාලීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කාසි නිකුත් කිරීමට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සෑම වසරකම විශාල මුදලක් වැය කරයි. කෙසේ වුවද ආගමික සිද්ධස්ථාන වැනි තැන්වල හා කැටවල කාසි විශාල වශයෙන් සංසරණයට එක් නොවී එකතුවී පවතී. එබැවින් නව කාසි ටංකනය කිරීමේ වියදම අඩු කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සංසරණයට එක් නොවී, එක්රැස් වී ඇති කාසි එකතු කිරීමේ වැඩසටහනක් 2012 වසරේ සිව්වන කාර්තුවේ ආරම්භ කරන ලදී.

## 6. දේශීය කටයුතු

මුදල් නීති පනතේ 5 වන කොටසෙහි, 5 සහ 6 වන පරිච්ඡේද යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවට පැවරී ඇති විධිවිධාන අනුව, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව එහි ප්‍රධාන කාර්යයන් ලෙස විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම, ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය බලාත්මක කිරීම සහ වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු ලෙස කටයුතු කිරීමත් යන ප්‍රධාන කාර්යයන්හි නිරත විය.

එමෙන්ම, දෙපාර්තමේන්තුව තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ගෙවීම් හා පියවීම් කටයුතු සුමට ව පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත දවස තුළ ද්‍රවශීලතා පහසුකම් සපයමින් කාර්යක්ෂම හා ඵලදායී විද්‍යුත් ගෙවීම් හා පියවීම් පද්ධතියක් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සලසයි.

### 6.1 දේශීය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මුදල් මණ්ඩලය මගින් තීරණය කරනු ලබන ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ කෙටිකාලීන පොලී අනුපාතික අපේක්ෂිත මට්ටමක පවත්වාගෙන යාමේ අරමුණින් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විවට වෙළෙඳ කටයුතුවල නිරත වේ. ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් අනුපාත ලෙස හැඳින්වෙන ප්‍රතිපත්ති පොලී අනුපාතික මුදල් මණ්ඩලය විසින් මාසිකව විචරණයට ලක් කරන අතර, ඒ අනුව කෙරෙන සංශෝධන

අනුව තීරණය වන ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව විවට වෙළෙඳ කටයුතු සඳහා පදනම සපයයි. ඉහත සඳහන් කළ ප්‍රතිපත්ති පොලී අනුපාතිකවලට ලබාදෙන නිත්‍ය පහසුකම ද දෛනික පදනම මත ලබාදෙන අතර, මෙය විවට වෙළෙඳ කටයුතු සඳහා පහළ හා ඉහළ පොලී අනුපාතික සීමාවන් තීරණය කරයි. මුදල් මණ්ඩලය මගින් කාලානුරූපීව තීරණය කරනු ලබන, බලපත්‍රලාභී වාණිජ බැංකුවල තැන්පතු වගකීම මත පවත්වා ගත යුතු ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය බලාත්මක කිරීම ද දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

## 6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

සලකා බලනු ලබන කාලපරිච්ඡේදයක් තුළ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරයට ගැලපෙන පරිදි කෙටිකාලීන පොලී අනුපාතික පවත්වා ගෙන යාම සඳහා වෙළෙඳපොළෙහි ඉල්ලුම් සහ සැපයුම් තත්ත්වයන් අනුව ද්‍රවශීලතාවය සැපයීමට හෝ අවශෝෂණය කිරීමට සිදුවේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් විවට වෙළෙඳ කටයුතු සහ නිත්‍ය පහසුකම උපයෝගී කර ගනිමින් දේශීය කටයුතු දෙපාර්තමේන්තුව මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබයි.

2012 වසර, හිඟ වෙළෙඳපොළ ද්‍රවශීලතා තත්ත්වයකින් ආරම්භ වූ අතර එය අතිරික්ත සහ හිඟ තත්ත්වයන් අතර හුවමාරු වීම වසර තුළ නිරතුරුවම අත්දකින ලදී. වසරේ මුල් භාගය තුළ ද්‍රවශීලතා මට්ටම මෙසේ නිරතුරුව උච්චාවචනය වීම කෙටිකාලීන පොලී අනුපාතික, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයේ පැවතීමට මූලිකව ම හේතු විය.

2012 පෙබරවාරි මාසයේ දී ප්‍රතිපත්ති පොලී අනුපාතික ඉහළ දැමීමට අමතරව වෙළෙඳපොළ සහභාගිත්වය ඉහළ දැමීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන දිනයන්හි දී සහභාගිත්ව ආයතනයක් සඳහා ප්‍රතිමිලදී ගැනුම් නිත්‍ය පහසුකම ලබාගැනීමේ උපරිම සීමාව රුපියල් මිලියන 100 කිරීමේ චක්‍රලේඛනය නැවත බලාත්මක කරන ලදී. ප්‍රතිමිලදී ගැනීමේ නිත්‍ය පහසුකම සීමා කිරීමෙන් අතිරික්ත බැංකු වෙළෙඳපොළ තුළ ණය දීමට පෙළඹවීම ඒ වන තෙක් පැවති ද්‍රවශීලතාව මත වූ පීඩනය පාලනය කිරීමට උපකාරී විය. වෙළෙඳපොළ තත්ත්වයන් වෙනස්වන අවස්ථාවල ඒ පිළිබඳව වෙළෙඳපොළ සහභාගිත්ව ආයතන වෙත සන්නිවේදනය කිරීම සඳහා සුදුසු පරිදි ශිෂ්ට ප්‍රයෝග භාවිතා කිරීම සිදුවිය. ඒ අනුව අතිරික්ත අරමුදල් ශ්‍රී ලංකා මහ බැංකුවේ තැන්පත් කිරීමට පෙර සහභාගිත්ව ආයතන එකිනෙක අතර සිදුකළ ගනුදෙනුවල වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

රජය ස්වෛරීත්ව බැඳුම්කර ලැබීම්වලින් කොටසක් රුපියල්වලට මාරු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අන්තර් බැංකු වෙළෙඳපොළ තුළ 2012 වසරේ දක්නට ලැබූ විශාලතම ද්‍රවශීලතා අගය වූ රුපියල් බිලියන 58.8 ජූලි මාසයේ දී වාර්තා විය. ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් අලෙවි කිරීම, රජයේ විදේශ ණය පියවීම සහ වාණිජ බැංකු සමග පැවති විදේශ විනිමය හුවමාරු (මිලදී ගැනුම් - විකුණුම්) ගනුදෙනු කෙටි කාලපරිච්ඡේදයක් තුළ දී පරිණත වීම මගින් ප්‍රධාන වශයෙන් අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගන්නා ලදී.

2012 වසරේ අවසාන කාර්තුව තුළ දී වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නැවතත් හිඟ තත්ත්වයක් පෙන්නුම් කරන ලදී. කාලීන මුදල් ඉල්ලුම හේතුකොට ගෙන දේශීය වෙළෙඳපොළ තුළ ද්‍රවශීලතා හිඟය උග්‍ර වුවත්, 2012 වසරේ හතර වන කාර්තුව තුළ කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පැවැත්වීමෙන් ද්‍රවශීලතා හිඟය පියවීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකි විය.

මුදල් ප්‍රතිපත්ති ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට පහසුකම් සලසමින් සක්‍රිය මෙන්ම අකර්මන්‍ය උපකරණ භාවිතා කරමින් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය කළමනාකරණය කිරීමට දෙපාර්තමේන්තුවට හැකි වූ අතර, බදු ගලපන ලද එක් දින අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළ පොලී අනුපාතිකය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ පවත්වාගෙන යන ලදී. අප්‍රේල් මාසයේ දින කිහිපයක හැර අන්තර් බැංකු එක් දින බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ මුදල් පොලී අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවට ඉහළින් පැවතුණි. එනමුත් සාමාන්‍යයෙන්, බදු ගැලපූ බර තබන ලද ඒක්ෂණ මුදල් පොලී අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාවට ආසන්නව කොරිඩෝව තුළ පැවතුණි. වසරේ මුල භාගයේ දී ද කෙටි කාලීන පොලී අනුපාතිකය විචලනය වුවද 2012 වසරේ දෙවන භාගය තුළ නිරතුරුවම සිදු කළ විවට වෙළෙඳපොළ කටයුතුවලට හා ප්‍රතිපත්ති උපාය මාර්ගවලට ප්‍රතිචාර දක්වමින් ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව ආසන්නයේ ස්ථාවරව පැවතුණි. 2012 වසරේ දෙසැම්බර් මස සිදුකළ ප්‍රතිපත්ති පොලී අනුපාතික පහත දැමීමේ සංශෝධනයත් සමග බර තබන ලද සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය, ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව මධ්‍යයට ගමන් කරන ලදී.

### (අ) විවට වෙළෙඳපොළ කටයුතු

#### (i) එක්දින ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු

ප්‍රධාන වශයෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුව සතු භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීමේ පදනම මත විකිණීම සඳහා දෛනිකව වෙන්දේසි පැවැත්වීම මගින් බැංකු පද්ධතිය තුළ පැවති අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගන්නා ලදී. සාමාන්‍ය වශයෙන් දිනකට රුපියල් බිලියන 16 ක් පමණ වෙන්දේසි සඳහා පිරිනමන ලද අතර, වෙන්දේසියේ දී පිළිගත් ප්‍රමාණය අතිරික්ත ද්‍රවශීලතාවයක් පැවති දිනයන්හි සත්‍ය වශයෙන් පැවති ද්‍රවශීලතාවයෙන් සියයට 51 ක් පමණ විය. එක්දින ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසිවල බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතය (රූප සටහන් II-1) සියයට 8.10 සහ සියයට 9.50 අතර පැවතුණි. ස්ථායී වෙළෙඳපොළ තත්ත්වයන් පෙන්නුම් කරමින් බර තබන ලද සාමාන්‍ය ඵලදා අනුපාතය ප්‍රතිපත්ති පොලී අනුපාතික කොරිඩෝව තුළ හැසුරුණි.

#### (ii) එක්දින ප්‍රතිවිකුණුම් ගනුදෙනු

2012 වසර තුළ දී, වෙළෙඳපොළ ද්‍රවශීලතාවය අඛණ්ඩව හිඟ හා අතිරික්ත තත්ත්වයන් අතර දෝලනය වූ අතර මෙම තත්ත්වය එක්දින පොලී අනුපාත ඉහළ යාමේ පීඩනයක් ඇති කරවිය. එම නිසා ඉහත සඳහන් කළ පොලී අනුපාත මත වූ ඉහළ යාමේ පීඩනය සමනය කිරීම සඳහා, යෝග්‍ය අවස්ථාවන්හි දී වසර තුළ දී නොකඩවා ප්‍රතිවිකුණුම් වෙන්දේසි සිදු කරන ලදී.

**II-1 රූප සටහන** **විවට වෙළෙඳපොළ කටයුතු යටතේ ප්‍රතිමිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් වෙන්දේසි - 2012 (මාසික බර තබන ලද සාමාන්‍ය ප්‍රතිමිලදී ගැනුම් / ප්‍රතිවිකුණුම් අනුපාත)**




සාමාන්‍ය වශයෙන්, දිනකට රුපියල් බිලියන 7.4 ක් වෙන්දේසි සඳහා පිරිනමන ලද අතර, බර තබන ලද සාමාන්‍ය එළඳා අනුපාතය සියයට 7.90 සහ සියයට 9.70 අතර පැවතුණි (රූප සටහන් II-1). තවද, වෙළෙඳපොළ ද්‍රවශීලතා හිඟයක් පැවති දිනයන්හි දී, වෙළෙඳපොළ ද්‍රවශීලතා අවශ්‍යතාවයෙන් සියයට 53 ක් සපයනු ලැබුවේ එක්දින ප්‍රතිවිකුණුම් වෙන්දේසි තුළිණි.

**(ආ) කාලීන ගනුදෙනු**

(i) කාලීන ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු

ශ්‍රී ලංකා මහ බැංකුව වසර තුළ පවත්වන ලද කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසිවලින් රුපියල් බිලියන 8.7 ක් වටිනා අතිරික්ත ද්‍රවශීලතාවයක් අවශෝෂණය කර ගන්නා ලදී. කාලීන ප්‍රතිමිලදී ගැනුම් වෙන්දේසිවල කල්පිරීමේ කාලය දින 7 ත් දින 14 ත් අතර විය. වසර තුළ සාමාන්‍ය එළඳා අනුපාතිකය සියයට 8.80 ත් 9.50 ත් අතර පැවතුණි.

(ii) කාලීන ප්‍රතිවිකුණුම් ගනුදෙනු

2012 වසර තුළ දී, වෙළෙඳපොළට දිගුකාලීනව ද්‍රවශීලතාවය සැපයීමේ උපාය මාර්ගයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර මිලදී ගැනීම සඳහා කාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. එම වෙන්දේසිවල කල්පිරීමේ කාලය දින 7 ත් 31 ත් අතර පරාසයක වෙනස් වූ අතර බර තබන ලද සාමාන්‍ය එළඳා අනුපාතිකය සියයට 9.60 ත් 10.30 ත් අතර පැවතුණි. වසර තුළ දී මෙම වෙන්දේසි මගින් සපයන ලද ද්‍රවශීලතා වටිනාකම රුපියල් බිලියන 51 ක් විය.

**(ඇ) නිත්‍ය පහසුකම**

අන්තර් බැංකු මුදල් වෙළෙඳපොළෙන් සහ විවට වෙළෙඳ කටයුතු යටතේ දෛනික වෙන්දේසි තුළින් සිය කෙටිකාලීන අරමුදල් අවශ්‍යතාවන් කළමනාකරණය කර ගැනීමට අපොහොසත් වූ සහභාගිත්ව ආයතන සඳහා මහ බැංකු ප්‍රතිමිලදී ගැනීම් හා ප්‍රතිවිකුණුම් අනුපාතික යටතේ නිත්‍ය පහසුකම් සැපයීම වසර පුරාම සිදු කරන ලදී. ප්‍රතිමිලදී ගැනුම් ගනුදෙනු යටතේ 2012 වසර තුළ තැන්පත් කරන ලද නිත්‍ය පහසුකම්වල දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 5 ක් ද මුළු වටිනාකම රුපියල් බිලියන 1,314 ක් ද ලෙස වාර්තා විය. මෙම වසරේ නිත්‍ය පහසුකම් යටතේ සිදුකළ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 321 ක් විය.

**(ඈ) ස්ථිර පදනමක් මත වූ ගනුදෙනු**

ස්ථිර පදනමක් මත අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ආයෝජන කළඹ සතු භාණ්ඩාගාර බිල්පත් අලෙවිය සඳහා වෙන්දේසි පවත්වනු ලැබීය. 2012 වසරේ දී පවත්වන ලද මෙම වෙන්දේසි තුළින් අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල වටිනාකම රුපියල් බිලියන 18.5 ක් විය. මෙම අලෙවි කරන ලද භාණ්ඩාගාර බිල්පත්වල කල්පිරීමේ කාලය දින 10 සිට දින 39 දක්වා පරාසයක පැවැති අතර එළඳා අනුපාතිකය සියයට 10.69 ත් 10.98 ත් අතර විය.

**(ඉ) ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාව**

ශ්‍රී ලංකා මහ බැංකුවේ රෙගුලාසිවලට අනුකූලව සෑම වාණිජ බැංකුවක්ම තම තැන්පතු වගකීම් පදනම් කර ගෙන මහ බැංකු ජංගම ගිණුමේ අනිවාර්යයෙන් පවත්වාගෙන යායුතු අවම සංචිත ප්‍රමාණය ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතාවය ලෙස හඳුන්වයි. වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත පවත්වාගෙන යාම සහ එම ගිණුම් පරිපාලනය කිරීමේ වගකීම දේශීය කටයුතු දෙපාර්තමේන්තුව සතු වේ. වසර තුළ එම අගය තැන්පතු වගකීම්වලින් සියයට 8 ක් වශයෙන් පැවතිණි.

**(ඊ) බැංකු අනුපාතිකය**

මුදල් නීති පනතේ 87 වන වගන්තිය යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවලට සපයනු ලබන කෙටිකාලීන අත්තිකාරම් මත වූ මහ බැංකු පොලී අනුපාතිකය සියයට 15 ක් ලෙස නොවෙනස්ව පැවතිණි. කෙසේ වුවද මෙම පොලී අනුපාතිකය යටතේ වාණිජ බැංකු විසින් මහ බැංකුවෙන් ණය ලබාගැනීමේ අවශ්‍යතාවයක් මෙම වසර තුළ ඇති නොවුණු නිසා මෙම බැංකු අනුපාතිකය අධ්‍යයන කරුණක් වශයෙන් පමණක් වැදගත් විය.

## 6.3 වාණිජ බැංකුවල හා රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය

**(අ) මූල්‍ය ආයතනවල ගිණුම්**

මහ බැංකුවට වාණිජ බැංකුවල බැංකුකරු ලෙස ක්‍රියාත්මක වීමට අවශ්‍ය පහසුකම් සලස්වමින් කාර්යක්ෂම අන්තර් බැංකු ගෙවීම් හා පියවීම් පද්ධතියක් සහතික කරනු පිණිස දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් වාණිජ බැංකු සහ ප්‍රාථමික වෙළෙඳුන් වෙත ජංගම ගිණුම් පහසුකම සපයන ලදී. 2012 වසර අවසාන වන විට මහ බැංකුව මගින් වාණිජ බැංකු සඳහා ගිණුම් 24 ක් ද ප්‍රාථමික වෙළෙඳුන් සඳහා ගිණුම් 10 ක් ද පවත්වාගෙන යන ලදී. මෙම ගිණුම් ස්වයංක්‍රීය පොදු ලෙජර් පද්ධතිය තුළ තත්කාලීන දළ පියවුම් පදනමක් මත ක්‍රියාත්මක විය.

**(ආ) රජයේ ගිණුම්**

රජයේ බැංකුකරු වශයෙන් රජයට අවශ්‍ය බැංකු පහසුකම් ලබාදෙමින්, දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින්, රජයේ දෙපාර්තමේන්තු, රජයේ නියෝජිත ආයතන හා සංස්ථා සහ ඇතැම් ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා අවශ්‍ය ගිණුම් පවත්වාගෙන යන ලදී. 2012 වසර අවසානය වන විට, මහ බැංකුව විසින් පවත්වාගෙන යනු ලැබූ මුළු ගිණුම් සංඛ්‍යාව 56 ක් විය. මුදල් නීති පනතේ 89 වැනි කාණ්ඩය ප්‍රකාරව මහ බැංකුව විසින් රජයට පොලී රහිතව අත්තිකාරම් ලබාදුන් අතර මෙකී අත්තිකාරම් රජයේ ඉදිරි වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 ක් නොඉක්මවිය යුතුය. රජයේ ඇස්තමේන්තුගත ආදායම ඉහළ යාම හේතුවෙන්, 2012 වර්ෂය තුළ රජයට සපයන ලද තාවකාලික අත්තිකාරම්වල වටිනාකම රුපියල් බිලියන 5.1 කින් ඉහළ ගිය අතර ඒ අනුව මේ දක්වා සපයා ඇති මුළු අත්තිකාරම්වල වටිනාකම රුපියල් බිලියන 113 ක් විය.

### 6.4 දිනය තුළ ද්‍රවශීලතා පහසුකම් සැපයීම

තත්කාලීන දළ පියවුම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව සිදුකිරීම සහතික කිරීමට දේශීය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සහභාගිත්ව ආයතන වෙත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සපයන ලදී. රජයේ භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සුරැකුම් ලෙස තබාගනිමින් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම, ගාස්තුවකින් තොරව සිදුකළ අතර, එකී සුරැකුම්පත්වල වටිනාකම, ඒවායේ වර්තමාන මිල ගණන් මත, එම දිනය තුළ සිදුවිය හැකි මිල උච්චාවචනයන් ආවරණය කරගත හැකි පරිදි ප්‍රමාණවත් ගැලපීමක් සහිතව ගණනය කරන ලදී.

වසර තුළ ලබාගත් එක්දින ද්‍රවශීලතා පහසුකම් ප්‍රමාණය සහ දෛනික වටිනාකමේ සාමාන්‍යය පිළිවෙළින් රුපියල් බිලියන 3,692 ක් සහ රුපියල් බිලියන 15 ක් විය. පසුගිය වසරේ මෙම අගයන් පිළිවෙළින් රුපියල් බිලියන 2,781 ක් සහ රුපියල් බිලියන 12 ක් වූ අතර, මේ වසරේ එක්දින ද්‍රවශීලතා පහසුකම ප්‍රයෝජනයට ගැනීම පසුගිය වසරට වඩා වර්ධනයක් පෙන්නුම් කෙරුණි.

**II-2 රූප සටහන** **2012 වසරේ දිනය තුළ ලබාගත් ද්‍රවශීලතා පහසුකම්**




## 7. ආර්ථික පර්යේෂණ

මුදල් නීති පනත අනුව 1949 දී මහ බැංකුව ස්ථාපිත කිරීම හා සමගාමීව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. ඒ අනුව, මුදල් හා බැංකු සහ අනෙකුත් පොදු ආර්ථික විෂය කරුණු සම්බන්ධයෙන් ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් මණ්ඩලයට සහ අධිපතිට උපකාරී වීම පිණිස සහ මහජනතාවට තොරතුරු ලබාදීම සඳහා දත්ත සකස් කිරීම සහ ආර්ථික පර්යේෂණ සිදුකිරීම යන කාර්යයන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට අයත් ප්‍රධාන කාර්යභාරයන් වේ. මෙම වගකීම් ඉටු කිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකට හෝ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ඕනෑම නිලධාරියෙකුට අවශ්‍ය යැයි හැඟෙන තොරතුරු ඕනෑම පුද්ගලයෙකුගෙන් ලබාගැනීමේ හැකියාව සහ එවැනි තොරතුරු අඩංගු වන හෝ අඩංගු විය හැකි පොත් හෝ වෙනයම් වාර්තාවන් වෙතොත් ඒවා නිරීක්ෂණය කිරීම සඳහා ඕනෑම පුද්ගලයෙකුගෙන් ලබාගැනීමට අවශ්‍ය අධිකාරිමය බලතල මුදල් නීති පනත මගින් ඔවුන් වෙත ලබා දී තිබේ. සාධාරණ හේතුවක් මත හැර අදාළ දත්ත ලබාදීමට නොහැකි වීම හෝ ලබාදීම ප්‍රතික්ෂේප කරනු ලබන ඕනෑම පුද්ගලයකු නීති විරෝධී ක්‍රියාවකට වරදකරුවකු වනු ඇත.

මුදල් මණ්ඩලයට, කළමනාකාරිත්වයට සහ මුදල් ප්‍රතිපත්ති කමිටුව ඇතුළුව එය නියෝජනය කරනු ලබන අනෙකුත් කමිටු වෙත ඵලදායී ලෙස සහ කාලීනව ප්‍රතිපත්ති නිර්දේශයන් ලබාදීම මගින් රටෙහි තිරසාර සංවර්ධනයක් ඇති කරලීමට ආර්ථික හා මිල ස්ථායීතාවය පවත්වා ගැනීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් එහි සමස්ත කාර්යභාරය නොපිරිහෙලා ඉටුකරනු ලැබීය. එවැනි කටයුතු ඉටු කිරීමේ දී දෙපාර්තමේන්තුව විසින් මුදල් හා බැංකු සහ පොදුවේ වැදගත් වන අනෙකුත් ආර්ථික විෂයයන් පිළිබඳව විස්තරාත්මක ආර්ථික පර්යේෂණයන් සිදු කරනු ලබන අතර, ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග විධිමත් අයුරින් සම්පාදනය කිරීම සහ ක්‍රියාත්මක කිරීමේ දී මුදල් මණ්ඩලයට සහ අධිපතිට මගපෙන්වීම සඳහා අවශ්‍ය වන දත්ත සහ තොරතුරු ලබාදීම ද සිදු කරනු ලබයි. රජයේ ආර්ථික උපදේශකයා ලෙස මහ බැංකුව විසින් සිදුකළ යුතු කාර්යය ඉටු කිරීමෙහිලා, ආර්ථිකයේ ඇතිවන ගැටලු සම්බන්ධයෙන් සහ සාර්ව ආර්ථික ස්ථායීතාවය පවත්වාගෙන යාමට අවශ්‍යයෙන්ම ගත යුතු රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සහ දැනට අනුගමනය කරනු ලබන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති සාර්ව ආර්ථිකය කෙරෙහි බලපාන ආකාරය සම්බන්ධයෙන් කාලීන වශයෙන් සුදුසු ප්‍රතිපත්තිමය උපදෙස් සහ නිර්දේශයන් ඉදිරිපත් කිරීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තවද, ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ අනෙකුත් ප්‍රකාශන නිරන්තරයෙන් ප්‍රකාශයට පත් කිරීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. මීට අමතරව, නවතම දත්ත සහ තොරතුරු ලබාදීමේ ක්‍රියාවලියෙහි නිරත වෙමින් පුවත්පත් නිවේදන සහ මහ බැංකු වෙබ් අඩවිය නිරන්තරයෙන්ම යාවත්කාලීන කිරීම තුළින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති හා අනෙකුත් ආර්ථික තොරතුරු මහජනතාවට

සහ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වනු ලබන අනෙකුත් පාර්ශ්වයන් වෙත ලබාදෙන ලදී. ව්‍යවස්ථාපිත වගකීම් හැරුණු විට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් රජයේ ප්‍රතිපත්ති උපදේශක කමිටුවලට සහභාගි වූ අතර, දේශීය සහ ජාත්‍යන්තර සමුළුවල දී නිරන්තරයෙන්ම මහ බැංකුව නියෝජනය කරන ලදී. තවද, දේශීය සහ ජාත්‍යන්තර වශයෙන් සිදු කරනු ලබන දැනුම වර්ධනය සඳහා වන වැඩසටහන් සඳහා සම්පත්දායකයින් ලබාදීම ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

## 7.1 මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට සහයවීම සඳහා පර්යේෂණ සිදු කිරීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති කමිටුවේ මාසික රැස්වීම් සඳහා මෙන්ම මුදල් මණ්ඩලයට නිරන්තරයෙන් ආර්ථික හා මුදල් විශ්ලේෂණ ඇතුළත් විස්තීරණ වාර්තා සැකසීම තවදුරටත් අඛණ්ඩව සිදුකරන ලදී. මුදල් මණ්ඩලය වෙත ලබාදෙන මුදල් ප්‍රතිපත්ති නිර්දේශයන් සඳහා උපකාරී වීමට ආර්ථිකයේ තත්ත්වය නිසි ලෙස පිළිබිඹු වන පරිදි ගෝලීය ආර්ථිකයේ වර්ධනයන් සහ එමගින් දේශීය ආර්ථිකය මත ඇතිවන බලපෑම, ඉල්ලුම් හා සැපයුම් අංශයන්හි විශ්ලේෂණ ඇතුළු උද්ධමනයෙහි වර්ධනයන් මෙන්ම ඉදිරි උද්ධමනය පිළිබඳ පුරෝකථන, සාර්ව ආර්ථිකයේ ප්‍රධාන අංශවල වර්ධනයන් හා පවතින ගැටලු මෙන්ම ප්‍රාග්ධන හා මූල්‍ය වෙළෙඳපොළ වර්ධනයන් පිළිබඳව විශ්ලේෂණය කර ආර්ථික තත්ත්වය පිළිබඳ වාර්තා මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත නිරතුරුව ලබාදෙන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා දියත් කරන ලද ආර්ථිකමිතික ආකෘතිකකරණ රාමුව අඛණ්ඩව ක්‍රියාත්මක විය. මේ අතර, නිමැවුම් පරතර විශ්ලේෂණ කටයුතු ආරම්භ කළ අතර, නිමැවුම් පරතරය සඳහා විකල්ප මිනුම් ඇස්තමේන්තු කරන ලදී. කාලීන සහ නිවැරදි මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමට සහය වීම සඳහා මෙහි මූලික සොයාගැනීම් මුදල් ප්‍රතිපත්ති කමිටුවට ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් අතර පර්යේෂණ සංස්කෘතියක් ඇති කිරීම සඳහා ඔවුන් තවදුරටත් ධෛර්යමත් කිරීම සඳහා සහ අවශ්‍ය පහසුකම් සැපයීම සඳහා සාර්ව ආර්ථික ආකෘතිකකරණ ඒකකය 2012 සිව්වැනි කාර්තුවේ දී පිහිටුවන ලදී. සාර්ව ආර්ථික ආකෘතිකකරණ ඒකකය සඳහා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් අනුයුක්ත කිරීම සඳහා ද කැඳවීම් කර ඇති අතර, එම අංශයට අනුයුක්ත කළ නිලධාරීන්ගෙන් ප්‍රකාශයට පත්කළ හැකි තත්ත්වයෙන් යුත් පර්යේෂණ පත්‍රිකාවන් සම්පූර්ණ කිරීම අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාමාර්ග තුළින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලයට සාක්ෂි මත පදනම් වූ ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීමේ හැකියාව ශක්තිමත් කරනු ඇති අතර, මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන පර්යේෂණ පත්‍රිකාවල ගුණාත්මකභාවය ඉහළ නංවනු ඇත.

2012 වසරේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව එහි ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව නොකඩවා පස්වන වරටත් සාර්ථකව නිම කරන ලදී. ජාත්‍යන්තර පර්යේෂණ සමුළුව මගින් ශ්‍රී ලංකාවේ මෙන්ම විදේශීය පර්යේෂකයන් හට විශේෂයෙන්ම කලාපය තුළ පර්යේෂකයන් හට ඔවුන් විසින් සිදු කරන ලද න්‍යායාත්මක සහ ප්‍රායෝගික පර්යේෂණයන් ඉදිරිපත් කිරීමට සහ සාකච්ඡා කිරීමට අවස්ථාව ලැබුණි. ක්‍රමවත් තෝරා ගැනීමේ පටිපාටියකින් අනතුරුව, සමුළුව සඳහා ලැබුණු පර්යේෂණ පත්‍රිකා 48 ක් අතුරින් තෝරාගත් පත්‍රිකා 8 ක් සමුළුවේ දී ඉදිරිපත් කරන ලදී. බංගලාදේශය, ජර්මනිය, ඉන්දියාව, පකිස්ථානය හා ශ්‍රී ලංකාව යන රටවල පර්යේෂකයෝ ඔවුන්ගේ පර්යේෂණ තුළින් අනාවරණය වූ කරුණු ජාත්‍යන්තර පර්යේෂණ සමුළුවේ දී ඉදිරිපත් කළහ.

තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනයේ (SEACEN) පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වැනි ජාත්‍යන්තර සංවිධාන, අභ්‍යන්තර පර්යේෂණ කණ්ඩායම් සහ පශ්චාත් උපාධි කාර්යයන්හි දී ඔවුන්ගේ පර්යේෂණ උපදේශකවරුන්ව සිටි අය සමග ඒකාබද්ධ පර්යේෂණ වැඩසටහන්, අඛණ්ඩවම පවත්වාගෙන යන ලදී.

2012 වසරේ දී වර්තමාන ආර්ථික තත්ත්වයන් ආවරණය වන පරිදි සම්මන්ත්‍රණ 20 ක් දෙපාර්තමේන්තුව තුළ සම්මන්ත්‍රණ මාලාව මගින් පැවැත් වූ අතර, එමගින් නිලධාරීන් අතර දැනුම බෙදා ගැනීමට අවස්ථාවක් සලසා දෙන ලදී. තවදුරටත්, ආර්ථිකයේ මතුවන ගැටලු පිළිබඳ සාකච්ඡා කිරීමට සහ ඒවා පිළිබඳ තොරතුරු සෘජුවම දැනගැනීමට මහ බැංකුවට ඉඩ සලසා දෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් හෝ විවිධ අංශයන්හි නියුතු වෘත්තීයවේදීන්ට ආරාධනා කරමින් විශේෂ සම්මන්ත්‍රණ කිහිපයක්ම සංවිධානය කරන ලදී.

2010/2011 ජාතික ආනයන තීරුබදු මාර්ගෝපදේශයට අනුව නව වෙළෙඳ දත්ත වර්ගීකරණ ක්‍රමය හඳුන්වාදුන් අතර, 2010 පදනම් වර්ෂය ලෙස සලකා නව වෙළෙඳ දර්ශකය සම්පාදනය කිරීම සම්පූර්ණ කොට 2011 වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත්කරන ලදී. කාර්මික අංශයේ සිදුවන ව්‍යුහමය වෙනස්කම් සම්පූර්ණයෙන්ම පෙන්නුම් කිරීම සඳහා මාසික කාර්මික නිෂ්පාදන පරිමා දර්ශකය දැනට පවතින කාර්මික වර්ගීකරණය මත වූ අන්තර්ජාතික ප්‍රමිතීන් II වන සංශෝධනයේ සිට වඩාත් පුළුල්, කාර්මික වර්ගීකරණය මත වූ අන්තර්ජාතික ප්‍රමිතීන්ගේ IV වන සංශෝධනය සම්පූර්ණ කරන ලදී. එසේම, කෘෂි නිෂ්පාදන දර්ශකයේ පදනම් කාලය 1997 - 2000 සිට 2007 - 2010 ලෙස සංශෝධනය කරන ලදී.

වසර තුළ දී, මුදල් සමීක්ෂණය සම්පාදනය කිරීමේ දී අන්තර් ජාතික මූල්‍ය අරමුදලේ මුදල් සංඛ්‍යාලේඛන ප්‍රමිතීන්ට (Monetary Statistics Standards) අනුකූලව මුදල් සමීක්ෂණය සිදුකිරීමටත්, ගෙවුම් තුලන සංඛ්‍යාලේඛන සකස් කිරීමේ දී දැනට පවතින ගෙවුම් තුලන අත්පොත 5 (BPM 5) සිට ගෙවුම්

තුලන අත්පොත 6 (BPM 6) දක්වා මාරුවීම සඳහාත් අවශ්‍ය කටයුතු ආරම්භ කරන ලදී.

පෞද්ගලික අංශයේ අදහස් ලබාගැනීම තුළින් මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා පිහිටුවන ලද මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුවට 2012 දී නව සාමාජිකයන් දෙදෙනෙකු එනම්, මොහාන් පණ්ඩිතගේ මහතා සහ ආචාර්ය ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා ඇතුළත් කර ගනිමින් තවදුරටත් එම කමිටුවේ කටයුතු ශක්තිමත් කරන ලදී. දැනට මුදල් ප්‍රතිපත්ති උපදේශක කමිටුව සාමාජිකයන් 10 දෙනෙකුගෙන් සමන්විත වන අතර, මහෙන් දයානන්ද මහතාගේ සභාපතිත්වයෙන් යුතුව මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව ක්‍රියාත්මක වේ.

### 7.2 ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් වාර්තා/ ප්‍රකාශන සකස් කිරීම

මුදල් නීති පනතේ අවශ්‍යතා අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් අනෙකුත් දෙපාර්තමේන්තුවල ද සහාය ඇතිව 2011 වසර සඳහා මහ බැංකු වාර්ෂික වාර්තාව සකස් කරන ලද අතර, නියමිත කාලය තුළ දී එය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව මෑත කාලීන ආර්ථික ප්‍රවණතා - 2012 සුවිශේෂ සිදුවීම් හා 2013 අපේක්ෂාවන් සහ මාසික විවරණිකාව යන වාර්තා ද ප්‍රකාශයට පත් කරන ලදී. මුදල් නීති පනතේ අංක 116 (1) වගන්තිය යටතේ 2012 වසරේ පළමු මාස හය තුළ දී ආර්ථිකයේ ක්‍රියාකාරිත්වය පිළිබඳව සහ 2012 වසරේ ආර්ථිකය කෙබඳු විය හැකි ද යන්න පිළිබඳ විග්‍රහයක් මෙන්ම මහ බැංකුව සිය මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමේ දී සහ එහි මිල ස්ථායීතාවය පවත්වාගැනීම යන අරමුණට රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිවලින් වන බලපෑම සහ 2013 වසරේ රජයේ අයවැය සකස් කිරීම සඳහා උපයෝගී කරගැනීමට හැකිවන පරිදි ප්‍රතිපත්ති යෝජනා මාලාවක් ද ඇතුළත් කරමින් සකසන ලද සැප්තැම්බර් 15 වාර්තාව ද මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

තවදුරටත්, මෑතකාලීන ආර්ථික ප්‍රවණතා සන්නිවේදනය කිරීම සඳහා සහ මුදල් ප්‍රතිපත්ති කටයුතුවල විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා මුදල් ප්‍රතිපත්තිය හා විදේශ අංශයේ ක්‍රියාකාරිත්වය යන අංශයන් සඳහා පුවත්පත් නිවේදන 12 බැගින් නිකුත් කරන ලදී. මෙම පුවත්පත් නිවේදන සහ අනෙකුත් විශේෂිත දැන්වීම් මගින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මුදල් ප්‍රතිපත්තියේ වෙනස්වීම් හා සංඛ්‍යා ලේඛන, ගෙවුම් ශේෂය හා අන්තර්ජාතික වෙළෙඳාම සහ සෙසු වැදගත් ආර්ථික තොරතුරු අඛණ්ඩව ක්‍රමානුකූල පදනමක් මත මහජනයා වෙත ලබාදෙන ලදී.

මහ බැංකුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය වන 2012 වසර සහ ඉදිරිය සඳහා මුදල් සහ මූල්‍ය අංශයේ ප්‍රතිපත්ති පෙර දැක්ම සකස් කර, මහජනයා වෙත 2012 ජනවාරි මස 3 දින ප්‍රකාශයට පත් කරන ලදී. පෙර දැක්මෙහි පරමාර්ථය වූයේ ඉදිරි කාලපරිච්ඡේදය සඳහා පාර්ශ්වකරුවන්ට සිය සැලසුම් හා උපායමාර්ග නිර්මාණය කරගැනීමට සහ සංශෝධනය කර ගැනීමට උපකාරී වන පරිදි මහ බැංකුවේ ප්‍රතිපත්තිවල පුරෝකථන හැකියාව සහ විනිවිදභාවය වැඩිදියුණු කිරීමයි. 2012 වසර අවසානයේ දී මේ හා සමාන ප්‍රකාශනයක් 2013 වසර සහ ඉදිරිය සඳහා සකස් කළ අතර, 2013 ජනවාරි මස දෙවැනි දින එය ප්‍රකාශයට පත් කරන ලදී.

පෙර වසරවල දී මෙන් 2012 වසරේ දී ද, ආර්ථික සහ මූල්‍යමය වැදගත්කමක් තිබූ අමාත්‍ය මණ්ඩල පත්‍රිකා 68 කට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය ස්වාධීන අදහස් සහ නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. තවද රාජ්‍ය අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන විසින් මහ බැංකුව වෙත යොමු කරන ලද විවිධාකාර ගැටලු සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය අදහස් සහ නිරීක්ෂණයන් ලබාදෙන ලදී. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, රජය සහ රජයේ නියෝජිතායතන මගින් ලබාගත් විදේශ ණයවල මූල්‍යමය බලපෑම පිළිබඳව අඛණ්ඩ ලෙස ඇගයීමට ලක් කළ අතර මුදල් මණ්ඩලය සඳහා නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ජාතික වශයෙන් වැදගත්කමක් ඇති ප්‍රධාන ව්‍යාපෘතියකට දායක වෙමින්, උගත් පාඩම් සහ සංහිඳියා කොමිසමෙහි වාර්තාව දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් තෝරා ගන්නා ලද දෙපාර්තමේන්තුවල කාර්යමණ්ඩලවලද සහාය ඇතිව සිංහලට පරිවර්තනය කරන ලදී.

### 7.3 දැනුම වර්ධනය කිරීම සඳහා දායක වීම සහ විශේෂඥ දැනුම ලබාදීම

දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ දැනුම වර්ධනය කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ විශේෂඥ දැනුම සැපයීම නොකඩවා සිදු කරන ලදී. විශ්ව විද්‍යාල, බැංකු අධ්‍යයන කේන්ද්‍රය, ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය, පාසල් සහ වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතන විසින් සංවිධානය කරන ලද විවිධ අධ්‍යාපනික වැඩසටහන් සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සම්පත් දායකත්වය සපයන ලදී. මහ බැංකුවට පැමිණෙන දේශීය සහ විදේශීය දූත මණ්ඩල සඳහා මහ බැංකුකරණය සහ සාර්ව ආර්ථික සංවර්ධනයන් පිළිබඳ දේශන පැවැත්වීම සඳහා දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සපයන ලදී. මීට අමතර, දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කරන ලද පර්යේෂණ පත්‍රිකා ඇගයීම මෙන්ම ඔවුන්ගේ පර්යේෂණ යෝජනා හා පර්යේෂණ පත්‍රිකා පිළියෙළ කිරීම සඳහාත් නිරතුරුව සහාය වන ලදී.

බැංකුවේ සහ බැංකුවෙන් පිටත විවිධ කමිටු සහ මණ්ඩල සඳහා දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ සේවය ලබාදෙන ලදී. පොහොර සඳහා වාණිජ මිල තීරණය කිරීම, උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ කළමනාකරණ කමිටුව, ශ්‍රී ලංකා කෘෂිකර්ම පර්යේෂණ හා ප්‍රතිපත්ති පිළිබඳ කවුන්සිලයේ සමාජ ආර්ථික හා ප්‍රතිපත්ති පර්යේෂණ ජාතික කමිටුව, 2011 වසරේ ශ්‍රී ලංකාවේ කම්කරු හා සමාජ නැඹුරුව විශ්ලේෂණය පිළිබඳ කමිටුව, සෞඛ්‍ය සේවා මූල්‍යනය පිළිබඳ නියාමන කමිටුව,

සෞඛ්‍ය ගිණුම් පිළිබඳ නියාමන කමිටුව, රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයේ වතු අටක් ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳ කමිටුව රජය මගින් සලකා බලනු ලැබූ ආර්ථික කේන්ද්‍රස්ථාන පහට (දැනුම, වෙළෙඳ, නාවුක, ගුවන්, බලශක්ති) අදාළ ආයතන ගොඩනැංවීමේ හා ක්‍රියාවට නැංවීමේ කටයුතු සඳහා පත්කළ කමිටුව, ගෝලීය ව්‍යාපාර මධ්‍යස්ථානය පිහිටුවීම සඳහා වන උප කමිටුව, වෙළෙඳ කේන්ද්‍රස්ථානයේ ක්‍රියාකාරිත්වය සඳහා වූ නියාමන කමිටුව, ශ්‍රී ලංකාවේ ව්‍යාපාර පවත්වාගෙන යාමේ දර්ශකය සම්බන්ධව පවතින ගැටලු අධ්‍යයනය කිරීම සඳහා පත්කළ ක්‍රියාකාරී කමිටුව, රාජ්‍ය ව්‍යවසාය සඳහා වූ කමිටුව, රට තුළට විදේශ මුදල් ලැබීම් පිළිබඳ කමිටුව, ෂරියා නීතියට අදාළ රාජ්‍ය සුරැකුම් පිළිබඳ ගැටලු සාකච්ඡාව සඳහා වූ කමිටුව, මන්නාරම් ද්‍රෝණියේ අක්වෙරළ තෙල් ගවේෂණය පිළිබඳ තාක්ෂණික ඇගයීම් කමිටුව, සහ සංචාරක පරිවාර ගිණුම් (TSA) වැඩසටහන යනාදිය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් නියෝජනය කළ බාහිර කමිටු අතර වේ. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය ඇතුළු විවිධ අමාත්‍යාංශ මගින් සංවිධානය කරන ලද සමුළු සඳහා මහ බැංකුව නියෝජනය කරන ලදී.

### 7.4 ජාත්‍යන්තර සබඳතා

ශ්‍රී ලංකා මහ බැංකුව සහ රජය වෙනුවෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව, අග්නිදිග ආසියානු මහ බැංකු ආයතනය (SEACEN) සාර්ක් මූල්‍ය ජාලය (SAARCFINANCE) සහ අග්නිදිග ආසියානු, නවසීලන්ත සහ ඕස්ට්‍රේලියානු බැංකු සංගමය (SEANZA) වැනි ආයතන සමග අඛණ්ඩ සබඳතා පවත්වන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම විමර්ශනය කිරීමට පැමිණෙන ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ දූත කණ්ඩායම් සමග ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සමීපව කටයුතු කරන ලද අතර, එම ණය පහසුකම යටතේ දත්ත වාර්තා කිරීමේ කාර්යයද නිසි ලෙස ඉටු කරන ලදී. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සම්පස්ථ ණය පහසුකම යටතේ අනුමත වූ සියලුම මුදල් ලැබීමත් සමග 2012 ජූලි මාසයේ දී වැඩසටහන අවසන් විය. තවදුරටත්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්පස්ථ ණය පහසුකම යටතේ වූ කාර්යඵල නිර්ණායක අධීක්ෂණය කළ අතර, එම ඉලක්ක ළඟා කර ගැනීම සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිළිබඳ කළමනාකාරිත්වය සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය දැනුවත් කරන ලදී. මීට අමතරව 2012 වසරේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ දත්ත ඉදිරිපත් කිරීමේ ප්‍රමිති නිර්ණය කිරීම සඳහා ද දූත කණ්ඩායමක් දිවයිනට පැමිණියේය. තවද, 2012 වසරේ දී ශ්‍රී ලංකාව සම්බන්ධව ණය ශ්‍රේණිගත කිරීම උසස් කිරීම සඳහා, ෆිච් රේටින්ග්ස් (Fitch Ratings), එස් ඇන්ඩ් පී රේටින්ග්ස් (S&P Ratings) සහ මූඩීස් රේටින්ග්ස් (Moody's Ratings) යන අන්තර්ජාතික ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන සහ ණය නිකුතු උපදේශක ආයතන තුනක් සමග සමීපව කටයුතු කරන ලදී. තවද, ස්වෛරීත්ව බැඳුම්කර නිකුතුව සාර්ථකව නිම කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සියලුම ප්‍රතිපත්තිමය විමර්ශනයන් සඳහා පියවර ගත් අතර, ආර්ථික දත්ත යාවත්කාලීන කිරීම සඳහා සියලුම ලේඛනාදියෙන් සහ ඉදිරිපත් කිරීම් මගින් සහාය දක්වන ලදී.

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් රාජ්‍ය ණය කළමනාකරණ සමුළුව, SEACEN සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් පවත්වන ලද "සාර්ව ආර්ථික විශ්ලේෂණ" පාඨමාලාව සංවිධානය කළ අතර, සාර්ක් මූල්‍ය ජාලයේ සේවක හුවමාරු කිරීමේ වැඩසටහන් සඳහා පුහුණු කිරීමේ විවිධ වැඩසටහන් ද මෙහෙයවන ලදී.

## 8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල (සේ.අ.අ./ අරමුදල) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශාලතම විශ්‍රාම පාරිතෝෂික අරමුදලයි. පෞද්ගලික හා අර්ධ රාජ්‍ය ආයතනයන්හි සේවය කරනු ලබන සේවක සේවිකාවන් සඳහා විශ්‍රාම ප්‍රතිලාභ ලබාදීමේ අරමුණ පෙරදැරි කොට 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනත යටතේ මෙය ස්ථාපිත කරනු ලැබීය. පනතේ විධිවිධානවලට අනුව අරමුදලෙහි ප්‍රධාන පරිපාලන නිලධාරියා ලෙස කම්කරු කොමසාරිස් ජනරාල්වරයා කටයුතු කරන අතර අරමුදලෙහි භාරකරු ලෙස අදාළ බලතල, කාර්යයන් සහ වගකීම් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයට පැවරී ඇත. පනත මගින් තමන් වෙත පැවරී ඇති වගකීම් හා කාර්යභාරයන් මුදල් මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන්නේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව මගිනි.

### 8.1 දෙපාර්තමේන්තුවේ කාර්යයන්

සාමාජික දායක මුදල් සහ අධිභාර රැස්කිරීම, සාමාජික ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය කිරීම, සාමාජිකයින්ට හා ඔවුන්ගේ නීතිමය හිමිකරුවන්ට ප්‍රතිලාභ ආපසු ගෙවීම, පනත මගින් මුදල් මණ්ඩලය හා කම්කරු කොමසාරිස් ජනරාල්වරයා වෙත පවරා ඇති කාර්යභාරයන් ඉටු කිරීමේ දී දරන පිරිවැය අරමුදලේ ආදායමෙන් අය කර ගැනීම හා සාමාජික ගිණුම්වලට පොලිය බැර කිරීම යනාදිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත පවරන ලද කාර්යයන් වේ. එම කාර්යයන් ඉටු කිරීමේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව කම්කරු කොමසාරිස් ජනරාල්වරයා සමග සමීප සම්බන්ධීකරණයක් පවත්වාගෙන යන ලදී.

### 8.2 කාර්යයන්හි කාර්ය සාධනය

#### (අ) සාමාජිකත්වය, සාමාජික ගිණුම් ශේෂ හා ප්‍රතිලාභ ගෙවීම්

අරමුදලේ සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව 2012 වසර අවසානයේ දී මිලියන 14.25 ක් වූ අතර, එය 2011 වසර අවසානයේ වූ මිලියන 14 හා සසඳන විට සියයට 1.8 ක වර්ධනයකි. 2011 වසර අවසාන වන විට දී මිලියන 2.21 ක්

වූ දායක මුදල් එවන සාමාජික ගිණුම් සංඛ්‍යාව, 2012 වසර අවසාන වන විට මිලියන 2.25 ක් දක්වා වර්ධනය විය. තවද දායක මුදල් එවනු ලබන සේවායෝජකයින් සංඛ්‍යාව 2011 වසරේ පැවති 64,562 සිට 2012 අවසානය වන විට 68,771 දක්වා වර්ධනය විය.

**II-4 සංඛ්‍යා සටහන** **අරමුදල පිළිබඳ මූලික දත්ත**

| අයිතමය | 2011 | 2012 (අ) | ප්‍රතිශත වෙනස්වීම් (%) |
|---|---|---|---|
| සමස්ත සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන) | 14.00 | 14.25 | 1.8 |
| වර්තමානයේදී දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන) | 2.21 | 2.25 | 1.8 |
| වර්තමානයේ දී දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන) | 11.79 | 12.00 | 1.8 |
| දායක මුදල් එවනු ලබන සේවායෝජකයින් | 64,562 | 68,771 | 6.5 |
| මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන) | 61.9 | 70.2 | 13.4 |
| ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන) | 47.3 | 48.7 | 3.0 |
| ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව | 120,301 | 115,654 | (3.9) |
| සාමාජිකයන් වෙත වූ සමස්ත වගකීම (රුපියල් බිලියන) | 986 | 1,125 | 14.1 |
| අරමුදලේ සමස්ත වටිනාකම (රුපියල් බිලියන) | 1,018 | 1,144 | 12.4 |

(අ) තාවකාලික

*මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව*

2012 වසර අවසානයේ දී සේ.අ. අරමුදලෙහි මුළු වටිනාකම රුපියල් බිලියන 1,144 ක් වූ අතර එය 2011 වසර අවසානයේ වූ රුපියල් බිලියන 1,018 හා සසඳන විට සියයට 12.4 ක වර්ධනයක් පෙන්නුම් කරයි. වසර තුළ දී අරමුදල විචක්ෂණශීලී ලෙස කළමනාකරණය කිරීම මගින් ඉපැයූ ඉහළ ආදායම සහ සාමාජික දායක මුදල් ලැබීම් අරමුදලේ වර්ධනයට හේතු විය. 2011 වසරේ රුපියල් බිලියන 986 ක් ව පැවති සාමාජිකයින් වෙත වූ අරමුදලෙහි මුළු වගකීම 2012 අවසන් වන විට රුපියල් බිලියන 1,125 ක් දක්වා සියයට 14.1 කින් වර්ධනය විය (සංඛ්‍යා සටහන් II-4). සාමාජික ගිණුම වෙත 2012 වසර අවසානයේ දී බැර කරන ලද පොලී ගෙවීම් ද ඇතුළත් වේ. ශුද්ධ දායක මුදල් (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම අඩු කළ පසු) ලැබීම් ද පසුගිය වසරට සාපේක්ෂව රුපියල් බිලියන 14.6 සිට රුපියල් බිලියන 21.5 දක්වා වර්ධනය විය. වසර තුළ දී අරමුදලේ සාමාජිකයින් හා ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ප්‍රතිලාභ ලෙස රුපියල් බිලියන 48.7 ක මුදලක් ගෙවන ලදී. එය පෙර වසරේ ගෙවන ලද මුදල හා සසඳන විට සියයට 3.0 ක වර්ධනයක් පෙන්නුම් කරයි.

### (ආ) අරමුදල් ආයෝජනය හා ප්‍රතිලාභය

**(i) ආයෝජන කළඹ :** 2012 වසර අවසානයේ දී සමස්ත ආයෝජන කළඹෙහි වටිනාකම රුපියල් බිලියන 1,105.5 (පොත් අගය) ලෙස වාර්තා වූ අතර, එය 2011 වසරේ පැවති රුපියල් බිලියන 985.6 ට සාපේක්ෂව සියයට 12.2 ක වර්ධනයක් පෙන්නුම් කරයි. (සංඛ්‍යා සටහන් II-5) අරමුදලේ සුරක්ෂිතභාවය ආරක්ෂා කර ගනිමින්, ප්‍රතිලාභ ගෙවීම් සිදු කිරීමට ප්‍රමාණවත් පරිදි ද්‍රවශීලතාවයක් පවත්වා ගනිමින් අරමුදලේ සාමාජිකයන් වෙත දිගුකාලීන ධන මූර්ත ප්‍රතිලාභයක් ලබාදීම ඉලක්ක කොට ගත් අරමුදලේ ආයෝජන ප්‍රතිපත්තිය 2012 වසර තුළ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව 2012 වසර අවසාන වන විට අරමුදලේ සමස්ත ආයෝජනයන්ගෙන් සියයට 93.6 ක් රජයේ සුරැකුම්පත්හි ආයෝජනය කර තිබූ අතර, ව්‍යාපාර කොටස් හා සාංගමික ණයකරයන්හි පිළිවෙළින් සියයට 5.4 ක් සහ සියයට 0.7 ක් ආයෝජනය කර තිබුණි. ඉතිරි සියයට 0.3 අරමුදලේ දෛනික ද්‍රවශීලතා අවශ්‍යතාවයන් කළමනාකරණය කර ගැනීම සඳහා ප්‍රතිවිකිණීමේ ගිවිසුම (Reverse Repo) වැනි ද්‍රවශීල වත්කම්වල ආයෝජනය කර තිබුණි.

**II-5 සංඛ්‍යා සටහන** **ආයෝජන කළඹ**

| ආයෝජන වර්ගය | 2011 | | 2012 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.බිලියන) | දායකත්වය (%) |
| භාණ්ඩාගාර බැඳුම්කර සහ බිල්පත් | 874.6 | 88.7 | 1,012.1 | 91.5 |
| රජයේ රුපියල් ණය | 23.1 | 2.3 | 23.1 | 2.1 |
| සාංගමික ණයකර | 9.2 | 1.0 | 8.0 | 0.7 |
| සමාගම් කොටස් | 75.9 | 7.7 | 59.2 | 5.4 |
| ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් | 2.8 | 0.3 | 3.1 | 0.3 |
| **එකතුව** | **985.6** | **100.0** | **1,105.5** | **100.0** |

(අ) තාවකාලික

*මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව*

**(ii) ආයෝජන ආදායම :** අරමුදලේ සමස්ත ආයෝජන ආදායම 2012 වසරේ දී රුපියල් බිලියන 121.4 ක් ලෙස සටහන් වූ අතර, එය 2011 වසරේ උපයන ලද සමස්ත ආයෝජන ආදායම හා සැසඳීමේ දී සියයට 4.6 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී. (සංඛ්‍යා සටහන II-6) පොලී ආදායම අරමුදලේ ප්‍රධාන ආදායම් ප්‍රභවය විය. එය ආදායමෙන් සියයට 74.9 කි. 2012 වසරේ පොලී ආදායම රුපියල් බිලියන 90.9 ක් වූ අතර, එය 2011 වසරේ උපයන ලද රුපියල් බිලියන 84.7 හා සැසඳීමේ දී සියයට 7.4 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී. සේ.අ. අරමුදලේ රජයේ සුරැකුම්පත්වලින් ජනිත වූ බර තැබූ සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය සියයට 11.1 ක් වූ අතර එම සුරැකුම්පත්වල ඵලදායීතා අනුපාතිකය සියයට 9.8 ත් 12.7 ත් අතර විය. ව්‍යාපාර කොටස්වල ආයෝජනය කිරීම

තුළින් 2012 වසර තුළ දී රුපියල් මිලියන 3,016 ක් උපයන ලද අතර එය 2011 වසරේ දී ආදායම වූ රුපියල් මිලියන 2,678 සමග සැසඳීමේ දී සියයට 12.6 ක වැඩිවීමකි. මෙම ප්‍රතිලාභ තුළ වර්ෂය තුළ උපලබ්ධි වූ ප්‍රාග්ධන ලාභ හා ලාභාංශ අන්තර්ගත වේ (සංඛ්‍යා සටහන II-6).

**II-6 සංඛ්‍යා සටහන — ආයෝජන මගින් ලද ආදායම්**

| ආදායම් මූලාශ්‍රය | 2011 | | 2012 (අ) | |
|---|---|---|---|---|
| | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) |
| පොලී | 84,673 | 73.0 | 90,904 | 74.9 |
| ක්‍රමාක්ෂය ලාභ | 28,727 | 24.7 | 27,792 | 22.9 |
| ප්‍රාග්ධන ලාභ - රජයේ සුරැකුම්පත් | 10 | ... | 34 | ... |
| වෙළෙඳපොළ මිලට අගය කිරීමෙන් ලාභ/පාඩු | (267) | (0.2) | (388) | (0.3) |
| ප්‍රාග්ධන ලාභ - ව්‍යාපාර කොටස් | 715 | 0.6 | 1,020 | 0.8 |
| ලාභාංශ | 1,963 | 1.7 | 1,996 | 1.6 |
| වෙනත් | 222 | 0.2 | 55 | 0.1 |
| **එකතුව** | **116,043** | **100.0** | **121,413** | **100.0** |

(අ) තාවකාලික — මූලය: සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-7 සංඛ්‍යා සටහන — 2012 වසර අවසානයේ දී රාජ්‍ය සුරැකුම්පත් ආයෝජන කළඹෙහි කල්පිරීමේ ව්‍යුහය**

| කල්පිරීම | වටිනාකම (රු.මිලියන) | දායකත්වය (%) | බරතැබූ සාමාන්‍ය ඵලදායිතාව (%) |
|---|---|---|---|
| වසරකට වඩා අඩු | 231,193 | 22.3 | 12.7 |
| වසර 1-2 | 126,146 | 12.2 | 9.8 |
| වසර 3-4 | 209,817 | 20.3 | 10.1 |
| වසර 5 ට වැඩි | 468,082 | 45.2 | 11.1 |
| **එකතුව** | **1,035,238** | **100.0** | **11.1** |

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(iii) වියදම් :** 2012 වසරේ අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම රුපියල් මිලියන 948 ක් වූ අතර, එය පෙර වසරේ සමස්ත වියදම වූ රුපියල් මිලියන 786 හා සසඳන විට සියයට 20.6 ක වැඩිවීමක් පෙන්නුම් කරන ලදී (සංඛ්‍යා සටහන II-8). 2012 වසරේ දී අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම අරමුදලේ දළ ආදායමින් සියයට 0.78 ක් ලෙස සටහන් වූ අතර එය 2011 වසරේ සියයට 0.68 ක් ලෙස පැවතුනි. අරමුදලේ සමස්ත මෙහෙයුම් වියදම එහි දළ ආදායමින් සියයට 1 කට වඩා පහළ මට්ටමක පවත්වා ගැනීමට හැකි වීම වසර ගණනාවක් පුරාම අරමුදලේ කැපී පෙනුණ විශේෂ ලක්ෂණයක් විය.

**II-8 සංඛ්‍යා සටහන — මෙහෙයුම් වියදම්**

| අයිතමය | වටිනාකම (රු.මිලියන) 2011 | වටිනාකම (රු.මිලියන) 2012 (අ) | ප්‍රතිශත වෙනස (%) |
|---|---|---|---|
| සේවක පිරිවැය | 417 | 514 | 23.3 |
| පරිපාලන වියදම් | 335 | 397 | 18.5 |
| වෙනත් වියදම් | 34 | 37 | 8.9 |
| **එකතුව** | **786** | **948** | **20.6** |
| **මුළු පිරිවැය දළ ආදායමේ ප්‍රතිශතයක් ලෙස** | **0.68** | **0.78** | - |

(අ) තාවකාලික — මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**(ඇ) සාමාජික ශේෂ සඳහා පොලිය ගෙවීම**

අරමුදලේ සාමාජිකයන් වෙත බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම 2011 වර්ෂයේ පැවති රුපියල් බිලියන 101.7 සමඟ සැසඳීමේදී 2012 වසර අවසානයේ දී රුපියල් බිලියන 115.8 ක් විය. (සංඛ්‍යා සටහන II-9). සංචිතවලින් රුපියල් බිලියන 5.7 ක් මාරු කිරීමෙන් පසු සාමාජික ශේෂයන් මත පොලී අනුපාතිකය ලෙස සියයට 11.5 ක ප්‍රතිශතයක් ගෙවීමට අරමුදලට හැකි වුණි (සංඛ්‍යා සටහන II-10).

**II-9 සංඛ්‍යා සටහන — සාමාජිකයන්ට ගෙවන ලද පොලිය**

| අයිතමය | වටිනාකම (රු.මිලියන) | | ප්‍රතිශත |
|---|---|---|---|
| | 2011 | 2012 (අ) | වෙනස (%) |
| දළ ආදායම | 116,043 | 121,413 | 4.6 |
| මුළු මෙහෙයුම් වියදම | (786) | (948) | 20.6 |
| ආදායම් බදු | (8,055) | (8,637) | 7.2 |
| සාමාජිකයන්ට බෙදා හැරීම සඳහා ඇති ශුද්ධ ආදායම | 107,496 | 111,828 | 4.0 |
| වසර තුළ සිදු කළ ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය | (2,343) | (2,098) | (10.5) |
| සාමාජිකයන් වෙත බෙදාහැරීමට ඇති ශුද්ධ ආදායම (වසර තුළදී ප්‍රතිලාභ ගෙවීම් මත ගෙවන ලද පොලිය අඩු කළ පසු) | 105,153 | 109,730 | 4.3 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරුකිරීම | (3,500) | 5,700 | 262.8 |
| සංචිත වලින්/(සංචිත වලට) මාරුකිරීමෙන් පසු සාමාජිකයන්ට බෙදා හැරීමට ඇති ශුද්ධ ආදායම | 101,653 | 115,799 | 8.3 |
| සාමාජික ශේෂ සඳහා පොලිය | (101,284) | (115,771) | 12.5 |
| ඉදිරියට ගෙනයන ලද ශේෂය | 369 | 28 | (92.4) |
| සාමාජික ශේෂ සඳහා ගෙවන ලද පොලී අනුපාතිකය % | 11.5 | 11.5 | - |

(අ) තාවකාලික — මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

**II-10 සංඛ්‍යා සටහන** **සාමාජික ගිණුම් ශේෂ මත ගෙවන ලද පොලී අනුපාතික**

| වසර | ගෙවන ලද පොලී අනුපාතිකය (%) | සඵල පොලී අනුපාතිකය (%) |
|---|---|---|
| 2002 | 12.10 | 12.26 |
| 2003 | 12.00 | 12.07 |
| 2004 | 9.50 | 9.59 |
| 2005 | 9.00 | 9.13 |
| 2006 | 10.10 | 10.30 |
| 2007 | 11.20 | 11.40 |
| 2008 | 13.20 | 13.44 |
| 2009 | 13.75 | 13.92 |
| 2010 | 12.50 | 12.65 |
| 2011 | 11.50 | 11.58 |
| 2012 (අ) | 11.50 | 11.62 |

(අ) තාවකාලික මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

## 8.3 සාමාජික සේවාවන්

### (අ) සාමාජික ගිණුම් ප්‍රකාශන

2012 වසරේ පළමු අර්ධ වාර්ෂික සාමාජික ගිණුම් ප්‍රකාශන සේවා යෝජකයන් මගින් 2013 වසරේ මාර්තු මාසය තුළ දී සාමාජිකයන් වෙත නිකුත් කිරීමට නියමිතය. 2012 වසරේ දෙවන අර්ධ වසරට අදාළ ගිණුම් ප්‍රකාශන 2013 වසරේ අගෝස්තු මාසය අවසානය වන විට නිකුත් කොට අවසන් කිරීමට ද කටයුතු පිළියෙළ කර ඇත.

### (ආ) සාමාජිකයන් සඳහා වූ නිවාස ණය පහසුකම

අරමුදලේ සාමාජිකයන් හට සිය සේ.අ.අ. ගිණුමේ ශේෂය ඇපයට තබා නිවාස ණය ලබාගැනීමේ යෝජනා ක්‍රමය 1998 වසරේ දී හඳුන්වා දුන් අතර, එම ණය ලංකා බැංකුව, මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, නිවාස සංවර්ධන හා මූල්‍ය සංස්ථාව, සමූපකාර ග්‍රාමීය බැංකු සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය යන සහභාගිත්ව ණය දෙන ආයතන මගින් 2012 වසර තුළ දී ද ලබාගැනීමට හැකි විය. එම යෝජනා ක්‍රමය යටතේ අරමුදලේ සාමාජිකයන් වෙනුවෙන් ශේෂ සහතික නිකුත් කිරීමේ කාර්යය 2012 වසර තුළ දී ද ක්‍රියාත්මක කරන ලදී. වසර තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ ශේෂ සහතික 11,234 ක් අදාළ ආයතන වෙත නිකුත් කරන ලද අතර, අනුමත කරන ලද සමස්ත නිවාස ණය ප්‍රමාණය රුපියල් මිලියන 3,973 කි (සංඛ්‍යා සටහන II - 11). තවද, වසර තුළ දී මෙම ව්‍යාපෘතිය යටතේ 2011 වසරේ දී පැහැර හරින ලද ණය වෙනුවෙන්, අරමුදල විසින් රුපියල් මිලියන 2,019 කට ආසන්න මුදල් ප්‍රමාණයක් සාමාජික ගිණුම්වලින් අඩු කර සහභාගිත්ව ණය දෙන ආයතන වෙත 2012 වර්ෂය තුළ දී ප්‍රේෂණය කරන ලදී.

**II-11 සංඛ්‍යා සටහන** **නිවාස ණය සේවාව**

| වසර | නිකුත් කළ සහතිකපත් සංඛ්‍යාව | අනුමත කළ ණය ප්‍රමාණය (රු.මිලියන) | අනුමත ණය දෙන ආයතන වෙත මුදාහළ මුදල (රු.මිලියන) |
|---|---|---|---|
| 2000 | 12,938 | 1,648 | 262 |
| 2001 | 16,066 | 2,091 | 381 |
| 2002 | 19,502 | 2,673 | 541 |
| 2003 | 18,689 | 2,792 | 670 |
| 2004 | 14,307 | 2,452 | 735 |
| 2005 | 14,600 | 2,766 | 900 |
| 2006 | 15,136 | 3,049 | 1,078 |
| 2007 | 12,969 | 2,872 | 1,240 |
| 2008 | 12,519 | 3,008 | 1,192 |
| 2009 | 10,383 | 2,680 | 1,552 |
| 2010 | 13,848 | 4,512 | 2,093 |
| 2011 | 20,041 | 6,355 | 1,896 |
| 2012 (අ) | 11,234 | 3,973 | 2,019 |
| එකතුව | 192,322 | 40,871 | 14,555 |

(අ) තාවකාලික මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

### (ඇ) මහජනතාව දැනුම්වත් කිරීම

වර්ෂ 2012 දී දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධතාවයන් තුළින් දැනුම්වත් කිරීම සඳහා මූලිකත්වය දෙන ලදී. ඒ අනුව දැනුම්වත් කිරීමේ වැඩසටහන්, විශාල සාමාජික සංඛ්‍යාවක් සහිත සේවායතනයන් සඳහා පවත්වන ලදී. තවද සාමාජිකයන්, සේව්‍යයන්, රැකියා වෙළෙඳපොළට අලුතෙන් එක්වන්නන්, කම්කරු නිලධාරීන්, ග්‍රාමීය බැංකු නිලධාරීන් හා පොදු මහජනතාව එම වැඩසටහන් තුළින් අර්ථ සාධක අරමුදලට සම්බන්ධ කරුණු පිළිබඳව දැනුම්වත් කරන ලදී.

2012 වර්ෂයේ දී සේවා යෝජකයන් සඳහා ජංගම සේවාවන් 12 ක් විවිධ ප්‍රදේශවල පවත්වන ලදී. මෙම ජංගම සේවාවන් පැවැත්වූ ස්ථාන වන්නේ, හෙන්ෆෝල්ඩ් වත්ත, කුරුණෑගල මහ නගර සභාව, උඩුනුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, වෛද්‍ය සහ සමාජ සත්කාරක සේවා දිනයේදී මොරටුව, කොළඹ මානව සම්පත් සපයන්නන්ගේ ප්‍රදර්ශනය, යුනිවෙලා පෞද්ගලික සමාගම, කොළඹ ඇල්පිටිය වැවිලි සමාගම - මැදකුඹුර වත්ත, මාස් ස්ලිම්ටෙක්ස්, මාස් ඇක්ටිව් පුද්ගලික සමාගම කටුනායක, රැකියා හා වෙළෙඳ ප්‍රදර්ශනය - හැටන් යන ස්ථානයි.

ජංගම සේවාවන් සංවිධානය කරනු ලැබුවේ කම්කරු දෙපාර්තමේන්තුව, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව, රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, පොලිස් දෙපාර්තමේන්තුව හා අනෙකුත් අදාළ ආයතනයන්හි ද සහභාගිත්වයෙනි. ඒ අනුව ජංගම සේවාවන් ඔස්සේ පහත දැක්වෙන සේවාවන් ලබා දෙන ලදී.

(i) සාමාජිකයින් සඳහා ශේෂ වාර්තා නිකුත් කිරීම.

(ii) සාමාජිකයින්ගේ නම් හා ජාතික හැඳුනුම්පත් අංක සංශෝධනය කිරීම.

(iii) සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම.

(iv) කෙටි පණිවිඩ (SMS) හා අන්තර්ජාලය යටතේ තොරතුරු ලබා ගැනීම සඳහා සාමාජිකයින් ලියාපදිංචි කිරීම.

(v) සාමාජිකයින්ට උපදෙස් ලබාදීම

(vi) සේ.අ.අ. සාමාජිකයින්ට ජාතික හැඳුනුම්පත් ලබාගැනීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අයදුම්පත් නිකුත් කිරීම.

(vii) සේ.අ.අ. සාමාජිකයින්ට උප්පැන්න සහතික/අනුමාන වයස් සහතික ලබාගැනීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් අයදුම්පත් නිකුත් කිරීම.

**(ඈ) විද්‍යුත් මාධ්‍ය මගින් සේ.අ.අ. දායක මුදල් රැස්කිරීමේ ව්‍යාපෘතිය**

“සී” වාර්තාව සහ “සී 3” වාර්තාව මගින් සාමාජික දායක මුදල් ගෙවීම් සඳහා වූ තොරතුරු ඉදිරිපත් කිරීම වෙනුවට සේවායෝජකයින්ට විද්‍යුත් මාධ්‍යයෙන් (E-return) එම තොරතුරු සැපයීමේ ක්‍රමයක් සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇත. ලේඛන ඉදිරිපත් කිරීමෙන් තොරව විද්‍යුත් මාධ්‍ය භාවිතයෙන් තොරතුරු දීමේ මෙම නව ක්‍රමය මගින් අරමුදලට හා සේවායෝජකයින්ට දැනට මුහුණපාන ගැටලු අවම කර ගැනීමට හැකියාව ලැබෙනු ඇත. 2012 වසර වන තෙක් මෙලෙස තොරතුරු සැපයීම සේවායෝජකයින්ගේ මූලිකත්වයෙන් හා ස්වෙච්ඡා සහභාගීත්වයෙන් පවත්වා ගෙන ගොස් ඇත. 2012 දී හඳුන්වා දුන්, 2012 අංක 2 දරන සේ.අ.අ. (සංශෝධන) පනත මගින් මෙම ක්‍රමය නීතිගත කරන ලදී.

මෙම ව්‍යාපෘතිය සඳහා සම්බන්ධ වන සේවායෝජකයින්ට අරමුදල වෙත කරනු ලබන ගෙවීම් සිය බැංකුව හරහා සෘජු හර කිරීමක් මගින් මාසිකව සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ බැංකු ගිණුමට සෘජුවම ප්‍රේෂණය කිරීමේ පහසුකම ද සලසා ඇත.

2012 වසරේ දී සේ.අ.අ. දෙපාර්තමේන්තුව විසින් විද්‍යුත් මාධ්‍ය රැස්කිරීම් ව්‍යාපෘතිය පිළිබඳව සේවායෝජකයින් දැනුවත් කිරීමේ වැඩමුළු 12 ක් පවත්වා ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස, 2011 වසරේ දී මෙම ව්‍යාපෘතිය යටතේ ලියාපදිංචි වී සිටි 1,098 ක් වූ සේවායෝජක සංඛ්‍යාව 2012 වසර තුළ දී 1,385 දක්වා වර්ධනය විය.

විද්‍යුත් මාධ්‍යය මගින් දායක මුදල් රැස්කිරීමේ නියෝජිතයන් ලෙස වාණිජ බැංකු පත්කිරීම මගින් ඔවුන්ගේ සේවය ලබා ගැනීම දෙපාර්තමේන්තුව විසින් ගන්නා ලද තවත් පියවරකි. ඒ අනුව, කොමර්ෂල් බැංකුව හා ලංකා බැංකුව පිළිවෙළින් 2011 ඔක්තෝබර් හා 2012 සැප්තැම්බර් මස සිට ක්‍රියාත්මක වන පරිදි සිය ගනුදෙනුකරුවන්ට මේ සඳහා තම සේවය ලබාදීමට පියවර ගන්නා ලදී. 2012 වසර අවසාන වන විට මෙම ගෙවීම් පද්ධතිය යටතේ සේවායෝජකයින් 235 දෙනෙකු තම දායක මුදල් එවීම් සිදු කර ඇත. තවද, ඒ හා සමාන දායක මුදල් රැස්කිරීමේ සේවාවක් තම ගනුදෙනුකරුවන් වෙත ලබාදීම උදෙසා සම්පත් බැංකුව, මහජන බැංකුව හා හැටන් නැෂනල් බැංකුව ඔවුන්ගේ තොරතුරු තාක්ෂණ පද්ධති සකසා ගැනීමේ කටයුතු මේ වන විට ආරම්භ කර ඇත.

**(ඉ) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම**

සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය සේ.අ.අ. දෙපාර්තමේන්තුව හා කම්කරු දෙපාර්තමේන්තුව සම්බන්ධ වී සිදුකළ ප්‍රධාන ව්‍යාපෘති අතුරින් එකකි. එහිදී සේ.අ.අ. සාමාජිකයන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පතෙහි (ජා.හැ.ප.) නම සඳහන්ව ඇති ආකාරයට නැවත ලියාපදිංචි කරන අතර, ජා.හැ.ප. අංකය සාමාජිකයාගේ ඒකීය හඳුනා ගැනීමේ අංකය ලෙස භාවිතා කිරීම සිදුවේ. මෙම දත්ත ගබඩාව වැඩිදියුණු කිරීමේ ඉතා වැදගත් ලක්ෂණයක් වනුයේ ආයතන දෙකටම සේ.අ.අ. සාමාජික ගිණුම් පවත්වාගෙන යාම සඳහා පොදු දත්ත ගබඩාවක් ලෙස මෙය භාවිතා කළහැකි වීමයි. ඒ අනුව, මෙතෙක් පැවති සේවායෝජකයා කේන්ද්‍ර කරගත් දත්ත ගබඩාව, සාමාජිකයා කේන්ද්‍ර කරගත් දත්ත ගබඩාවක් බවට පරිවර්තනය වනු ඇත.

2012 අවසාන වන විට මිලියන 1.2 කට ආසන්න ජා.හැ.ප. තොරතුරු ප්‍රමාණයක් රැස්කර ගනිමින් අරමුදලේ සක්‍රීය (වර්තමානයේ දායක මුදල ගෙවනු ලබන) සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම් සිදුකර ඇත. ඒ අතුරින් සියයට 79 ක් පමණ වූ සාමාජික ප්‍රතිශතයකට ඒකීය හඳුනා ගැනීමේ අංක ලබාදී ඇති අතර, ඉදිරිපත් කර ඇති තොරතුරුවල පවතින යම් යම් ගැටලු නිසා රැස්කරන ලද ඉතිරි තොරතුරු අදාළ සේවායෝජකයන් මගින් නැවත තහවුරු කිරීම් ලබාගැනීමෙන් පසුව ලියාපදිංචි කිරීම් සඳහා යොමු කරනු ලැබේ.

2010 නොවැම්බර් මාසයේ ආරම්භ කරන ලද සේ.අ.අරමුදලට සම්බන්ධවන සාමාජිකයන් තත්කාලීනව ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය 2012 වසර තුළ දී ද ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, නව සාමාජිකයන් 40,000 ක් පමණ මේ යටතේ නැවත ලියාපදිංචි වී ඇති අතර, ඒ අනුව නව සාමාජික තොරතුරු ගොනුව යාවත්කාලීන කිරීමද මෙම කාලපරිච්ඡේදය තුළ සිදුකර ඇත. පළමුවරට දායක මුදල් ලැබෙන සාමාජිකයින්ගේ ජා.හැ.ප. තොරතුරු මාසික පදනමින් රැස්කර ගැනීම සඳහා මෙහෙයුම් ක්‍රියාවලියන් ද පවත්වාගෙන ගනු ලැබේ.

සාමාජිකයින්ගේ අතීත සේවා නියුක්තියන්ට අදාළ වන සාමාජික ගිණුම් ඒකීය හඳුනාගැනීමේ අංකයට සම්බන්ධ කිරීම, 2012 වසර තුළදී ද සිදු කරන ලදී. ඒ අනුව, 2012 දී එවැනි සාමාජික ගිණුම් 6,000 ක් ඒකීය හඳුනාගැනීමේ අංකයට සම්බන්ධ කරන ලදී. මෙම ක්‍රමය මගින් අන්තර්ජාලය හරහා සහ ජංගම දුරකථන තුළින් කෙටි පණිවුඩ සේවාව හරහා ජා.හැ.ප. අංකය ඉදිරිපත් කිරීමෙන් සාමාජිකයන්ට තමන්ට හිමි සියලුම සාමාජික ගිණුම් පිළිබඳ තොරතුරු විමසීමට හැකියාව ලැබේ.

2012 වසරේ දී අරමුදලේ අක්‍රීය (වර්තමානයේ දායක මුදල් ගෙවනු නොලබන) සාමාජිකයින් නැවත ලියාපදිංචිය සඳහා කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ අනුමැතිය සහිතව ක්‍රියාවලියන් යෝජනා කරන ලදී. මෙම යෝජිත ව්‍යාපෘතිය 2013 මුල භාගයේ දී නියාමන ව්‍යාපෘතියක් ලෙස ආරම්භ කර පසුව ක්‍රියාත්මක කිරීමට නියමිතය.

**(ඊ) ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය**

සේ.අ.අ. දෙපාර්තමේන්තුව ලිපිගොනු රහිත මෙහෙයුම් පරිසරයකට පරිවර්තනය වෙමින් පවතී. ඡායාස්ථගත කිරීමේ ව්‍යාපෘතිය (ISP) මෙම අරමුණ සාක්ෂාත් කරගැනීමෙහිලා ප්‍රමුඛස්ථානයක් ගනී. ISP ව්‍යාපෘතිය මගින් කාලය, ඉඩකඩ, වියදම හා මානව සම්පත යොදා ගැනීම අවම කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාවය වැඩි කිරීම සහ දෙපාර්තමේන්තුවේ අනෙකුත් ව්‍යාපෘති සාර්ථක කරගැනීමට ISP ව්‍යාපෘතිය මගින් බලාපොරොත්තු වේ.

මෙම ව්‍යාපෘතියෙහි ප්‍රධාන කාර්යයන් වන්නේ,

(i) දැනට පවතින ලේඛන ඡායාස්ථගත කිරීම. (ප්‍රධාන ලිපිගොනු, “ඩී” ආකෘති පත්‍ර, “RR6” ආකෘති පත්‍ර, ජාතික හැඳුනුම්පත් පිටපත්)

(ii) ඡායාස්ථගත පිටපත් තැන්පත් කිරීම සඳහා ඒකාබද්ධ ලේඛන කළමනාකරණ පද්ධතියක් (DMS) සැපයීම හා ස්ථාපිත කිරීම.

(iii) සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි පවතින තොරතුරු පද්ධතිය සමග ඡායාස්ථගත ලේඛන කළමනාකරණ පද්ධතිය සම්බන්ධ කිරීම.

(iv) “සී”/“සී3” ආකෘති පත්‍ර, D ආකෘති පත්‍ර “RR6” ආකෘති පත්‍ර, ජාතික හැඳුනුම්පත් පිටපත් ඡායාස්ථගත කිරීම සඳහා අනාගතයට අවශ්‍ය පරිදි තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (ICT) ස්ථාපිත කිරීම.

මෙම ව්‍යාපෘතිය 2013 වසරේ පළමු කාර්තුව තුළ ආරම්භ කිරීමට සැලසුම් කර ඇත.

## 9. විනිමය පාලන

1950 සැප්තැම්බර් මස 01 වන දින විනිමය පාලන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ස්ථාපිත කරන ලදී. 1953 අංක 24 දරන විනිමය පාලන පනත යටතේ විනිමය පාලන දෙපාර්තමේන්තුවට පවරා ඇති වගකීම් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. බලයලත් වෙළෙඳුන් හට විධානයන් නිකුත් කිරීම, ගැසට් නිවේදන නිකුත් කිරීම, විශේෂිත විදේශ විනිමය ගනුදෙනු සම්බන්ධයෙන් අනුමැතීන් සහ බලපත්‍ර ලබාදීම, විවිධ විදේශ විනිමය ගනුදෙනු සුපරීක්ෂණය, විනිමය පාලන පනතේ විධිවිධානයන් උල්ලංඝනය කිරීම් සම්බන්ධව විමර්ශන කටයුතු සිදු කිරීම යනාදිය තුළින් ශ්‍රී ලංකා ආර්ථිකයේ උන්නතිය උදෙසා විනිමය පාලන පනතේ විධිවිධානයන්ට අනුව විදේශ විනිමය ගනුදෙනු හා සම්බන්ධ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම විනිමය පාලන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයන් වේ. මෑත කාල වකවානුව තුළදී මෙන්ම 2012 වර්ෂයේදී ද, මෙම සියළුම කාර්යයන් ඉලක්ක ගත කරනු ලැබුයේ ශ්‍රී ලංකාවට ඉහළ වර්ධන වේගයක් සහතික කිරීමෙහි ලා ඉවහල් වන ගෝලීය ව්‍යාපාරික ක්‍රියාකාරකම් තුළින් ශ්‍රී ලංකාවට තරඟකාරිත්ව වාසි අත් කර ගැනීම උදෙසා, වත්මන් සාර්ව ආර්ථික ප්‍රතිපත්ති හා සබැඳිව විදේශ විනිමය ගනුදෙනු තවදුරටත් ලිහිල් කිරීම උදෙසාය.

2012 වර්ෂය තුළ දී නිකුත් කරන ලද විධානයන් හා ගැසට් නිවේදන වාර්ෂික වාර්තාවේ III කොටසේ දැක්වේ.

### 9.1 විධානයන් නිකුත් කිරීම

පහත සාරාංශ ගත කර ඇති ආකාරයට විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය තුළ දී බලයලත් වෙළෙඳුන් හට නව විධානයන් 12 ක් නිකුත් කරන ලදී.

(අ) **විදේශ විනිමය ඉදිරි විකිණීම් හා මිල දී ගැනීම්:** විදේශ විනිමය විකිණීම සහ/හෝ මිල දී ගැනීම සඳහා වන ඉදිරි වෙළෙඳ ගිවිසුම් දින 90 ක උපරිම කාලයක් සඳහා පමණක් වියයුතු බවට දැනුම්දීම.

(ආ) **විදේශ විනිමය වෙළෙඳාම සඳහා ගෙවීම්:** විදේශ විනිමය වෙළෙඳාම සඳහා ගෙවීම විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත් හෝ වෙනත් ඕනෑම ගෙවීම් ක්‍රමයක් හරහා සිදු කිරීමට අවසර නොදිය යුතු බව දැනුම් දීම.

(ඇ) **එතෙර සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා රුපියල් වලින් ණය ලබාදීම:** එතෙර සේවය කරන ශ්‍රී ලාංකිකයන් හට ශ්‍රී ලංකාව තුළ ඕනෑම අරමුණක් වෙනුවෙන් ප්‍රයෝජනයට ගැනීම සඳහා ශ්‍රී ලංකා රුපියල්වලින් ණය ලබාදීමට බලයලත් වෙළෙඳුන් හට අවසර ලබාදීම.

(ඈ) **ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුම (IRDA):** මුහුදු යාත්‍රා/නැව්, වාණිජ ගුවන් යානා ආදියට මෙන්ම විදේශ රටවලදී ඉදිකිරීම්, පවිත්‍රතා, සෞඛ්‍යය, ආරක්ෂක, ගිණුම්කරණ, නෛතික සහ වෙනත් සේවා සපයනු ලබන පුද්ගලයන්ගේ ඉපැයීම් බෙදා හැරීම සඳහා නිශ්කාෂණ ගිණුමක් ලෙස භාවිතා කළහැකි “ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුම (IRDA)” හඳුන්වාදීම.

(ඉ) **විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA):**

(i) අපනයනකරුවන්, වක්‍ර අපනයනකරුවන්, යෙදවුම් සපයන්නන්, වෘත්තිමය සේවා සපයන්නන්, අන්තරාල වෙළෙඳුන්, මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳුන්, රක්ෂකයන්, රක්ෂණ තැරැව්කරුවන්, සංචාරක නියෝජිතයන්, හෝටල්කරුවන්, නැව් සඳහා ඉන්ධන සැපයුම්කරුවන් සහ විදේශ ව්‍යාපෘති සිදු කරනු ලබන අනෙකුත් නේවාසිකයන් වැනි විදේශ විනිමය උපයන්නන් සඳහා හඳුන්වා දී තිබූ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් කිහිපයක් ඒකාබද්ධ කරමින් “විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුම (FEEA)” නමින් තනි විදේශ ව්‍යවහාර මුදල් ගිණුමක් හඳුන්වා දීම.

(ii) ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුමෙන් විදේශ විනිමය උපයන්නන්ගේ ගිණුමට අරමුදල් බැර කිරීමට අවසර ලබාදීම.

**(ඊ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම්:** NRFC ගිණුම්වලට හර කිරීම් නිදහසේ සිදු කිරීමට අවසර ලබාදීම සඳහා අදාළ විධානයන් සංශෝධනය කිරීම.

**(උ) බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් හට පිරිනමන ලද දෛනික විදේශ විනිමය අනුපාතඃ** එක් එක් අනුමත විදේශ ව්‍යවහාර මුදල් වර්ගය සඳහා, එම මුදල් තැන්පත් කරන හෝ විකුණන අවස්ථාවේදී බලයලත් විදේශ මුදල් හුවමාරු කරන්නන් හට පිරිනමන ලද උපරිම විදේශ විනිමය අනුපාතය, සෑම වැඩ කරන දිනයකදීම විනිමය පාලක වරයාට දැනුම් දිය යුතු බවට බලයලත් වෙළෙන්දන් හට නියම කිරීම.

**(ඌ) බැංකු ඇපකර නිකුත් කිරීම හා අළුත් කිරීම:** විවිධ ඇපකර කාණ්ඩයන් කිහිපයක් ආවරණය කිරීම සඳහා බැංකු ඇපකර නිකුත් කිරීම හා අළුත් කිරීම සම්බන්ධ විධානය සංශෝධනය කිරීම.

**(එ) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) සහ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්:**

(i) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම් අතර, නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම් අතර සහ අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම්වලින් නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්වලට අරමුදල් මාරු කිරීම සඳහා අවසර ලබාදීම.

(ii) ආමුඛ ප්‍රේෂණ බෙදා හැරීමේ ගිණුමෙන් (IRDA) අනේවාසික විදේශ ව්‍යවහාර මුදල් (NRFC) ගිණුම් හෝ නේවාසික විදේශ ව්‍යවහාර මුදල් (RFC) ගිණුම්වලට අරමුදල් බැර කිරීම සඳහා අවසර ලබාදීම.

## 9.2 ගැසට් නිවේදන නිකුත් කිරීම

විනිමය පාලන දෙපාර්තමේන්තුව 2012 වර්ෂය තුළදී නව ගැසට් නිවේදන දෙකක් නිකුත් කරන ලදී.

**(අ) ශ්‍රී ලංකාවේ ව්‍යවහාර මුදල් අපනයන හා ආනයන සීමාව ඉහළ නැංවීම (2012 සැප්තැම්බර් මස 07 වැනි දිනැති ගැසට් අංක 1774/33) :** ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන හෝ ශ්‍රී ලංකාවේ පදිංචි තැනැත්තෙකු විසින් තමා වෙත හෝ තම ගමන් මලු තුළ තබාගෙන අපනයනය/ආනයනය කිරීම සඳහා එක් අයෙකුට ලබා දී තිබූ රු.5000/- වූ සීමාව රු.20,000/- දක්වා ඉහළ නැංවීම.

**(ආ) විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් (EFTC) භාවිතයෙන් විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කිරීමට අවසර ලබාදීම (2012 දෙසැම්බර් මස 20 වැනි දිනැති ගැසට් අංක 1789/34) :** ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකුට විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පතක් හරහා ගෙවීම් කිරීමට ලබා දී තිබූ අවසරය සංශෝධනය කිරීම.

## 9.3 අනුමැතීන්/අවසරපත්‍ර

පහත සාරාංශ ගත කර ඇති ආකාරයට, විනිමය පාලන පනතේ විධිවිධානයන් යටතට ගැනෙන ගනුදෙනු සඳහා විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අනුමැතීන් 42 ක් සහ අවසර පත්‍ර 75 ක් ප්‍රදානය කරන ලදී.

### (අ) අනුමැතීන්

(i) විදේශීය ආයෝජනයන් සඳහා විශේෂ අනුමැතිය ඉල්ලුම් කරමින් නේවාසික සමාගම්වලින් ඉල්ලීම් 25 ක් ලැබුණු අතර සමාගම් 14 කට එ.ජ. ඩොලර් මිලියන 65.68 ක මුදලක් ආයෝජනය කිරීම සඳහා අවසර ප්‍රදානය කරන ලදී. එක් ඉල්ලීමක් ප්‍රතික්ෂේප කරන ලද අතර ඉල්ලීම් 10 ක් පිළිබඳව ඉදිරි කටයුතු කරගෙන යමින් පවතී.

(ii) විදේශයන්ගෙන් ණය ලබා ගැනීම සඳහා නේවාසික සමාගම්වලින් ඉල්ලීම් 37 ක් ලැබුණු අතර, එ.ජ. ඩොලර් මිලියන 412.89 ක මුදලක් ණය වශයෙන් ලබා ගැනීම සඳහා සමාගම් 28 කට අවසර ප්‍රදානය කරන ලදී. ඉල්ලීම් 4 ක් ප්‍රතික්ෂේප කරන ලද අතර, ඉල්ලීම් 5 ක් පිළිබඳව ඉදිරි කටයුතු කරගෙන යමින් පවතී.

### (ආ) අවසරපත්‍ර/බලපත්‍ර නිකුත් කිරීම

(i) මුදල් හුවමාරු කිරීමේ නව බලපත්‍ර 10 ක් නිකුත් කරන ලද අතර, බලයලත් මුදල් හුවමාරු කරන්නන් මුළු ගණන 82 සිට 84 දක්වා ඉහළ යන ලදී.

(ii) වාර්ෂිකව එ.ජ. ඩොලර් මිලියන 4 ඉක්මවා විදේශ විනිමය මිලදී ගැනීමට සමත් වූ මුදල් හුවමාරු කරන්නන් දෙදෙනෙකුට විදේශ විනිමය විකිණීම සඳහා අවසර ප්‍රදානය කරන ලදී.

(iii) නව සමාගම් 75 ක් භාණ්ඩ නැව් ගත කරන්නන් ලෙස ලියාපදිංචි කළ අතර, ඒ අනුව භාණ්ඩ නැව් ගත කරන්නන්ගේ මුළු ගණන 504 දක්වා ඉහළ යන ලදී.

(iv) තීරුබදු රහිත වෙළෙඳසැල්, සංචාරක හෝටල්/අවන්හල්, මැණික් හා ස්වර්ණාභරණ වෙළෙඳසැල් සහ සංචාරක නියෝජිතවරුන් වැනි අනෙකුත් සීමිත බලයලත් වෙළෙඳුන් හට විදේශ පාර්ශවයන් හට භාණ්ඩ හා සේවා විකිණීම වෙනුවෙන් කරනු ලබන ගෙවීම් විදේශ ව්‍යවහාර මුදලින් භාර ගැනීමට නව බලපත්‍ර 65 ක් නිකුත් කරන ලද අතර, එවැනි සීමිත බලයලත් වෙළෙඳුන් මුළු ගණන 765 ක් විය.

## 9.4 සුපරීක්ෂණය හා විමර්ශනයන්

(අ) විනිමය පාලන රෙගුලාසිවලට අනුකූල නොවීම සම්බන්ධයෙන් 2012 වර්ෂය තුළ දී විමර්ශනයන් 99 ක් මෙහෙයවන ලදී. එබඳු විනිමය පාලන නීතිරීති

උල්ලංඝනය කිරීම් සම්බන්ධයෙන් පනවන ලද දඩ මුදල් වශයෙන් රු. 14,171,853.03 ක මුදලක් අය කර ගන්නා ලදී. විමර්ශනවලින් බහුතරයක්ම නේවාසිකයන් විසින් අනේවාසිකයන්ට කරන ලද අනවසර ගෙවීම්, සීමිත බලයලත් වෙළෙඳුන් විසින් බලපත්‍රයන්හි සඳහන් කොන්දේසි උල්ලංඝනය කිරීම සහ පොදු අවසරයන්හි දක්වා ඇති ක්‍රියාපටිපාටිය උල්ලංඝනය කරමින් සුරැකුම්පත් නිකුත් කිරීම සහ පැවරීම හා සම්බන්ධ වේ.

(ආ) විනිමය පාලන නීතිරීති උල්ලංඝනය කිරීම් සහ ශ්‍රී ලංකාව හා විදේශ රටවල් අතර අහිතකර විදේශ විනිමය ප්‍රවාහයන් සිදුවීම පිළිබඳ තක්සේරු කිරීම හෝ හඳුනා ගැනීම පිණිස, අදාළ නියෝගයන් යටතේ බලයලත් වෙළෙඳුන් සහ අනෙකුත් බලපත්‍ර හිමියන් විසින් කලින් කලට වාර්තා කරනු ලබන විදේශ විනිමය ගනුදෙනු විශාල ප්‍රමාණයක් විනිමය පාලන දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරන ලදී. මෙම අධීක්ෂණයන් අදාළ අවස්ථාවන් පිළිබඳ විවිධ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ගැනීමට හා විමර්ශනයන් සිදු කිරීමට පහසුකම් සපයන ලදී.

### 9.5 මහජනතාව දැනුම්වත් කිරීම

වත්මන් විදේශ විනිමය ප්‍රතිපත්ති සහ ප්‍රාග්ධන ස්වරූපයේ ගණුදෙනුවල මෑතකාලීන ලිහිල් කිරීම් පිළිබඳ දැනුම වැඩිදියුණු කිරීමේ අරමුණින් මූල්‍ය ආයතන, නීති බලාත්මක කිරීමේ අධිකාරීන්, රජයේ දෙපාර්තමේන්තු මෙන්ම මහජනතාව උදෙසා ද දැනුවත් කිරීමේ වැඩසටහන් මෙහෙයවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගිත්වය ඇතිව ප්‍රාදේශීය සම්මන්ත්‍රණ කිහිපයක් ද මෙහෙයවන ලදී. 2012 වර්ෂය තුළදී දැනුවත් කිරීමේ වැඩසටහන් 31 ක් මෙහෙයවන ලදී.

## 10. පහසුකම් කළමනාකරණ

දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය සම්ප්‍රදායික ලෙස සේවාවන් සැපයීමේ කාර්යයන්ගෙන් බැහැරව පහසුකම් කළමනාකරණය වෙත පරිවර්තනය කිරීම හේතුවෙන් පරිශ්‍ර දෙපාර්තමේන්තුවේ නම 2012.01.01 දින සිට පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ලෙස වෙනස් කරන ලදී.

මහ බැංකුවේ අරමුණු ඉටුකර ගැනීම සඳහා සේවයේ යෙදීමට කාර්ය මණ්ඩලයට සතුටුදායක සහ පහසු වාතාවරණයක් පවත්වාගෙන යාමට සහ සියලුම වැදගත් සේවාවන් අඛණ්ඩව සිදුකිරීමට 2012 වසර තුළ දී පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව පියවර ගන්නා ලදී.

2012 වසරේ උපාය මාර්ගික සැලැස්මට අනුකූලව ප්‍රවාහන සේවා, විදුලිය, වායු සමීකරණ, ජල සැපයුම, සහ සන්නිවේදන වැනි ඉතා වැදගත් සේවාවන් ඉහළ තත්ත්වයේ මෙහෙයුම් විශ්වාසනීය මට්ටමකින් යුතුව පවත්වාගෙන යාම සහ බැංකු පරිශ්‍රය නඩත්තු කිරීම ඇතුළුව දෙපාර්තමේන්තුවේ අභිමතාර්ථයන් සපුරා ගැනීම අරමුණු කරගත් මූලික ක්‍රියාකාරකම් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යන ලදී. රාජගිරිය බැංකු අධ්‍යයන කේන්ද්‍රයේ නව පොරොත්තු (stand by) විදුලි ජනක යන්ත්‍රයක් සවිකිරීම මගින් එහි විදුලිය බලය සැපයීමේ විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීමට සහ බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩතාවය සහතික කිරීමට දායක වන පහසුකම් සැපයීම සියයට 100 විශ්වාසනීය මට්ටමකින් පවත්වාගෙන යාමට ද දෙපාර්තමේන්තුවට හැකි විය. කාර්යක්ෂමතාව සහ පිරිවැය ඵලදායීතාවය වැඩි කිරීම මෙන්ම, වෘත්තීය මට්ටමින් ව්‍යාපෘති ඇගයීමේ ක්‍රමවේදයක් තුළින් නියමිත කාල වකවානු තුළ ව්‍යාපෘතීන් සම්පූර්ණ කිරීම මගින් දෙපාර්තමේන්තුවෙන් සපයන සේවාවන් සඳහා "මුදලට වටිනාකමක්" ලැබීම තහවුරු කිරීමට ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට හැකිවිය.

ඉහළ වෘත්තීය නිපුණතාවයෙන් සහ පිරිවැය ඵලදායීතාවයෙන් යුතු කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීම සහ ව්‍යාපෘති ප්‍රගතිය සමීපස්ථව අධීක්ෂණය කිරීම මගින්, එම ව්‍යාපෘතිය අපේක්ෂිත ප්‍රමිතියෙන් යුතුව, එකඟවී ඇති කාල ඉලක්කයන් තුළ සම්පූර්ණ කිරීම සහතික කිරීමට ද හැකි විය. ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇති ඒකාබද්ධ ආරක්ෂක පද්ධතිය යාවත්කාලීන කිරීමට සහ කරකැවෙන ඇතුළුවීමේ බාධක (Turnstile Barriers) ඉවත් කර නවීන පෙති ආකාර බාධක සවිකිරීම (Flap Type Barriers) සැලසුම් කළ අතර, ඒ සම්බන්ධ ප්‍රසම්පාදන කටයුතු 2012 වසරේ අවසානයට පෙර සම්පූර්ණ කරන ලදී. වර්ෂය තුළ දී රථ ගාලක් සඳහා බහුමහල් ගොඩනැගිල්ලක්, කතරගම නිවාඩු නිකේතනයට අතිරේක අනු නිවාස, උතුරු පළාත් කාර්යාලය සඳහා කිලිනොච්චියේ ගොඩනැගිල්ලක්, රාජගිරියේ ආපදා ප්‍රතිසාධන ඒකකයක් (Disaster Recovery Site) සඳහා ගොඩනැගිල්ලක් වශයෙන් නව ඉදිකිරීම් කිහිපයක් සහ ගොඩනැගිලි ප්‍රතිසංස්කරණ ව්‍යාපෘති කිහිපයක් ද ආරම්භ කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අයිතිකරගත්, පළමුව නැෂනල් මියුචුවල් ඇෂුවරන්ස් ගොඩනැගිල්ල ලෙස හැඳින්වූ වසර සීයක පමණ පැරණි සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ලේ ප්‍රතිසංස්කරණ කටයුතු දිගටම පවත්වාගෙන ගිය අතර එහි මූලික වැඩ කටයුතු බොහොමයක් 2012 වර්ෂ අවසානයට පෙර සම්පූර්ණ කරන ලදී. මෙම ප්‍රතිසංස්කරණ කටයුතු 2013 වර්ෂයේ පළමු භාගය තුළ අවසන් කිරීමට නියමිතය.

වසර 100 කට පමණ පෙර ඉදිකරන ලද ඓතිහාසික ගොඩනැගිල්ලක් වන "වයිට්එවේස්" ගොඩනැගිල්ල, 2013 වර්ෂය තුළ දී එහි මුල් අලංකාරත්වයට ප්‍රතිසංස්කරණය කිරීමේ අරමුණින් යුතුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මිල දී ගන්නා ලදී. මිලදී ගැනීමේ ක්‍රියාවලිය අවසන් කර ප්‍රතිසංස්කරණ කටයුතු 2012 දෙසැම්බර් මස තුළ දී ආරම්භ කෙරිණි.

උතුරු පළාතේ සියලුම පරිපාලන දිස්ත්‍රික්කවල ක්‍රියාත්මක වන සංවර්ධන කාර්යයන් කඩිනම් කිරීමට පහසුකම් සැපයීම සඳහා සංවර්ධන මූල්‍යකරණය වැඩිදියුණු කිරීම, බැංකු හා මූල්‍ය ක්‍රියාකාරිත්වය, අදාළ ක්‍රියාකාරකම් සඳහා මහජනතාව දැනුවත්කරලීම වැනි අරමුණු සපුරාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ උතුරු පළාත් කාර්යාලය ස්ථාපනය කිරීම සඳහා ගොඩනැගිලි සංකීර්ණයක්

කිලිනොච්චියේ ඉදිකිරීමට මූලික වැඩකටයුතු 2012 වර්ෂය තුළ දී අවසන් කරන ලදී. බැංකුවේ සහ එහි සේවා නියුක්තයන්ගේ රථ ගාල්කිරීම සඳහා මහල් නමයකින් යුතු රථගාලක් ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ ඉදිකිරීමට ව්‍යාපෘතියක් 2012 වර්ෂයේ හතරවන කාර්තුවේ ආරම්භකරන ලදී. මෙම ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සම්පූර්ණයෙන්ම නිමකිරීමට අපේක්ෂිතය.

මෙහෙයුම් අවදානම අඩුකිරීම සඳහා 2012 වර්ෂය තුළ දී අළුතින් වාහන මිල දී ගැනීම සහ පවත්නා වාහනවල තත්ත්වය උසස් කිරීම මගින් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව සිය වාහන පද්ධතිය ශක්තිමත් කරගන්නා ලදී. බැංකුවේ සාමාන්‍ය කටයුතු සඳහා ප්‍රවාහන සේවා සැපයීමට අමතරව බැංකුව විසින් පවත්වන ලද අන්තර් ජාතික සම්මන්ත්‍රණ ගණනාවකට අඛණ්ඩ ප්‍රවාහන සේවා සැපයීමට ද දෙපාර්තමේන්තුවට හැකි විය. ට්‍රාන්ස්වර්ක් චතුරශ්‍රයේ පිහිටි රථගාල චාමර්ස් ධාන්‍යාගාර ඉඩමට රැගෙන ගිය පසු එම රථගාල සහ මහ බැංකු ප්‍රධාන කාර්යාලය අතර සම්බන්ධිත ප්‍රවාහන සේවාවක් කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කරන ලදී. තවද ආගමික කටයුතු, සුභසාධන කටයුතු සහ ජාතික වැදගත්කමකින් යුතු කාර්යන්ට ද පහසුකම් සපයන ලදී.

# 11. මූල්‍ය කටයුතු

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව වර්ෂ 2002 දී ආරම්භ කරන ලද අතර, මුදල් නීති පනතේ විධිවිධාන අනුව, අදාළ වන ගණකාධිකරණ ප්‍රමිතීන්ට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම කරනු ලැබේ. මෙම දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම, වාර්ෂික අයවැය ලේඛන පිළියෙළ කිරීම හා අධීක්ෂණය, අභ්‍යන්තර හා බාහිර ගනුදෙනු සඳහා කාලීන හා නිවැරදි ගෙවීම් ක්‍රමයක් පවත්වාගෙන යාම, අභ්‍යන්තර අරමුදල් කිහිපයක් පවත්වාගෙන යාම, ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම සහ සේවක ණය මුදල් සඳහා ක්‍රමවත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම ඇතුළත්ය. 2012 වර්ෂය සඳහා වූ, විගණනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික ගිණුම් වාර්තාව වාර්ෂික වාර්තාවේ මෙම කොටස ආරම්භයේ ඇතුලත් කර ඇත.

## 11.1 මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය:** මූල්‍ය නීති පනත ප්‍රකාරව 2012 වසර තුළ දී මාසික ශේෂ පත්‍රය පිළියෙළ කර ඊළඟ මාසයේ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලදී.

(ආ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන:** 2003 වසර සිට වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙළ කිරීමට ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන් (ජා.ගි.ප්‍ර.) හා ජාත්‍යන්තර මූල්‍ය වාර්තා ප්‍රමිතීන් (ජා.මූ.වා.ප්‍ර.) උපයෝගී කරගෙන ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ ප්‍රකාශයට පත්කර ඇත. මෙම ප්‍රමිතීන් හා හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් අනුගමනය කරමින් මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව ගිණුම්කරණ පද්ධතිය හා ක්‍රියාපටිපාටීන් 2012 වර්ෂය තුළ දීත් යාවත්කාලීන කරන ලදී.

## 11.2 වාර්ෂික අයවැය හා ක්‍රියාකාරකම් මත පදනම් වූ අයවැය පිළියෙළ කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2013 වසර සඳහා වූ ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපාය මාර්ගික සැලසුම්වල කාර්යයන්ට අනුකූලව සිදුකර ඇත. ක්‍රියාකාරකම් හා කාර්යයන් මත පදනම් වූ අයවැය පිළියෙළ කිරීම ද වාර්ෂික අයවැය සමගම සිදු කළ අතර එමගින් දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් මත වූ පිරිවැය හා මහ බැංකුවේ කාර්යයන් මත පිරිවැය පෙන්නුම් කරන ලදී. මෙම ක්‍රියාවලිය 2012 අගෝස්තු මස ආරම්භ වූ අතර 2012 දෙසැම්බර් මස අවසාන වුණි. වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2012 දෙසැම්බර් මස ලබාගන්නා ලද අතර අනුමත අයවැය ප්‍රකාශනය 2013 වසරේ පළමු දිනම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2012 වර්ෂය සඳහා වූ අයවැයෙහි ක්‍රියාකාරිත්වය දැක්වෙන කාර්තුමය වාර්තා අයවැය පාලනය සඳහා යොමු කිරීමට සියලුම දෙපාර්තමේන්තුවලට සහ මුදල් මණ්ඩලයට යොමු කරන ලදී.

## 11.3 අභ්‍යන්තර හා බාහිර මූල්‍ය ගනුදෙනු සඳහා ගෙවීම් ක්‍රමය

(අ) 2012 වසර තුළ දී නිවැරදිව හා නියමිත කාලසීමාවන්ට අනුව අභ්‍යන්තර ගෙවීම් එනම්, සේවකයන් සඳහා ගෙවූ වේතන, සේවක ණය සහ මෙහෙයුම් වියදම් සිදු කරන ලදී.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ ක්‍රියාපටිපාටීන්ට යටත්ව සියලුම බාහිර ගෙවීම් දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට සිදුකර ඇත. ඒ අනුව 2012 වර්ෂය තුළ දේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම් 4,563 ක් හා විදේශීය සැපයුම්කරුවන් සඳහා ගෙවීම් 262 ක් සිදුකර ඇත.

(ඇ) 2012 වර්ෂය තුළ දී මහා භාණ්ඩාගාරයට හා අදාළ ව්‍යාපෘතීන් සඳහා ණය මුදල් නිදහස් කිරීම් ආසන්න වශයෙන් 2,722 ක් සහ විදේශීය ණය ආපසු ගෙවීම් 1,035 ක් සිදුකර ඇත. මහා භාණ්ඩාගාරයේ හා ව්‍යාපෘතීන්වල ඉල්ලීම පරිදි මාසිකව සිදු කරන ලද ගනුදෙනුවල වාර්තා නිකුත් කරන ලදී.

## 11.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව අභ්‍යන්තර අරමුදල් 12 ක් කළමනාකරණය කරන අතර, එයට සේවක හා විශ්‍රාම අරමුදල් 6 ක් ද, වෛද්‍ය ප්‍රතිලාභ අරමුදල් 3 ක් හා විශේෂ අරමුදල් 3 ක් ඇතුළත් වේ. මුදල් ප්‍රවාහ කළමනාකරණය, අරමුදල් ආයෝජනය, ගෙවීම් හා පියවීම් කිරීම, ගිණුම් තැබීම හා වාර්ෂික මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම මේ සම්බන්ධයෙන් ප්‍රධාන කාර්යයන් වේ. මෙම අරමුදල් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන අතර, 2012 වර්ෂය සඳහා වූ සාමාන්‍ය ඵලදා (Yield) අනුපාතය සියයට 11.66 ක් විය. 2011 වර්ෂය සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා මෙම අරමුදල්වල

නීතිරීතිවලට අනුව 2012 වර්ෂය තුළ දී මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත.

**II-12 සංඛ්‍යා සටහන** **අභ්‍යන්තරව කළමනාකරණය කරන අරමුදල්වල ක්‍රියාකාරිත්වය - 2012**

(රුපියල් මිලියන)

| අරමුදල් | ලැබීම් | ගෙවීම් | ආයෝජන | ආයෝජන වර්ෂය අවසානයේ දී | සාමාන්‍ය ඵලදාව (%) |
|---|---|---|---|---|---|
| විශ්‍රාම අරමුදල් | 11,509.1 | 3,296.6 | 8,212.5 | 34,246.6 | 11.52 |
| වෛද්‍ය ප්‍රතිලාභ | 31.0 | 1.0 | 30.0 | 93.9 | 12.26 |
| විශේෂ අරමුදල් | 657.0 | 13.9 | 643.1 | 1,141.2 | 12.63 |
| එකතුව | 12,197.1 | 3,311.5 | 8,885.6 | 35,481.7 | 11.66 |

### 11.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යාම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් යටතේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලබයි. එහිදී සියලුම වෙනස්කම් එනම්, නව මිලදී ගැනීම් හා ඒවායේ පිහිටුවීම්, පිහිටුවීම්වල සිදුවූ වෙනස්කම්, ප්‍රත්‍යාගණන, ක්ෂයකිරීම් සහ ඉවත් කිරීම් මෙම ලේඛනයේ 2012 වර්ෂය තුළ වාර්තා කර ඇත. ආසන්න වශයෙන් මෙවැනි වාර්තා කිරීම් 693 ක් 2012 වර්ෂය තුළ ඇතුළත් කර ඇත.

### 11.6 කාර්ය මණ්ඩල ණය දත්ත පවත්වාගෙන යාම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නිරතුරුවම මහ බැංකු කාර්ය මණ්ඩල ණය දත්ත පවත්වාගෙන යනු ලබන අතර, එමගින් ණය අය කර ගැනීම සහ සේවකයින්ට හා කළමනාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු පහසු කිරීම 2012 වර්ෂය තුළ දී ද සිදු කර ඇත.

### 11.7 අනෙකුත් කාර්යයන්

(අ) මිලදී ගැනීම් ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීතිරීතිවලට අනුව 2012 වර්ෂය තුළ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් භාණ්ඩ හා සේවා ලබාගැනීමට පෙර පවත්වන තාක්ෂණික ඇගයීම් කමිටුවලට හා ටෙන්ඩර් මණ්ඩලවලට සහ ලේකම් දෙපාර්තමේන්තුව මගින් පවත්වනු ලබන සමීක්ෂණ මණ්ඩලවලට ද සහභාගි වී ඇත. 2012 වර්ෂය තුළ දී එවැනි ටෙන්ඩර් මණ්ඩල 261 ක් සඳහා සහභාගි වී ඇත.

(ආ) නව පොදු ලෙජර පද්ධතිය

ශ්‍රී ලංකා මහ බැංකුව 2003 වර්ෂයේ සිට ඔරකල් (Oracle) පොදු ලෙජර පද්ධතිය ගිණුම්කරන කාර්ය සඳහා භාවිත කරයි. දැනට ආයතනය අභ්‍යන්තරයේ නව පොදු ලෙජර පද්ධතියක් සංවර්ධනය කරමින් පවතින අතර එය 2014.01.01 දින සිට භාවිතා කිරීමට නියමිතය. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම නව පොදු ලෙජර පද්ධතිය සංවර්ධනය කරන අතර, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව මෙම කාර්යයට නිරන්තර සහාය දෙමින් හා ගිණුම් සැකැස්ම යාවත්කාලීන කිරීමේ කටයුතුවලට සහයෝගය ලබාදෙමින් කටයුතු කරයි.

(ඇ) ආයෝජන උපදේශකත්ව කමිටුව

මුදල් මණ්ඩලය මගින් පත්කරන ලද මෙම කමිටුවේ කාර්යභාරය වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු මගින් සිදුකරනු ලබන අරමුදල්හි ආයෝජන සඳහා උපදේශකත්වය සැපයීමයි. මෙම කමිටුව මාසිකව රැස්වේ. ඒ සඳහා අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් සහභාගී වන අතර මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව ලේකම් කාර්යභාරය ද ඉටු කරයි. මෙම කමිටුව 2012 වර්ෂය තුළ දෙළොස්වරක් රැස්වූ අතර අදාළ කටයුතු කාර්තුවකට වරක් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

## 12. මූල්‍ය බුද්ධි ඒකකය

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ පිහිටුවන ලද මූල්‍ය බුද්ධි ඒකකය, 2007 වසරේ සිට ශ්‍රී ලංකා මහ බැංකුව තුළ ක්‍රියාත්මක වේ. මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යයන් අතරට මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී කටයුතුවලට මුදල් සැපයීම සහ මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ දැක්වෙන අනෙකුත් නීති විරෝධී ක්‍රියා සිදුවිය හැකි අවස්ථාවන් අනාවරණය කර ගැනීම පිණිස මුදල් ගනුදෙනුවලට අදාළ තොරතුරු එක්රැස් කිරීම, තොරතුරු ලබාගැනීම, සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විශ්ලේෂණ සිදු කිරීම, නෛතික බලාත්මක කිරීමේ ක්‍රියාමාර්ග ස්ථාපිත කිරීම සඳහා අදාළ නියාමන හා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට අවශ්‍ය තොරතුරු හා විස්තර ලබාදීම සහ මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා කරන ආයතන පරීක්ෂා කිරීම ද ඇතුළත් වේ. 2012 වසර තුළ මූල්‍ය බුද්ධි ඒකකයෙහි ප්‍රධාන කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 12.1 තොරතුරු එක්රැස් කිරීම, විමර්ශනය සහ බෙදාහැරීම

බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්, කොටස් තැරැව්කාර සමාගම් හා රක්ෂණ සමාගම් විසින් මූල්‍ය බුද්ධි ඒකකය මගින් පනවන ලද නියමයන්ට අනුකූලව එනම්, ශ්‍රී ලංකා මුදලින් හෝ විදේශ ව්‍යවහාර මුදලින් රුපියල් දස ලක්ෂය හෝ ඊට වැඩිවන සියලුම මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ වාර්තා (දේශීය හා විදේශීය), මූල්‍ය බුද්ධි ඒකකය සතු මාර්ගගත දත්ත කළමනාකරණ පද්ධතිය වන ලංකාෆින් (LankaFIN) හරහා වාර්තා කරන ලදී. ඒ අනුව පසුගිය වසර තුළ දී මිලියන 3.9 කට වැඩි මුදල් ගනුදෙනු සහ විද්‍යුත් මුදල් ප්‍රේෂණ සංඛ්‍යාවක් වාර්තා වූ අතර, සැකකටයුතු ගනුදෙනු වාර්තා 559 ක් වාර්තා විය. මූලික විමර්ශනවලින් අනතුරුව සැක කටයුතු ගනුදෙනු වාර්තා 56 ක් වැඩිදුර

විමර්ශනය සඳහා නීතිය ක්‍රියාත්මක කරන ආයතනවලට හා නියාමන අධිකාරීන්ට යොමුකරන ලදී. මේ වනවිට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID) විසින් සිදු කරන ලද විමර්ශනයන් පදනම් කරගෙන නීතිපති දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේ දී ගොනු කරන ලද අධිචෝදනා පත්‍ර 4ක් ද ඇතුළුව, මුදල් විශුද්ධිකරණය සම්බන්ධව අධිචෝදනා පත්‍ර 7ක් ද ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම සම්බන්ධව අධිචෝදනා පත්‍ර 3ක් ද ගොනුකර ඇත.

## 12.2 වාර්තා කරන ආයතන පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම

මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත යටතේ මුදල් විශුද්ධිකරණ ක්‍රියාවලියට සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමේ කටයුතුවලට පාත්‍රවීමේ අවදානම සොයා බැලීම සහ එම පනත යටතේ මූල්‍ය බුද්ධි ඒකකය විසින් නිකුත් කරන ලද රීති සහ විධානයන්ට අනුකූලව කටයුතු කරන්නේ ද යන්න සොයාබැලීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය මගින් 2012 වසර තුළ දී සියලුම ක්ෂේත්‍ර ආවරණය වන පරිදි පරීක්ෂණ 16ක් පවත්වන ලදී.

## 12.3 වෙනත් කටයුතු

### (අ) අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම

සැක කටයුතු ගනුදෙනුවලට අදාළ විමර්ශන කටයුතු සහ චෝදනා ගොනුකිරීම උදෙසා තොරතුරු හුවමාරු කර ගැනීමේ ක්‍රියාවලිය පහසු කර ගැනීමට මූල්‍ය බුද්ධි ඒකකය 2012 වසරේ දී ඇමෙරිකා එක්සත් ජනපද මූල්‍ය බුද්ධි ඒකකය (Financial Crime Enforcement Network-FinCEN), මොංගෝලියානු බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය (The Financial Information Unit of the Bank of Mongolia), රුසියානු සමූහාණ්ඩුවේ මූල්‍ය බුද්ධි ඒකකය (Federal Financial Monitoring Services of Russian Federation), සහ සෞදි අරාබියානු මූල්‍ය බුද්ධි ඒකකය (Saudi Arabian Financial Investigation Unit) සමග අවබෝධතා ගිවිසුම් 4ක් අත්සන් කරන ලදී. ඒ අනුව 2012 වසර අවසාන වන විට අත්සන් කර ඇති මුළු අවබෝධතා ගිවිසුම් සංඛ්‍යාව 20 දක්වා ඉහළ යන ලදී.

### (ආ) නියාමන රාමුවේ ප්‍රවර්ධනය

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට අරමුදල් සැපයීම වැළැක්වීම පිළිබඳ ජගත් ප්‍රමිතීන් සැලසුම් කරනු ලබන ආයතනය වන මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකාය (Financial Action Task Force) මගින් මෙතෙක් පැවති 40+9 නිර්දේශ 2012 පෙබරවාරි මස සිට බලාත්මක වන පරිදි නිර්දේශ 40කට සංශෝධනය කරන ලදී. තවද මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකාය (FATF) සමූහඝාතක අවි ප්‍රවර්ධනයට අරමුදල් සැපයීම වැළැක්වීම ද (Financing of proliferation of weapons of mass destruction) තම විෂය පථයට ඇතුළත් කරන ලදී. ජාත්‍යන්තර ආරක්ෂාව පිළිබඳව පවත්නා අවදානම්කාරී තත්ත්වය හමුවේ සමූහඝාතක අවි ප්‍රවර්ධනය මැඩපැවැත්වීමෙහිලා මූල්‍ය කටයුතු කාර්ය සාධන බලකාය විසින් නව නිර්දේශයක් (සංශෝධිත නිර්දේශ අනුව 7 වෙනි නිර්දේශය) ඇතුළත් කර ඇති අතර මේ මගින් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය මගින් ප්‍රකාශිත සම්බාධක ක්‍රියාවට නැංවීමට කටයුතු සලසා ඇත. අන්තර්ජාතික ප්‍රමිතීන්ට සමගාමීව පවත්නා නීතිමය රාමුව තවදුරටත් ශක්තිමත් කිරීමේ සහ ජාතික මට්ටමේ යහ පරිචයන් හඳුන්වාදීමේ අදිටනින් මූල්‍ය බුද්ධි ඒකකයෙහි උපදේශන කමිටුව විසින් නීති සමාලෝචන කමිටුවක් ස්ථාපනය කරන ලදී. මෙම කමිටුවේ ප්‍රධාන අරමුණ වනුයේ මූල්‍ය බුද්ධි ඒකකයෙහි ක්‍රියාකාරිත්වය තවදුරටත් නෛතිකව ශක්තිමත් කරනු වස් මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සංශෝධනය කිරීම වේ. තවද විදේශ විනිමය හුවමාරු කිරීමට බලයලත් සමාගම් විසින් ගනුදෙනුකරු හඳුනාගැනීම (Know -Your Customer) සහ ගනුදෙනුකරු සම්බන්ධ සුපරීක්ෂාකාරී වීමේ (Customer-Due-Diligence) අවශ්‍යතාව දැක්වෙන නිර්දේශයන් 2013 වසරේ නිකුත් කිරීම සඳහා අවශ්‍ය කටයුතු මූල්‍ය බුද්ධි ඒකකය විසින් සම්පාදනය කෙරිණි.

### (ඇ) ආයතනික හැකියාව ප්‍රවර්ධනය කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන්

මුදල් විශුද්ධිකරණයට හා ත්‍රස්තවාදයට අරමුදල් සැපයීමට අදාළ ගනුදෙනු හඳුනා ගැනීම, විශ්ලේෂණය කිරීම හා වාර්තා කිරීම සම්බන්ධයෙන් දැනුවත් කිරීමේ වැඩසටහන් 2012 වසරේ දී ද තවදුරටත් පවත්වමින් මූල්‍ය බුද්ධි ඒකකය විසින් පුහුණු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩසටහන් 28ක් පවත්වන ලදී. මේ සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, ලියාපදිංචි මූල්‍ය සමාගම්, ශ්‍රී ලංකා පොලීසිය, අධ්‍යාපනික සහ රාජ්‍ය ආයතන නියෝජනය කරමින් 1,825කට වැඩි පිරිසක් සහභාගි විය. මෙවැනි වැඩමුළු 2ක් සඳහා ඕස්ට්‍රේලියානු මූල්‍ය බුද්ධි ඒකකයේ (AUSTRAC - Australian FIU) සහය ලබාගැනිණි.

### (ඈ) ජාත්‍යන්තර සම්බන්ධතා

#### (i) එග්මොන්ට් කණ්ඩායම (EGMONT Group)

2012 වසරේ දී ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය සහ එග්මොන්ට් කණ්ඩායමේ (මූල්‍ය බුද්ධි ඒකක 132 කින් සමන්විත සංවිධානයකි) සාමාජික විදේශීය මූල්‍ය බුද්ධි ඒකක සිය විමර්ශන කටයුතුවල දී අන්‍යෝන්‍ය සහයෝග යෙන් කටයුතු කළ අතර විමර්ශනවලට අදාළ තොරතුරු හුවමාරු කිරීම් 23ක් සිදු කරන ලදී.

#### (ii) ආසියා - ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායම (Asia Pacific Group on Money Laundering)

ආසියා-ශාන්තිකර කලාපීය මුදල් විශුද්ධිකරණය පිළිබඳ කණ්ඩායමෙහි ආරම්භක සාමාජික රටක් ලෙස ශ්‍රී ලංකාව, 2012 වසරේ ජුලි මාසයේ දී ඕස්ට්‍රේලියාවේ දී පැවැත්වූ 15 වන වාර්ෂික සමුළුවට ද 2012 නොවැම්බර් මස වියට්නාමයේ දී පැවැති මුදල් විශුද්ධිකරණ උපායමාර්ග පිළිබඳ

සහ හැකියාව ප්‍රවර්ධනය කිරීමේ 15 වන වාර්ෂික වැඩමුළුවට ද සහභාගි විය. මෙවර උපායමාර්ග පිළිබඳ වාර්ෂික වැඩමුළුවේ දී තැනැත්තන් යොදවා සිදුකරන මුදල් ප්‍රවාහන කටයුතු (Cash Courier Service) සහ ජාත්‍යන්තර වෙළෙඳාම පදනම් කරගත් මූල්‍ය විශුද්ධිකරණයේ (Trade Based Money Laundering) අවදානම පිළිබඳ අවධානය යොමු කෙරිණි.

## 13. මූල්‍ය ස්ථායිතා අධ්‍යයන

මුදල් නීති පනතට අනුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු දෙකින් එක් අරමුණක් වන්නේ, මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීමයි. මූල්‍ය ස්ථායිතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පර්යේෂණ සහ අවේක්ෂණ කාර්යයන් සිදුකිරීම මගින් එම අරමුණ සඳහා පහසුකම් සලසනු ඇත.

මූල්‍ය ස්ථායිතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ, මූල්‍ය ස්ථායිතාවට අදාළ ක්ෂේත්‍රයන්හි පර්යේෂණ පැවැත්වීම, සාර්ව විචක්ෂණ අවේක්ෂණ රාමුවක් මාර්ගයෙන් මූල්‍ය පද්ධතියේ ඇති අවදානම් සහ සිදුවිය හැකි අනතුරු තක්සේරු කිරීම, එවැනි පර්යේෂණ සහ අවේක්ෂණ මත පදනම්ව සුදුසු ප්‍රතිපත්ති පියවර යෝජනා කිරීම සහ ප්‍රතිපත්ති සම්පාදකයන් හා මූල්‍ය අංශයට සම්බන්ධ අනෙකුත් පාර්ශ්වයන් අතර මූල්‍ය ස්ථායිතාව සම්බන්ධයෙන් දැනුවත් කිරීම යනාදිය සිදුකිරීමයි.

### 13.1 වසර තුළ සිදු කරන ලද ක්‍රියාකාරකම් :

#### (අ) පර්යේෂණ

2012 වසර තුළ පර්යේෂණ අධ්‍යයනයන් කිහිපයක් සිදුකරගෙන යන ලදී. ණය වර්ධනය සහ බැංකු අංශයේ ලාභදායිතා නිර්ණායක ආදිය සම්බන්ධයෙන් සිදුකරන ලද අධ්‍යයන, ඒ අතර ප්‍රධාන තැනක් ගනු ලැබීය.

#### (ආ) සාර්ව විචක්ෂණ අවේක්ෂණය

(i) ප්‍රධාන මූල්‍ය සහ මූල්‍ය නොවන ආයතනවල ශක්තිමත් බව පරීක්ෂා කිරීම පිණිස බැංකු, බැංකු නොවන සහ සංස්ථාපිත අංශ සඳහා අඛණ්ඩව සහ කාලීන පදනමක් මත මූල්‍ය ශක්තිමත්භාව දර්ශක පිළියෙළ කරන ලදී.

(ii) මූල්‍ය ස්ථායිතාවට අදාළ අංශවල වර්ධනය, අවදානම් සහ ඇති විය හැකි අනපේක්ෂිත ගැටලු පිළිබිඹු කරමින් මූල්‍ය අංශයේ අවදානම් තක්සේරු කරන වාර්තා, මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව වෙත අඛණ්ඩව ඉදිරිපත් කරන ලදී.

(iii) බැංකු අංශයේ සාංගමික යහපාලනය සම්බන්ධයෙන් වැදගත්වන උප දර්ශකයක් ඇතුළත් කරමින්, කාර්තුමය පදනම මත පිළියෙළ කරන බැංකු ශක්තිමත්භාව දර්ශකය වැඩි දියුණු කරන ලදී. එසේම, එම දර්ශකය කාර්තුමය පදනම මත යාවත්කාලීන කරන ලදී.

(iv) මුදල් වෙළෙඳපොළ සහ බැඳුම්කර වෙළෙඳපොළ, කොටස් වෙළෙඳපොළ සහ විදේශීය විනිමය වෙළෙඳපොළ යනාදියේ ස්ථායිතාව තක්සේරු කිරීම සඳහා මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතා දර්ශකය, විචල්‍යයන්ගේ යෝග්‍යතාව පරීක්ෂා කිරීමෙන් පසු වැඩිදියුණු කරන ලදී. මෙම දර්ශක මාසික පදනම මත යාවත්කාලීන කරන ලදී.

(v) රාජ්‍ය මූල්‍ය, මූර්ත අංශය, මූල්‍ය අංශය සහ විදේශ අංශය මෙන්ම ගෝලීය මූල්‍ය තත්ත්වය යනාදී සාර්ව ආර්ථික අංශයන්ගේ ස්ථායිතාව තක්සේරු කිරීම සඳහා නව සාර්ව ආර්ථික ස්ථායිතා දර්ශකයක් සකස් කරන ලදී. මෙම දර්ශකය මාසික පදනම මත යාවත්කාලීන කරන ලදී.

(vi) බැංකු ශක්තිමත්භාව දර්ශකය, මූල්‍ය වෙළෙඳපොළ ස්ථායිතා දර්ශකය සහ සාර්ව ආර්ථික ස්ථායිතා දර්ශකය භාවිතයෙන් රටේ සමස්ත මූල්‍ය ස්ථායිතාව පිළිබිඹු කරන සංයුක්ත දර්ශකයක් වන මූල්‍ය පද්ධති ස්ථායිතා දර්ශකයක් ද පිළියෙළ කරන ලදී.

(vii) කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත සමාගම්වල ණය පැහැර හැරීමේ සම්භාවිතාව තක්සේරු කිරීම මගින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත අංශයේ ණය ආපසු ගෙවීමේ ශක්‍යතාව විශ්ලේෂණය කිරීම උදෙසා සංස්ථාපිත අංශය සඳහා වූ ණය ආපසු ගෙවීමේ යෝග්‍යතා දර්ශකයක් කාර්තුමය පදනම මත යාවත්කාලීන කරන ලදී.

#### (ඇ) ප්‍රකාශන

2011 වසරට අදාළ මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම 2012 මාර්තු මාසයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. 2012 වසර සඳහා වන මූල්‍ය පද්ධති ස්ථායිතා විමසුම, 2012 අවසාන කාර්තුවේ දී පිළියෙළ කරනු ලැබූ අතර, එය 2013 වසරේ පළමු කාර්තුවේ දී ප්‍රකාශයට පත් කිරීමට නියමිතය.

#### (ඈ) මූල්‍ය පද්ධති ස්ථායිතාවට අදාළ කමිටුවල කටයුතු සම්බන්ධීකරණය

අභ්‍යන්තර කමිටුවක් වන මූල්‍ය පද්ධති ස්ථායිතා කමිටුව සහ පෞද්ගලික අංශයේ පළපුරුදු සහ ප්‍රවීණ නිලධාරීන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් අඛණ්ඩව කටයුතු පවත්වාගෙන යන ලදී.

### 13.2 දායකත්වය

#### (අ) දැනුවත්කම ඇතිකිරීම

මූල්‍ය පද්ධති ස්ථායිතාවට අදාළ ප්‍රකාශන මගින්, ස්ථායිතාව සඳහා දායක වූ මූලික සාධක සහ ස්ථායිතාව සහතික කිරීම සඳහා සමීපස්ථ සුපරීක්ෂණයට ලක්කළ යුතු සාධක පිළිබිඹු කරමින්, මූල්‍ය ස්ථායිතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අංශයට සම්බන්ධිත පාර්ශ්වයන් සහ පොදු ජනතාව සඳහා දැනුවත් කිරීම් සිදුකරන ලදී.

**(ආ) මූල්‍ය අංශයේ අවදානම් අවම කිරීම සඳහා පහසුකම් සැලසීම**

(i) මූල්‍ය අංශය සඳහා නව මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත ආදේශ කිරීම සැලකිල්ලට ගෙන, එම නව ප්‍රමිති මූල්‍ය ආයතන විසින් යොදාගැනීමට ඇති සූදානම තක්සේරු කරනු ලැබීය.

(ii) නියාමනය සහිත උකස් අංශයේ ශීඝ්‍ර වර්ධනය සැලකිල්ලට ගනිමින්, නියාමනය නොකරන උකස් අංශයේ ප්‍රමාණය තක්සේරු කිරීම සඳහා සමීක්ෂණයක් ආරම්භ කර ඇත.

(iii) මූල්‍ය ආයතනවල මූල්‍ය වාර්තාකරණයේ දී යොදාගනු ලබන තක්සේරු කිරීම්වල දී සිදුවන අක්‍රමිකතා අවම කිරීම සඳහා අදාළ ආයතන සමග සුදුසු ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සාකච්ඡා ආරම්භ කර ඇත.

**(ඇ) මූල්‍ය වෙළෙඳපොළ සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම**

(i) සාංගමික ණය වෙළෙඳපොළේ වේගවත් වර්ධනයට අවශ්‍ය පියවර සහ විදේශ විනිමය ආශ්‍රිත සාංගමික ණයකරණයේ දී ඇතිවන ගැටලු යනාදී සංක්ෂිප්ත යෝජනා අදාළ බලධාරීන්ට යොමුකරන ලදී. මෙම පියවරයන්ගෙන් සමහරක් 2013 අයවැය මගින් දැනටමත් හඳුන්වා දී ඇත.

(ii) 2007 අංක 7 දරන සමාගම් පනතට ඇතුළත් කිරීමට නියමිත "සමාගම් පුනරුත්ථාපනය කිරීම සහ ප්‍රතිසංවිධානය කිරීම" යන නව වගන්තීන් වැඩි දියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කරන ලදී.

## 14. අධිපති ලේකම්

නොකඩවා වෙනස්වන හා අභියෝගාත්මක මූල්‍ය හා ආර්ථික වාතාවරණයක් යටතේ මහ බැංකු අධිපතිතුමා හට සිය කටයුතු කරගෙනයාමේ දී අවශ්‍ය වූ පුළුල් මෙහෙයුම් හා තාක්ෂණික සහායයන් සැපයීම අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය තුළ සිදුකරන ලදී.

ශ්‍රී ලංකා ආර්ථිකයෙහි අපේක්ෂිත ආර්ථික අරමුණුවලට අනුකූලව සකස් වූ පසුබිමක් තුළ, අධිපති ලේකම් දෙපාර්තමේන්තුව සිය බහුවිධ කාර්යයන් ඉටු කරන ලදී. අධිපති ලේකම් දෙපාර්තමේන්තුව, අධිපතිතුමාට අවශ්‍ය වූ ඉහළ මට්ටමේ ලේකම් සේවාවන්, පරිපාලන සහායයන් හා සන්ධාන සේවාවන් සපයනු ලැබූ අතර බැංකු, මූල්‍ය හා ආර්ථික ක්ෂේත්‍රයන්හි දේශීය හා විදේශීය පාර්ශ්වයන් සමග ඵලදායී අන්තර් සම්බන්ධතා පවත්වා ගන්නා ලදී. මේ සම්බන්ධයෙන්, කාලය, තොරතුරු, සන්නිවේදනය සහ අන්තර් සම්බන්ධතා කළමනාකරණය අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ කේන්ද්‍රීය කරගත් කාර්යභාරයන් වූ අතර මෙය ඉතා සැලකිලිමත්ව හා වෘත්තීයමය ලෙස හසුරුවන ලදී.

අධිපතිතුමාගේ හමුවීම් සහ රැස්වීම් විශාල ප්‍රමාණයක් නිසි ලෙස දිනපොත්ගත කරමින් සහ එවැනි හමුවීම් හා රැස්වීම් නිසි පරිදි සම්බන්ධීකරණය කිරීමෙන් සහ අදාළ පාර්ශ්වයන් සමග අවශ්‍ය අවස්ථාවන්හි දී පසු විපරම් කටයුතු සිදු කිරීමත් මගින් අධිපතිතුමාගේ කාලය නිසි ලෙස කළමනාකරණය කර ගනිමින් අධිපති ලේකම් දෙපාර්තමේන්තුව සැලසුම්ගත වැඩ පිළිවෙළක් වර්ෂය තුළ ක්‍රියාත්මක කරනු ලැබීය. තවද, අධිපතිතුමා විසින් කරනු ලැබූ ඉදිරිපත් කිරීම් සහ දේශන කෙටුම්පත් කිරීම හා සකස් කිරීම යන ලේකම් සේවාවන් ද නියමිත පරිදි සිදුකරන ලදී.

මහ බැංකුවෙහි සියලුම කාර්යයන් පිළිබඳව මෙන්ම අධිපතිතුමන් මගින් හුවමාරු වන සියලුම තොරතුරු හා ලියකියවිලි ආදිය පිළිබඳව මනා දැනුවත් බවක් ලබාගෙන තිබූ අතර, අධිපතිතුමා හා අනෙකුත් පාර්ශ්වයන් අතර තොරතුරු සන්නිවේදනය කිරීම සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව සහාය විය. මහ බැංකුවෙහි කටයුතු සඳහා තීරණාත්මක ලෙස බලපෑ හැකි තොරතුරු බැංකුවෙහි උන්නතියට ඉවහල් වන පරිදි අධිපතිතුමාට සන්නිවේදනය කිරීම ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. එලෙසම, අධිපතිතුමා වෙත ලැබෙන හා අධිපතිතුමා වෙතින් යොමු වෙන දුරකථන ඇමතුම් විශාල ප්‍රමාණයක් ඉතාමත් ඉහළ ආචාරශීලිත්වයකින් යුතුව හසුරුවන ලදී. මහ බැංකු අධිපතිතුමා වෙත යොමු වූ මහජන විමසීම් සඳහා පැහැදිලි කිරීම් සහ මඟ පෙන්වීම් දෛනික වශයෙන් සිදුකරන ලැබූ අතර අවශ්‍ය අවස්ථාවන්හිදී ඒවා යුහුසුළුව අධිපතිතුමාගේ අවධානයට යොමු කරන ලදී. එයට අමතරව, මහ බැංකු අධිපතිතුමා ආමන්ත්‍රිත හා අධිපතිතුමා විසින් යොමු කරන ලද සාමාන්‍ය තැපැල්, විද්‍යුත් තැපැල් හා අනෙකුත් ලියකියවිලිවලට අදාළ ලේකම් කටයුතු ද මෙහෙයවනු ලැබූ අතර, අධිපතිතුමා වෙත යොමු කර තිබූ එවැනි දෑ සුදුසු ලෙසට සාරාංශගත කොට අධිපතිතුමා වෙත ඉදිරිපත් කිරීම ද සිදුකරන ලදී. ඒ අතරම, අධිපතිතුමා විසින් පවරන ලද කාර්යයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකරමින් අනෙකුත් දෙපාර්තමේන්තු වෙත සහ ඉහළ කළමනාකරණය වෙත පවරන ලද කාර්යයන් නිසි කාල රාමුවකට අනුව සිදු කරන ලද්දේ ද යන්න පිළිබඳව පසුවිපරම් කිරීම අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. එලෙසම, ඉතා වැදගත් හා ඉක්මණින් කළ යුතු කාර්යයන් විශාල ප්‍රමාණයකට මූලිකත්වය දෙමින් අධිපති ලේකම් දෙපාර්තමේන්තුව තම කාර්යයන් සිදුකරන ලදී.

බැංකුවේ ඉහළ කළමනාකරණය, අනෙකුත් දෙපාර්තමේන්තු සහ සම්බන්ධිත බාහිර ආයතන සමග ඉතා සමීප සම්බන්ධතාවයන් පවත්වා ගැනීමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. ශ්‍රී ලංකාවේ මූල්‍ය හා ආර්ථිකය පිළිබඳ ප්‍රසාදය සුදුසු තලයකට ගෙන ඒමට අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර සම්බන්ධතා කළමනාකරණය මනාව ශ්‍රී ලංකාව පිළිබඳ ආයෝජකයන්ගේ

විශ්වාසය වැඩි දියුණු කිරීමට කටයුතු සිදුකරන ලදී. මේ අනුව, විදේශීය ආයෝජකයන් සමග මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීමත් ඔවුන් සඳහා අවශ්‍ය වන තොරතුරු සැපයීම හා රැස්වීම් සංවිධානය කිරීමත්, අධිපතිතුමන් විදේශ ආයෝජකයන් හා විදේශ මාධ්‍ය සමග පවත්වන්නාවූ විද්‍යුත් සම්මන්ත්‍රණ හා විද්‍යුත් සම්මුඛ සාකච්ඡා සංවිධානය කිරීමත් යන කටයුතු විධිමත්ව හා කාර්යක්ෂම ලෙස අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

අධිපතිතුමන්ගේ හා මුදල් මණ්ඩලයේ ගෞරවය හා විශ්වාසය සුරක්ෂිත වන පරිදි අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සන්ධාන පහසුකම් අවශ්‍ය සියලු අවස්ථාවන්හි දී සපයන ලදී. මේ සම්බන්ධයෙන්, අධිපතිතුමාට, නියෝජ්‍ය අධිපතිවරුනට, අධිපතිතුමාගේ විශේෂිත අමුත්තන්ට මෙන්ම බැංකුවේ විශේෂ ආරාධිත අමුත්තන්ට අවශ්‍ය කෙරෙන සියලුම සන්ධාන සේවාවන් ලබාදීමට ද, අධිපති ලේකම් දෙපාර්තමේන්තුව අවශ්‍ය පියවර ගනු ලැබීය. එහිදී අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගනු ලැබූ ඉහළ ආචාරශීලීත්වය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රතිරූපය ගොඩනැගීමට හේතු සාධක විය.

අධිපතිතුමන්ගේ දේශීය මෙන්ම විදේශීය නිල සංචාරයන්ට අදාළ සියලුම කටයුතු අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. අධිපතිතුමා විසින් රටෙහි ආර්ථික වශයෙන් වඩාත් වැදගත්කමක් ඇති ස්ථාන වෙතට කරනු ලැබූ ක්ෂේත්‍ර චාරිකා සඳහා සහ නිල උත්සව සම්බන්ධිත සන්ධාන කටයුතු ඇතුළු සියලු කාර්යයන් යථා පරිදි ඉටු කිරීම සඳහා අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සියලු කටයුතු සංවිධානය කරන ලදී. ඉහළ පෙළේ ජාත්‍යන්තර රැස්වීම් හා සම්මන්ත්‍රණ, විදේශ ආයෝජන ප්‍රවර්ධන රැස්වීම් හා අනෙකුත් නිල රැස්වීම් මෙන්ම රාජ්‍ය නිල සංචාරවලට ද අධිපතිතුමා සහභාගි වූ අවස්ථාවල දී එම විදේශීය නිල සංචාර සංවිධානය කිරීමත් එම රැස්වීම්වල සාර්ථකභාවය සඳහා අවශ්‍ය කෙරෙන ඉදිරිපත් කිරීම්, දත්ත හා තොරතුරු ලබාදීම ආදී කාර්යයන් ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී. එයට අමතරව, අධිපතිතුමන් හා නියෝජ්‍ය අධිපතිවරුන්ගේ මෙහෙයවීමෙන් පැවති සියලු නිල උත්සව සංවිධානය ද අධිපති ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

## 15. මානව සම්පත් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ඉදිරි දැක්ම සහ මෙහෙවර සපුරාගැනීම අරමුණු කර ගනිමින් සේවකයන්ගේ සැබෑ දක්ෂතාවන් උකහා ගැනීම සහ එමඟින් මහ බැංකුවට වඩාත් ගුණාත්මක සේවාවක් සැපයීමට හැකි වන අයුරින් විශේෂිත කුසලතාවන් ඇති පුද්ගලයන් ආකර්ෂණය කර ගැනීමට හා රඳවා ගැනීමට හැකිවන පරිදි මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් හා පරිචයන් සංවර්ධනය කිරීම සහ ඒ සඳහා වඩාත් සුදුසු ක්‍රමවේදයන් සැකසීම මානව සම්පත් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. මානව සම්පත් දෙපාර්තමේන්තුවේ උපාය මාර්ගික අරමුණ කේන්ද්‍රගත වී ඇත්තේ ඉදිරි අභියෝග හමුවේ මහ බැංකුවේ මූලික අරමුණ ඉටු කර ගැනීමට දායක විය හැකි ඉහළ ඵලදායිතාවයකින් යුත් අභිප්‍රේරිත සහ කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ ස්ථාපිත කිරීම කෙරෙහිය. සිය උපායමාර්ගික අරමුණ ඉටුකර ගැනීමෙහිලා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේ දී ක්‍රියාත්මක කරන ලද මූලික කාර්යයන් වූයේ මහ බැංකුවේ උපායමාර්ගික සැලැස්ම තුළ හඳුනාගත් මානව සම්පත් අවශ්‍යතාවයන්ට අනුකූලව පුහුණුවීම් ලබාදීම හා සංවර්ධනය, කාර්යසාධන කළමනාකරණය, අනුප්‍රාප්ති සැලසුම්කරණය හා උසස්වීම් ලබාදීම, නව සේවකයන් බඳවා ගැනීම, සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම සහ බැංකුවේ සියලු පාර්ශ්වයන් සමග සමීප සංවාදයක් පවත්වා ගැනීම වේ.

### 15.1 මානව සම්පත් ව්‍යුහය

2012 දෙසැම්බර් මස අවසානය වන විට මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,398 ක් වූ අතර, එය මාණ්ඩලික පංතියේ නිලධාරීන් 615 ගෙන් ද, මාණ්ඩලික නොවන පංතියේ නිලධාරීන් 625 ගෙන් ද, සුළු සේවක කාර්ය මණ්ඩලය 155 ගෙන් හා ස්ථාවර කාලීන කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරීන් 03 දෙනෙකුගෙන් ද සමන්විත විය. 2012 වසර තුළ දී මාණ්ඩලික නිලධාරීන් 33 ක් හා මාණ්ඩලික නොවන නිලධාරීන් 16 ක් බැංකු සේවාවෙන් විශ්‍රාම ගිය අතර, තවත් සේවකයන් 11 දෙනෙකු බැංකු සේවාවෙන් ඉල්ලා අස්විය.

2012 දෙසැම්බර් මස 31 දින වන විට මහ බැංකු කාර්ය මණ්ඩල සේවකයෙකුගේ ඇස්තමේන්තුගත සාමාන්‍ය වයස අවුරුදු 42 ක් විය. සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 26 ක් වයස අවුරුදු 30 ට අඩු වූවන් වූ අතර, සියයට 29 ක් වයස අවුරුදු 31 - 45 අතර විය. මෑතකාලීනව සිදු කළ නව සේවක බඳවා ගැනීම් මහ බැංකුවේ තරුණ සේවක ප්‍රතිශතය සැලකිය යුතු ලෙස වර්ධනය වීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබේ.

මහ බැංකුව දෙපාර්තමේන්තු 27 කින් සහ පළාත් කාර්යාල 5 කින් සමන්විත වන අතර සෑම දෙපාර්තමේන්තුවක් හා

**II-3 රූප සටහන** **2012.12.31 දිනට සේවක සංයුතිය**



**II-13 සංඛ්‍යා සටහන** **2012.12.31 දිනට මානව සම්පත් ව්‍යුහය**

| සේවක පංතිය | සේවක සංඛ්‍යාව | | | සාමාන්‍ය වයස (අවුරුදු) | අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පිරිමි | ගැහැණු | මුළු සංඛ්‍යාව | | පශ්චාත් උපාධිය, ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | පශ්චාත් උපාධිය හා ප්‍රථම උපාධිය | පශ්චාත් උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය හා වෘත්තීය සුදුසුකම් | ප්‍රථම උපාධිය | වෘත්තීය සුදුසුකම් |
| 1. මාණ්ඩලික පංතිය | | | | | | | | | | |
| i) IV ශ්‍රේණිය සහ ඉහළ ශ්‍රේණි | 55 | 17 | 72 | 54 | 15 | 46 | 03 | 04 | 04 | - |
| ii) III 2 ශ්‍රේණිය | 50 | 10 | 60 | 53 | 06 | 36 | - | 01 | 16 | - |
| iii) III 1 ශ්‍රේණිය | 14 | 26 | 40 | 47 | 01 | 10 | 01 | 06 | 20 | - |
| iv) II ශ්‍රේණිය | 75 | 84 | 159 | 44 | 11 | 19 | 02 | 21 | 70 | 4 |
| v) I ශ්‍රේණිය | 108 | 176 | 284 | 41 | 05 | 17 | 01 | 44 | 118 | 22 |
| 2. මාණ්ඩලික නොවන පංතිය | | | | | | | | | | |
| i) V ශ්‍රේණිය | 39 | 29 | 68 | 56 | - | - | - | - | 04 | 02 |
| ii) IV ශ්‍රේණිය | 80 | 41 | 121 | 50 | - | - | - | - | 12 | 02 |
| iii) III ශ්‍රේණිය | 39 | 07 | 46 | 52 | - | - | 01 | - | - | 02 |
| iv) II ශ්‍රේණිය | 157 | 130 | 287 | 32 | - | - | - | 07 | 28 | 13 |
| v) I ශ්‍රේණිය | 96 | 07 | 103 | 44 | - | - | - | - | - | - |
| 3. සුළු සේවක පංතිය | | | | | | | | | | |
| i) I, II සහ III ශ්‍රේණි | 142 | 13 | 155 | 32 | - | - | - | - | - | - |
| 4. කොන්ත්‍රාත් පදනම යටතේ බඳවාගත් නිලධාරීන් | | | | | | | | | | |
| i) සියලුම කාණ්ඩයන් | 02 | 01 | 03 | 58 | - | 01 | - | - | - | 01 |
| මුළු සංඛ්‍යාව | 857 | 541 | 1,398 | 42 | 38 | 129 | 08 | 83 | 272 | 46 |

පළාත් කාර්යාලයක්ම රාජකාරී කටයුතු කාර්යක්ෂමව ඉටු කළ හැකි සුදුසුකම්ලත් සහ කුසලතාවයන්ගෙන් හෙබි සේවක මණ්ඩලයකින් සමන්විත වේ. මාණ්ඩලික පංතියේ නිලධාරීන්ගෙන් සියයට 82 කට වඩා වැඩි ප්‍රතිශතයක් අවම වශයෙන් ප්‍රථම උපාධි සුදුසුකමක්, පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ වෘත්තීය සුදුසුකමක් සපුරා තිබිණ. 2012 වසර අවසාන වන විට මහ බැංකුවේ ආචාර්ය උපාධි සුදුසුකම් සහිත නිලධාරීන් සංඛ්‍යාව 9 දෙනෙකු වූ අතර, ඔවුන් තිදෙනෙකු වෘත්තීය සුදුසුකම් ද සපුරා තිබිණි.

2012 දෙසැම්බර් මස අවසානය වන විට, බැංකුවට අදාළ විෂය ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රථම උපාධියක්, පශ්චාත් උපාධියක් හෝ වෘත්තීය සුදුසුකමක් සපුරන ලද සමස්ත සේවක සංඛ්‍යාව 576 ක් විය. එම සුදුසුකම් වල සංයුතිය II-4 රූප සටහනෙහි දැක්වේ.

**II-4 රූප සටහන** **මහ බැංකු නිලධාරීන්ගේ අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් සංයුතිය**



## 15.2 මානව සම්පත් දෙපාර්තමේන්තුවේ කාර්යයන්

### (අ) පුහුණු වැඩ කටයුතු හා සංවර්ධනය

මුදල් නීති පනතේ 27 වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, මහ බැංකු නිලධාරීන් හට ආර්ථික විද්‍යාව, බැංකුකරණය, සංඛ්‍යානය සහ වෙනත් අදාළ විෂයයන් යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ විදේශගතව අධ්‍යයන කටයුතු කිරීමට හා පුහුණුව ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ශ්‍රී ලංකා මහ බැංකුව මගින් සම්පාදනය කරනු ලැබේ. ඒ අනුව, අන්තර්ජාතික මූල්‍ය අංශය තුළ සිදු වන නවීන තාක්ෂණික වෙනස්කම් පිළිබඳව මහ බැංකු කාර්යමණ්ඩලයේ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමත්, බුද්ධිමය හැකියාවන් (Intellectual Capacity) පුළුල් කිරීමත් අරමුණු කොටගෙන මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් දිගුකාලීන හා කෙටිකාලීන විදේශීය හා දේශීය පුහුණු අවස්ථාවන් ලබාදීම 2012 වසර තුළ දී ද අඛණ්ඩව සිදු කරන ලදී.

### (i) කෙටිකාලීන පුහුණු අවස්ථා

2011 වසර අවසානයේ දී සිදුකළ වාර්ෂික නිපුණතා අනුරූපන ක්‍රියාවලිය (Annual Competancy Mapping Exercise) තුළින් හඳුනාගත් නිපුණතා පරතරයන් පදනම් කර ගනිමින් සකස් කරන ලද 2012 වසර සඳහා වූ පුහුණු සැලසුම අනුව මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු නිලධාරීන්ගේ නිපුණතා පරතරයන් අවම කිරීම සඳහා දේශීය හා විදේශීය කෙටිකාලීන පුහුණු පාඨමාලාවන්ට සහභාගි වීමට නිලධාරීන්ට අවස්ථාවන් සලසා දෙන ලදී.

### (ii) කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා

ප්‍රධාන වශයෙන්ම කෙටිකාලීන විදේශ පුහුණු වීම් සඳහා ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, සියැසන් (SEACEN) මධ්‍යස්ථානය, ඉන්දියානු සංචිත බැංකුව සහ ජර්මානු මහ බැංකුව වැනි ජාත්‍යන්තරව පිළිගත් ආයතනවල පැවති පාඨමාලා සඳහා මහ බැංකු සේවකයින් යොමු කරන ලදී. 2012 වසර තුළ දී ලබා දුන් විදේශ පුහුණු අවස්ථා සංඛ්‍යාව 213 ක් වූ අතර, එය 2011 වසරේ දී ලබා දුන් විදේශ පුහුණු අවස්ථා 204 ට සාපේක්ෂව සියයට 4 ක වර්ධනයක් පෙන්නුම් කරන ලදී.

2012 වසරේ දී ලබා දුන් විදේශ පුහුණු අවස්ථා පිළිබඳ තොරතුරු II-14 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-14 සංඛ්‍යා සටහන** — **කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා - 2012**

| ක්ෂේත්‍රය | සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| ආර්ථික විද්‍යාව | 43 |
| මූල්‍ය ස්ථායිතාව | 56 |
| සංචිත කළමනාකරණය | 19 |
| රාජ්‍ය ණය කළමනාකරණය/ආයෝජන කළඹ කළමනාකරණය | 25 |
| ව්‍යවහාර මුදල් කළමනාකරණය | 10 |
| තොරතුරු තාක්ෂණය සහ ගෙවීම් පද්ධති | 12 |
| මහ බැංකු කටයුතු | 12 |
| මානව සම්පත් කළමනාකරණය | 10 |
| වෙනත් | 26 |
| **එකතුව** | **213** |

විදේශ පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ නිලධාරීන්ට එමගින් ලබාගත් දැනුම උපයෝගී කොටගෙන විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට පැවරීම තුළින් විදේශ පුහුණුවීම්වල ඵලදායිතාවය ඇගැයීමට පුහුණු කටයුතු පිළිබඳ උපකමිටුව අඛණ්ඩව කටයුතු කරන ලදී. ඒ අනුව, 2012 වසරේ දී පුහුණු කටයුතු පිළිබඳ උප කමිටුව මගින් නිර්දේශ කළ පරිදි එවැනි පැවරුම් 111 ක් අදාළ නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලදී. පසුගිය වසරට සාපේක්ෂව කෙටිකාලීන විදේශ පුහුණුවීම් වලින් ඇති වූ ඵලදායිතාවයෙහි කැපී පෙනෙන වර්ධනයක් සනිටුහන් කරමින් පැවරුම් 30 ක් තුළින් ඉදිරිපත් කරන ලද යෝජනා සාර්ථකව ක්‍රියාවට නංවන ලදී. මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා වූ මාර්ගෝපදේශ නිකුත් කිරීම, මහ බැංකුවේ පැවති ඇතැම් ක්‍රමවේදයන් හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම, පුහුණු වැඩසටහන් මගින් ලබාගත් දැනුම තුළින් මහජනතාව දැනුවත් කිරීම සහ එම දැනුම මහ බැංකුවේ අනෙකුත් නිලධාරීන්ට ද ලබාදීම වැනි ව්‍යාපෘති මේ යටතේ ක්‍රියාත්මක කෙරිණි. 2012 වසර තුළ දී සම්පූර්ණ කරන ලද සහ ක්‍රියාත්මක කරන ලද පැවරුම් පිළිබඳ සාරාංශගත විස්තරයක් II-15 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-15 සංඛ්‍යා සටහන** — **2012 වසර තුළ දී කෙටිකාලීන විදේශ පුහුණුව ලැබූ නිලධාරීන් විසින් සම්පූර්ණ කරන ලද /ක්‍රියාවට නංවන ලද පැවරුම්**

| කාණ්ඩය | පැවරුම් සංඛ්‍යාව |
|---|---|
| මූල්‍ය ආයතන අධීක්ෂණය සඳහා වූ මාර්ගෝපදේශ | 12 |
| පුහුණු පාඨමාලා සැකසීම | 05 |
| දැනුම බෙදාදීමේ සහ මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් | 28 |
| සංකල්ප පත්‍රිකා සහ රටවල් පිළිබඳ අධ්‍යයන | 40 |
| පද්ධති හා ක්‍රියාවලීන් වැඩිදියුණු කිරීම සඳහා වූ යෝජනා | 26 |
| **මුළු එකතුව** | **111** |

### (iii) කෙටිකාලීන දේශීය පුහුණු අවස්ථා

මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා විදේශ පුහුණු අවස්ථාවලට අමතරව දේශීය පුහුණු අවස්ථාවන් 1,530 ක් 2012 වසර තුළ දී ලබා දෙන ලදී. මෙම පුහුණු අවස්ථාවන් ප්‍රධාන වශයෙන් ම ලබාදෙන ලද්දේ මහ බැංකුවේ බැංකු අධ්‍යයන කටයුතු

පිළිබඳ දෙපාර්තමේන්තුව වන බැංකු විදු පියෙස (CBS) සහ අනෙකුත් පිළිගත් දේශීය පුහුණු ආයතනයන් මගිනි. බැංකු විදු පියෙස මගින් පවත්වන ලද පුහුණු වැඩසටහන් වලට සහභාගි වූ නිලධාරීන් සංඛ්‍යාව 900 ක් වූ අතර තවත් නිලධාරීහු 318 ක් වෙනත් පිළිගත් දේශීය පුහුණු ආයතන මගින් පවත්වනලද පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූහ. දේශීය පුහුණු අවස්ථාවන් ලබාදීමේ දී නිලධාරීන්ට සිය දැනුම යාවත්කාලීන කර ගැනීමට සහ කාර්යසාධනය වැඩිදියුණු කරගැනීමට හැකි වන පරිදි ආර්ථික විද්‍යාව, බැංකු අධීක්ෂණය, තොරතුරු තාක්ෂණය, සන්නිවේදනය, මූල්‍ය හා ප්‍රාග්ධන වෙළෙඳපොළ, අභ්‍යන්තර විගණනය සහ කළමනාකරණය යන ක්ෂේත්‍ර සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලදී.

### (iv) වැඩමුළු සහ භාෂා පුහුණු පාඨමාලාවන්

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2012 වසර තුළ දී නායකත්වය, අභිප්‍රේරණය, සන්නිවේදනය සහ වාර්තා ලිවීම යන ක්ෂේත්‍රයන් ආවරණය කරමින් වැඩමුළු 11 ක් සංවිධානය කරන ලදී. මෙම වැඩමුළුවල අරමුණ වූයේ බැංකු කාර්ය මණ්ඩලයට සිය වෘත්තීය විශිෂ්ටත්වය ළඟා කර ගැනීමට අවශ්‍ය වන වෘත්තීය හා ශිල්පීය හැකියාවන් වැඩිදියුණු කර ගැනීමට අවස්ථාව සැලසීමයි. මීට අමතරව, ද්‍රවිඩ බස කථා කරන ජනතාවට වඩා කාර්යක්ෂම අයුරින් සේවා සැපයීමට මහ බැංකු කාර්ය මණ්ඩලයට පහසුකම් සැලසීමේ අරමුණින් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව සමග එක්ව දෙමළ භාෂා පුහුණු පාඨමාලා පැවැත්වීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

2012 වසරේ දී ලබාදුන් කෙටිකාලීන විදේශීය හා දේශීය පුහුණු අවස්ථා දෙපාර්තමේන්තු කාණ්ඩ පහ තුළ ව්‍යාප්ත වූ අයුරු පහත II - 5 රූපසටහනෙහි දැක්වේ.

**II-5 රූප සටහන** **කෙටිකාලීන පුහුණු අවස්ථා - 2012**




සමස්ත කෙටිකාලීන විදේශ පුහුණු අවස්ථා ප්‍රමාණයෙන් සියයට 35 ක් ආර්ථික හා මිල ස්ථායිතාව සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව යන කාණ්ඩවලට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන්ට ලබා දෙන ලදී.

**II-6 රූප සටහන** **ආර්ථික හා මිල ස්ථායිතා කාණ්ඩය**




**II-7 රූප සටහන** **මූල්‍ය පද්ධති ස්ථායිතා කාණ්ඩය**




ආර්ථික හා මිල ස්ථායිතා කාණ්ඩයට සහ මූල්‍ය පද්ධති ස්ථායිතා කාණ්ඩයට අයත් දෙපාර්තමේන්තු අතර පුහුණු අවස්ථා ව්‍යාප්තිය II-6 හා II-7 රූපසටහන් මගින් දැක්වේ. ඒ අනුව ආර්ථික හා මිල ස්ථායිතා කාණ්ඩයට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා ලබා දුන් සමස්ත පුහුණු අවස්ථා සංඛ්‍යාවෙන් සියයට 46 ක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ද, මූල්‍ය පද්ධති ස්ථායිතා කාණ්ඩයට අයත් දෙපාර්තමේන්තුවල නිලධාරීන් සඳහා ලබාදුන් පුහුණු අවස්ථාවලින් බහුතරය බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා ද ලබා දෙන ලදී.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද පුහුණු අවස්ථාවන්ට අමතරව, විවිධ දෙපාර්තමේන්තු විසින් සිය සේවකයන්ගේ දැනුම සහ කුසලතා වැඩිදියුණු කර ගැනීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු තුළදීම දැනුම හුවමාරු කර ගැනීමට, කුසලතා වර්ධනය කර ගැනීමට මෙන්ම පර්යේෂණ කටයුතුවල නියැලීමට අවස්ථාවන් සලසා දෙන ලද අතර, එවැනි එක් උදාහරණයක් ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය නිලධාරීන්ට පුළුල් ආර්ථික විද්‍යා පර්යේෂණයන්හි නිරතවීමට අවස්ථාව සලසමින් සාර්ව ආර්ථික විද්‍යා ආකෘතිකරණ ඒකකය ආරම්භ කිරීම දැක්විය හැකිය.

### (v) දිගුකාලීන පුහුණු අවස්ථා

මහ බැංකු මාණ්ඩලික නිලධාරීන්ගේ බුද්ධිමය හැකියාවන් පුළුල් කිරීම අරමුණු කොටගත් පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකු ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ 2012 වසර තුළ දී, එක්සත් රාජධානිය, ඇමෙරිකා එක්සත් ජනපදය, කැනඩාව, ඕස්ට්‍රේලියාව සහ චීනය යන රටවල පිළිගත් විශ්ව විද්‍යාලවල ආචාර්ය උපාධි හා විද්‍යාපති උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම සඳහා පිළිවෙළින් නිලධාරීන් 4 දෙනෙකුට සහ 18 දෙනෙකුට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුග්‍රහය දක්වන ලදී. පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කළ සමස්ත නිලධාරීන් 22 න් 16 දෙනෙක් ආර්ථික විද්‍යා විෂයධාරාවෙන් සිය අධ්‍යයන කටයුතු සිදු කරනු ලබති. මේ අතර, ආචාර්ය උපාධි පාඨමාලා සාර්ථකව නිම කරන ලද නිලධාරීන් 02 දෙනෙකු සහ විද්‍යාපති උපාධි පාඨමාලා සාර්ථකව නිමකළ නිලධාරීන් 17 දෙනෙකු 2012 වසර තුළ දී නැවත බැංකු සේවයට වාර්තා කරන ලදී. මෙලෙස නිලධාරීන්ගේ බුද්ධිමය හැකියාවන් පුළුල්වීමත් සමග ආර්ථික හා මූල්‍ය අංශයන්ට අදාළව වඩාත් නිරවද්‍ය ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවට හැකියාව ලැබී තිබේ. 2008 සිට 2012 දක්වා කාල පරාසය තුළ ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ සිය පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සිදු කළ නිලධාරීන් සංඛ්‍යාව පහත II - 16 සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

**II-16 සංඛ්‍යා සටහන** — **ශ්‍රී ලංකා මහ බැංකුවේ ශිෂ්‍යත්ව වැඩසටහන යටතේ පශ්චාත් උපාධි සුදුසුකම් ලැබූ නිලධාරීන් සංඛ්‍යාව**

| සුදුසුකම | 2008 | 2009 | 2010 | 2011 | 2012 |
|---|---|---|---|---|---|
| විද්‍යාපති උපාධි | 9 | 2 | 6 | 10 | 17 |
| ආචාර්ය උපාධි | - | 1 | 2 | 2 | 2 |

### (ආ) කාර්යසාධන කළමනාකරණ ක්‍රමය

රැකියා විස්තර සකස් කිරීම, උපාය මාර්ගික සැලැස්ම හා අනුගත වන පරිදි ඉලක්ක පිහිටුවීම, අඛණ්ඩ පදනමක් මත කාර්යසාධන නිරීක්ෂණය, කාර්යසාධනය ඇගැයීම සහ ඉහළ කාර්යසාධනයන්ට ප්‍රතිලාභ සැලසීම යන අංශයන්ගෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යසාධන කළමණාකරන ක්‍රමය සමන්විත වේ. කාර්යසාධන ඇගැයීම් ක්‍රියාවලියේ දී එක් එක් සේවකයින්ගේ කාර්යසාධනයට, සාමාන්‍ය නිපුණතාවන්ට හා ශිල්පීය නිපුණතාවන්ට අදාළ කාර්යසාධන මට්ටම් නිර්ණය කරමින් කාර්යසාධන මට්ටම ඇගැයීම සිදු කරනු ලබයි. සේවක උසස්වීම් ලබාදීමේදී එක් නිර්ණායකයක් ලෙස මෙම අවසාන කාර්යසාධන මට්ටම් භාවිතා කරනු ලබයි.

සියලුම බැංකු සේවකයන්ගේ 2011 වසරේ කාර්යසාධන ඇගැයීම් ක්‍රියාවලිය උපාය මාර්ගික සැලැස්මෙහි ඉලක්කගත කළ අයුරින්ම 2012 වසර තුළ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සම්පූර්ණ කරන ලදී. 2012 වසර සඳහා දෙපාර්තමේන්තුවල සහ සේවකයන්ගේ රැකියා ඉලක්ක සකස් කිරීම ද උපාය මාර්ගික සැලැස්මෙහි ඉලක්කගත කළ කාලසීමාවන් තුළ දී සිදුකරන ලදී.

කාර්යසාධන කළමනාකරණය තවදුරටත් විධිමත් කිරීමේ අරමුණින් යුතුව 2012 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මධ්‍ය වාර්ෂික කාර්යසාධන සමාලෝචන ක්‍රමය හඳුන්වා දෙන ලද අතර, එමගින් අධීක්ෂණ නිලධාරීන්ට සහ සේවකයන්ට වසරේ මුල් භාගය තුළ කාර්යසාධන මට්ටම පිළිබඳව තක්සේරුවක් ලබාගත හැකි වේ.

### (ඇ) අනුප්‍රාප්ති සැලසුම්කරණය සහ උසස්වීම්

අනුප්‍රාප්ති සැලසුම්කරණයෙහි මෙන්ම මහ බැංකුවේ ඉහළ තනතුරු සියල්ලෙහිම ඇබෑර්තු සම්පූර්ණ කිරීමෙහි වැදගත්කම හඳුනාගනිමින්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් 04 දෙනෙකු සහකාර අධිපති ධූරයන්ට ද, මාණ්ඩලික පංතියේ III ශ්‍රේණියේ නිලධාරීන් 12 දෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානි තනතුරුවලට ද උසස් කිරීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2012 වසර තුළ දී පහසුකම් සලසා දෙන ලදී.

මාණ්ඩලික නොවන පංතියේ නිලධාරීන් මාණ්ඩලික පංතියට උසස් කිරීම සඳහා වන උසස් කිරීම් පටිපාටිය යටතේ මාණ්ඩලික නොවන පංතියේ IV හා V ශ්‍රේණිවලට අයත් නිලධාරීන් 26 දෙනෙකු 2012 වසරේ දී මාණ්ඩලික පංතියේ 1 ශ්‍රේණියට උසස් කරන ලදී. තවද, අදාළ උසස්වීම් පටිපාටියේ සඳහන් සුදුසුකම් සපුරාලන ලද සුළු සේවක පන්තියේ III ශ්‍රේණියේ සේවකයන් 7 දෙනෙකු මාණ්ඩලික නොවන පංතියේ I ශ්‍රේණියට උසස් කරන ලදී. මීට අමතරව, විවිධ ශ්‍රේණි සඳහා වන උසස් කිරීම් පටිපාටීන්වලට අනුකූලව කාර්ය මණ්ඩල සාමාජිකයන් 192 දෙනෙකු සඳහා ශ්‍රේණි උසස්වීම් ලබා දීම ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

### (ඈ) බඳවා ගැනීම්

මහ බැංකුවෙහි නිපුණතා අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා ශ්‍රම වෙළෙඳපොළෙහි දැනට පවතින උසස්ම කුසලතාවයන් සහ නව දැනුම බැංකුව තුළට අවශෝෂණය කර ගැනීමේ අරමුණින් නව කළමනාකරණ පුහුණුවන්නන් කණ්ඩායමක් මහ බැංකුවට බඳවා ගැනීමට 2012 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මේ අනුව බාහිර අපේක්ෂකයන් 74 ක් හා අභ්‍යන්තර අපේක්ෂකයන් 8 ක් 2013 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන පරිදි කළමනාකරණ පුහුණුවන්නන් වශයෙන් බඳවා ගන්නා ලදී. මෙම බඳවා ගැනීමේ ක්‍රියාවලිය තුළ දී, ආබාධ සහිත වූවන්ට ද සමාන රැකියා අවස්ථා ලබාදීමේ වැදගත්කම ඉස්මතු කරමින් ආබාධිත කළමනාකරණ පුහුණු අපේක්ෂකයන් 09 දෙනෙකු ද කළමනාකරණ පුහුණුවන්නන් වශයෙන් බඳවා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. තවද, ආරක්ෂක නිලධාරීන්ගේ විශ්‍රාම යාම හා බැංකුවේ කාර්යභාරය පුළුල්වීම හේතුවෙන් ඇති වූ ආරක්ෂක සේවා ඇබෑර්තු සම්පූර්ණ කිරීම සඳහා සහකාර ආරක්ෂක නිලධාරීන් 15 දෙනෙකු ද බඳවා ගන්නා ලදී. පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සපයන සේවාවන්හි කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ අරමුණින් යුතුව ඉලෙක්ට්‍රොනික/විදුලි සංදේශ හා සිවිල් යන ක්ෂේත්‍රවලට අදාළව කාර්මික නිලධාරීන් දෙදෙනෙකු ද පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුවට බඳවා ගන්නා ලදී.

**(ඉ) සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීම**

බහුවිධ කුසලතාවයන්ගෙන් යුත් ශ්‍රම බලකායක් ඇති කොට බැංකුවේ සමස්ත ඵලදායිතාවය ඉහළ නැංවීමේ අරමුණින් යුක්තව වාර්ෂිකව සිදු කරන සේවකයන් දෙපාර්තමේන්තු අතර ස්ථානගත කිරීමේ ක්‍රියාවලිය 2012 වසරේ දී ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලදී. ඒ අනුව, දෙපාර්තමේන්තුවල නිපුණතා අවශ්‍යතාවයන් සහ සේවකයන්ගේ සුදුසුකම් හා නිපුණතා මට්ටම් සැලකිල්ලට ගනිමින් එකම දෙපාර්තමේන්තුවේ හෝ එකම පළාත් කාර්යාලයේ වසර 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ කාර්ය මණ්ඩල සාමාජිකයන් 43 දෙනෙකු, 2012 ජූලි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු 15 ක් හා පළාත් කාර්යාල 2 ක් අතර ස්ථානගත කිරීම සිදු කරන ලදී.

**(ඊ) සේව්‍ය සේවක සම්බන්ධතා**

වෘත්තීය සමිති හා කළමනාකාරිත්වය අතර සමීප සංවාදයක් පවත්වාගෙන යාම සඳහා පහසුකම් සලසාදෙන්නෙකු වශයෙන් වූ සිය භූමිකාව මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2012 වසරේ දී ද අඛණ්ඩව ඉටු කරන ලද අතර අවශ්‍ය අවස්ථාවන්හි දී වෘත්තීය සමිතිවලට කළමනාකාරිත්වය මුණ ගැසී ගැටලු සාකච්ඡා කිරීමට පහසුකම් සලසා දෙන ලදී. ඒ අනුව වසර තුළ දී එවැනි සාකච්ඡා වාර 12 ක් පමණ පවත්වන ලදී. වැටුප්, උසස්වීම්, පුහුණු කටයුතු, සුභසාධනය, නව බඳවා ගැනීම් සහ සාමාන්‍ය පරිපාලනය යනාදිය ආශ්‍රිතව පැවති ගැටලු ගණනාවක් මගහරවා ගැනීමට ද මෙම සංවාදයන් උපකාරී වූ අතර, එමගින් බැංකුව තුළ කාර්මික සාමය පවත්වා ගැනීමට ද පහසුකම් සැලසිණි. තවද, සියලු වෘත්තීය සමිති සමග සාර්ථක ලෙස සාකච්ඡා කරමින් 2012 - 2014 කාලසීමාව සඳහා වූ වැටුප් සංශෝධනය පිළිබඳ සාමූහික ගිවිසුම අත්සන් කිරීමට ද මානව සම්පත් දෙපාර්තමේන්තුවට හැකි විය.

## 15.3 උපාධි අපේක්ෂකයන් හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා පුහුණුව ලබාදීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව ප්‍රාග්ධනය සංවර්ධනය කිරීමට අමතරව උපාධි අපේක්ෂකයන් සඳහා පුහුණුව ලබාදීම හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ ආයතනයේ සිසුන් සඳහා ගණකාධිකරණ පුහුණුව ලබාදීම මගින්, රට තුළ ඉහළ ගුණාත්මකභාවයකින් යුතු ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා පහසුකම් සැලසීමට ද මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිය දායකත්වය සපයන ලදී.

**(අ) උපාධි අපේක්ෂකයන් සඳහා වූ ත්‍රෛමාසික පුහුණු වැඩසටහන**

මෙම පුහුණු වැඩසටහන තුළින් ශ්‍රී ලාංකීය උපාධි අපේක්ෂකයන් හට ආර්ථික විද්‍යාව, මූල්‍යය, තොරතුරු තාක්ෂණය, මානව සම්පත් කළමණාකරණය සහ නීතිය යන ක්ෂේත්‍රයන්ට අදාළව විශ්ව විද්‍යාලයේ දී අධ්‍යයනය කරනු ලබන න්‍යායාත්මක සංකල්පයන්හි ප්‍රායෝගික භාවිතය පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම සඳහා මහ බැංකුව විසින් අවස්ථාව උදා කර දී තිබේ. මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරකම් පිළිබඳවද මාස 3 ක පුහුණු කාලය තුළ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට මෙම පුහුණු වැඩසටහන තුළින් සිසුන්ට පහසුකම් සලසා ඇත. මීට අමතරව රැකියා වෙළෙඳපොළ තුළ ඔවුන්ගේ රැකියා නියුක්තභාවය ඉහළ නංවා ගැනීමට අවශ්‍ය වන පෞරුෂත්වය හා වෘත්තීය හැකියාව වර්ධනය කර ගැනීමට ද මෙතුළින් අවස්ථාව සැලසේ. 2012 වසරේදී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් දේශීය හා විදේශීය විශ්ව විද්‍යාල 14 කින් සහ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් තෝරාගත් සිසුන් 99 දෙනෙකු සඳහා ත්‍රෛමාසික පුහුණු පාඨමාලා 4 ක්, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලද සහයෝගය ඇතිව පවත්වන ලදී.

**(ආ) උපාධි අපේක්ෂකයන් සඳහා වූ සය මාසික පුහුණු වැඩසටහන**

උපාධි අපේක්ෂකයන් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සලසා ඇති පුහුණු පහසුකම් තවදුරටත් පුළුල් කරමින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වානිජ විද්‍යා පීඨයේ, අවසන් වසර උපාධි අපේක්ෂකයින්ගේ උපාධි පාඨමාලාවන්හි අනිවාර්ය අංගයක් වන සය මාසික පුහුණුව, මහ බැංකුවේ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවට අනුයුක්තව ලබාදීම සඳහා ද ශ්‍රී ලංකා මහ බැංකුව කටයුතු සලසා ඇති අතර, 2012 ඔක්තෝබර් මසදී ඒ සම්බන්ධයෙන් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන හා වාණිජ විද්‍යා පීඨය සමග අවබෝධතා ගිවිසුමකට එළඹෙන ලදී. ඒ අනුව 2012 ඔක්තෝබර් 03 දින සිට උපාධි අපේක්ෂකයන් 48 දෙනෙකුට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ පුහුණු අවස්ථාවන් සලසා දෙන ලදී.

**(ඇ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් සඳහා වන ගණකාධිකරණ පුහුණු වැඩසටහන**

2012 වසර තුළ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ ආයතනයේ සිසුන් 21 දෙනෙකුට මහ බැංකුවේ සිටින සුදුසුකම්ලත් වරලත් ගණකාධිකාරීවරුන්ගේ අධීක්ෂණය යටතේ ගණකාධිකරණ පුහුණුව ලැබීමට අවස්ථාව සලසා දීම තුළින් ඔවුන්ගේ ගණකාධිකරණ පාඨමාලාවේ අනිවාර්ය පුහුණුව සම්පූර්ණ කර ගැනීමට පහසුකම් සලසන ලදී.

## 15.4 2012 වසර තුළ අධිපතිතුමා විදේශයන්හි දී සහභාගි වූ රැස්වීම්

1. ජනවාරි මාසයේ දී කටාර් හා ඩුබායි රජයන් හා එහි ප්‍රමුඛ ව්‍යාපාරිකයන් සමග අතිගරු ජනාධිපතිතුමාගේ නියෝජිත පිරිස පැවැත්වූ සාකච්ඡා.
2. පෙබරවාරි මාසයේ දී කොරියාවේ දී 47 වන සියැසන් (SEACEN) අධිපතිවරුන්ගේ සම්මේලනය සහ 31 වන

සියැසන් අධිපතිවරුන්ගේ මණ්ඩලයේ රැස්වීම සහ සිංගප්පූරුවේ ජනාධිපති හා අගමැති සමග පැවැත් වූ රාජ්‍ය තාන්ත්‍රික හමුවීම.

3. මාර්තු මාසයේ දී කටාර් රාජ්‍යයේ ආයෝජකයන් හා බැංකුකරුවන් සමග පැවති සාකච්ඡා.

4. අප්‍රේල් මාසයේ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල/ලෝක බැංකුවේ වසන්ත සෘතුවේ දී පවත්වන ලද රැස්වීම් (Spring meetings) හා ආයෝජකයින් සමග පැවැත්වූ රැස්වීම් සහ කොරියාවේ පැවති අතිගරු ජනාධිපතිතුමාගේ නියෝජිත පිරිස සහභාගි වූ ව්‍යාපාරික සාකච්ඡා.

5. මැයි මාසයේ දී නේපාලයේ පැවති 6 වන සියැසන් උසස් නායකත්ව පාඨමාලාවේ ප්‍රධාන දේශනය පැවැත්වීම සහ සියැසන් (SEACEN) අධිපතිවරුන්ගේ සම්මන්ත්‍රණය.

6. ජුනි මාසයේ දී තායිලන්තයේ ව්‍යාපාරික සමුළුවට සහභාගි වීම සහ එක්සත් රාජධානියේ ආයෝජකයන් සමග පැවති රැස්වීම්.

7. ජූලි මාසයේ දී එක්සත් රාජධානියේ ආයෝජකයන් සමග රැස්වීම්.

8. අගෝස්තු මාසයේ දී මොරිෂස් රාජ්‍ය නිලධාරීන් සමග රැස්වීම්.

9. ඔක්තෝබර් මාසයේ දී ජපානයේ පැවති ආයෝජන ප්‍රවර්ධන සම්මන්ත්‍රණය.

10. නොවැම්බර් මාසයේ දී මොංගෝලියාවේ පැවති 48 වන සියැසන් (SEACEN) අධිපතිවරුන්ගේ සම්මේලනය සහ 32 වන සියැසන් (SEACEN) අධිපතිවරුන්ගේ මණ්ඩලයේ රැස්වීම.

### 15.5 උසස් කිරීම්/ පත්කිරීම්

1. පහත සඳහන් උසස් කිරීම් හා පත්කිරීම් 2012 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක කරන ලදී.

(i) ආර්.ධීරසිංහ මහත්මිය සහකාර අධිපතිවරියක වශයෙන් පත් කරන ලදී.

(ii) ඒ. කමලසිරි මහතා සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.

(iii) කේ.ඩී.රණසිංහ මහතා සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.

(iv) එස්.එස්.රත්නායක මහතා සහකාර අධිපතිවරයෙකු වශයෙන් පත් කරන ලදී.

2. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩී.වසන්ත මහතා 2012 ජනවාරි 01 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ ලේකම් වශයෙන් පත් කරන ලදී.

3. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එස්. ගුණරත්න මහත්මිය 2012 ජනවාරි 01 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී. අනතුරුව 2012 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

4. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී කේ. ගුණතිලක මහත්මිය 2012 ජනවාරි 01 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරී ලෙස පත් කරන ලදී. අනතුරුව 2012 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

5. බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එන්.ඩබ්.ජී.ආර්.ඩී.නානායක්කාර මහතා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරී ලෙස 2012 ජනවාරි 01 දින සිට පත් කරන ලදී. අනතුරුව 2012 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

6. ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ පී.ඩබ්.ඩී.එන්.ආර්. රොඩ්‍රිගෝ මහතා ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස 2012 ජනවාරි 01 දින සිට පත් කරන ලදී. අනතුරුව 2012 ජූලි 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

7. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ජේ.පී.ආර්.කරුණාරත්න මහතා 2012 ජනවාරි 01 දින සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී. අනතුරුව 2012 සැප්තැම්බර් 03 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධිකාරී ලෙස පත් කරන ලදී.

8. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධ්‍යක්ෂ යූ.එල්. මුතුගල මහත්මිය 2012 ජනවාරි 01 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ වැඩ බලන අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී. අනතුරුව 2012 ජුනි 13 දින සිට එම දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

9. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ.එම්.ඒ.එන්.දවුලගල මහත්මිය 2012 අප්‍රේල් 02 දින සිට මූල්‍ය ස්ථායීතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

10. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඊ.ඒ.හෙට්ටිආරච්චි මහතා 2012 අප්‍රේල් 02 දින සිට සුභසාධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

11. මූල්‍ය ස්ථායිතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. සරවනමුත්තු මෙනෙවිය 2012 අප්‍රේල් 02 දින සිට සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

12. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්.එම්.ඒකනායක මහතා 2012 අප්‍රේල් 02 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී. අනතුරුව 2012 ඔක්තෝබර් 02 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

13. පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්. අමරතුංග මහතා 2012 ජූලි 01 දින සිට පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී. අනතුරුව 2012 ඔක්තෝබර් 01 දින සිට එම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

14. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී සී.පී.ඒ. කරුණාතිලක මහතා 2012 සැප්තැම්බර් 03 දින සිට බැංකු විදු පියයෙහි අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

15. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ වී. බාස්කරන් මහතා 2012 සැප්තැම්බර් 03 දින සිට ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

16. මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ එස්.කේ. රණසිංහ මහතා 2012 සැප්තැම්බර් 03 දින සිට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත්කරන ලදී.

17. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ නිලධාරියෙකු වූ සී.එන්. විජයසේකර මහතා 2012 නොවැම්බර් 01 වන දින සිට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

### 15.6 විශ්‍රාම ගැනීම්

1. පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ එස්.එම්.ඒ. සිරිවර්ධන මහතා 2012 ජූලි 01 දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

2. සුභසාධන දෙපාර්තමේන්තුවේ වැඩ බලන අධ්‍යක්ෂ කේ.පී.එන්.එස්. කරුණාගොඩ මහතා 2012 අප්‍රේල් 01 දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

3. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඒ.එස්.ද අල්විස් මෙනෙවිය 2012 පෙබරවාරි 18 දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

4. ලේකම් දෙපාර්තමේන්තුවේ අතිරේක ලේකම් පී.විජේසිංහ මහත්මිය 2012 අගෝස්තු 28 දින සිට මහ බැංකු සේවාවෙන් විශ්‍රාම ගන්නා ලදී.

### 15.7 මුදහරිනු ලැබ සිටි නිලධාරීන්

1. සහකාර අධිපති කේ.ඩී.රණසිංහ මහතා විකල්ප විධායක අධ්‍යක්ෂවරයෙකු ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

2. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ එස්.ආර්. ආටිගල මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

3. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ කේ.එම්.එම්. සිරිවර්ධන මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

4. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එම්. මහින්ද සාලිය මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

5. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එස්.ජේ.කේ. ගුරුගේ මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.

6. මාණ්ඩලික පංතියේ II ශ්‍රේණියේ එච්.එම්.එස්. දර්ශන මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.

7. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ජේ.ඒ.ඒ. ප්‍රියන්ත මහතා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත.

8. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ කේ.පී.එම්. පෙරේරා මහතා රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය වෙත.

9. මාණ්ඩලික පංතියේ I ශ්‍රේණියේ ඒ.සී. අබේසිංහ මහත්මිය ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

10. කොන්ත්‍රාත් පදනම මත බඳවා ගනු ලැබූ නීති නිලධාරිණී එච්.එම්.එන්.එස්. ගුණවර්ධන මහත්මිය මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය වෙත.

### 15.8 වැටුප් රහිත අධ්‍යයන නිවාඩු මත සිටින නිලධාරීන්

1. මාණ්ඩලික පංතියේ IV ශ්‍රේණියේ යූ.පී. අලවත්තගේ මහතා 2012 සැප්තැම්බර් 04 දින සිට වැටුප් රහිත අධ්‍යයන නිවාඩු ලබා සිටී.

## 16. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු සංනිවේදන තාක්ෂණ අවශ්‍යතා සැපයීම තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇති කාර්යභාරයයි. ඒ අනුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රමුඛ අරමුණු අතර නවීන තාක්ෂණයෙන් යුතු පද්ධති සැපයීම හා පවත්වා ගැනීමත්, උපාය මාර්ගික ආයතනික ක්‍රියාදාමයන් බලගන්වන්නා ලෙස ක්‍රියා කිරීමත්, ඉහළ කුසලතා සහිත කාර්ය මණ්ඩලයක් සමග ඉහළ තොරතුරු තාක්ෂණ භාවිතය ළඟා කරගැනීමත්, මෙහෙයුම් අවදානම් අවම කිරීමත්, ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධතිය සඳහා ශක්තිමත් තොරතුරු සංනිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සම්පාදනය කිරීමත් ඇතුළත් වේ.

උපාය මාර්ගික සැලැස්මේ තේමාව වූ "තබමු පියවර ඉහළ ඉමකට" යන්න හා සමගාමීව තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව වසර තුළ පුළුල් ක්ෂේත්‍ර 5 ක් යටතේ සිය ක්‍රියාකාරකම් ඉටු කරන ලදී.

## 16.1 නව ව්‍යාපාරික විසඳුම් හඳුන්වාදීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැනට හඳුන්වා දී ඇති ස්වයංක්‍රීය යෙදවුම් මෘදුකාංග සඳහා අවශ්‍ය නඩත්තු හා උපකාරක සේවාවන් පවත්වා ගන්නා අතරම, පුළුල් ව්‍යාපාරික ක්‍රියාවලිවල අවශ්‍යතාවයන් පිරිමැසීම සඳහා ඒකාබද්ධ ව්‍යාපාරික විසඳුම් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව සම්පාදනය කරන ලදී. මෙම වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද ප්‍රධාන ව්‍යාපාරික විසඳුම් කිහිපයක් පහත දැක්වේ.

(අ) කර්මාන්තය තුළ පවත්නා පිළිගත් සුදුසුතම ක්‍රියා මාර්ග යන්ට අනුගතව, අනෙකුත් තීරණාත්මක මෘදුකාංග පද්ධති සමග අතුරු මුහුණත් වලින් සමන්විත ඒකාබද්ධ පොදු ලෙජර් පද්ධතියක් නිර්මාණය කිරීම.

(ආ) ඵලදායී මානව සම්පත් කළමනාකරණයක් සඳහා වන ඒකාබද්ධ මානව සම්පත් කළමනාකරණ (eHRNet) පද්ධතිය සැකසීම.

(ඇ) සමස්ත මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව සඳහා දායක වෙමින් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ සම්මතයන්ට අනුකූලව තැන්පත්කරුවන් සඳහා ආරක්ෂණ ආවරණයක් වශයෙන් ස්වයංකෘත තැන්පතු රක්ෂණ ක්‍රමයක් නිර්මාණය කිරීම.

(ඈ) කාර්යක්ෂම තීරණ ගැනීමේ අවශ්‍යතා සඳහා සේවක අර්ථසාධක අරමුදලේ සාමාජිකයන්ගේ දත්ත පරිලේඛණ ගත කොට ඒවා ප්‍රධාන සේවක අර්ථසාධක අරමුදල් පද්ධතිය හා ඒකාබද්ධව පවත්වා ගෙන යාම සඳහා පිහිටුවන සුරක්ෂිතාගාරයක් (e-Recording Room) සඳහා වූ ටෙන්ඩර් ක්‍රියාවලියේ කටයුතුවලට දායක වීම.

(ඉ) දිළිඳුකම පිටු දැකීමේ අරමුණින් ක්‍රියාත්මක වන ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ස්වයංක්‍රීය පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.

(ඊ) කාර්යක්ෂම අභ්‍යන්තර පරිපාලනයක් සඳහා සේවක සුබ සාධන ණය යෝජනා ක්‍රම සරලකරණය කිරීම.

## 16.2 පවත්නා පද්ධති වැඩි දියුණු කිරීම

අභ්‍යන්තරව නිර්මාණය කරන ලද පද්ධතිවල නඩත්තු කටයුතු, 99.5% ට වඩා වැඩි වාර්ෂික මෙහෙයුම් උපයෝජ්‍යතාවයකින් යුක්තව අඛණ්ඩව පවත්වා ගැනීමට හැකිවිය. වසර තුළ ඉටු කරන ලද ප්‍රධානතම වැඩි දියුණු කිරීම් කිහිපයක් පහත දැක්වේ.

(අ) කාර්යක්ෂම මහජන සේවයක් සැලසීම සඳහා ලංකා රාජ්‍ය ජාලය (Lanka Gate) හා සංකලිතව සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිඉංජිනේරුකරණ ක්‍රියාවලිය පුරවැසි ද්වාරය (citizen portal) හරහා හඳුන්වා දීම.

(ආ) දේශීය වෙළෙඳපොළ සඳහා අවශ්‍ය දෛනික විදේශ විනිමය අවශ්‍යතාවයන් සපුරා ගැනීම සඳහා විදේශ විනිමය පරිගණක පද්ධතිය පුළුල් කිරීම.

(ඇ) ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ සම්මතයන්ට අනුකූලව මධ්‍යගත දත්ත ගබඩාකරණ පද්ධතිය (FinNet) පුළුල් කිරීම සහ ප්‍රාථමික අලෙවිකරු ක්‍රමය සඳහා වාර්තාකරණ පද්ධතියක් හඳුන්වා දීම.

## 16.3 පද්ධතිමය වශයෙන් වැදගත් වූ ගෙවීම් සහ පියවීම් ක්‍රමය (SIPSS) වැඩි දියුණු කිරීම.

ඉහත 16.2 හි සඳහන් කරන ලද පද්ධති නවීකරණයන්ට අමතරව ගනුදෙනු ධාරිතාවයන්හි අපේක්ෂිත වර්ධනය ළඟා කර ගැනීම උදෙසා ගෙවීම් සහ පියවීම් ක්‍රමයේ ව්‍යාපාරික පහසුකම් වැඩි දියුණු කිරීම් සිදු කරන ලදී.

(අ) ලොව අන්තර් බැංකු මූල්‍ය සන්නිවේදනය සඳහා වූ සංවිධානයේ (SWIFT) ඉදිරි දැක්මට අනුගතව අදාළ යෙදුම් මෘදුකාංග යාවත්කාලීන කිරීම.

(ආ) SWIFT පණිවිඩ සම්මුතීන්ගේ වැඩි දියුණු කිරීම ග්‍රහණය කරගත හැකිවන අයුරින් LankaSettle/LankaSecure යෙදවුම් මෘදුකාංගයන් අංක 3.5 සිට අංක 3.6 සංස්කරණයන්ට අදාළ පරිදි යාවත්කාලීන කිරීම.

(ඇ) තාක්ෂණික යල් පැනීම් වලක්වා ගැනීම සඳහා LankaSettle පද්ධතියේ දෘඩාංග හා මෙහෙයුම් පද්ධති මෘදුකාංග ප්‍රතිස්ථාපනය කිරීම.

මූල්‍ය පද්ධති ස්ථායීතාවයට දායක වන පද්ධතිමය වශයෙන් වැදගත් වූ ගෙවීම් සහ පියවීම් ක්‍රමයේ (SIPSS) 99.8 % වඩා වැඩි උපයෝජ්‍යතාවයක් පවත්වා ගෙන යාමට 2012 වසර තුළ දී තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවට හැකි විය.

## 16.4 තොරතුරු හා සංනිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සහ අවදානම් අවම කිරීම

තොරතුරු තාක්ෂණ සේවාවන්හි කාර්යක්ෂමතාවය ළඟාකර ගැනීම සඳහා තොරතුරු හා සංනිවේදන තාක්ෂණ යටිතල පහසුකම් සංවර්ධනයට, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව පහත දැක්වෙන මූල පිරීම් සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ව්‍යාපාරික මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගනු ලැබූ පැරණි IBM-iseries පරිගණක පද්ධති ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියා පටිපාටි අනුග මනය කරමින් නව පරිගණක පද්ධති 3 ක් මිළ දී ගන්නා ලදී. තවද මහජන සේවා වැඩි දියුණු කිරීමේ අරමුණින් සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල සිට කම්කරු දෙපාර්තමේන්තුවේ ස්ථානගත කොට ඇති පරිගණක පද්ධති සමග සම්බන්ධ වී අදාළ තොරතුරු ඒ මොහොතේදීම අනුපිටපත් කිරීමට හැකිවන පරිදි කටයුතු සම්පාදනය කරන ලදී.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ මෙහෙයුම් කටයුතු පහසු කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අව පැතුරුම් ජාලය (LAN) ලොයිඩ්ස් ගොඩනැගිල්ල දක්වා විස්තෘත කරන ලදී. ඵලදායිතාව වැඩි කිරීමේ අරමුණින් මහ බැංකුවේ ප්‍රධාන

කාර්යාලය හා ලොයිඩ්ස් ගොඩනැගිල්ල අතර අන්තර්ජාල රැහැන් ධාරිතාව 4Mbps දක්වා වැඩි දියුණු කරන ලදී.

මයික්‍රොසොෆ්ට් සමාගම හා ඇති කර ගන්නා ලද ව්‍යාපාරික සම්මුතීන් යටතේ විද්‍යුත් තැපෑල, ලේඛන, වැඩප්‍රවාහ, උපස්ථ පිටපත් සහ තොරතුරු තාක්ෂණ වත්කම් කළමනාකරණය සහ පුළුල් වෛරස ආරක්ෂාවක් සඳහා පහසුකම් සලසන නවීන අංගයන්ගෙන් සමන්විත මනා ක්‍රියාකාරී මෘදුකාංග විසඳුම් මිලට ගන්නා ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ අව පැතුරුම් ජාලය හා විසිරි ජාලය ඉතා ඉහළ ආරක්ෂණ මට්ටමක වසර තුළ දී පවත්වාගෙන යාමට හැකි විය. එමගින් ආරක්ෂණ බිඳවැටීම සැබවින්ම 0% ක මට්ටමේ පවත්වා ගැනීමට හැකි විය. තවද, අභ්‍යන්තර හා බාහිර විගණකයන් විසින් මෙහෙයවන ලද තොරතුරු පද්ධති විගණනයන් සඳහා ද පහසුකම් සලසන ලදී.

හදිසි අවස්ථාවන් සඳහා පෙර සූදානමක් ලෙස අභ්‍යන්තර දෙපාර්තමේන්තු හා බාහිර මූල්‍ය ආයතනවල සහභාගිත්වයෙන් ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් දෙකක් වසර තුළ දී ද්විතීයක පරිගණක අංශයේ සිට සාර්ථකව ක්‍රියාවට නංවන ලදී. මීට අමතරව ද්විතීයක පරිගණක අංශය සවිගැන්වීම සඳහා නවීන පහසුකම් සම්පාදනය කරමින් ව්‍යසන ප්‍රතිසාධන මෙහෙයුම් කාර්යක්ෂම කිරීමට අවශ්‍ය මූලික කටයුතු ඉටු කරන ලදී.

### 16.5 අගය එකතු කළ තොරතුරු තාක්ෂණික සේවාවන් සැපයීම

ජාතික ගෙවීම් කවුන්සිලයේ මාර්ගෝපදේශයන්ට අනුව ජාතික තලයේ ව්‍යාපෘති සඳහා විශේෂඥ සේවාවන් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. විශේෂයෙන්ම ආර්ථික ක්‍රියාකාරකම් ශීඝ්‍ර ලෙස පුළුල් කිරීම සඳහා දායක වන පොදු කාඩ්පත් සහ ගෙවීම් ස්විචයක් හඳුන්වා දීමට අවශ්‍ය සේවාවන් හා ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය සඳහා සන්නිවේදන ඒකකයක් හඳුන්වා දීම සඳහා සේවාවන් සැපයීමත් මේ අතර වේ. තවද ගෙවීම් හා පියවීම් පද්ධතියේ ගෙවීම් සංදේශන උපස්ථරයේ උපයෝග්‍යතාවය යාවත්කාලීන කිරීම සඳහා උපකාරී වූ තාක්ෂණික විශේෂඥ දැනුම සම්පාදනය කරන ලදී. මාසික සිද්ධි විභේදන අනුපාතය 95% කට වඩා ඉහළ මට්ටමක පවත්වා ගනිමින් කාර්යක්ෂම සේවාවක් සැපයීමට තොරතුරු තාක්ෂණ උපකාරක කණ්ඩායමට හැකි විය.

## 17. ජාත්‍යන්තර මෙහෙයුම්

මූල්‍ය පනත අනුව ජාත්‍යන්තර සංචිත කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති අතර එම කාර්යයන් ශ්‍රී ලංකා රුපියලෙහි බාහිර අගය ස්ථායී ලෙස පවත්වා ගැනීමත්, ජාත්‍යන්තර ගනුදෙනු උපරිම නිදහසකින් යුක්තව කිරීමේ හැකියාව තහවුරු කිරීමත් ඉලක්ක කර ගනිමින් සිදුවේ. මේ සම්බන්ධයෙන් විදේශ සංචිත කළමනාකරණය කිරීම හා දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ මනා ක්‍රියාකාරිත්වයකින් යුක්තව පවත්වා ගැනීමට අවශ්‍ය අධීක්ෂණ කටයුතු සිදුකිරීමේ වගකීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පවරා ඇත.

### 17.1 විදේශ සංචිත කළමනාකරණය

මූල්‍ය නීති පනතේ 67 වන වගන්තිය මගින් ශ්‍රී ලංකාවේ විදේශ මුදල් සහ රත්රන් සංචිත ආයෝජනය කිරීමේ නීතිමය රාමුව සකසා ඇති අතර එමගින් විදේශ සංචිත ආයෝජනය කළ හැකි මූල්‍ය උපකරණ, ආයතන සහ ගනුදෙනු කළ හැකි පාර්ශව මෙන්ම ආයෝජනය සඳහා පිළිගතහැකි විදේශ මුදල් වර්ග සඳහා ද පුළුල් අර්ථකතන ලබාදී ඇත. විදේශ සංචිතයේ ඇතුළත් විදේශ මුදල් වර්ගයන්හි ද්‍රවශීලතාවය, ස්ථායීතාවය සහ එම මුදල් වර්ගයේ ඉදිරි ඉල්ලුම සලකා බලා විදේශ සංචිත රත්රන් ආකාරයෙන් හෝ රත්රන්වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි විදේශ මුදල් වර්ගයන්ගෙන් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට නිර්දේශයන් නිකුත් කළ හැක. තවද, විදේශ සංචිතයේ ආරක්ෂාව, ද්‍රවශීලතාවය සහ ඉපයීම යන අරමුණු මුදුන් පමුනුවාගැනීමේ අභිප්‍රායෙන් විදේශ සංචිත කළමනාකරණයේ පරාස තවත් පුළුල් කිරීමට නිර්දේශ කිරීමේ බලය ද මුදල් මණ්ඩලය සතුව ඇත. මෙම විදේශ සංචිත ආයෝජන කළඹ කළමනාකරණ කටයුතු තවදුරටත් ක්‍රමවත් කිරීමේ අටියෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ආයෝජනයට යෝග්‍ය මූල්‍ය උපකරණ නිකුතුකරුවන්, විවිධ පාර්ශව සමග කළ හැකි ආයෝජන වර්ග, ආයෝජන කල් පිරීමේ රටාවන් සහ අවදානම් කළමනාකරණය පිළිබඳ නිශ්චිත නිර්ණායකයන්ගෙන් සමන්විත නිසි මාර්ගෝපදේශ සකසා ඇති අතර මෙම මාර්ගෝපදේශ මුදල් මණ්ඩලය මගින් ද අනුමත කර ඇත. ඒ අනුව විදේශ සංචිත ආයෝජනය කරනු ලබන්නේ විදේශ සංචිත කළමනාකරණ කමිටුවේ අධීක්ෂණයට යටත්වය.

මුදල් මණ්ඩලය මගින් අනුමත කර ඇති විදේශ සංචිත කළමනාකරණ මාර්ගෝපදේශයන්ට අනුකූලව ශ්‍රී ලංකාවේ විදේශ සංචිත ප්‍රධාන වශයෙන් ස්ථායී ආදායම් උපදවන සුරැකුම්පත් සහ රත්රන් ඇතුළු වෙනත් මුදල් වෙළෙඳපොළ වත්කම් යන වත්කම් වර්ග දෙකෙහි ආයෝජනය කරන ලදී. විදේශ සංචිත ආයෝජන කළඹෙහි මූල්‍ය උපකරණ සහ මුදල් වර්ගයන්ගේ සංයුතිය තීරණය කිරීමේ දී ප්‍රධාන වශයෙන් බැංකුවේ ද්‍රවශීලතා අවශ්‍යතාවයන්, ණය සේවාකරණ ගෙවීම්, අවදානම් කළමනාකරණ නිර්ණායක, ආදායම් උත්පාදනය කිරීමේ හැකියාව සහ මුදල් මණ්ඩලය මගින් කරනු ලබන විශේෂිත මගපෙන්වීම ද සලකා බලනු ලැබිණි.

විවිධ රටවල විදේශ සංචිත කළමනාකරුවන් තම සම්පත් කෙසේ ආයෝජනය කරන්නේ ද යන අභියෝගයට මුහුණ දෙමින් සිටි අවස්ථාවක, විචක්ෂණශීලීව ආයෝජනය කිරීමෙන් තම විදේශ සංචිත මගින් සැලකිය යුතු ප්‍රතිලාභ අනුපාතයන් 2012 වසර තුළ දී උපයාගැනීමට ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සමත් විය. 2012 වසර තුළ සංචිත කළමනාකරණයේ දී මුහුණ දෙන ලද අභියෝග යන් අතර, යුරෝපා කලාපය තුළ දැනට පවත්නා ණය අර්බුදය, ඇමෙරිකානු එක්සත් ජනපද රාජ්‍ය මූල්‍ය අර්බුදය, අඩු වෙමින් පවතින බැඳුම්කර ප්‍රතිලාභ අනුපාතයන්, රටවල් හතෙහි කණ්ඩායමෙහි වෙනස් වෙමින් පවතින ස්වෛරීත්ව ණය ගතිකයන් මෙන්ම යුරෝපය තුළ පවතින දේශපාලන අස්ථාවරභාවයන්, මැදපෙරදිග කලාපය තුළ පවතින

අසහනකාරී තත්ත්වයන් සහ ඇමෙරිකානු එක්සත් ජනපදය තුළ ඇති වූ ස්වභාවික විපත් යන සාධක නිසා මූල්‍ය වෙළෙඳපොළ තුළ වැඩි වෙමින් පැවති අවදානම් සහගත තත්ත්වය යන කරුණු ප්‍රධාන තැනක් ගන්නා ලදී.

2012 වසර තුළ, සමස්ත විදේශ සංචිත කළමනාකරණ කටයුතු මගින් ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මිලියන 221 ක් (ආසන්න වශයෙන් රුපියල් බිලියන 28 ක්) ඉපයූ අතර එය සාමාන්‍ය සංචිත ප්‍රමාණයෙන් සියයට 4 කට වඩා වැඩි ප්‍රතිලාභයකි. සංසන්දනාත්මක ලෙස අඩු වෙළෙඳපොළ පොලී අනුපාතික පරිසරයක් තුළ වුවද, වෙළෙඳපොළ උච්චාවචනයන් නිසි පරිදි ප්‍රයෝජනයට ගෙන ස්ථාවර ආදායම් සුරැකුම්පත් මත ඉපයූ ප්‍රාග්ධන ප්‍රතිලාභ වැඩි කර ගැනීම මගින් සහ අභියෝගාත්මක තත්ත්වයන් යටතේ වුවද විදේශ මුදල් සහ රත්රන් ගනුදෙනු තුළින් සැලකිය යුතු ආදායමක් උපයා ගැනීමෙන් මෙම ප්‍රගතිය ලබා ගන්නා ලදී.

විදේශ සංචිත කළමනාකරණ කටයුතු වර්ධනය කර ගැනීමේ අරමුණෙන් දෙපාර්තමේන්තුව නවීකරණ කටයුතු ඉදිරියට කරගෙන ගිය අතර නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් ප්‍රසම්පාදනය කර ගැනීමද එයට ඇතුළත් විය. 2012 නොවැම්බර් මාසයේ දී මෙයට අදාළ ගිවිසුම අත්සන් කරන ලදී. 2014 වර්ෂය ආරම්භයේ දී නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතිය ක්‍රියාවට නැංවීම ආරම්භ කරනු ඇත. වෙනස් කාල පරාසයන් තුළ ක්‍රියාත්මක වන විදේශීය මූල්‍ය වෙළෙඳපොළවල් ආවරණය කරමින් විදේශ විනිමය ගනුදෙනු අඛණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම ද වසර තුළ දී තවදුරටත් කරගෙන යන ලදී.

## 17.2 අවදානම් කළමනාකරණය

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ මැදි කාර්යාලය (middle office), ජාත්‍යන්තර සංචිත ආයෝජනය හා බැඳුනු අවදානම් හඳුනාගැනීම, ගණනය කිරීම හා කළමනාකරණය කිරීම යන වගකීම් සඳහා නිරන්තරයෙන්ම බැඳී සිටියි. ජාත්‍යන්තර සංචිත කළමනාකරණ මෙහෙයුම් කටයුතුවල දී පැන නගින අවදානම් අවම කිරීම සඳහා, ජාත්‍යන්තර වෙළෙඳපොළෙහි සිදුවන වෙනස්වීම් සමීපව අධීක්ෂණය කිරීමත්, එම වෙනස්වීම් නිසා සිදුවිය හැකි අහිතකර ප්‍රතිවිපාක අවම කිරීමෙහිලා විචක්ෂණශීලී ලෙස තීරණාත්මක ක්‍රියාමාර්ගයන්හි නිරතවීම සහ සංචිත කළමනාකරණ කටයුතු "සංචිත කළමනාකරණ මාර්ගෝපදේශ" නිර්ණායකයනට අනුකූල වන ලෙස පවත්වාගැනීම සහතික කර ගැනීමත් සිදු කරන ලදී.

විදේශ විනිමය වගකීම් සේම ගෝලීය විනිමය වෙළෙඳපොළ පිළිබඳ ඉදිරි දැක්ම සහ වෙළෙඳ රටාවන් සැලකිල්ලට ගනිමින් ආයෝජන කළඹ විවිධාංගීකරණය කිරීම සහ උපාය මාර්ගික ලෙස මුදල් සංයෝජනයන් භාවිතා කිරීම තුළින් **විනිමය අනුපාතික** අවදානම කළමනාකරණය කරන ලදී. ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි වෙළෙඳපොළ අගය කෙටිකාලීනව අඩුවීම ගණනයකර ගැනීම සඳහාත් එය පාලනය කළ හැකි මට්ටමක පවත්වා ගැනීම සඳහාත්, අවදානමේ වටිනාකම (Value at Risk - VaR) ගණනය කිරීම් යොදා ගන්නා ලදී. ගනුදෙනුවල දී පැන නැගිය හැකි විදේශ විනිමය අලාභ අවම කිරීම සඳහා පාඩු නැවැත්වීමේ විධාන (stop loss orders) සහ ගනුදෙනුකරු සීමාවන් (dealer limits) යොදා ගන්නා ලදී. අපේක්ෂිත ඵලදා වක්‍රයෙහි වෙනස්වීම මත පදනම්ව, ස්ථාවර ආදායම් සහ මුදල් වෙළෙඳපොළ ආයෝජනයන්හි සඵල ආයෝජිත කාලය (duration) කාලීනව වෙනස්කිරීම මගින් **පොලී අනුපාත අවදානම** සාර්ථකව අඩු කෙරිණි. පොලී අනුපාත වෙනස්වීම මගින් සිදුවිය හැකි අවදානම අවම කරගැනීම සඳහා කාලීන ක්‍රියාමාර්ග ගැනීමට සහ ඒ මගින් අවදානමට නිරාවරණය වී ඇති ප්‍රමාණය ගණනය කිරීම සඳහා සංවේදිතා විශ්ලේෂණයන්ද (sensitivity analysis) යොදා ගන්නා ලදී.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, එහි ගනුදෙනුවලට සම්බන්ධිත පාර්ශවයනට අදාළ ණය අවදානම් කළමනාකරණය සඳහා මූල්‍ය සංරචක, ණය ඇගයීම් (credit ratings) හා වෙළෙඳපොළ නිරාවරණය වීම් පදනම් කරගත් විස්තරාත්මක ඇගයීම් ක්‍රමයක් වන පාර්ශවකාර ණය අවදානම් කළමනාකරණ පද්ධතිය (counterparty credit risk management system) යොදා ගන්නා ලදී. එම පාර්ශවයන් අවදානම්වලට නිරාවරණය වී ඇත්දැයි අධීක්ෂණය කිරීමට එකී සම්බන්ධිත පාර්ශවයන්ගේ ණය පැහැර හැරීමේ හුවමාරු අනුපාතිකයන් (CDS) හා කොටස් වෙළෙඳපොළ අගයයන් යොදා ගන්නා ලදී. සම්බන්ධිත පාර්ශව වෙත ශ්‍රී ලංකා මහ බැංකුවේ නිරාවරණය වීම අවම කර ගැනීම සඳහා, ණය ඇගයීම් පහත හෙලා ඇති සම්බන්ධිත පාර්ශවයන්හි ආයෝජන සීමාවන් අඩුකිරීම සහ පසුව ඉන් කිහිපයක් සුදුසුකම්ලත් සම්බන්ධිත පාර්ශව ගොනුවෙන් ඉවත් කිරීමක් සිදුකරන ලදී. අදාළ මුදල් වර්ගවලින් ප්‍රමාණවත් වත්කම් ප්‍රමාණයක් ද්‍රවශීල වත්කම් ලෙස පවත්වා ගැනීම සඳහා වැඩිදියුණු කරන ලද මුදල් ප්‍රවාහ කළමනාකරණ සහ පුරෝකථන ශිල්පීය ක්‍රමයන් වසර මුළුල්ලෙහිම යොදා ගන්නා ලදී. මෙම ක්‍රියාමාර්ගයන් ද්‍රවශීලතා අවදානම අවම කර ගැනීමට සහ සියලුම ගෙවීම් පැහැර හැරීමකින් තොරව කාලීනව සිදු කිරීමට උපකාරී විය. කාර්යයන්හි නිරත වන සේවකයින්, පද්ධතීන් සහ අනෙකුත් ක්‍රියාවන් තුළින් මතුවන මෙහෙයුම් අවදානම, අභ්‍යන්තර පාලන ක්‍රම සහ ආයෝජන මාර්ගෝපදේශ ශක්තිමත් කිරීම, සහ ව්‍යසන ප්‍රතිප්‍රාප්ති වැඩබිමේ (Disaster Recovery Site) සිට මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම මගින් අවම කරන ලදී.

## 17.3 දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ප්‍රගතිය

දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙහි මනා ක්‍රියාකාරිත්වය උදෙසා, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය කිරීමේ කටයුතු අඛණ්ඩව පවත්වාගෙන ගිය අතර එ.ජ.ඩොලරයට සාපේක්ෂව ශ්‍රී ලංකා රුපියලෙහි විනිමය අනුපාතිකය අධික ලෙස විචලනය වීම වළක්වාලීම සඳහා අවශ්‍ය කටයුතු ද දියත් කරන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් විදේශ විනිමය ප්‍රමාණයන් ඔවුන්ට නියමිත සීමාවන් තුළ පවත්වාගෙන යන බව තහවුරු කරගැනීම සඳහා අවශ්‍ය සමීප අධීක්ෂණ කටයුතු ද සිදුකරන ලදී. එයට අමතරව විදේශ විනිමය අනුපාතිකයන් ගණනය සහ එම තොරතුරු විවිධ රාජ්‍ය, දේශීය සහ විදේශීය නියෝජිත ආයතනයන් සහ පොදුජනතාව වෙත බෙදාහැරීමේ කටයුතු ද පවත්වාගෙන යන ලදී.

පසුගිය වසර තුළ දී බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් පවත්වාගෙන යා හැකි ශුද්ධ විදේශ විනිමය ප්‍රමාණයන් විමර්ශනයකට ලක්කිරීමෙන් පසු විදේශ විනිමය වෙළෙඳපොළෙහි අවදානම අඩු කිරීමේ පරමාර්ථයෙන් යුතුව එම ප්‍රමාණයන් පහත හෙලනු ලැබීය. 2012 වර්ෂයේ පෙබරවාරි මස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විදේශ විනිමය ප්‍රතිපත්තියෙහි කැපී පෙනෙන වෙනසක් සිදු කරන ලද අතර ඒ තුළින් මිල ඉලක්කයන් වෙනුවට ප්‍රමාණයන් ඉලක්ක කරගනිමින් විදේශ විනිමය වෙළෙඳපොළ කටයුතු සඳහා මැදිහත් වීමේ අවස්ථාව සැලසිණි.

මෙම දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලද විදේශ විනිමය වෙළෙඳපොළ අධීක්ෂණ කටයුතු, බලපත්‍රලාභී වාණිජ බැංකුවලට විදේශ විනිමය ගනුදෙනු විචක්ෂණශීලීව සිදුකිරීමට සහය වූ අතර එමගින්, එම වාණිජ බැංකු මගින් සිදු කරන ලද විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ පොදු මහජන විශ්වාසය ඉහළ නැංවීය. විදේශ විනිමය අනුපාතිකයෙහි අධික විචල්‍යතාවයන් අවම කිරීමෙන්, විදේශ මුදල් මිලදී ගැනීමේ හෝ විකිණීමේ අවශ්‍යතාවය ඇති ගනුදෙනුකරුවන්ට තම අවශ්‍යතාවයන් වඩාත් නිවැරදිව පුරෝකථනය කරගැනීමට සහ එමගින් විදේශ විනිමය අවදානම අවම කරගැනීමට උපකාරී විය. තවද ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරනු ලබන, ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව අනෙකුත් විදේශ මුදල් ඒකකයන්හි විනිමය අනුපාතික මගින් පොදු මහජනතාවට, මෙන්ම විවිධ රාජ්‍ය, දේශීය සහ විදේශීය නියෝජිත ආයතනවලට ද තම දෛනික විදේශ මුදල් ගනුදෙනු අවශ්‍යතාවයන් සඳහා විශ්වාසවන්ත විනිමය අනුපාතිකයන් ලබාගැනීමට හැකි වීම වාසිදායක තත්ත්වයකි.

**II-17 සංඛ්‍යා සටහන** **ශ්‍රී ලංකා මහ බැංකුව මගින් විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් - 2012**

ඇ.එ.ජ.ඩොලර් මිලියන

| 2012 | මිලට ගැනීම් | විකුණුම් | ශුද්ධ මිලට ගැනීම්/(විකුණුම්) |
|---|---|---|---|
| ජනවාරි | | 609.80 | (609.80) |
| පෙබරවාරි | - | 367.43 | (367.43) |
| මාර්තු | 124.59 | 177.95 | (53.36) |
| අප්‍රේල් | - | 153.70 | (153.70) |
| මැයි | 19.00 | 62.73 | (43.73) |
| ජූනි | 325.00 | 38.38 | 286.62 |
| ජූලි | 21.00 | 50.75 | (29.75) |
| අගෝස්තු | 5.00 | 15.75 | (10.75) |
| සැප්තැම්බර් | 23.00 | 300.00 | (277.00) |
| ඔක්තෝබර් | 36.70 | 6.40 | 30.30 |
| නොවැම්බර් | - | 7.85 | (7.85) |
| දෙසැම්බර් | 77.00 | 6.30 | 70.70 |
| **එකතුව** | **631.29** | **1,797.04** | **(1,165.75)** |

මූලයන් : ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

**II-18 සංඛ්‍යා සටහන** **අන්තර් බැංකු විදේශ විනිමය ගනුදෙනු පරිමාව 2012**

ඇ.එ.ජ.ඩොලර් මිලියන

| මාසය | එතැන් | පසුදින | එදින | ඉදිරි | එකතුව |
|---|---|---|---|---|---|
| ජනවාරි | 656.30 | 192.05 | 147.00 | 460.08 | 1,455.43 |
| පෙබරවාරි | 911.97 | 237.75 | 111.75 | 514.62 | 1,776.09 |
| මාර්තු | 547.72 | 194.00 | 105.80 | 337.05 | 1,184.57 |
| අප්‍රේල් | 473.31 | 141.05 | 133.51 | 196.73 | 944.60 |
| මැයි | 307.00 | 150.20 | 82.01 | 330.96 | 870.17 |
| ජූනි | 233.98 | 227.40 | 101.56 | 420.80 | 983.74 |
| ජූලි | 482.30 | 334.40 | 126.44 | 307.47 | 1,250.61 |
| අගෝස්තු | 215.40 | 184.45 | 172.52 | 246.44 | 818.81 |
| සැප්තැම්බර් | 317.85 | 209.10 | 206.70 | 340.92 | 1,074.57 |
| ඔක්තෝබර් | 386.69 | 293.83 | 222.70 | 412.74 | 1,315.96 |
| නොවැම්බර් | 299.60 | 207.60 | 142.60 | 245.07 | 894.87 |
| දෙසැම්බර් | 303.24 | 166.85 | 104.02 | 276.37 | 850.48 |
| **එකතුව** | **5,135.36** | **2,538.68** | **1,656.61** | **4,089.25** | **13,419.90** |

මූලයන් : ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව

## 18. කළමනාකාරිත්ව විගණන

කළමනාකාරිත්ව විගණන දෙපාර්තමේන්තුව මගින් බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය ඉටු කරයි. ඊට අමතරව, මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවට සහ බාහිර විගණන කටයුතු සඳහා මුදල් මණ්ඩල හා විගණන කමිටු ලේකම් මගින් අවශ්‍ය පහසුකම් සැපයීම ද කරනු ලැබේ. තවද, අභ්‍යන්තර විගණනය හා සම්බන්ධ හැකියාවන් වර්ධනය කිරීමේ වැඩසටහන් ද වර්ෂය තුළ දී සංවිධානය කරන ලදී. 1951 වර්ෂයේ සිට බැංකුව තුළ අභ්‍යන්තර විගණන කාර්යය ක්‍රියාත්මක වේ. දෙපාර්තමේන්තුව විසින් 2012 වර්ෂය තුළ සිදුකරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

### 18.1 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

**(අ) අභ්‍යන්තර විගණනයේ මූලික ඉලක්කය**

බැංකුවේ දෙපාර්තමේන්තු විසින් ඊට අදාළ නීති, ප්‍රතිපත්ති හා අභ්‍යන්තර පාලන ක්‍රම කෙරෙහි දක්වා ඇති අනුකූලතාවය පිළිබඳ තහවුරුවක් ලබාදීම හා අදාළ කළමනාකාරිත්වය හරහා විගණන නිරීක්ෂණයන් නිරාකරණය කර ගැනීම කෙරෙහි අවධානය යොමු කරමින් 2012 වර්ෂය තුළ දී ද අභ්‍යන්තර විගණන කටයුතු සිදුකරන ලදී. විගණන කටයුතු සිදුකිරීමේ දී ඇමෙරිකා එක්සත් ජනපදයේ අභ්‍යන්තර විගණකයින්ගේ ආයතනයේ (Institute of Internal Auditors - USA) ප්‍රමිතීන් හා ක්ෂේත්‍රයේ සම්මත පරිචයන් අනුගමනය කරන ලදී. දෙපාර්තමේන්තුවේ මෙහෙවර හා කාර්ය වපසරියත්, කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂගේ හා කාර්ය මණ්ඩලයේ වගකීම, ස්වාධීනත්වය, වගකීම හා

අධිකාරියත් අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රය මගින් අර්ථ දක්වා ඇත.

(ආ) 2012 වාර්ෂික විගණන සැලැස්ම

වාර්ෂික විගණන සැලැස්ම බැංකුවේ සියලුම පර්ෂදයන්හි ප්‍රධානතම හා වැදගත් ක්‍රියාකාරකම් සැලකිල්ලට ගනිමින් සකස් කරන ලද අතර මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවේ අනුමැතිය සහිතව ක්‍රියාවට නංවන ලදී. අනුගමනය කරන ලද විගණන ක්‍රියාවලිය අදියර 4 කින් යුක්ත වේ. එනම්, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, සන්නිවේදනය හා නිරාකරණය කිරීම වේ. විගණන නිරීක්ෂණයන්, විගණනයන් සිදුකරන අතරතුර හා ප්‍රතිඵල සන්නිවේදනය කරන අවස්ථාවල දී නිරාකරණය කිරීම සිදුකරන ලදී. ඒ අනුව, බැංකුවේ ප්‍රධානතම හා වැදගත් මෙහෙයුම් කටයුතු ආවරණය වන පරිදි විගණන පැවරුම් උචිත නිරාකරණය කිරීම් සහිතව සම්පූර්ණ කරන ලදී. මීට අමතරව, අදාළ කළමනාකාරිත්ව පාර්ශවයන් විසින් එකඟ වූ නිරාකරණය කිරීම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පසුවිපරම් විගණනයන් ද සිදුකරන ලදී.

(ඇ) විගණන ක්‍රියාවලියෙහි ප්‍රගතිය වාර්තා කිරීම

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමෙහි ප්‍රගතිය අධිපතිතුමාට හා මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුවට කාර්තුමය වශයෙන් ද, එම ප්‍රගතිය කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ හා මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව මගින් කමිටුවේ නිර්දේශයන් ද සහිතව මුදල් මණ්ඩලයට ද වාර්තා කරන ලදී. තවද, ක්‍රියාත්මක කරන ලද විගණනයන් පිළිබඳව විගණකාධිපතිතුමා හට අර්ධ වාර්ෂිකව වාර්තා කරන ලදී.

### 18.2 මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව

විගණන කමිටු සම්බන්ධයෙන් ජාත්‍යන්තර පියවීම් බැංකුව (Bank for International Settlements) අනුගමනය කරන පරිචයන් හා රාජ්‍ය සංස්ථා සඳහා නිකුත් කර ඇති චක්‍රලේඛය අනුගමනය කරමින් මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව කටයුතු කරනු ලැබේ. මුදල් මණ්ඩල උපදේශාත්මක විගණන කමිටුව, මුදල් මණ්ඩලයේ එක් සාමාජිකයකු හා බාහිර විගණන වෘත්තිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වන අතර මාස 2 කට වරක් රැස්වේ. කමිටුව වර්ෂය තුළ 6 වරක් රැස්වුන අතර අවශ්‍යතාවයන් පරිදි නිර්දේශයන් ද ඉදිරිපත් කරන ලදී. කළමනාකාරිත්ව විගණන අධ්‍යක්ෂ විසින් විගණන කමිටු ලේකම් මගින් විගණන කමිටුවට අවශ්‍ය පහසුකම් සැපයීම සිදුකරන ලදී.

### 18.3 බාහිර විගණන කටයුතු සඳහා පහසුකම් සැපයීම

2012 වර්ෂය තුළ දී බාහිර විගණන කටයුතු හා නිරීක්ෂණයන් නිරාකරණය කිරීමේ කටයුතු සම්බන්ධීකරණය කිරීමේ බලයලත් නිලධාරී ලෙස මුදල් මණ්ඩල ලේකම් කටයුතු කරන ලදී. විගණකාධිපතිතුමා විසින් බාහිර විගණන කටයුතු සිදුකරනු ලබයි. අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (International Financial Reporting Standards) අනුකූලව මූල්‍ය ප්‍රකාශන විගණනය කිරීම සඳහා විගණකාධිපතිතුමා විසින් අර්නස්ට් ඇන්ඩ් යන්ග් (Ernst & Young) ආයතනය පත්කර ඇත. ඒ අනුව අදාළ කටයුතු සිදුකිරීමට අවශ්‍ය තොරතුරු රැස්කිරීම, නිරීක්ෂණයන් විශ්ලේෂණය හා සන්නිවේදනය කිරීම සඳහා මුදල් මණ්ඩල ලේකම් වෙත තාක්ෂණික සහාය සැපයීම ද දෙපාර්තමේන්තුව මගින් සිදුකරන ලදී.

### 18.4 දැනුවත් කිරීමේ වැඩසටහන් හා පුහුණු සැසි පැවැත්වීම

බැංකුවේ තොරතුරු පද්ධතිවල ආරක්ෂාව සැලකිල්ලට ගනිමින් බැංකුවේ කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම සඳහා ක්ෂේත්‍රයෙහි ප්‍රවීණයකු යොදා ගනිමින් 'Ensuring IT Security through Information Systems Audit' යන මැයෙන් සම්මන්ත්‍රණයක් සංවිධානය කරන ලදී. උපාධි අපේක්ෂකයින් හා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙහි ශිෂ්‍යයින් සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණුවක් ලබාදුන් අතර, බංගලාදේශ මහ බැංකු (Bangladesh Bank) නිලධාරීන් සඳහා අභ්‍යන්තර විගණනය පිළිබඳ පුහුණු වැඩමුළුවක් ද සංවිධානය කෙරිණි. තවද, බැංකු කටයුතු අධ්‍යයන කේන්ද්‍රය මගින් නේපාල මහ බැංකුවේ (Nepal Rastra Bank) නිලධාරීන් සඳහා පවත්වන ලද වැඩමුළුවක් සඳහා අභ්‍යන්තර විගණන විෂය පිළිබඳ දේශන පැවැත්වීම මගින් සම්පත් දායකත්වය ලබාදෙන ලදී.

## 19. ගෙවීම් සහ පියවීම්

ශ්‍රී ලංකා මහ බැංකුව නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ සිදුකරන ලද ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිසංවිධාන ක්‍රියාවලියට අනුව 2002 වසරේ දී ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ස්ථාපනය කරන ලදී. ශ්‍රී ලංකාවේ ගෙවීම් පද්ධතිවල සුරක්ෂිත බව, කාර්යක්ෂම බව, තරඟකාරී බව සහ ස්ථායීතාවය සහතික කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් පද්ධති අවේක්ෂණය සහ නියාමනය කිරීමත්, ජාතික ගෙවීම් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමත් සඳහා 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පවරා ඇති බලතල ක්‍රියාත්මක කරනු ලබන්නේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගිනි.

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවෙහි ප්‍රධාන කාර්යයන් වනුයේ තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු පවත්වාගෙන යෑමත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණය කිරීමට සහ විවට වෙළෙඳ කටයුතු සඳහා අවශ්‍ය ගෙවීම් සහ පියවීම් දත්ත සැකසීම සහ ඒවා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් නිකුත් කිරීම සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සැලසීමත්, ස්විෆ්ට් සන්නිවේදන කටයුතු කළමනාකරණය කිරීමත්, ආසියානු නිෂ්කාශන සංගමයේ

රටවල් අතර ගනුදෙනු පියවීමත්, ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමත්, අවේක්ෂණ කටයුතු සිදු කිරීමත්ය. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

## 19.1 තත්කාලීන දළ පියවීම් පද්ධතිය

අන්තර් බැංකු ගෙවීම් මෙන්ම ගනුදෙනුකරුවන්ගේ ගෙවීම් ද තත්කාලීන දළ පියවීම් පදනම මත පියවීමත් තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා අතිරේක අරමුදල් ඉල්ලා සිටි සහභාගිත්ව ආයතන වෙත දෛනිකව ලබාදෙන ද්‍රවශීලතා පහසුකම් සැලසීම සහ එම කටයුතු නිරීක්ෂණය කිරීමත් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කරන ලදී.

- 2012 වසර තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් සිදුකළ ගනුදෙනු සංඛ්‍යාව 284,561 ක් වූ අතර එම ගනුදෙනුවල මූල්‍යමය වටිනාකම රුපියල් බිලියන 43,255 ක් විය.
- තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් සිදු කළ ගනුදෙනු සංඛ්‍යාවේ සහ මූල්‍ය වටිනාකම්වල දෛනික සාමාන්‍යය පිළිවෙලින් 1,176 ක් සහ රුපියල් බිලියන 179 ක් ද විය.
- දෛනිකව ලබාදෙන ද්‍රවශීලතා පහසුකම යටතේ සහභාගිත්ව ආයතන වෙත මුදාහරින ලද මුදල් ප්‍රමාණයෙහි දෛනික සාමාන්‍යය රුපියල් බිලියන 15.2 ක් විය.
- 2012 වර්ෂය තුළ දී තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි ක්‍රියාකාරී පැවැත්ම සියයට 99.81 ක් ලෙස පවත්වා ගැනීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට හැකි විය.

## 19.2 විදේශ විනිමය ගනුදෙනු පියවීම

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ජාත්‍යන්තර සංචිත කළමනාකරණ ගනුදෙනු සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සැලසීම 2012 වර්ෂය තුළ දී ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් නොකඩවා සිදු කරන ලදී.

- 2012 වර්ෂය තුළ දී ඩොලර් බිලියන 226 ක වටිනාකමකින් යුත් විදේශ විනිමය වෙළෙඳපොළ ගනුදෙනු, මූල්‍ය වෙළෙඳපොළ ගනුදෙනු, ස්ථාවර ආදායම් සුරැකුම්පත් ගනුදෙනු සහ රන් වෙළෙඳපොළ ගනුදෙනු 19,602 කට අදාළ ගෙවීම් පියවන ලදී.
- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගනුදෙනු මෙහෙයුම් මැදිරියේ (Dealing Room) කටයුතු නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු පිළිබඳව අවශ්‍ය තොරතුරු ලබාදෙන ලදී.
- ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි වැඩි වන ගනුදෙනු ප්‍රමාණය පියවීම සඳහා 2012 වර්ෂයේ දී ද බහු මුර වැඩ ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

## 19.3 විවට වෙළෙඳ කටයුතු පිළිබඳ ගනුදෙනු පියවීම

ලංකාසෙට්ල් සහභාගිකරුවන්ගේ ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් පිළිබඳ ගනුදෙනු සඳහා සුරැකුම්පත් වෙන්කර දීම මගින් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විවට වෙළෙඳ කටයුතු සඳහා පසු මෙහෙයුම් කාර්යාල පහසුකම් සලසා දෙන ලදී.

- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රුපියල් බිලියන 2,722 ක් වූ ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනු 4,016 ක් ද, රුපියල් බිලියන 798 ක් වූ ප්‍රතිවිකුණුම් ගනුදෙනු 1,097 ක් ද, රුපියල් බිලියන 18 ක් වූ ස්ථිර පදනමක් මත කරන ලද විකුණුම් ගනුදෙනු 36 ක් ද, සඳහා පියවීම් කටයුතු සිදුකරන ලදී.

## 19.4 ස්විෆ්ට් සන්නිවේදන කටයුතු

දේශීය සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතන සමග ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන ස්විෆ්ට් සන්නිවේදන කටයුතු පවත්වාගෙන යාම සිදු කරනු ලබන්නේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසිනි.

- 2012 වර්ෂය තුළ දී යවන ලද සහ ලබන ලද ස්විෆ්ට් පණිවුඩ සංඛ්‍යාව පිළිවෙළින් 1,384,174 ක් සහ 818,612 ක් විය.
- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ස්විෆ්ට් පද්ධතියේ කාර්යක්ෂමතාවය වැඩිදියුණු කිරීම අරමුණු කොට ගෙන එම පද්ධතියට අදාළ නවීකරණයන් සාර්ථක ලෙස ස්ථාපනය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුවේ වැඩි වන විදේශ විනිමය ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම සඳහා ස්විෆ්ට් සේවාව ලබාගැනීමේ කාලය පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වා දීර්ඝ කරන ලදී.

## 19.5 ආසියානු නිෂ්කාශන සංගමයේ ගනුදෙනු

ආසියානු නිෂ්කාශන සංගමයේ (ආ.නි.සං.) සාමාජික රටවල් නවය අතර අන්තර් කලාපීය ගනුදෙනු ආ.නි.සං. යාන්ත්‍රණය හරහා සිදු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

- 2012 වසරේ දී ආ.නි.සං. හරහා කරන ලද මුළු ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 421.9 කි.
- ආ.නි.සං. හි අධ්‍යක්ෂ මණ්ඩලයේ 41 වන රැස්වීම 2012 මැයි මස නේපාලයේ දී පවත්වන ලද අතර, මහ බැංකු අධිපතිතුමා අධ්‍යක්ෂ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙස ද ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය විකල්ප අධ්‍යක්ෂවරියක ලෙස ද එම රැස්වීමට සහභාගි වූහ. එහිදී වැඩි අවධානයක් යොමු කරන ලද්දේ තාක්ෂණික කමිටුව විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශයන් වූ, ආ.නි.සං. වෙළෙඳ සහ සංවර්ධන

බැංකුව පිහිටුවීම, ආ.නි.සං. ගනුදෙනු සම්බන්ධයෙන් රටවල් අතර ඇතිවන ආරවුල් බේරුම් කිරීම සඳහා ක්‍රමවේදයක් පිහිටුවීම, ආ.නි.සං. ගනුදෙනු පිළිබඳ වාර්තා සුරක්ෂිතව තබාගත යුතු කාලය ආ.නි.සං. මෙහෙයුම් රීතිවලට (Procedure Rules) ඇතුළත් කිරීම, පණිවුඩ හුවමාරුව, ගිණුම්ගත කිරීම සහ ගිණුම් සැසඳීම සඳහා ඇති කරන ලද අන්තර්ජාලය පදනම් කරගත් පරිගණක පද්ධතිය ක්‍රියාත්මක කිරීම සහ වියදම් ඇස්තමේන්තු කිරීම යනාදිය වෙනුවෙන්ය.

### 19.6 ගෙවීම් පද්ධති පිළිබඳ ප්‍රතිපත්ති සම්පාදනය සහ අවේක්ෂණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සුරක්ෂිත, ශක්තිමත් සහ කාර්යක්ෂම ගෙවීම් සහ පියවීම් පද්ධතියක් පවත්වා ගැනීම මගින් මූල්‍ය පද්ධති ස්ථායීතාවය සහතික කිරීම සඳහා නියාමන සහ අධීක්ෂණ කටයුතු නොකඩවා සිදු කරන ලදී. ඒ අනුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන අවේක්ෂණ කටයුතු පහත දැක්වේ.

- 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග යටතේ ඉදිරිපත් කරන ලද අයැදුම්පත් පහක ඇගයීම් කටයුතු සිදු කරන ලද අතර, ගෙවීම් කාඩ්පත් ව්‍යාපාරයේ නිරතවීම සඳහා සේවා සැපයුම්කරුවන් තිදෙනෙකුට ද, ජංගම දුරකථන ආශ්‍රිත විද්‍යුත් මුදල් ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම සඳහා ජංගම දුරකථන ජාල ක්‍රියාකරුවෙකු හට ද, බලපත්‍ර නිකුත් කරන ලදී.
- බලපත්‍රලාභී ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් 17 දෙනෙකු විසින් බලපත්‍ර අලුත් කිරීම සඳහා ඉදිරිපත් කරන ලද අයැදුම්පත් ඇගයීම් කටයුතු සිදු කරන ලද අතර, එම බලපත්‍ර වර්ෂයක කාලයක් සඳහා අලුත් කරන ලදී.
- ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් සේවා නියාමනය කිරීමේ දී ඇති වූ ප්‍රායෝගික සහ නීතිමය ගැටලු නිරාකරණය කර ගැනීම සඳහා 2009 අංක 1 දරන ගෙවීම් කාඩ්පත් සේවා සැපයුම්කරුවන් සඳහා වූ නියෝග සංශෝධනය කිරීම සඳහා කටයුතු ආරම්භ කරන ලදී.
- ශ්‍රී ලංකාව තුළ ණය කාඩ්පත් මෙහෙයුම් කටයුතු සුරක්ෂිත කිරීම සහතික කිරීම සඳහා දත්ත සංකේතන තාක්ෂණය ආදේශ කිරීමේ කටයුතු අධීක්ෂණය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුව සිය ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් යාවත්කාලීන කර තිබේදැයි අධීක්ෂණය සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිත්ව ආයතනවල ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීම සිදු කරන ලදී.
- ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු ප්‍රචාරණය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය ගෙවීම් සඟරාව ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි පළ කරන ලදී.

ගෙවීම් සහ පියවීම් පද්ධති ස්ථායීතාවය ළඟා කර ගන්නා අතරම ගනුදෙනු කාලීනව පියවීමට පහසුකම් සැලසීම සඳහා චෙක්පත් නිෂ්කාශන ශේෂයන්, ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය සහ අනෙකුත් ගෙවීම් පද්ධතිවල පියවීම් ඇතුලුව අන්තර් බැංකු පියවීම් කාලීනව සිදුවන බවට සහතික වෙමින් ලංකාසෙට්ල් පද්ධතියේ ක්‍රියාකාරී පැවැත්ම 99.81 ක් ලෙස පවත්වා ගනිමින් ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් කටයුතු සිදු කිරීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවට හැකි විය. එමෙන්ම, කඩදාසි පත් මත පදනම් වූ ගෙවීම් ක්‍රමවලට වඩා සුරක්ෂිත සහ කාර්යක්ෂම විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතයට උනන්දු කිරීම අරමුණු කරගෙන සාමාන්‍ය ජනතාවට සහ බැංකු කාර්යමණ්ඩලවලට ගෙවීම් පද්ධති සහ අනෙකුත් අදාළ කරුණු පිළිබඳ දැනුමක් ලබාදීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව, කාඩ්පත් ගෙවීම් ක්‍රම සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් ක්‍රම අවේක්ෂණයේ දී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන ලද්දේ ගනුදෙනුකරුවන් ආරක්ෂා කිරීම කෙරෙහිය. ඒ අනුව සේවා සැපයුම්කරුවන් විසින් ණය කාඩ්පත් සහ ජංගම දුරකථන ආශ්‍රිත ගෙවීම් ක්‍රම පිළිබඳ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම තුළින් සාමාන්‍ය ජනතාවට තම එදිනෙදා සුළු පරිමාණ ගෙවීම් සිදු කිරීම සඳහා සුරක්ෂිත සහ විශ්වාසවන්ත පරිසරයක් ඇති කිරීමට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

## 20. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

2007 වර්ෂයේ දී පිහිටුවන ලද ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුවේ වගකීම වනුයේ, ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයනයන් සිදු කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම පිළියෙළ කිරීම සම්බන්ධීකරණය සහ උපාය මාර්ගික සැලසුම ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කිරීමයි. මේ යටතේ වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව පහත සඳහන් කාර්යයන්වල නිරත විය.

### 20.1 ප්‍රතිපත්ති සමාලෝචන සහ අධ්‍යයනයන් සිදු කිරීම

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් "මෑත කාලීන සිදුකරන ලද මූල්‍ය ප්‍රතිපත්ති වෙනස්වීම්වල සාර්ව ආර්ථික බලපෑම" සහ "ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගත භාවය", යනාදී ප්‍රතිපත්ති අධ්‍යයනයන් කිහිපයක් ද "සෞභාග්‍ය ණය යෝජනා ක්‍රමය", "ගැටලු සහිත මූල්‍ය ආයතන නිරාකරණය කිරීම සඳහා රාමුවක්" සහ "ශ්‍රී ලංකා මහ බැංකුවේ මානව සම්පත වැඩිදියුණු කිරීම සඳහා ගන්නා ලද පියවර" යනාදී අනෙකුත් අධ්‍යයනයන් කිහිපයක් ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු විසින් නිකුත් කරන ලද ප්‍රතිපත්ති සම්බන්ධ ලේඛන ඇතුළත් කොට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග පිළිබඳව වූ විද්‍යුත් පුස්තකාලය අඛණ්ඩව යාවත්කාලීන කරන

ලදී. 2012 අවසානය වන විට මෙම පුස්තකාලයට ඇතුළත් කරන ලද ප්‍රතිපත්ති සම්බන්ධ ලේඛන සංඛ්‍යාව 844 ක් විය. මීට අමතරව, දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් දැනුම හුවමාරු කරගැනීම අරමුණු කරගනිමින් විවිධ ප්‍රතිපත්ති ගැටළු පිළිබඳව සාකච්ඡා 08 ක් දෙපාර්තමේන්තුව තුළ සිදුකරන ලදී.

### 20.2 උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම

ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ හත්වැනි උපායමාර්ගික සැලසුම් කතිකාවත, 2012 ඔක්තෝබර් මස 05 සිට 07 දින දක්වා මීගමුව, ජෙට්වින්ග් බ්ලූ හෝටලයේ දී පැවැත්වීමේ කටයුතු සංවිධානය කරන ලදී. "සුදානම්වන්න ඩොලර් 4,000 ඉදිරියෙන්" යන තේමාව යටතේ, 2013 - 2017 වර්ෂයන් සඳහා වූ උපාය මාර්ගික සැලසුම පිළියෙළ කිරීමේ කතිකාවත සඳහා මුදල් මණ්ඩලයේ සාමාජිකයන් කිහිපදෙනෙක්, සාංගමික කළමනාකරණ කමිටුවල සාමාජිකයන්, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදේශන කමිටුවල සාමාජිකයන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ ඔවුන්ගේ නියෝජිතයන් සහභාගි විය. කතිකාවතෙහි අරමුණ වූයේ, 2012 - 2016 වර්ෂයන් සඳහා වූ උපාය මාර්ගික සැලසුමේ කාර්යසාධන ප්‍රගතිය විමර්ශනය කිරීමත්, ඉදිරි වර්ෂ 05 සඳහා උපාය මාර්ගික සැලසුම යාවත්කාලීන කිරීමත්ය. කතිකාවතට පෙර, තෝරාගත් තේමාවට අනුකූලව, දෙපාර්තමේන්තුවල උපාය මාර්ගික සැලසුම් ප්‍රමාණවත් ලෙස සැකසී ඇද්ද යන්න තහවුරු කරගැනීම සඳහා, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම දෙපාර්තමේන්තු සහ පළාත් කාර්යාල සමඟ රැස්වීම් 32 ක් පවත්වන ලදී.

### 20.3 වර්තමාන උපාය මාර්ගික සැලසුම (2012 - 2016) ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම

"ඉහළ ඉමකට තබමු පියවර" යන තේමාව යටතේ 2012 - 2016 කාලපරිච්ඡේදය සඳහා පිළියෙල කළ, ශ්‍රී ලංකා මහ බැංකුවේ හයවන උපායමාර්ගික සැලසුම පිළිබඳව, ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් දැනුවත් කිරීමේ දෙදින වැඩමුළුවක් 2012 වර්ෂයේ ජනවාරි මස පළමු සතිය තුළ සිදු කෙරිණි. වැඩමුළුවේ අංගයක් ලෙස කරන ලද සමීක්ෂණය අනුව, මහ බැංකු නිලධාරීන්ට, උපාය මාර්ගික සැලසුම සහ සැලසුම් ක්‍රියාවලියේ ප්‍රධාන අංග පිළිබඳව සතුටුදායක දැනුමක් ඇති බව අනාවරණය විය.

2012 - 2016 උපාය මාර්ගික සැලැස්ම අනුව කාර්යසාධන මට්ටම් ඇගයීම සඳහාත්, උපාය මාර්ගික සැලැස්ම සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා වූ බාධාවන් හඳුනාගැනීම සඳහාත්, ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම්, සෑම දෙපාර්තමේන්තුවක් සහ ප්‍රාදේශීය කාර්යාලයක් සමඟ පවත්වන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ සභාපතිත්වයෙන් සහ ඉහළ කළමනාකාරීත්වයෙන් සැදුම් ලත් උපාය මාර්ගික සමාලෝචන කමිටුව වෙත ප්‍රගති සමාලෝචන රැස්වීම්වල ප්‍රතිඵල වාර්තා කෙරිණි. එම වාර්තා පදනම් කරගනිමින්, මහ බැංකුවේ උපාය මාර්ගික සැලසුම් අපේක්ෂිත මාර්ගයෙහි ගමන්කරවීම සහතික කිරීමට කළමනාකාරීත්වය විසින් අවශ්‍ය පියවර ගන්නා ලදී. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ දෙපාර්තමේන්තුව, උක්ත කමිටුව මගින් ගන්නා ලද තීරණ, අදාළ දෙපාර්තමේන්තු සහ පළාත් කාර්යාල වෙත දැනුම් දුන් අතර, උපාය මාර්ගික සැලසුමේ සඳහන් අරමුණු ළඟා කරගැනීම සඳහා අවශ්‍ය පසු විපරම් කටයුතු ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, 2012 වර්ෂයේ දී එහි දෙපාර්තමේන්තු සහ පළාත් කාර්යාලවලට පවරන ලද අපේක්ෂිත කටයුතුවලින් සියයට 97.1 ක් ළඟාකර ගෙන ඇති බව වාර්ෂික ප්‍රගති සමාලෝචනය මගින් පෙන්නුම් කරන ලදී. තවද දෙපාර්තමේන්තුව, උපාධි අපේක්ෂකයන් 53 දෙනෙකුට වර්ෂය තුළ දී පුහුණු සැසි වාර පවත්වන ලදී.

## 21. පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ඉටුකරනු ලබන සංවර්ධන කාර්යයන් ඇතුළු අනෙකුත් මහ බැංකු කාර්යයන්, ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සහ එම කාර්යයන් අධීක්ෂණය කිරීම අරමුණු කර ගනිමින්, 2009 වර්ෂයේදී පළාත් කාර්යාල මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව (ප.මෙ.දෙ.) පිහිටුවන ලදී. ඒ අනුව ප.මෙ.දෙ. 2012 වසරේදී දකුණ, උතුරුමැද, මධ්‍යම, උතුර හා නැගෙනහිර යන පළාත්වල ක්‍රියාත්මක වන පළාත් කාර්යාල පහ මගින් සිදුකරනු ලබන කාර්යයන් මෙහෙයවීමේ කටයුතුවල නිරත විය.

### 21.1 පළාත් කාර්යාලවල කටයුතු මෙහෙයවීම

මහ බැංකුවේ ප්‍රධාන කාර්යයන් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම උදෙසා, 2012 වර්ෂය ආරම්භයේදීම අදාළ දෙපාර්තමේන්තුවල එකඟතාවයද ඇතිව, තෝරාගත් වැඩසටහන් රැසක් පළාත් කාර්යාල වෙත පවරන ලදී. පළාත් කාර්යාල විසින් සතිපතා සහ මාසිකව ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තා පදනම් කරගෙන, ප.මෙ.දෙ. සිය දුරස්ථ අධීක්ෂණ කටයුතු සිදුකරනු ලැබීය. ඊට අමතරව, අවස්ථා 33 ක දී බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ සහ ප.මෙ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන් පළාත් කාර්යාලවලට ගොස් එතැන් පරීක්ෂණ කටයුතුවල නිරත විය. මෙම අවස්ථාවලදී පවත්වන ලද වැඩසටහන් වලට සහභාගීවූවන් සමග සෘජුවම අදහස් හුවමාරු කරගැනීමට එම නිලධාරීන්ට හැකි විය. තවදුරටත්, 2012 වර්ෂය තුළදී පළාත් කාර්යාල කටයුතුවල ප්‍රගතිය සමාලෝචනය කිරීම සඳහා පළාත් කළමනාකරුවන් සහ අනෙකුත් නිලධාරීන්ද සමග දුරකථන සම්මන්ත්‍රණ 04 ක් සහ මහ බැංකු පරිශ්‍රය තුළ සම්මන්ත්‍රණ 07 ක්ද පවත්වන ලදී.

## 21.2 පළාත් කාර්යාලවල කාර්යයන්

### (අ) මහ බැංකු කාර්යයන් පළාත් මට්ටමින් ව්‍යාප්ත කිරීම

වසර තුළදී මහ බැංකුවේ විශේෂිත කාර්යයන් පළාත් කාර්යාල පහ මගින් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කිරීම සඳහා සහායවීම ප.මෙ.දෙ. විසින් තවදුරටත් සිදුකරන ලදී. මේ යටතේ පළාත් කාර්යාල විසින්, මහ බැංකුව හඳුන්වා දී ඇති ණය යෝජනා ක්‍රම ඇතුළුව රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය, පිළිගත් බැංකු පුරුදු ඇති කිරීම, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනාගැනීම සහ මුදල් නෝට්ටු භාවිතය පිළිබඳ යහපත් පුරුදු, අවසර නොලත් මූල්‍ය ආයතනවල සහ නීතිවිරෝධී යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීමේ අහිසි ප්‍රතිඵල ආදිය සම්බන්ධව රාජ්‍ය හා වෙනත් මූල්‍ය ආයතන නිලධාරීන්ද ඇතුළුව මහජනයා දැනුම්වත් කිරීම සඳහා වැඩසටහන් 469 ක් පවත්වා ඇත. ඊට අමතරව, මහ බැංකුවේ විවිධ දෙපාර්තමේන්තු වෙනුවෙන්, තෝරාගත් විෂයයන්ට අදාළව සමීක්ෂණ පැවැත්වීම සහ ප්‍රාදේශීය වශයෙන් නීතිවිරෝධීව පවත්වාගෙන යන ලද මූල්‍ය ආයතන සම්බන්ධව විමර්ශන කටයුතු සිදුකිරීම මගින් පළාත් කාර්යාල සිය දායකත්වය සපයා ඇත. සේවක අර්ථසාධක අරමුදලට අදාළ වන විමසුම් සම්බන්ධව කටයුතු කිරීම සහ සමරු කාසි සහ මහ බැංකු ප්‍රකාශන අලෙවියද පළාත් කාර්යාල විසින් සිදුකරන ලද තවත් කාර්යයන් විය. ඊට අමතරව, සෑම පළාත් කාර්යාලයක් විසින්ම සිය පළාත තුළ පවතින සම්පත්, ව්‍යාපාරික හා ආයෝජන අවස්ථා පිළිබඳව සවිස්තරාත්මක වාර්තා සකස් කරන ලදී. පළාත් කාර්යාල කාර්ය මණ්ඩලය විසින් ප්‍රතිලාභීන් 7,500 ක ගේ පමණ සවිස්තරාත්මක තොරතුරු එක්රැස් කිරීම සම්පූර්ණ කරන ලද අතර, පළාතට අදාළව පවත්වාගෙන යනු ලබන දත්ත එකතුව යාවත්කාලීන කිරීම තවදුරටත් කරගෙන යන ලදී. සංවර්ධන කාර්යයන්ට අදාළව ඒ ඒ පළාත්වල පවත්වන ලද විවිධ රැස්වීම් හා සම්මන්ත්‍රණවලදී මහ බැංකුව නියෝජනය කිරීම, පළාත් කළමනාකරුවන් විසින් ඉටු කරන ලදී.

### (ආ) සංවර්ධන කටයුතු

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන විවිධ ණය යෝජනා උපයෝගී කරගෙන, ඒ ඒ පළාත්වල හඳුනාගත් ඵලදායී ආයෝජන අවස්ථා වර්ධනය කිරීමට පළාත් කාර්යාල විසින් කටයුතු කරන ලදී. එමෙන්ම, ඌව හා සබරගමුව යන පළාත් තුළ ණය මුදාහැරීමේදී පැවති මන්දගාමී බව හේතුකොට ගෙන එම පළාත්වලට ණය ගලායාම් වැඩිකිරීම සඳහා අදාළ පළාත්වල බැංකු නිලධාරීන් සහ ආයෝජකයින් සහභාගී කරවා ගෙන මහ බැංකු ණය යෝජනා ක්‍රම පිළිබඳ විශේෂ දැනුමවත් කිරීමේ වැඩසටහන් මාලාවක් පැවැත්වීමට දකුණ හා මධ්‍යම පළාත් කාර්යාල විසින් පියවර ගන්නා ලදී. විද්‍යාත්මක කෘෂිකාර්මික ක්‍රම, පසු අස්වනු තාක්ෂණය, අධි තාක්ෂණික කෘෂිකර්මය, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘතීන් සඳහා වන පිළිගත් ක්‍රමවේද යනාදී විෂයයන් ආවරණය වන පරිදි, අදාළ ආයතනයන්ද සම්බන්ධ කර ගනිමින් නිපුණතා සංවර්ධන වැඩසටහන් 155 ක්ද පළාත් කාර්යාල විසින් පවත්වනු ලැබීය.

2012 වර්ෂය තුළ, පළාත් කාර්යාල විසින් පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර අංක II-19 දරන සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

**II-19 සංඛ්‍යා සටහන** — **2012 වර්ෂය තුළදී පළාත් කාර්යාල විසින් පවත්වන ලද වැඩසටහන්**

| පළාත් කාර්යාලය | දැනුවත් කිරීමේ වැඩසටහන් | | නිපුණතා සංවර්ධන වැඩසටහන් | |
|---|---|---|---|---|
| | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව | වැඩසටහන් සංඛ්‍යාව | සහභාගී වූ සංඛ්‍යාව |
| දකුණු පළාත | 84 | 6,606 | 37 | 1,032 |
| උතුරු මැද පළාත | 89 | 7,707 | 38 | 1,378 |
| මධ්‍යම පළාත | 107 | 6,966 | 31 | 1,044 |
| උතුරු පළාත | 114 | 8,530 | 17 | 569 |
| නැගෙනහිර පළාත | 75 | 6,846 | 32 | 1,361 |
| **එකතුව** | **469** | **36,655** | **155** | **5,384** |

## 22. රාජ්‍ය ණය

මුදල් නීති පනතේ 113 වගන්තියට අනුව රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ වගකීම ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. ඒ අනුව රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, දේශීය ණය උපකරණ නිකුත් කිරීම, සේවාකරණය කිරීම සහ කළමනාකරණය කිරීම සහ රජය වෙනුවෙන් විදේශීය ණය සේවාකරණය කිරීමේ කටයුතුවල අඛණ්ඩව නියැලිණි. 2012 වර්ෂය තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

### 22.1 රාජ්‍ය අයවැය මූල්‍යනය සඳහා අරමුදල් රැස්කිරීම

2012 වර්ෂයේදී රුපියල් බිලියන 1,139 ක් වූ රජයේ දළ ණය අරමුදල් අවශ්‍යතාවය මූල්‍යනය කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වර්ෂය පුරාම දේශීය සහ විදේශීය මූලාශ්‍රයන්ගෙන් අරමුදල් රැස්කිරීමෙහි අඛණ්ඩව නිරත විය. 2012 වර්ෂයේදී ශුද්ධ පදනම යටතේ රජයේ මුළු ණය අරමුදල් අවශ්‍යතාවය රුපියල් බිලියන 468.9 ක් විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2012 දී විවිධ ණය උපකරණ උපයෝගි කර ගනිමින් සිදු කළ මූල්‍යන කටයුතුවල සාරාංශයක් පහත දැක්වේ.

### (අ) භාණ්ඩාගාර බිල්පත්

2012 වර්ෂයේදී සතිපතා පවත්වනු ලැබූ භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි 52 ක් සහ සෘජු ලබා ගැනීම් මගින්, මුහුණත වටිනාකම රුපියල් බිලියන 1,650 ක් වූ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කරන ලදී. 2012 වර්ෂයේ මුළුනිකුත් කිරීම් වලින් රුපියල් බිලියන 1,602 ක් පරිණත වූ භාණ්ඩාගාර බිල්පත් නැවත නිකුත් කිරීම් වන අතර රුපියල් බිලියන 48 ක් පමණක් වසර තුළදී සිදු කළ නව නිකුතුන් විය.

(ආ) භාණ්ඩාගාර බැඳුම්කර

භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කිරීම මගින් 2012 දී රුපියල් බිලියන 968 ක් (මුහුණත වටිනාකම) රැස් කෙරිණි. ප්‍රාථමික වෙන්දේසි 9 කට අමතරව, 2012 වර්ෂයේදී සෘජු ලබාගැනීම් මගින් ද භාණ්ඩාගාර බැඳුම්කර නිකුත් කරන ලදී.

(ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2012 මාර්තු, ජූලි සහ සැප්තැම්බර් මාසවලදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රාථමික වෙන්දේසි 3 ක් පැවැත්වූ අතර එමගින් ඇමෙරිකානු ඩොලර් මිලියන 456.5 ක් හෙවත් රුපියල් බිලියන 58.8 ක් රැස් කරගන්නා ලදී. එම මුළු නිකුතු වලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 317 ක්, පරිණත වූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නැවත නිකුත් කිරීම් වූ අතර 2012 දී අළුතින් නිකුත් කරනු ලැබූ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල වටිනාකම ඇමෙරිකානු ඩොලර් මිලියන 139.5 ක් පමණි.

(ඈ) ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය

2012 වර්ෂයේදී, රජය වෙනුවෙන් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,000 ක් ජාත්‍යන්තර ප්‍රාග්ධන වෙළෙඳපොළ තුලින් රැස් කිරීම පිණිස, පස්වන ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කරය නිකුත් කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී. එමගින් ලැබුණු මුදල, 2012 වසර තුළදී පරිණත වූ ඇමෙරිකානු ඩොලර් මිලියන 500 ක ස්වෛරීත්ව බැඳුම්කරය මූල්‍යනය කිරීමටත් ඉතිරි කොටස රජයේ ශුද්ධ ණය අවශ්‍යතාවය සඳහාත් යොදාගන්නා ලදී.

## 22.2 රාජ්‍ය ණය සේවාකරණය

රජයේ ණය ගෙවීම් පැහැර නොහැරීමේ අඛණ්ඩ වාර්තාව තවදුරටත් පවත්වා ගනිමින්, නිවැරදි ආකාරයෙන් අදාළ ප්‍රතිපාර්ශ්වයන් වෙත, නියමිත වේලාවට, නියමිත වටිනාකම් සහිත රාජ්‍ය ණය සේවාකරණ ගෙවීම් කිරීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2012 වසර තුළදීත් අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව 2012 වසර සඳහා දේශීය ණය 250 ක් සහ විදේශීය ණය 672 ක් වෙනුවෙන් රුපියල් බිලියන 1,025 ක් වූ සමස්ත ණය ප්‍රමාණයක් සේවාකරණය කරන ලදී.

## 22.3 රාජ්‍ය සුරැකුම්පත්වල නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය සුරැකුම්පත් ද්විතීයික වෙළෙඳපොළේ කාර්යක්ෂමතාව සහ ඵලදායිතාව පවත්වා ගැනීමේ අදහසින් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, නිර්ලේඛන සුරැකුම්පත් පියවීමේ පද්ධතියේ (SSSS) කටයුතු සුමටව මෙහෙයවීම සහතික කරමින් 2012 වසර පුරාම නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනු පියවීම සඳහා අඛණ්ඩව පහසුකම් සලසා දෙන ලදී. 2012 වසරේදී ලංකාසෙකියෝහි සහභාගිකරුවන් අතර සිදුවූ නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල වටිනාකම රුපියල් බිලියන 3,205 ක් විය. ලංකාසෙකියෝහි සහභාගිකරුවන් අතර බලපත්‍රලාභී වාණිජ බැංකු 24 ක් ද බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 7 ක් ද සෘජු සහභාගිකරුවන් 3 ක් ද වෙති.

## 22.4 රාජ්‍ය සුරැකුම්පත්වල හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම

2012 වසරේදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, මධ්‍යම තැන්පතු පද්ධතියේ රාජ්‍ය සුරැකුම්පත් හිමිකාරිත්වයේ දෛනිකව සිදුවන වෙනස්වීම් අඛණ්ඩව වාර්තාගත කළ අතර, මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත රාජ්‍ය සුරැකුම්පත් අයිතිය පිළිබඳ අර්ධ වාර්ෂික ප්‍රකාශන, මාසික ගනුදෙනු ප්‍රකාශන හා ගෙවීම් ප්‍රකාශන නිකුත් කරනු ලැබිණි. ඒ අනුව, 2012 වසරේදී අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 36,023 ක් ද, මාසික ගනුදෙනු ප්‍රකාශන 98,538 ක් ද, ගෙවීම් ප්‍රකාශන 72,647 ක් ද මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත තැපැල් මගින් යවන ලදී. 2012 වසර අවසාන වන විට මධ්‍යම තැන්පතු පද්ධතියේ පැවති මුළු ගිණුම් සංඛ්‍යාව 78,896 ක් විය.

## 22.5 රාජ්‍ය ණය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම

රාජ්‍ය ණය සුරැකුම්පත් සඳහා වූ ප්‍රාථමික අලෙවිකරුවන් නියාමනය, දේශීය භාණ්ඩාගාර බිල්පත් ආඥා පනත සහ ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් ආඥා පනත අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇත. ඒ අනුව, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2012 වසරේදී ද ප්‍රාථමික අලෙවිකරුවන් අධීක්ෂණය කිරීම සම්බන්ධ කටයුතුවල නිරත විය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික අලෙවිකරු පද්ධතියේ ස්ථායිතාවය සහ රජයේ සුරැකුම්පත්හි මුදල් ආයෝජනය කරන්නන්ගේ සුරක්ෂිතභාවය තහවුරු කිරීමේ අපේක්ෂාවෙන් ප්‍රාථමික අලෙවිකරුවන්ගේ මූල්‍ය තත්ත්වය, කාර්ය සාධනය මෙන්ම වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතු ද නිතිපතා අධීක්ෂණය කරන ලදී. ප්‍රාථමික අලෙවිකරුවන් පිළිබඳ එකී නියාමනය සම්බන්ධයෙන් පහත සඳහන් කටයුතුවල රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව අඛණ්ඩව නියුක්ත විය.

(අ) එතැන් පරීක්ෂණ

2011 වසරේදී ආරම්භ කළ පරීක්ෂණ 3ක්ද, 2012 වසරේදී ආරම්භ කළ පරීක්ෂණ 4ක් ද, 2012 වසර තුළදී නිම කරන ලද අතර එකී පරීක්ෂණ මගින් අනාවරණය කරගන්නට යෙදුනු දුර්වලතාවයන් හා ඒවා නිවැරදි කිරීමට ගතයුතු ක්‍රියා සැලසුම් ද සමග එක් එක් ප්‍රාථමික අලෙවිකරු වෙත දන්වන ලදී. වසර අවසන් වන විට තවත් එතැන් පරීක්ෂණ දෙකක කටයුතු අවසාන වෙමින් පැවතින. එක් එක් ප්‍රාථමික අලෙවිකරුගේ අවදානම් තක්සේරුව, ප්‍රමාණාත්මකතාවය, ද්‍රවශීලතාවය, වත්කම්වල ගුණාත්මක භාවය, ලාභදායීත්වය, විචක්ෂණ විධිවිධාන සහ නියෝගවලට අනුගත වීම සහ ආයතනික යහපාලනය යන අංග කෙරෙහි මෙම එතැන් පරීක්ෂණවලදී අවධානය යොමු කරන ලදී. පරීක්ෂණවලදී සොයාගන්නා ලද අඩුලුහුඩුකම් නිවැරදි කිරීමේ කාර්යයන්හි ප්‍රගතිය සෑම

කාර්තුවකදීම ප්‍රාථමික අලෙවිකරුවන්ගෙන් ලබාගන්නා ප්‍රගති වාර්තා මගින් නිරීක්ෂණය කරන ලදී.

(ආ) දුරස්ථ පරීක්ෂාව

දුරස්ථ පරීක්ෂාව යනු, නියමිත කාල වකවානු සඳහා ප්‍රාථමික අලෙවිකරුවන් විසින් රාජ්‍ය ණය අධිකාරී වෙත නිතිපතා එවනු ලබන වාර්තා මාර්ගයෙන් එක් එක් ප්‍රාථමික අලෙවිකරුගේ මූල්‍ය තත්ත්වය හා මෙහෙයුම් තත්කාලීනව විමර්ශනය කිරීමේ ක්‍රියාදාමයයි. එය එක් එක් ප්‍රාථමික අලෙවිකරුගේ මෙන්ම සමස්ත ප්‍රාථමික අලෙවිකරු ව්‍යාපාරයේ, ඉක්මන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග අවශ්‍ය වන අන්දමේ අහිතකර අවස්ථා උද්ගතවීමේ හැකියාවන් කල්තබා හඳුනාගැනීමේ මාර්ගයක් වේ. 2012 වසරේ සෑම මාසයකදීම දුරස්ථ පරීක්ෂණ 12 බැගින් සිදු කරන ලද අතර, අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්ෂණිකව අදාල නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග දියත් කරන ලදී.

### 22.6 ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා පවත්වන මාසික රැස්වීම්

2012 වසර තුළ ප්‍රාථමික අලෙවිකරුවන්ගේ ප්‍රධාන විධායක නිලධාරීන් සහ රාජ්‍ය ණය අධිකාරී/ ලේඛකාධිකාරී අතර පැවැත්වෙන මාසික රැස්වීම් 12 ක් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කරන ලදී. මෙම රැස්වීම්, ආර්ථික හා මූල්‍යමය අංශයන්ගේ වර්ධනයන්, ප්‍රාථමික අලෙවිකරු ව්‍යාපාරයේ කාර්ය සාධනය, රාජ්‍ය ණය සුරැකුම්පත්වල ප්‍රාථමික හා ද්විතීයික වෙළෙඳපොළවල්වල මෙහෙයුම් තත්ත්වය සහ වෙළෙඳපොළ සංවර්ධනය යනාදිය පිළිබඳව අදහස් හුවමාරු කර ගැනීම සඳහා භාවිතා කරන ලදී.

### 22.7 රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළ සංවර්ධනය

රජයට ණය ගැනීමේ පිරිවැය සහ ණය නැවත ගෙවීමේ අවදානම අවම කිරීම පිණිස සංවර්ධිත රජයේ සුරැකුම්පත් වෙළෙඳපොළක් තිබීම අත්‍යවශ්‍ය අංගයකි. එම නිසා, රජයේ සුරැකුම්පත් වෙළෙඳපොල අඛණ්ඩ සංවර්ධනය තහවුරු කිරීම සඳහා රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2012 වසර තුළදී පහත දැක්වෙන කාර්යයන්හි නිරත විය.

(අ) කාලීන පදනමක් මත පාදක බැඳුම්කර නිකුත් කිරීම මගින් සහ ඛණ්ඩනීකරණය අවම කිරීම මගින් පාදක ඵලදා වක්‍රය දීර්ඝ කාලයන් සඳහා වැඩිදියුණු කිරීම. ඊට අමතරව, වෙළෙඳපොළ ද්‍රවශීලතාව වර්ධනය කිරීමට ආධාර වන පරිදි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව භාණ්ඩාගාර බැඳුම්කර නිකුතු සංඛ්‍යාව සීමා කොට නිකුතුවේ වටිනාකම වැඩි කිරීම.

(ආ) වෙළෙඳපොළ සඳහා මිල අනාවරණය කිරීමේ හා මිල විනිවිදභාවය ඇතිකිරීමේ ක්‍රමවේදයක් සපයා දීම පිණිස රජයේ සුරැකුම්පත් සඳහා ඉලෙක්ට්‍රොනික වෙළෙඳම් කවුළුවක් හඳුන්වා දීම.

(ඇ) රජයේ සුරැකුම්පත් සඳහා කුඩා පරිමාණ ආයෝජකයන් දිරිමත් කිරීමේ අරමුණින්, සම්මන්ත්‍රණ, රූපවාහිනී වැඩසටහන් සහ ප්‍රදර්ශන වලට සහභාගි වීම් ඇතුළු මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 8 ක් පැවැත්වීම.

(ඈ) ජගත් අන්තර් බැංකු මූල්‍ය විද්‍යුත් සන්නිවේදන සංගමයේ (SWIFT) නව ප්‍රමිතියට අනුකූල වීම සඳහා ලංකාසෙක්‍යු පද්ධතිය නවතම ශ්‍රේණියට සංස්කරණය කිරීම.

### 22.8 ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීම පවත්වා ගැනීම තහවුරු කිරීම

ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන මගින් ලබා දෙන්නාවූ ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමක් පවත්වා ගැනීම මහ බැංකුව මත පැවරී ඇති කාර්යයක් වන අතර, ඒ සඳහා වූ කාර්යයන්හි රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව 2012 දී ද අඛණ්ඩව නියුතු විය. ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතන සඳහා පැවැත්වූ රැස්වීම් හතර සඳහා පහසුකම් සැපයීමට අමතරව, ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට වසර පුරා ආර්ථික සංවර්ධනයට අදාළ දත්ත සහ තොරතුරු සැපයීම ද රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

**ඇමුණුම II-2 රජයේ සුරැකුම්පත්හි ප්‍රාථමික අලෙවිකරුවන්**

| | |
|---|---|
| 1. | ඇකියුටි සෙකියුරිටීස් ලිමිටඩ් |
| 2. | ලංකා බැංකුව ප්‍රාථමික අලෙවිකරු අංශය |
| 3. | කැපිටල් එලයන්ස් ලිමිටඩ් |
| 4. | කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී. ප්‍රාථමික අලෙවි අංශය |
| 5. | එන්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් |
| 6. | ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් ලිමිටඩ් |
| 7. | නැට්වෙල්ත් සෙකියුරිටීස් ලිමිටඩ් |
| 8. | එන්.එස්.බී. ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැණි ලිමිටඩ් |
| 9. | මහජන බැංකුව ප්‍රාථමික අලෙවිකරු අංශය |
| 10. | සම්පත් බැන්ක් පී.එල්.සී. ප්‍රාථමික අලෙවි අංශය |
| 11. | සෙලාන් බැන්ක් පී.එල්.සී ප්‍රාථමික අලෙවි අංශය |
| 12. | වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටීස් ලිමිටඩ් |

## 23. ප්‍රාදේශීය සංවර්ධන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව රට තුළ මූල්‍ය අන්තර්භාවය ප්‍රවර්ධනය කරන අතරම තුලිත වර්ධනයක් ළඟා කර ගැනීම සඳහා වන රජයේ නියෝජිත කාර්යයේ යෙදී සිටී.

එම අරමුණු ඉටු කර ගැනීමේ අදහස ඇතිව ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව 2012 වසරේ දී සහභාගිත්ව මූල්‍ය ආයතන හා ඒවායේ ශාඛා ජාලය හරහා කෘෂිකර්ම, සත්ව පාලන සහ ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශවල ප්‍රතිලාභීන්

සඳහා සහනදායී ණය යෝජනා ක්‍රම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම හා ක්‍රියාත්මක කිරීම සහ ණය අතිරේකකරණ සේවාවන් සැපයීම තුළින් ප්‍රාදේශීය ප්‍රාදේශීය සංවර්ධනය ප්‍රවර්ධනය කිරීමේ කටයුතුවල නිරත විය. මෙම ණය යෝජනා ක්‍රම සහ ණය අතිරේකකරණ සේවා සඳහා අරමුදල් සපයන ලද්දේ ශ්‍රී ලංකා රජය, ශ්‍රී ලංකා මහ බැංකුව, ජාත්‍යන්තර ණය දෙන ආයතන සහ සහභාගිත්ව මූල්‍ය ආයතන විසිනි. එම වැඩසටහන්වල උපාය මාර්ගික අරමුණු අතරට ප්‍රාදේශීය සංවර්ධනය ඉහළ නැංවීම, මූල්‍ය අන්තර්ගත භාවය ඉහළ නැංවීම තුළින් දිළිඳුකම අඩු කිරීම, ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සහ රැකියා අවස්ථා ඇති කිරීම, විධිමත් මූල්‍ය අංශයේ සේවාවන් ලබා ගැනීම සඳහා සුදුසුකම් සැලසීම, හැකියාවන් සංවර්ධනය සහ පුහුණුව සඳහා ප්‍රතිපාදන සැපයීම, ඌණ සංවර්ධිත ප්‍රදේශවල ව්‍යාපාර හා ආර්ථික ක්‍රියාකාරකම් සවිබල ගැන්වීම සහ ආහාර සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය ඉහළ නැංවීම අයත් වේ.

2012 වසර තුළ දී සහභාගිත්ව මූල්‍ය ආයතනවලට ප්‍රතිමූල්‍ය හෝ පොලී සහනාධාර සැපයීම මගින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද විවිධ ණය යෝජනා ක්‍රම සංඛ්‍යා සටහන II-20 හි දැක්වේ.

### 23.1 කෘෂිකාර්මික හා සත්ව පාලන අංශය

සුළු ගොවීන්ගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපයන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය 2011/12 මහ කන්නයේ දී ගොවීන් 72,336 දෙනෙකු සඳහා රුපියල් මිලියන 6,001 ක් ප්‍රදානය කර ඇත. පසුගිය වසරේ අනුරූප කන්නයට වඩා ණය වටිනාකමෙහි සියයට 69 ක සහ ණය සංඛ්‍යාවෙහි සියයට 22 ක වර්ධනයක් මෙමගින් පෙන්වයි. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ 2012 යල කන්නය සඳහා රුපියල් මිලියන 3,359 ක ණය ප්‍රදානය කර ඇති අතර එය පසුගිය වසරේ අනුරූප යල කන්නයට වඩා සියයට 15 ක වැඩිවීමකි. මුදාහරින ලද ණය ප්‍රමාණයෙහි මෙම වැඩිවීම, වී සහ අනෙක් බෝග වගා කරන ලද භූමි ප්‍රමාණය මගින් නිරූපණය විය. වී, නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කරන ලද ණයවලින් සියයට 58 ක් නියෝජනය කළ අතර ඒඌණු සියයට 24 නියෝජනය කළේය. ඉතිරිය අර්තාපල්, බඩ ඉරිඟු, මිරිස්, එළවළු හා අනෙක් ආහාර බෝග සඳහා විය. පසුගිය වසරේ දී නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ ණය ප්‍රමාණයෙන් සියයට 64 ක් වී සඳහා විය. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය අනෙකුත් කෙටිකාලීන බෝග වෙත විවිධාංගීකරණය වීම නිසා වී වගාව සඳහා ප්‍රදානය කර ඇති ණය ප්‍රමාණයේ ක්‍රමානුකූල අඩුවීමක් ඇති බව පසුගිය වසර වල දත්ත මගින් නිරූපණය කරයි. පසුගිය වසරේ මෙන්ම නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ ප්‍රදානය කළ වගා ණය ප්‍රමාණයෙන් සියයට 30 ක ණය ප්‍රමාණයක් එනම් කෘෂිකාර්මික ණය සඳහා වන ඉහළම ණය ප්‍රමාණයක් ප්‍රදානය කර ඇත්තේ යාපනය දිස්ත්‍රික්කය තුළ වන අතර ඊට පිටුපසින් අනුරාධපුරය, පොළොන්නරුව සහ කිලිනොච්චි දිස්ත්‍රික්ක වාර්තා විය.

වාණිජමය කෘෂි ව්‍යාපාර ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය හා විවිධාංගීකරණය සඳහා ණය සපයන විස්කම් ණය යෝජනා ක්‍රමය, සුදුසුකම් ඇති ආයෝජකයන් අතර රුපියල් මිලියන 523 ක් ප්‍රදානයකර ඇත. මෙය පසුගිය වසරේ ප්‍රදානය කළ ණයවලට වඩා සියයට 47 ක වැඩිවීමකි. විස්කම් ණය යෝජනා ක්‍රමය යටතේ කෘෂිකර්මය පදනම් කරගත් ව්‍යාපාර සහ කිරි නිෂ්පාදනය පදනම් කරගත් ව්‍යාපෘති සඳහා ඉහළම ණය සංඛ්‍යාවක් ප්‍රදානය කර ඇත. එමෙන්ම, රට තුළ දියර කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා හඳුන්වාදෙනු ලැබූ කෘෂි සත්වපාලන ණය යෝජනා ක්‍රමය තුළින් සුදුසුකම් ඇති ප්‍රතිලාභීන් වෙත රුපියල් මිලියන 247 ක් මුදාහරින ලද අතර වසර තුළ දී දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධනය චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය සහ තේ සංවර්ධන චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය මගින් පිළිවෙළින් රුපියල් මිලියන 173 ක් සහ රුපියල් මිලියන 104 ක් බැගින් ප්‍රදානය කර ඇත.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් කෘෂිකාර්මික සංවර්ධනය සඳහා ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම කිහිපයක් තුළින් සහභාගිත්ව මූල්‍ය ආයතන 2012 වසරේ දී රුපියල් මිලියන 10,464 ක් වටිනා ණය මුදාහැර ඇත. මෙය පසුගිය වසරට වඩා සියයට 39 ක ඉහළ යාමකි. මෙසේ ඉහළ ණය සංඛ්‍යාවක් මුදාහැරීම දේශීය වෙළෙඳපොළෙහි කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ යාමට හේතු වූ අතර එය 2012 වසරේ ආහාර මිල ස්ථායී වීමට උපකාරී විය.

### 23.2 සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය

2012 වසරේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහනදායී පොලී අනුපාත යටතේ ණය මුදා හරින ණය යෝජනා ක්‍රම කිහිපයක් තුළින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන්ට සහය දැක්වීය. 2010 වසරේ දී ආරම්භ කරන ලද සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සහ ව්‍යසනවලින් හානියට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා ණය පහසුකම් සපයයි. මෙම ණය යෝජනා ක්‍රමය මගින් මුළු දිවයිනම ආවරණය කරන අතර ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් ආරම්භ කිරීම සඳහා රුපියල් 500,000 ක උපරිමයක් දක්වා ද ව්‍යසනවලින් හානියට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා රුපියල් මිලියන 20 දක්වා ණය පහසුකම් ද සපයයි. මෙම යෝජනා ක්‍රමය යටතේ 2012 වසරේ දී ප්‍රතිලාභීන් 6,985 දෙනෙකු අතර රුපියල් මිලියන 2,464 ක් මුදා හැර ඇත. සේවා අංශයේ ක්‍රියාකාරකම් සඳහා ඇති වර්ධනය වන ඉල්ලුම නිරූපණය කරමින් සෞභාග්‍යා යෝජනා ක්‍රමය යටතේ වන වැඩිම ණය සංඛ්‍යාව හෝටල් සහ ආපනශාලා ක්ෂේත්‍රය, සෞඛ්‍ය සහ අදාළ සේවා සඳහා ප්‍රදානය කර ඇත.

සුළු හා මධ්‍ය පරිමාණ අංශය තුළ මධ්‍ය හා දිගුකාලීන ව්‍යාපෘති සඳහා ප්‍රාග්ධනය සැපයීමේ අරමුණ ඇතිව ආරම්භ කරන ලද පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය, සුළු හා මධ්‍ය

පරිමාණ ව්‍යවසාය අංශය තුළ සුදුසුකම් සපුරාලූ ව්‍යාපෘති සඳහා රුපියල් මිලියන 340 ක් මුදා හැර ඇත. මෙම යෝජනා ක්‍රමය යටතේ ඉහළම ණය සංඛ්‍යාවක් මුදාහැර ඇත්තේ ප්‍රධාන වශයෙන් වෙළෙඳ, ප්‍රවාහන සහ අධ්‍යාපන වැනි සේවා අංශයේ ක්‍රියාකාරකම් වන අතර ඉන් අනතුරුව නිෂ්පාදන ව්‍යාපාර සඳහාය. එමෙන්ම රට තුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවල පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා සහය වීම අරමුණු කර ගත් ස්වයංරැකියා උත්පාදන ප්‍රවර්ධන ණය යෝජනා ක්‍රමය 2012 වසරේ දී රුපියල් මිලියන 47 ක ණය ප්‍රදානය කර ඇත. පැස්සුම් වැඩපොළ, ඉලෙක්ට්‍රොනික් අලුත්වැඩියා මධ්‍යස්ථාන, රූපලාවන්‍ය මධ්‍යස්ථාන සහ සුළු

**II-20 සංඛ්‍යා සටහන**

**2012 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලැබූ ප්‍රාදේශීය සංවර්ධන ණය යෝජනා ක්‍රම**

| | ණය යෝජනා ක්‍රමයේ නම | අරමුදල් සපයන ලද ආයතන | පුළුල් අරමුණ | අරමුදල් යෙදවීම (රු.මිලියන) | 2012 වර්ෂයේදී මුදහල අරමුදල් (රු.මිලියන) | මුදාහැරීමට ඇති ඉතිරි අරමුදල් (රු.මිලියන) | ණයකරුවන් ගෙවිය යුතු පොලී අනුපාතිකය |
|---|---|---|---|---|---|---|---|
| 1. | කෘෂිකාර්මික හා සත්ත්ව පාලන අංශය | | | | | | |
| 1.1 | දෙවන බහුවාර්ෂික බෝග සංවර්ධන (චක්‍රීය අරමුදල) ණය ව්‍යාපෘතිය (SPCDP-RF) | ශ්‍රී ලංකා රජය | බහුවාර්ෂික බෝග අංශයේ වාණිජකරණය නිෂ්පාදන දියුණු කිරීම, පැල තවාන් දැමීම, පසු අවස්වනු මෙහෙයුම් කටයුතු, නිෂ්පාදන සැකසීම හා වෙළෙඳපොළ පහසුකම් ලබාදීම. | 1,200 | 174 | 2 | 9% |
| 1.2 | තේ සංවර්ධන (චක්‍රීය අරමුදල) ණය ව්‍යාපෘතිය (TDP-RF) | ශ්‍රී ලංකා රජය | කුඩා තේ වතු හිමියන්ගේ ආදායම තිරසාර ලෙස ඉහළ දැමීම සහ අපනයන වෙළෙඳපොළ සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සංවර්ධනය කිරීම මගින් HACCP සහතිකය ලබාගැනීම සඳහා තේ කර්මාන්තශාලා නවීකරණය කිරීමට අවශ්‍ය මූල්‍ය පහසුකම් සැපයීම | 1,100 | 131 | 243 | 9% |
| 1.3 | වාණිජකරණය වූ කෘෂි ව්‍යාපාර සංවර්ධනය සඳහා වන "විස්කම්" ණය යෝජනා ක්‍රමය [1] | ශ්‍රී ලංකා මහ බැංකුව | විවිධාංගීකරණය හා අනෙකුත් ප්‍රවර්ධනය කිරීම මගින් කෘෂි ව්‍යාපාර සංවර්ධනය කිරීම | 1,326 | 524 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත | 8% |
| 1.4 | නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS) | සහභාගිත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | වී සහ කෙටි කාලීන බෝග වගාවන්හි නියුතු ක්ෂුද්‍ර හා සුළු පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම | අරමුදල් සඳහා වන ඉල්ලුම් මත | 9,360 | - | 8% |
| 1.5 | කෘෂි සත්ත්ව පාලන ණය යෝජනා ක්‍රමය (ALDL) | සහභාගිත්ව මූල්‍ය ආයතන සහ අරමුදල් සහ රජයේ පොලී සහනාධාර පහසුකම් | විද්‍යානුකූලව කිරි ගව ගොවිපලවල් පිහිටුවීම සහ ඒ හා සම්බන්ධ කටයුතු ප්‍රවර්ධනය කිරීම | අරමුදල් සඳහා වන ඉල්ලුම් මත | 247 | | කුඩා කිරි ව්‍යාපෘති සඳහා 8% කිරි සහ කෘෂිබෝග සැකසීම සඳහා 12% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2. | ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය | | | | | | |
| 2.1 | සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන චක්‍රීය අරමුදල් ණය ව්‍යාපෘතිය (SPIRDP-RF) | ශ්‍රී ලංකා රජය | ව්‍යාපෘති ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ ජනතාවගේ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම | 100 | 19 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත | 10% |
| 2.2 | සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය ව්‍යාපෘතිය - අදියර II(SPIRDP-II) | ශ්‍රී ලංකා රජය | ව්‍යාපෘතිය ක්‍රියාත්මක වන ප්‍රදේශය තුළ ජනතාවගේ ආදායම් උත්පාදන කටයුතු ප්‍රවර්ධනය කිරීම | 70 | 17 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත | 12% |
| 2.3 | ස්වයං රැකියා ප්‍රවර්ධනය කිරීමේ ණය යෝජනා ක්‍රමය (SEPI)[1] | ශ්‍රී ලංකා රජය | පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් පුහුණුව ලැබූ තරුණ පිරිස් සඳහා මූල්‍ය සහාය සැපයීම | 116 | 45 | 4 | 10% |
| 2.4 | පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය (අදියර II) | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු පළාත තුළ ණය ප්‍රතිලාභීන් බවට පත්විය හැකි පුද්ගලයන්ගේ ආර්ථික කටයුතු ශක්තිමත් කිරීම සඳහා සහාය වීම | 2,154 | 668 | 1,486 | 9% |
| 2.5 | නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය අදියර II | ශ්‍රී ලංකා මහ බැංකුව | දැනට සිදුකෙරන සහ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා මූල්‍ය පහසුකම් සැපයීම මගින් නැගෙනහිර පළාත තුළ ජීවත්වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම | 1,078 | 528 | 550 | 9% |
| 2.6 | සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය[1] | ශ්‍රී ලංකා මහ බැංකුව | ව්‍යවසනවලින් හානියට පත් ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හෝ වෙනත් ක්ෂුද්‍ර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති ඇරඹීම හෝ වැඩිදියුණු කිරීම | 4,720 | 2,488 | 237 | 9% |
| 2.7 | පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | කෘෂිකාර්මික, සත්වපාලන, ධීවර, වෙළෙඳ සහ ප්‍රවාහන අංශවල මධ්‍ය හා මහා පරිමාණ ව්‍යාපෘතීන්හි ආදායම් උත්පාදන කටයුතු සඳහා සහාය වීම | 2,900 | 340 | 254 | 12% |
| 2.8 | උතුරු සහ නැගෙනහිර ප්‍රදේශවල විනාශ වූ නිවාස අලුත්වැඩියා කිරීමේ යෝජනා ක්‍රමය | ශ්‍රී ලංකා මහ බැංකුව | උතුරු හා නැගෙනහිර පළාත්වල ගැටුම් වලින් හානියට පත් නිවාස අලුත්වැඩියා කිරීම සඳහා ණය පහසුකම් සැපයීම | 100 | 84 | 16 | 8% |
| 2.9 | ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය (CSDP) | ප්‍රංශ සංවර්ධන නියෝජිත ආයතනය (AFD) | පශ්චාත් සුනාමි ඉදිකිරීම් කටයුතුවල යෙදෙන ඉදිකිරීම්, වාණිජ හා සංවර්ධන ආයතන විසින් අනුමත සමාගම් වෙත යන්ත්‍රෝපකරණ මිල දී ගැනීම සඳහා සහාය වීම | 1,400 | 27 | රු.මිලියන 01 ට වඩා අඩුවෙන් | 9% |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 2.10 | පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන (PTCRRMP)[2] | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | සුනාමි ව්‍යවසනයෙන් හානියට පත් ප්‍රජාවන්ගේ වත්කම් නැවත ඇති කිරීම සහ ඔවුන්ගේ සාමාන්‍ය ක්‍රියාකාරකම්වල පදනම නැවත පිහිටුවීම සඳහා සහාය වීම | 148 | 97 | 15 | 8% - 10% |
| 2.11 | මාතලේ ප්‍රාදේශීය ආර්ථික ප්‍රවර්ධන චක්‍රීය අරමුදල් ව්‍යාපෘතිය (MREAP-RF) | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා අරමුදල් සැපයීමෙන් දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම ඉහළ නැංවීම | 77 | 12 | අරමුදල් සම්පූර්ණයෙන් මුදාහැර ඇත | 10% |
| 3 | ක්ෂුද්‍රමූල්‍ය අංශය | | | | | | |
| 3.1 | සුළු ගොවීන් හා ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය (SFLCP - RF) | ශ්‍රී ලංකා රජය | ප්‍රතිලාභ ලබන්නන්ගේ සුබසාධනය සහ ආර්ථික තත්ත්වය වැඩි දියුණු කිරීම පිණිස ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආදායම් ඉපැයීමේ කටයුතු වෙනුවෙන් විධිමත් ණය සැපයීම | 345 | 180 | ආපසු අය කරගැනීම් නැවත අරමුදලට යෙදවේ | 14% |
| 3.2 | දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ චක්‍රීය අරමුදල් යෝජනා ක්‍රමය (PAMP-RF) | ශ්‍රී ලංකා රජය | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සංවිධිත බැංකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මගින් දිළිඳු බව පිටුදැකීම | 1,031 | 387 | ආපසු අය කරගැනීම් නැවත අරමුදලට යෙදවේ | 12% |
| 3.3 | දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය යෝජනා ක්‍රමය - II (PAMP II) [2] | ශ්‍රී ලංකා රජය සහ ජපන් අන්තර්ජාතික සහයෝගිතා සංවිධානය (JICA) | ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය සහ සංවිධිත බැංකු අංශය හා සම්බන්ධ වීම සඳහා අඩු ආදායම්ලාභී කණ්ඩායම් සංවිධානය කිරීම මගින් දිළිඳු බව පිටුදැකීම | 2,104 | 652 | 200 | 12% - 15.5% |
| 3.4 | වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහායවීමේ හා හවුල්වීමේ වැඩසටහන | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) | මොණරාගල, කුරුණෑගල, බදුල්ල හා අනුරාධපුර දිස්ත්‍රික්කවල දිළිඳු ගොවීන්ගේ ආදායම් උත්පාදන කටයුතු සඳහා සහාය වීම සහ දිළිඳුකම පිටුදැකීම | 252 | 84 | රු.මිලියන 01 ට වඩා අඩුවෙන් | 10% |
| 3.5 | කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන (SPEnDP)[2] | කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) සහ ජාත්‍යන්තර සංවර්ධනය සඳහා වන එක්සත් ජනපද නියෝජිත ආයතනය (USAID) | මැදරට ප්‍රදේශයේ තේ සහ බහුවාර්ෂික බෝග වගා කරන කුඩා වතු හිමියන්ගේ සහ මොණරාගල ප්‍රදේශයේ අන්තර් කලාපීය ප්‍රදේශයන්හි උස්බිම්වල ආහාර බෝග වගා කරන රබර් වගාව සඳහා යොමු වීමට කැමති ගොවීන්ගේ ජීවන තත්ත්වය නංවාලීම | 295 | 57 | 217 | 9% |

1. 2012 වසරේ දී නව අරමුදල් යොදවා ඇත.
2. 2.10, 3.3 සහ 3.5 හි සඳහන් ණය මුදල් පිළිවෙළින් විශේෂ හර ගැනුම් ඒකක මිලියන 1.32, ජපන් යෙන් මිලියන 2,100 සහ විශේෂ හර ගැනුම් ඒකක මිලියන 1.75 වශයෙන් වන අතර රුපියල් බවට හැරවීමේ දී ණය ගිවිසුම අත්සන් කළ දිනයට අදාළ විනිමය අනුපාතිකය යොදා ගෙන ඇත.

පරිමාණ ඇඟලුම් කර්මාන්ත මෙම ස්වයං රැකියා ව්‍යාපෘති අතරට අයත් විය.

මෙම යෝජනා ක්‍රමවලට අමතරව පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II, නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර II, සබරගමු පළාත් ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන ණය ව්‍යාපෘතිය - අදියර II, පශ්චාත් සුනාමි වෙරළබඩ පුනරුත්ථාපන සහ සම්පත් කළමනාකරණ වැඩසටහන සහ ඉදිකිරීම් අංශයේ සංවර්ධන ව්‍යාපෘතිය වසර තුළ දී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය වෙත මූල්‍ය සහය ලබා දෙන ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ණය යෝජනා ක්‍රම මගින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සංවර්ධනය සඳහා සමස්තයක් ලෙස රුපියල් මිලියන 4,139 ක් මුදා හැර ඇති අතර, එය පසුගිය වසරේ කාර්යසාධනය හා සසඳන විට සියයට 56 ක වැඩිවීමකි.

## 23.3 ගැටුම්වලින් හානියට පත් ප්‍රදේශ සංවර්ධනය

දශක තුනක් තිස්සේ පැවති ගැටුම් නිසා උතුරු සහ නැගෙනහිර පළාත්වල වර්ධන අවස්ථාවන් වැළකී ගිය අතර එම පළාත්වල ආර්ථික ක්‍රියාකාරකම් ඉහළ නැංවීම අරමුණු කරගනිමින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව තවදුරටත් ක්‍රියාත්මක විය. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙම පළාත් දෙක සඳහා හඳුන්වාදුන් විශේෂ ණය යෝජනා ක්‍රම දෙක, පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II සහ නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර II ලෙස තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. මෙම යෝජනා ක්‍රමවල පළමු අදියරයන්හි දී පළාත් දෙකෙහි කෘෂිකාර්මික, සත්ව පාලන, ධීවර, ක්ෂුද්‍ර සහ සුළු ව්‍යාපාර සහ වෙළෙඳ කටයුතු සහ ස්වයං රැකියා ව්‍යාපෘති යන අංශවල ආර්ථික ක්‍රියාකාරකම් නැවත ආරම්භ කිරීම සඳහා මූල්‍ය සහය සපයන ලදී. සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් පිබිදෙන උතුර ණය යෝජනා ක්‍රමය - අදියර II යටතේ රුපියල් මිලියන 668 ක් වටිනා ණය 5,546 ක් ප්‍රදානය කරන ලද අතර නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා වන ණය යෝජනා ක්‍රමය - අදියර II යටතේ ප්‍රතිලාභීන් 3,612 දෙනෙකු වෙත රුපියල් මිලියන 528 ක ණය ප්‍රදානය කරන ලදී. ඒ හැර උතුරු සහ නැගෙනහිර පළාත්වල විනාශයට පත් නිවාස අලුත්වැඩියා කිරීමේ යෝජනා ක්‍රමය යටතේ 2012 වසරේ දී නිවාස අංශයේ සංවර්ධනය සඳහා රුපියල් මිලියන 84 ක් මුදා හැර ඇත.

තවද වසර තුළ පැවති සාමකාමී වාතාවරණය යටතේ අනෙක් සංවර්ධන ණය යෝජනා ක්‍රමයන් ද උතුරු සහ නැගෙනහිර පළාත් දෙක තුළ සාර්ථකව ක්‍රියාත්මක විය. කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රම අතරින් විශේෂයෙන් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මෙම පළාත් දෙක සඳහා ණය පහසුකම් සපයන ලද අතර පළාත් දෙක තුළ කෘෂිකාර්මික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම සඳහා සැලකිය යුතු කර්තව්‍යයක් ඉටු කරන ලදී. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ සංවර්ධනය සඳහා සහාය සපයන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සහ පළාත් සංවර්ධන ණය යෝජනා ක්‍රමය ද වසර තුළ දී පළාත් දෙක තුළ සක්‍රියව ක්‍රියාත්මක විය. දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ ණය යෝජනා ක්‍රමය - අදියර II යටතේ සහභාගිත්ව මූල්‍ය ආයතනවල සහය ඇතිව පළාත් දෙකෙහි දිළිඳු පවුල් වෙත ළඟා වීමට ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

## 23.4 දිළිඳුකම පිටුදැකීම

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්‍රමෝපාය, විධිමත් මූල්‍ය ක්ෂේත්‍රයෙන් බැහැර වී සිටින ජනතාව වෙත ළඟාවීම, ඔවුන්ට මූල්‍ය කළමනාකරණය පිළිබඳ සාක්ෂරතාවය ලබා දීම මෙන්ම ආදායම් ඉපයීමේ ක්‍රියාකාරකම් ආරම්භ කිරීම සඳහා ඔවුන්ට ණය පහසුකම් සැලසීම යන දැ කේන්ද්‍ර කර ගත්තකි. මෙම ව්‍යායාමයේ දී ප්‍රදේශ තුළ ස්ථිරසාර ක්ෂුද්‍ර මූල්‍ය ජාලයන් ගොඩනැංවීමට ද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව බලාපොරොත්තු වේ.

2012 වසරේ දී දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය යෝජනා ක්‍රමය - අදියර II රට තුළ දිස්ත්‍රික්ක 14 ක ක්‍රියාත්මක විය. මෙම යෝජනා ක්‍රමයේ අරමුණ වන්නේ දිළිඳු ජනතාව විධිමත් මූල්‍ය අංශයට ඇතුල් කර ගැනීම තුළින් මෙමගින් ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීමෙන් සහ ඔවුන්ගේ ආර්ථික තත්ත්වය දියුණු කිරීම සහ නිපුණතාවයන් සංවර්ධනය කිරීම මගින් දිළිඳුකම පිටුදැකීම, ප්‍රාදේශීය විෂමතාවයන් අඩු කිරීම සහ සාමය ගොඩනැගීම සඳහා ඔවුන් පුහුණු කිරීමයි. ආදායම් උත්පාදන කාර්යයන් ආරම්භ කිරීම සඳහා වසර තුළ දී ප්‍රතිලාභීන් 10,116 දෙනෙකු වෙත රුපියල් මිලියන 652 ක වටිනාකමින් යුත් ණය ප්‍රදානය කර ඇත. එමෙන්ම, දිළිඳුකම පිටුදැකීම සඳහා වන කෙටි හා මධ්‍යකාලීන සුළු පරිමාණ චක්‍රීය අරමුදල් ණය යෝජනා ක්‍රමය ද ආදායම් උත්පාදන කාර්යයන් ආරම්භ කිරීම සඳහා ප්‍රතිලාභීන් 9,612 දෙනෙකු වෙත රුපියල් මිලියන 387 ක ණය ප්‍රදානය කර ඇත. මෙම යෝජනා ක්‍රම දෙක මගින් ප්‍රදානය කරන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 46 ක් වෙළෙඳ හා අනෙකුත් සේවාවන් සඳහා වන අතර සුළු ව්‍යාපාර සඳහා සියයට 19 ක්, සත්ව පාලන කටයුතු සඳහා සියයට 15 ක් සහ කෘෂිකර්මාන්තය සඳහා සියයට 13 ක් ද වේ.

එමෙන්ම 2012 වසර තුළ දී ග්‍රාමීය දිළිඳු ජනතාවගේ ආර්ථික සමෘද්ධිය සහ පොදු සුභසාධනය වැඩි දියුණු කිරීමේ අදහසින් සුළු ගොවීන් සහ ඉඩම් නොමැති අය සඳහා වන සුළු පරිමාණ ණය ව්‍යාපෘති යෝජනා ක්‍රමය ද ප්‍රතිලාභීන් 5,704 දෙනෙකු වෙත රුපියල් මිලියන 180 ක් වටිනා ණය ප්‍රදානය කර ඇත. නුවර, කෑගල්ල සහ නුවරඑළිය දිස්ත්‍රික්කවල තෝරාගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආන්තික කුඩා වතු හිමියන්

සහ මොණරාගල දිස්ත්‍රික්කයේ අන්තර් කලාපීය උස් බිම් ප්‍රදේශයන් හි ආහාර බෝග වගා කරන ගොවීන් හට මූල්‍ය සහාය සපයන කුඩා වතු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සහ අනුරාධපුර, බදුල්ල, මොණරාගල සහ කුරුණෑගල දිස්ත්‍රික්කවල ගොවීන්ගේ ජීවන තත්ත්වයන් නගාසිටුවීම අරමුණු කරගත් වියළි කලාපීය ජීවනෝපායයන් සඳහා සහයවීමේ හා හවුල් වීමේ වැඩසටහන ස්ව උපකාරක කණ්ඩායම් ක්‍රමය මගින් ක්ෂුද්‍රමූල්‍ය පහසුකම් ප්‍රදානය කරන ලදී.

### 23.5 දැනුම්වත් කිරීම් ප්‍රවර්ධනය කිරීම

ප්‍රාදේශීය වශයෙන් විධිමත් මූල්‍ය ක්ෂේත්‍රයෙන් බැහැර වූ පුද්ගලයන් අතර මූල්‍ය අන්තර්ගතභාවය ප්‍රවර්ධනය කිරීම් සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මූල්‍ය සාක්ෂරතාවය පිළිබඳ වැඩසටහන් 140 ක් පවත්වන ලදී. සහභාගිත්ව මූල්‍ය ආයතනවලද සහාය ඇතිව පවත්වන ලද මෙම වැඩසටහන් මගින් ගෘහස්ත මට්ටමේ මූල්‍ය කළමනාකරණය, නීත්‍යානුකූල නොවන මූල්‍ය ආයතන සමග ගනුදෙනු කිරීමේ අවදානම සහ විධිමත් මූල්‍ය ආයතනවලින් ලබාගත හැකි මූල්‍ය පහසුකම්/සේවාවන් පිළිබඳ දැනුවත්භාවය ඉහළ නංවන ලදී. තවද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය වශයෙන් ඉලක්කගත කණ්ඩායම් අතර මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීමේ අරමුණින් බාහිර සම්පත්දායක පුහුණු කිරීමේ නිලධාරීන්ගේ සහය ඇතිව ප්‍රාදේශීය බැංකුකරුවන් සඳහා පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා පහසුකම් සපයන ලදී.

එසේම ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ තෝරාගත් ව්‍යවසායකයන් සඳහා ලබාගත හැකි මූල්‍ය පහසුකම් සහ අදාළ ආයතනවලින් ලබාගත හැකි තාක්ෂණික සහ අලෙවිකරණ පහසුකම් පිළිබඳව ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ ව්‍යාපෘති ඇගයුම් වැඩමුළු 42 ක් පවත්වන ලදී. එමෙන්ම, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශයේ ව්‍යවසායකයන් වෙත නව තාක්ෂණය, තත්ත්ව සංවර්ධනය, අලෙවිකරණය, කළමනාකරණය සහ ගිණුම් භාවිතය පිළිබඳ තාක්ෂණ විශේෂඥයන්ගේ දැනුම ලබාදීම සඳහා එම විශේෂඥයන්ගේ ද සහභාගිත්වයෙන් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැඩමුළු 10 ක් පවත්වන ලදී. ඒ හැර ගොවීන් අතර ඵලදායිතාවය සහ ගුණාත්මකභාවය පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා 2012 වසරේ දී ගොවීන් සඳහා පෙර සහ පසු අස්වනු තාක්ෂණය පිළිබඳ වැඩමුළු 08 ක් ද පවත්වන ලදී.

## 24. ලේකම්

ලේකම් දෙපාර්තමේන්තුව බැංකුවේ සමස්ත සේවා අවශ්‍යතාවයන් හා පහසුකම් සපයා දීම අරමුණු කර ගනිමින් මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තුවකි. භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය, නිවාඩු ප්‍රතිපත්තීන් සැකසීම හා ක්‍රියාවට නැංවීම, විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ කළමනාකරණය, විදේශ සංචාරයන් සම්බන්ධයෙන් වන සේවාවන් හා අනෙකුත් පොදු සේවාවන් සැපයීම සහ නීතිමය සේවාවන් සපයාදීම ලේකම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් අතුරින් ප්‍රධාන වේ.

ලේකම් දෙපාර්තමේන්තුව 2012 වසරේ දී කලට වේලාවට භාණ්ඩ හා සේවාවන් සැපයීමෙන් ද, මෙහෙයුම් ක්‍රමවේදයන් සහ ක්‍රියාපිළිවෙත් නිරන්තර ඇගයීමකට ලක් කිරීමෙන් සහ වැඩිදියුණු කිරීමෙන් ද, නිවාඩු, විශ්‍රාම වැටුප් අරමුදල් සහ අනෙකුත් පොදු සේවාවන් සම්බන්ධ නීති හා නියෝග ක්‍රියාවට නගමින් ද, බැංකුවේ කාර්යයන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා දායක විය.

වර්ෂය තුළ දෙපාර්තමේන්තුව ප්‍රධාන වශයෙන්ම ටෙන්ඩර් පටිපාටිය මූලික කර ගනිමින් රුපියල් දශ ලක්ෂ 179.6 ක වටිනාකමින් යුත් ප්‍රාග්ධන හා ප්‍රාග්ධන නොවන භාණ්ඩ හා සේවාවන් ද, ගුණාත්මක භාවයෙන් යුතුව තරගකාරී මිල ගණන් යටතේ කලට වේලාවට සපයන ලදී. පෙර වර්ෂවල දී මෙන්ම මහ බැංකුවේ මිල දී ගැනීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම තුළින් දෙපාර්තමේන්තුවල භාණ්ඩ හා සේවා අවශ්‍යතා කලට වේලාවට සැපයීම කඩිනම් කිරීමේ අරමුණින් මිල දී ගැනුම් සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තවදුරටත් ක්‍රියාවට නගනු ලැබිණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා සැලසුම් කළ මහ බැංකුවේ සමස්ත මිල දී ගැනීමේ අවශ්‍යතාවලින් සියයට 90 ක ප්‍රමාණයක් ඉතා සාර්ථක ලෙස අවසන් කිරීමට ලේකම් දෙපාර්තමේන්තුවට හැකිවිය. මීට අමතරව, බැංකුවේ සියලුම දේපළ සඳහා සඵල විස්තීරණ රක්ෂණ ආවරණයක් ලබාගන්නා ලදී. මහ බැංකු විශ්‍රාම වැටුප් ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු අරමුදල සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු අරමුදලේ පාලන කටයුතු ද, ලේකම් දෙපාර්තමේන්තුව විසින් කර ගෙන යන ලදී. මෙම ක්‍රමයන් යටතේ 2012 වර්ෂය අවසාන වන විට ලියාපදිංචි විශ්‍රාම ප්‍රතිලාභීන් සංඛ්‍යාව 2048 දෙනෙකු විය.

වර්ෂය තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව, බැංකුව සඳහා අවශ්‍ය නීතිමය සේවාවන් අඛණ්ඩව සපයා දීමෙහි නිරත විය. බැංකුවේ කටයුතු උත්ප්‍රේරණය කිරීම සඳහා අවශ්‍ය සුපුරුදු නීතිමය කටයුතුවල සිට ප්‍රතිපත්ති සැලසුම් කිරීම දක්වා වූ පුළුල් පරාසයක් තුළ මෙකී සේවාවන් සපයන ලදී. අධිකරණමය කටයුතු මෙහෙයවීමේ දී පූර්ව ක්‍රියාකාරී පියවර අනුගමනය කිරීම තුළින් බැංකුවේ අයිතිවාසිකම් තහවුරු කිරීම හා රැකබලා ගැනීම සිදුවිය. බැංකුව හමුවේ ඇති අභියෝගයන්ට සාර්ථකව මුහුණදීම සඳහා, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයට අදාළ නීති සහ අනුනීති සැකසීමේ දී ක්‍රියාකාරී සහයෝගය ලබාදෙන ලදී.

2012 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් දීර්ඝ සේවා තිළිණ ප්‍රදානය, නිදහස් දින උත්සවය ඇතුළු විවිධ ආගමික උත්සව සම්බන්ධීකරණය සහ සංවිධානය සිදු කරනු ලැබීය.

## 25. ආරක්ෂක සේවා

රජයේ ආරක්ෂක අංශ සහ පොලිසියේ සහාය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකු සේවකයින්ගේ, අමුත්තන්ගේ හා දේපළවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහාත්, මුදල් ප්‍රවාහන කටයුතුවලට ආරක්ෂාව සැපයීම සඳහාත් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 2012 වර්ෂයේදීත් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගනු ලැබීය.

මෙම වගකීම ඉටු කරමින් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව 2011 වර්ෂයේ දී මහ බැංකු ප්‍රධාන කාර්යාලයට හඳුන්වා දුන් අමුත්තන්ගේ තොරතුරු ඇතුල් කිරීමේ පරිගණක වැඩසටහන තවදුරටත් දියුණු කිරීම මගින් සේවකයින්, අමුත්තන් හා බඩු බාහිරාදිය පරීක්ෂා කර නිදහස් කිරීම තහවුරු කළේය. එමෙන්ම නවතම කේන්ද්‍රගත ඇතුළුවීම්/පිටවීම් පරිගණක පද්ධතියක් ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයෙහි ස්ථාපිත කිරීම සඳහා ටෙන්ඩර් ක්‍රියා පටිපාටිය අනුගමනය කරමින් පවතී. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ නව නිවහන වූ, කොළඹ 01, සර්. බාරොන් ජයතිලක මාවතේ අංක 13 හි පිහිටි ලොයිඩ් ගොඩනැගිල්ලේ පිවිසුම් පාලන ක්‍රමයක් හා ගිනි ආරක්ෂක පද්ධතියක් ස්ථාපිත කරනු ලැබීය.

ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව රජයේ ආරක්ෂක අංශ හා පොලිසියෙන් බඳවා ගනු ලැබූ ස්ථිර කාර්ය මණ්ඩලයකින් ද, ඔවුන්ට සහාය වන පුද්ගලික ආරක්ෂක සේවයකින් ද සමන්විත වේ. ආරක්ෂක නිලධාරීන් විශ්‍රාම යාම නිසා ඇතිවන හිදැස පිරවීම සඳහා මෙන්ම ඔවුන්ගේ සාමාන්‍ය වයස පවත්වා ගැනීම සඳහාත් කොළඹින් පිටත ශ්‍රී ලංකා මහ බැංකු පළාත් කාර්යාලවලට ආරක්ෂාව සැපයීම සඳහාත් 2012 වසරේ දී මෙම දෙපාර්තමේන්තුවට නව තරුණ ආරක්ෂක නිලධාරීහු 15 දෙනෙක් බඳවා ගනු ලැබූහ. රාජකාරී පැවරීමට පෙර මෙම නිලධාරීන්ට සති දෙකක ආයතනික ආරක්ෂක කටයුතු පිළිබඳ පෘථුල පුහුණුවක් ලබාදෙන ලදී. නූතන ශිල්පීය ක්‍රම පිළිබඳ දැනුම ලබා ගැනීම සඳහා මැලේසියාවේ දී පැවැත්වූ නවීන ආයතනික ආරක්ෂාව සඳහා වූ පාඨමාලාවකට හා නායකත්ව පුහුණු පාඨමාලාවකට තෝරා ගත් මාණ්ඩලික නිලධාරීහු සහභාගි කරවනු ලැබූහ. එදිනෙදා කටයුතු කර ගැනීමට උපකාරී වනු වස් ශ්‍රී ලංකා පොලිසියේ සහයෝගය ඇතිව ප්‍රභූ ආරක්ෂාව, විමර්ශන හා වාර්තා ලිවීම පිළිබඳ පුහුණුවක් ආරක්ෂක නිලධාරීන් 56 දෙනෙකුට ලබා දෙන ලද අතර තවත් මාණ්ඩලික නිලධාරීන් 06 දෙනෙකු හා මාණ්ඩලික නොවන නිලධාරීන් 105 දෙනෙකු ඔවුන්ගේ දක්ෂතා වැඩි දියුණු කිරීම සඳහා මෙතෙර පැවැත්වූ ආයතනික ආරක්ෂාව හා අනෙකුත් පරිපාලනමය පුහුණු වැඩසටහන්වලට සහභාගි කරවන ලදී. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරීන් සඳහා ගිනි අවි භාවිතය හා ජීව වෙඩි තැබීම පිළිබඳ පුහුණුවක් ශ්‍රී ලංකා යුධ හමුදාවේ සහයෝගයෙන් 2012 වසරේ දී පවත්වනු ලැබීය. හදිසි අවස්ථාවක දී ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවා අඛණ්ඩව පවත්වා ගැනීම සඳහා වූ පෙරහුරුවන්ට ද ආරක්ෂක සේවා කාර්ය මණ්ඩලය සහභාගි විය. හදිසි අවස්ථාවක දී අවශ්‍ය සහාය ලබාගැනීමේ අරමුණින් හා දැනුම තම සහෝදර සේවකයින් අතර බෙදා හදා ගැනීමේ බලාපොරොත්තුවෙන් විවිධ දෙපාර්තමේන්තුවලින් තෝරා ගන්නා ලද ගිනි සහායක නිලධාරීන් අනූ දෙදෙනෙකු සඳහා ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ, කොළඹ ගිනි නිවීමේ ඒකකයේ හා ශාන්ත ජෝන් ගිලන්රථ සේවයේ සහයෝගය ඇතිව දින දෙකක ගිනි නිවීමේ හා ප්‍රථමාධාර වැඩමුළුවක් පවත්වන ලදී.

ඉහත සඳහන් ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් හා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය මගින් 2012 වර්ෂයේ දී කිසිදු ආරක්ෂක බිඳ වැටීමකින් හා බාධාවකින් තොරව ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ හා එයට සම්බන්ධ අනෙකුත් පරිශ්‍රයන්හි ආරක්ෂාව අඛණ්ඩව පවත්වා ගෙන යාමට ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුවට හැකිවිය.

## 26. සංඛ්‍යාන

ශ්‍රී ලංකාවේ සංඛ්‍යාන දත්ත එක්රැස් කිරීම හා විශ්ලේෂණය කිරීම පුළුල් කිරීමේ අවශ්‍යතාවය මැනවින් හඳුනාගත් ශ්‍රී ලංකා මහ බැංකුව, ජාතික ගිණුම් සැකසීම, නියැදි සමීක්ෂණ පැවැත්වීම හා ආර්ථිකමිති ආකෘතීන් සකස් කිරීම අරමුණු කොටගෙන 1978 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එතැන් සිට මේ දක්වා සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ කාර්යභාරය මූලික සාර්ව ආර්ථික විචල්‍යයන් පුරෝකථනය හා තක්සේරු කිරීම, මිල හා වැටුප් දර්ශක සකස් කිරීම, ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හා පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම, සමීක්ෂණ පැවැත්වීම, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ තුළින් දත්ත එක්රැස් කිරීම හා අවශ්‍ය පරිදි දත්ත සම්පාදනය කිරීම, ප්‍රකාශන හා මාධ්‍ය නිවේදන මගින් සංඛ්‍යාන හා තොරතුරු කාලීනව නිකුත් කිරීම සහ ශ්‍රී ලංකාවේ ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ පහසුව පිළිබඳ ශ්‍රේණිගත කිරීමේ දර්ශකය වැඩිදියුණු කිරීම වැනි කරුණු දක්වා ක්‍රමිකව විකාශය වී ඇත.

### 26.1 ප්‍රධාන සාර්ව ආර්ථික විචල්‍යයන් පුරෝකථනය කිරීම

මුදල් ප්‍රතිපත්ති සම්පාදනයට සහාය වනු පිණිස සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් පාරිභෝගික මිල උද්ධමනය හා ආර්ථික වර්ධනය කෙටිකාලීනව පුරෝකථනය කර මුදල් ප්‍රතිපත්ති කමිටුව හා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. උද්ධමනය පුරෝකථනය කිරීමේ දී ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ භාණ්ඩ හා සේවාවල විචලනයන් අඛණ්ඩව නිරීක්ෂණය කරනු ලබන අතර, අතීත හා අනාගත මිල ප්‍රවණතා සලකා බලමින් ආර්ථිකමිතික විධික්‍රම භාවිතයෙන් ඉදිරි වසර සඳහා කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ මාසික පුරෝකථනයන් ගණනය කරනු ලැබේ. එමෙන්ම ප්‍රාථමික හා ද්විතීයික මූලයන් තුළින් එක්රැස් කරගන්නා ලද දත්ත සහ ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන්

ලබාගන්නා දත්ත මගින් ආර්ථිකයේ ආංශික සංයුතීන් ද ඇතුළත් වන පරිදි දළ දේශීය නිෂ්පාදිතය වාර්ෂිකව හා කාර්තුමය වශයෙන් පුරෝකථනය කරනු ලැබේ. එමෙන්ම, ජාතික ආදායම් ගිණුම්වල ප්‍රධාන සංරචකයක් වන පරිභෝජනය, ආයෝජන හා ඉතුරුම් පුරෝකථනයන් ද වාර්ෂිකව සකස් කරනු ලැබේ.

### 26.2 මිල හා වැටුප් දර්ශක ගණනය කිරීම

පළාත් මට්ටමෙන් පාරිභෝගික මිල විචලනයන් නිරීක්ෂණය කිරීම සඳහා පළාත් පාරිභෝගික මිල දර්ශක ගණනය කිරීම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් අඛණ්ඩව සිදු කෙරිණි. පළාත් පාරිභෝගික මිල දර්ශක පිළියෙළ කිරීම සඳහා 2003/04 කාලපරිච්ඡේදයේ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද පාරිභෝගික මූල්‍ය හා සමාජ ආර්ථික සමීක්ෂණය පදනම් කර ගනී. පළාත් පාරිභෝගික මිල දර්ශක ගණනය සඳහා අවශ්‍ය මිල දත්ත, දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ හරහා රැස්කරනු ලබයි. මේ අනුව, 2012 වසරේ දී පළාත් නවය සහ සමස්ත දිවයින සඳහා වූ පාරිභෝගික මිල දර්ශක මාසිකව ගණනය කරනු ලැබිණි.

ප්‍රාථමික වෙළෙඳපොළ මට්ටමෙහි මිල හැසිරීම නිරීක්ෂණය කිරීම සඳහා මාසිකව තොග මිල දර්ශකය (තො.මි.ද.) ගණනය කිරීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් සිදු කරන ලදී. තො.මි.ද. සඳහා අවශ්‍ය දත්ත සපයා ගැනීම ද දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ හරහා සිදු කෙරිණි. නිෂ්පාදක මට්ටමෙහි මිල වර්ධනයන් නිරීක්ෂණය සඳහා වඩාත් නියෝජනාත්මක සහ යාවත්කාලීන මිල දර්ශකයක අවශ්‍යතාවය වෙනුවෙන්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව නිෂ්පාදන මිල දර්ශකයක් සැකසීමේ කටයුතු අරඹන ලද අතර, ආරම්භයේ දී එය කෘෂිකර්මාන්ත අංශය සඳහා ගණනය කරනු ඇත.

ආර්ථිකයේ වැටුප් හා වේතනයන්හි විචලනයන් තක්සේරු කිරීම සඳහා, රාජ්‍ය අංශයේ සේවකයන්ගේ සහ විධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ වැටුප් ප්‍රමාණ දර්ශක, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබේ. රාජ්‍ය අංශය සඳහා වූ වැටුප් ප්‍රමාණ දර්ශක මගින් මධ්‍යම රජයේ විධායක නොවන ශ්‍රේණි හා සුළු සේවක ශ්‍රේණි සහ රජයේ පාසල් ගුරුවරුන් ආවරණය කෙරේ. කම්කරු දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලබන, විධිමත් පෞද්ගලික අංශය සඳහා වූ අවම වැටුප් ප්‍රමාණ දර්ශක පදනම් කොටගෙන, අවම මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක ගණනය කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. මීට අමතරව, කෘෂිකර්මාන්ත හා ගොඩනැගිලි ඉදිකිරීම් අංශ ආවරණය වන පරිදි, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප් පිළිබඳ තොරතුරු, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ හරහා රැස් කරන ලදී. ඉහත සඳහන් දත්ත පදනම් කොටගෙන, වැටුප් ප්‍රමාණයන්ගේ උපනතීන් පිළිබඳ කාර්තුමය වාර්තාවක් පිළියෙළ කෙරිණි.

නිශ්චල දේපළවල වටිනාකමෙහි සිදුවන ශීඝ්‍ර විචලනයන් ආර්ථිකයට සුවිශේෂී බලපෑමක් එක් කරයි. ඒ හේතුවෙන් ඉඩම් මිල අධීක්ෂණයට පහසුකම් සැපයීමේ අරමුණෙන්, තක්සේරු දෙපාර්තමේන්තුව මගින් කොළඹ දිස්ත්‍රික්කය තුළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ පහකින් එක්රැස් කරගත් ඉඩම් මිල දත්ත භාවිතා කරමින්, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉඩම් මිල දර්ශකයක් සම්පාදනය කරනු ලබයි. ඉඩම් භාවිතයේ වන විවිධ වූ ස්වභාවයන් නිසා, සමානත්වය පවත්වා ගැනීමට, නේවාසික, වාණිජ හා කාර්මික යන වර්ග තුනකින් යුතු දර්ශක 1998 - 2012 කාලපරිච්ඡේදය සඳහා සම්පාදනය කර ඇත. ඉඩම් මිල දර්ශකයන් ද්විවාර්ෂික පදනමක් මත ගණනය කරනු ලැබේ.

### 26.3 ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය

සමස්ත ශ්‍රී ලංකාවේ සහ එහි එක් එක් පළාත්වල සෞභාග්‍ය තත්ත්වය තක්සේරු කිරීම සඳහා සංයුක්ත දර්ශකයක අවශ්‍යතාවය ඉටුකර ගැනීමට 2008 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය හඳුන්වා දෙන ලදී. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, සමස්ත දිවයිනෙහි සහ එක් එක් පළාත්වල ආර්ථික හා සමාජීය සංවර්ධනයන් පිළිබිඹු කරන බහුමාන දර්ශකයක් වේ. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය, ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජීය යටිතල පහසුකම් යන උප දර්ශක තුනෙන් සංයුක්ත වන අතර, සමස්ත දර්ශකය විචල්‍යයන් 26 කින් සමන්විත වේ. ශ්‍රී ලංකා සෞභාග්‍ය දර්ශකය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් වාර්ෂිකව සම්පාදනය කරනු ලබන අතර, 2009 - 2011 කාලපරිච්ඡේදය සඳහා එම දර්ශකය 2012 දී ප්‍රකාශයට පත්කරන ලදී.

### 26.4 පළාත් දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීම

2011 වසර සඳහා නාමික පළාත් දළ දේශීය නිෂ්පාදිතය (ප.ද.දේ.නි.) ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේ ඇස්තමේන්තුගත ද.දේ.නි. පාදක කොට ගෙන සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ගණනය කරනු ලැබිණි. පළාත් නමය සඳහා වාර්ෂික පදනම මත ගණනය කරනු ලැබූ පළාත් දළ දේශීය නිෂ්පාදිතය 2012 දී ප්‍රකාශයට පත්කරන ලදී.

### 26.5 සංඛ්‍යාන සමීක්ෂණ

2006 වසරේ දී ආරම්භ කරන ලද, උද්ධමන අපේක්ෂාවන් පිළිබඳ සමීක්ෂණය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් මාසිකව පවත්වන ලදී. මෙම සමීක්ෂණය මගින් මූල්‍ය ආයතන, රාජ්‍ය අංශයේ ආයතන, පාසල් හා සිල්ලර වෙළෙඳසැල් ආවරණය වන පරිදි 300 ක් පමණ පිරිසකගේ ප්‍රතිචාර ලබා ගැනේ. විද්‍යුත් තැපැල් හා සම්මුඛ පරීක්ෂණ මගින් ප්‍රතිචාර එක්රැස් කරගනු ලැබේ. ප්‍රතිචාර දක්වන්නන් විසින් වර්තමාන

උද්ධමන තත්ත්වය මෙන්ම ඉදිරි මාස 12 ක කාලය තුළදී අපේක්ෂිත උද්ධමනය පිළිබඳව ද ප්‍රමාණාත්මක හා ගුණාත්මක තොරතුරු සපයනු ලැබේ. අදාළ මාසයේ සමීක්ෂණයේ ප්‍රතිඵල මුදල් ප්‍රතිපත්ති කමිටුවට හා මුදල් මණ්ඩලයට වාර්තා කරනු ලැබේ.

රටෙහි රාජ්‍ය අංශයේ සේවා නියුක්තියෙහි මට්ටම් හා උපනතීන් නිර්ණය කිරීම සඳහා සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් 2001 දී ආරම්භ කරන ලද, රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සහ කාර්තුමය සමීක්ෂණ වසර තුළ දී සිදු කරන ලදී. ජාතික ආදායම ඇස්තමේන්තු කිරීමේදී ද මෙම දත්ත භාවිතා කෙරේ. 2010 වසරේ සිදු කළ රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ වාර්ෂික සමීක්ෂණයෙහිදී වාර්තා වූ සේවකයන් 1,000 ට වැඩි සියලුම මධ්‍යම රජයේ ආයතන, පළාත් පාලන ආයතන සහ අර්ධ රාජ්‍ය ආයතන කාර්තුමය සමීක්ෂණය තුළින් ආවරණය කෙරිණි.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලද, කාර්තුමය ශ්‍රම බලකා සමීක්ෂණය පදනම් කරගෙන ශ්‍රම බලකාය පිළිබඳ රැස්කරගත් තොරතුරු සහ විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා, ශ්‍රම වෙළෙඳපොළ ප්‍රතිසංස්කරණ සහ ශ්‍රම ඵලදායිතාවය යන අංශ ආවරණය වන පරිදි ශ්‍රම බලකාය සහ ශ්‍රම වෙළෙඳපොළ පිළිබඳව රැස් කළ තොරතුරු විශ්ලේෂණය කිරීම ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් දඹුල්ල, නුවරඑළිය හා ඇඹිලිපිටිය යන විශේෂ ආර්ථික මධ්‍යස්ථාන ආවරණය වන පරිදි එළවළු නිෂ්පාදනය සහ මිල පිළිබඳ විශේෂ සමීක්ෂණයක් පවත්වන ලදී. මෙම සමීක්ෂණයේ මූලික අරමුණ වූයේ එළවළු සැපයුම් ක්‍රියාවලිය කෙරෙහි බලපාන සාධක හඳුනාගැනීම සහ එළවළු මිල සමග සබැඳී ඇති ආවේණික විචලතාවන් හඳුනා ගැනීමයි. සමීක්ෂණය තුළින් සොයාගත් කරුණු අනුව පවත්නා ගැටළු නිරාකරණය කිරීම සඳහා ගතයුතු ප්‍රතිපත්තිමය කරුණු පිළිබඳව යෝජනා කර ඇත.

## 26.6 දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ

1978 දී ආරම්භ කරන ලද, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙළ උතුරු සහ නැගෙනහිර පළාත්වල දත්ත රැස් කිරීමේ මධ්‍යස්ථාන 19 ක් ඇතුළුව මධ්‍යස්ථාන 102 ක් සඳහා දත්ත සමීක්ෂකයන් ලෙස ක්‍රියාකරන, දිවයින පුරා විහිදුණු රජයේ පාසල් ගුරුවරුන්ගෙන් සමන්විත ජාලයක් හරහා අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. මෙම වැඩසටහන යටතේ, පාරිභෝගික භාණ්ඩවල සිල්ලර මිල ගණන්, කෘෂිකාර්මික භාණ්ඩවල නිෂ්පාදක මිල ගණන්, අවිධිමත් පෞද්ගලික අංශයේ දෛනික වැටුප් සහ ප්‍රධාන කෘෂිකාර්මික නිෂ්පාදනයන්ගේ අනාගත නිෂ්පාදන මට්ටම් පිළිබඳ තොරතුරු එක්රැස් කෙරිණි. මීට අමතරව, පිටකොටුව වෙළෙඳපොළ සහ මරදගහමුල සහල් වෙළෙඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන වැනි අනෙකුත් මධ්‍යස්ථානවලින් ප්‍රධාන ආහාර අයිතමයන්ගේ තොග හා සිල්ලර මිල ගණන් රැස්කිරීම ගුරුවරුන් නොවන සමීක්ෂකවරුන් විසින් සිදු කෙරිණි.

මෙම වැඩපිළිවෙළ යටතේ එක්රැස් කරනු ලබන දත්ත, මිල දර්ශක ගණනය කිරීම, මිල විචලනයන් පුරෝකථනය කිරීම, ප්‍රතිපත්ති වෙනස් කිරීම් මගින් මිල මත ඇති කළ බලපෑම ඇගයීම සහ ජාතික ආදායම හා වියදම ඇස්තමේන්තු කිරීම සඳහා යොදා ගැනෙයි. මෑතකාලීනව ආර්ථිකය තුළ හටගත් වෙළෙඳපොළ වර්ධනයන් සහ ආර්ථික ක්‍රියාකාරකම් ඇතුළත් වන පරිදි, යාවත්කාලීන දත්ත රැස්කිරීමේ ලේඛන හඳුන්වාදීම මගින්, වසර තුළ දී දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කරන ලදී. ක්‍රමවත්ව සිදු කෙරෙන ස්ථානීය හා දුරස්ථ අධීක්ෂණයන් සහ සමීක්ෂකවරුන් විසින් එවනු ලබන දත්ත අඛණ්ඩව නිරීක්ෂණය කිරීම හරහා දත්ත රැස්කිරීමෙහි ගුණාත්මක බව සහ කාලීන බව තවදුරටත් ශක්තිමත් කෙරිණි. මීට අමතරව, සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් කොළඹ දිස්ත්‍රික්කයේ තෝරා ගන්නා ලද වෙළෙඳපොළවලින් රැස්කරනු ලබන දත්ත සමග සැසඳීම මගින් මෙම දත්තවල නිරවද්‍යතාව තවදුරටත් තහවුරු කෙරිණි. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පළාත් කාර්යාල ආශ්‍රිතව පිහිටි තෝරාගත් මධ්‍යස්ථානවල අධීක්ෂණ කටයුතු, අදාළ පළාත් කාර්යාල හරහා අඛණ්ඩව සිදු කරන ලදී.

තවද, දත්ත රැස්කරන්නන්ට අවශ්‍ය මගපෙන්වීම සඳහා 2012 වසරේ දී, කොළඹ, මාතර, අනුරාධපුරය, මහනුවර සහ යාපනය යන ස්ථානවල දී ප්‍රාදේශීය සම්මන්ත්‍රණ පහක් පැවැත්විණි. මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ ගැටළු සාකච්ඡා කිරීමට හා ප්‍රතිචාර ලබා ගැනීමට, අත්දැකීම් බෙදා ගැනීමට මෙන්ම ගුරුවරුන් සමග පවත්නා සබඳතාව වර්ධනය කරගැනීමට මෙම සම්මන්ත්‍රණ මගින් අවස්ථාව සැලසිණි. දත්ත රැස්කිරීමේ නිරවද්‍යතාවය, ගුණාත්මක බව, කාර්යක්ෂමතාවය සහ කාලීන බව වැඩිදියුණු කිරීම සඳහා නවමු පුහුණුවක් මෙන්ම, පළාත් මිල දර්ශක සැකසීමේ දී හඳුනාගත් ප්‍රාදේශීය මිල වර්ධනයන්ගේ වෙනස්කම් පිළිබඳ අදහස් ලබා ගැනීමට අවස්ථාවක් මෙම සාකච්ඡා මගින් දත්ත සමීක්ෂකයන්හට ලැබිණි. ආර්ථිකයේ වත්මන් වර්ධනයන් පිළිබඳ විශේෂ අධ්‍යාපනික සැසි ද, මෙම සම්මන්ත්‍රණවලට ඇතුළත් විය.

තෝරාගත් බෝගවල නිෂ්පාදන මට්ටම් පිළිබඳ තොරතුරු ලබා ගැනීම සඳහා දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙළ භාවිතා කරමින් 2011 වසරේ ආරම්භ කරන ලද "පූර්ව අනතුරු ඇඟවීමේ" වැඩසටහන, උද්ධමන හා ද.දේ.නි. පුරෝකථන වැඩිදියුණු කිරීම සඳහා 2012 වසරේ දී යොදා ගන්නා ලදී. මෙම වසර තුළ දී, රජයේ නිලධාරීන්, ප්‍රධාන නිෂ්පාදකයන්, ප්‍රාදේශීය ව්‍යවසායක/නිෂ්පාදක සංගම්, පළාත් කාර්යාල සහ

වෙළෙන්දන් සහභාගී කරගනිමින් පූර්ව අනතුරු ඇඟවීමේ වැඩසටහන යටතේ තොරතුරු ලබාගන්නා මූලාශ්‍රයන් පුළුල් කරන ලදී. එක් එක් බෝග වගාව සඳහා විවිධ දිස්ත්‍රික්ක මගින් දක්වන ලද ඵලදායකත්වය මත සිදු කළ බර තැබීම මගින් වාර්තාකරණ වැඩපිළිවෙළ තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

### 26.7 ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව 2009 වසරේ පටන් ශ්‍රී ලංකාවේ "ව්‍යාපාර පවත්වාගෙන යාමේ පහසුව" පිළිබඳ වන ශ්‍රේණිය වැඩිදියුණු කිරීමේ කාර්යයෙහි නිරත විය. ඒ සඳහා දෙපාර්තමේන්තුව මගින් 2102 වසරේ දී ප්‍රධාන කාර්යයන් කිහිපයක් සිදු කරන ලදී. "ව්‍යාපාරයක් පවත්වාගෙන යාමේ පහසුව" ශ්‍රේණිය වර්ධනය කිරීම සඳහා අවශ්‍යවන උපායමාර්ග ව්‍යාප්ත කිරීමටත්, ඉදිරියේ දී එය තවදුරටත් වර්ධනය කිරීම සඳහා අවශ්‍යවන හා ඇතුලත් විය යුතු උපායමාර්ග සාකච්ඡා කිරීමටත්, ගරු ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගේ අනුග්‍රහය ඇතිව අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා ප්‍රධාන නිලධාරීන්ගේ සහභාගිත්වයෙන් වාර්ෂික සම්මන්ත්‍රණ සංවිධාන කිරීම, දත්ත සැපයුම්කරුවන්ගේ අදාළ සංවිධාන හා අදාළ ක්‍රියාපටිපාටීන්ගේ ප්‍රතිසංශෝධන විය යුතු අංශ පිළිබඳ ඔවුන් දැනුවත් කිරීම සඳහා දත්ත සැපයුම්කරුවන් හා මෙයට ඇල්මක් දක්වන පාර්ශ්වයන්ගේ සහභාගිත්වයෙන් සාකච්ඡා සංවිධානය කිරීම, සිදු කළ ප්‍රතිසංස්කරණ හා ගැටළුමය තැන් පැහැදිලි කර ගැනීමට හා ඊට අදාළ වාර්තා ලෝක බැංකුව වෙත යොමු කළ හැකි පරිදි, පාර්ශ්වකරුවන් වොෂින්ටනයේ ලෝක බැංකු මූලස්ථානය සමග සෘජුව සාකච්ඡා කළ හැකි වීඩියෝ සම්මන්ත්‍රණ පැවැත්වීම යන ක්‍රියාකාරකම් ඒ අතර වේ. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපාරයක් ආරම්භ කිරීම, දේපළ ලියාපදිංචි කිරීම, ණය ගැනීම හා බදු ගෙවීම යන අංශවලින් පෙන්නුම් කළ වර්ධනය මගින් ශ්‍රී ලංකාවේ ශ්‍රේණිය 2012 දී වූ 89 සිට 2013 වසරේ දී 81 දක්වා වර්ධනය වී ඇත. ශ්‍රී ලංකාව, ප්‍රතිසංස්කරණ ප්‍රගතිය තුළින් ඉහළම වර්ධනයක් ලැබූ දෙවන රට වන අතර, දකුණු ආසියාවේ ඉහළම රට ද වේ.

ආයෝජන ප්‍රජාවට අවශ්‍ය වන අදාළ තොරතුරු, පවත්නා නියාමනයන්ගේ යාවත්කාලීන තොරතුරු ඇතුළත් සංශෝධනයන් සිදු කරන ලද "Step by Step Guide to Doing Business in Sri Lanka" ග්‍රන්ථයෙහි තුන්වන මුද්‍රණය 2012 වසරේදී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් ප්‍රකාශයට පත්කර ඇත.

### 26.8 සංඛ්‍යාන ව්‍යාප්තිය

ප්‍රතිපත්ති සම්පාදකයන්, පර්යේෂකයන්, ශාස්ත්‍රඥයන්, වෘත්තිකයන්, ශිෂ්‍යයන් හා සාමාන්‍ය ජනතාවට අවශ්‍ය ඔවුන් උනන්දුවක් දක්වන සමාජ ආර්ථික දත්ත පුළුල් පරාසයකින් ලබාදීමට සංඛ්‍යාන දෙපාර්තමේන්තුව වගකීමෙන් යුතුව කටයුතු කරනු ලබයි. මෙම වසර තුළ සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් ප්‍රධාන වාර්ෂික ප්‍රකාශනයන් දෙකක් ප්‍රකාශයට පත් කළ අතර, "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2012 - XXXIV වෙළුම" ප්‍රථම වතාවට භාෂා ත්‍රිත්වයෙන්ම 2012 අප්‍රේල් මස ප්‍රකාශයට පත්කරන ලද අතර, "ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික දත්ත 2012 - XXXV වෙළුම" 2012 ජූනි මස ප්‍රකාශයට පත්කරන ලදී. ඊට අමතරව, 2012 වසරේ දී සතිපතා හා මාස්පතා ආර්ථික දර්ශක ද ප්‍රකාශයට පත් කරන ලදී. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාව හා මෑත කාලීන ආර්ථික ප්‍රවණතා යන ප්‍රකාශන සඳහා පරිච්ඡේද දෙකක් සපයන අතර, මාසික විවරණිකාව සඳහා ක්‍රමවත් දායකත්වයක් දැක්විය. එසේම, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව මගින් කොළඹ පාරිභෝගිකයන්ගේ මිල දර්ශකයේ (කො.පා.මි.ද.) අයිතමයන්ගේ මිල වර්ධනය විශ්ලේෂණය කරමින් උද්ධමනය පිළිබඳ මාසික පුවත්පත් නිවේදන ප්‍රකාශයට පත්කරයි. තවදුරටත්, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් ලබාගත්, තෝරාගත් භාණ්ඩවල මිල ගණන් ප්‍රතිපත්තිමය අරමුණු උදෙසා සතිපතා ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට ඉදිරිපත් කරයි. අදාළ තොරතුරු දෙපාර්තමේන්තු වෙබ් අඩවියේ (StaNet) හා CBSL වෙබ් අඩවියේ නිරන්තරව යාවත්කාලීන කෙරේ.

## 27. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ

බලපත්‍රලාභී මුදල් සමාගම් නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව 1988 වසරේ දී ස්ථාපනය කරන ලදී. ඒ වන විට, එතෙක් බලාත්මක වෙමින් පැවති 1979 අංක 27 දරන මුදල් සමාගම් පාලන පනත වෙනුවට 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත ප්‍රතිස්ථාපනය කර තිබූ අතර, මුදල් සමාගම් පනතෙහි ඇති විධිවිධාන බලගැන්වීමෙහි වගකීම මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරිණි. බලපත්‍රලාභී මුදල් සමාගම් නියාමනය හා අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කිරීමට හා අනවසරයෙන් තැන්පතු රැස් කරන ව්‍යාපාර මැඩලීමේ අරමුණින් 2011.11.09 දින සිට බලාත්මක වන පරිදි මුදල් සමාගම් පනත අහෝසි කරමින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත ප්‍රතිස්ථාපනය කරන ලදී. කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර මෙම දෙපාර්තමේන්තුව යටතේ නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහා 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනත 2000 අගෝස්තු මාසයේ දී නීතිගත කරන ලද අතර එය 2001.08.01 දින සිට බලාත්මක විය. තවද, ක්ෂුද්‍ර මූල්‍ය අංශය නියාමනය හා අධීක්ෂණය සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමේ කාර්යය ද මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

### 27.1 කාර්යයන්

මුදල් ව්‍යාපාර හා විශේෂිත කල්බදු මූල්‍යකරණ ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණ අවශ්‍යතා සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, නිරන්තර දුරස්ථ අධීක්ෂණයන් හා කාලාවර්ථිත එතැන් පරීක්ෂණ සිදු කිරීම, නියාමන අනුමැතීන් ලබාදීම, අනවසරයෙන් පවත්වාගෙන

යන මුදල් ව්‍යාපාර විමර්ශනය කිරීම හා එම ආයතන පිළිබඳ නීතිමය පියවර ගැනීම හා අනවසර මූල්‍ය ආයතනවල මුදල් තැන්පත් කිරීමේ ඇති අවදානම පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ වගකීම්වලට ඇතුළත් වේ.

2012 වසර අවසානය වන විට, බලපත්‍රලාභී මුදල් සමාගම් 47 ක් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු 13 කින්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 6 කින්, බලපත්‍රලාභී මුදල් සමාගම් 44 කින් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන 13 කින් සමන්විත ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 76 ක් පැවතිණ. පොදුවේ ගත් විට බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් යන දෙවර්ගයම බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වේ. මෙම බලපත්‍රලාභී මුදල් සමාගම් හා ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනවල නම් ඇමුණුම II-3 හි දක්වා ඇත.

## 27.2 වසර තුළ සිදු වූ ක්‍රියාකාරකම්

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

**(i) බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධ දුරස්ථ අධීක්ෂණ**

බැංකු නොවන මූල්‍ය ආයතන මගින් කාලාවර්තීතව ඉදිරිපත් කරන මූල්‍ය තොරතුරු විශ්ලේෂණය කිරීමෙන් සියලුම බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා නිරන්තර දුරස්ථ අධීක්ෂණ සිදු කෙරිනි. මෙම දුරස්ථ අධීක්ෂණයන්ගෙන් සොයා ගන්නා කරුණු මත පදනම්ව නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග යෝජනා කෙරේ.

බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීමට හා එම අවදානම් අවම කර ගැනීම සඳහා වූ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම උදෙසා දෙපාර්තමේන්තුව විසින් අනතුරු කල්තියා හැඟවීමේ හා පසුවිපරම් කිරීමේ පද්ධතියක් හඳුන්වා දෙන ලදී. තවද, මූල්‍යමය ශක්තිමත් භාවය අනුව බැංකු නොවන මූල්‍ය ආයතන අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ ක්‍රමවේදයක් ද හඳුන්වා දෙන ලදී.

**(ii) බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධ එතැන් පරීක්ෂණ**

බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ද්‍රවශීලතාව, වත්කම්වල ගුණාත්මක භාවය, ප්‍රාග්ධන ප්‍රමාණත්වය, කළමනාකරණ කාර්යක්ෂමතාව, ඉපැයීම්, ලාභදායිත්වය, පද්ධති පාලන ක්‍රම හා ආයතනික යහපාලන තත්ත්වය ඇගයීම සඳහා කාලාවර්තීතව එතැන් පරීක්ෂණ සිදු කරනු ලබයි. අවදානම් හඳුනා ගැනීම, අවදානම් කළමනාකරණය හා එම අවදානම් අවම කිරීමට අවශ්‍ය සම්පත් ඇගයීම කේන්ද්‍ර කරගත් අවදානම් මත පදනම් වූ ප්‍රවේශයන් මෙම පරීක්ෂණයන් සිදු කිරීමේ දී භාවිතා කෙරිණි. 2012 වර්ෂය තුළ දී, දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් 17 ක හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 6 ක එතැන් පරීක්ෂණ සිදු කරන ලදී. හඳුනාගත් අවදානම් හා නිර්දේශ ඇතුළත් පරීක්ෂණ වාර්තා නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ අධ්‍යක්ෂ මණ්ඩලයන් වෙත ඉදිරිපත් කරන ලදී.

මීට අමතරව, සීමිත විෂය පථයක් තුළ දුර්වල අංශ කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වමින් බලපත්‍රලාභී මුදල් සමාගම් 7 ක් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 2 ක් සීමිත පරීක්ෂාවට ලක් කරන ලදී.

(ආ) **විධානයන් හා විචක්ෂණශීලී අවශ්‍යතාවයන් හඳුන්වා දීම**

මුදල් මණ්ඩලයේ අනුමැතිය සහිතව බැංකු නොවන මූල්‍ය ආයතන වෙත නව විධාන හා විචක්ෂණශීලී අවශ්‍යතා හඳුන්වා දෙන ලදී.

**(i) බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා වූ රෙගුලාසි**

- **තොරතුරු පද්ධති ආරක්ෂණ ප්‍රතිපත්තිය:** බලපත්‍රලාභී මුදල් සමාගම්වල උපාය මාර්ගික මෙහෙයුම් හා අවදානම් කළමනාකරණය සඳහා තොරතුරු පද්ධති ඉතා වැදගත් තැනක් හිමි කරගෙන ඇත. තොරතුරු පද්ධති ආරක්ෂණ ප්‍රතිපත්තියක තිබිය යුතු අවම අවශ්‍යතාවන් දැක්වෙන පරිදි නියාමන රෙගුලාසියක් හඳුන්වා දෙන ලදී.
- **පොලී අනුපාත:** වෙළෙඳපොළ පොලී අනුපාත වෙනස්වීම් පිළිබිඹු වන පරිදි මුදල් සමාගම් සඳහා බලපැවැත්වෙන පොලී අනුපාත විධානය සංශෝධනය කරන ලදී.
- මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලබා ගැනීමට අයදුම් කිරීමේ ක්‍රියා පිළිවෙළෙහි වෙනස්වීම් ඇතුළත් අයදුම්පත් රීතිය හා සංශෝධිත බලපත්‍ර ගාස්තු රීතිය යන රීතීන් මුදල් සමාගම් වෙත නිකුත් කරන ලදී.

**(ii) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා වන රෙගුලාසි**

- **අධ්‍යක්ෂවරුන්ගේ හා විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාව තක්සේරු කිරීම හඳුන්වාදීම:** බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමෙහිලා එම ව්‍යාපාර පවත්වාගෙන යාමේ දී පැවතිය යුතු ආයතනික යහපාලනය සහ අවදානම් කළමනාකරණය තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂවරුන්ගේ සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන්ගේ සුදුසුකම් හා යෝග්‍යතාව ප්‍රමුඛ අවශ්‍යතාවයක් වේ. ඒ අනුව, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්හි අධ්‍යක්ෂවරුන්ගේ හා විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් එම තනතුරු දැරීමට ඔවුන්ගේ සුදුසුකම් හා යෝග්‍යතා සම්බන්ධයෙන් දිවුරුම් ප්‍රකාශ හා ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුතු වේ.
- **අවම මූලික ප්‍රාග්ධනය:** මූල්‍යමය ශක්තිමත්භාවය ඉහළ නැංවීම අරමුණු කොටගෙන විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් පවත්වා ගත යුතු අවම මූලික ප්‍රාග්ධනයන් නියම කරන ලදී. තවද,

මෙම විධානය මගින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් භාවිත මූලික ප්‍රාග්ධනයේ නිර්වචනය BASEL II රාමුවෙහි දැක්වෙන මූලික ප්‍රාග්ධනයෙහි නිර්වචනය සමග ගැලපෙන පරිදි සංශෝධනය කරන ලදී.

- **තෝලන අනුපාතය:** ප්‍රාග්ධන අරමුදල්, ප්‍රත්‍යාග ණන සංචිත ද ඇතුළුව විවිධාකාර සංචිතවලින් සමන්විත වන බැවින් විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන තෝලන අනුපාත ගණනය කිරීමේ දී ප්‍රාග්ධන අරමුදල් වෙනුවට ඒ සඳහා මූලික ප්‍රාග්ධනය මිනුමක් ලෙස යොදාගැනීම අවශ්‍ය වේ.
- **ද්‍රවශීල වත්කම් අවශ්‍යතාව හඳුන්වා දීම:** මෙම විධානය මගින් විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්හි ද්‍රවශීලතා වත්කම් අවශ්‍යතාවය ගණනය කිරීම සඳහා භාවිතා කළ, පවතින මුළු වගකීම් හා ශේෂ පත්‍රයෙන් බැහැර අගයන්ට, කොටස් හිමියන්ට ඇති වගකීම්, වත්කම්වලින් සුරක්ෂිත දිගුකාලීන ණය ගැනීම් හා සුරැකුම්කරණ ණය ඉවත් කළ හැකිවන පරිදි සංශෝධනය කෙරිණ.

**(iii)** බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා වූ රෙගුලාසි

- **බාහිර විගණක මඩුල්ල:** බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි විගණනය සිදු කිරීම සඳහා බාහිර විගණක මඩුල්ලක් පත් කෙරිණ. ඉහළ සංස්ථායිත්වයක් තහවුරු කිරීම හා බැංකු නොවන මූල්‍ය ආයතනයන්හි විගණනයන් සිදු කිරීමේ සම්මත ක්‍රියා පටිපාටියක් සකස් කිරීම උදෙසා මෙම විගණක මඩුල්ල වෙත උපදේශන මාලාවක් නිකුත් කරන ලදී.

**(ඇ) නියාමන අනුමැතීන්**

2012 වර්ෂය තුළ දී, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී, ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී, පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සහ පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී යන විශේෂිත කල්බදු මූල්‍යකරණ ආයතන, බලපත්‍රලාභී මුදල් සමාගම් බවට පත් වූ අතර දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්, අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්, මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ් සහ රිචඩ් පීරිස් ආපිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් යන සමාගම් මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලබාදීමෙන් මුළු බලපත්‍රලාභී මුදල් සමාගම් සංඛ්‍යාව 39 සිට 47 දක්වා වැඩි විය. මේ අතර, ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්, නිවස්ට් කැපිටල් ලිමිටඩ්, ටීකේඑස් ෆිනෑන්ස් ලිමිටඩ්, අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් හා මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ් යන ආයතන කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි වූ අතර, ඒ අනුව මෙම වර්ෂය තුළ දී ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන සංඛ්‍යාව 76 දක්වා වැඩි විය.

**(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන අංශය සමග පැවති හමුවීම්**

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයට අදාළ ගැටලු සම්බන්ධයෙන් අදහස් හුවමාරු කර ගැනීම සඳහා මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බැංකු නොවන මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරීන් සමග කාර්තුවකට වරක් රැස්වීම් පැවැත්විණ.

තවද, විචක්ෂණ විධානයන්ට අනුගත වීමේ වැදගත්කම සහ නියාමන අවශ්‍යතාවයන් හා නිවැරදි ක්‍රියාමාර්ග පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා මහ බැංකු අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බැංකු නොවන මූල්‍ය ආයතනවල සභාපතිවරුන් සමග රැස්වීමක් පැවැත්විණ.

- "ඒකපුද්ගල ආදායම එ.ජ. ඩොලර් 4000 න් පසු අවධියට බැංකු නොවන මූල්‍ය ආයතන ස්ථානගත කිරීම" යන තේමාව යටතේ බැංකු නොවන මූල්‍ය ආයතනවල අධ්‍යක්ෂවරුන් හා ප්‍රධාන විධායක නිලධාරීන් සඳහා වූ වාර්ෂික සමුළුව දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලදී.

**(ඉ) අර්බුදයට ලක් වූ ලියාපදිංචි බැංකු නොවන මූල්‍ය ආයතනවල ව්‍යාපාර කටයුතු යථාතත්ත්වයට පත් කිරීමේ සැලසුම්.**

දෙපාර්තමේන්තුව සිදු කරන දුරස්ථ අධීක්ෂණයන්ගෙන් හා අධ්‍යක්ෂ මණ්ඩල හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සමග පැවති නිරන්තර හමුවීම් මගින් 2008 වසරේ ද්‍රවශීලතා අර්බුදයෙන් පීඩාවට පත් සමාගම් 7 හි කාර්ය සාධනය නිරන්තර පරීක්ෂාවට ලක් කරන ලදී.

**(ඊ) අනෙකුත් ක්‍රියාකාරකම්**

**(i) මුදල් ව්‍යාපාර පනත පිළිබඳ පසු විපරම**

1988 අංක 78 දරන මුදල් සමාගම් පනත අහෝසි කර ඒ වෙනුවට 2011.11.09 දින ප්‍රතිස්ථාපනය කරන ලද මුදල් ව්‍යාපාර පනතේ ඇති වැදගත් කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ පුවත්පත් දැන්වීම් පළ කිරීම දෙපාර්තමේන්තුව මගින් සිදු කෙරිණි.

**(ii) යෝජිත ක්ෂුද්‍ර මූල්‍ය පනත**

ශ්‍රී ලංකා මහ බැංකුව සතු විශේෂඥ දැනුම හා අත්දැකීම් සලකා බලමින් 2012 මාර්තු මාසයේ දී මුදල් මණ්ඩලය විසින් ක්ෂුද්‍ර මූල්‍ය අංශය ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ අධීක්ෂණය කිරීම නැවත සලකා බැලීමට තීරණය කරන ලදී. දෙපාර්තමේන්තුව මගින් ක්ෂුද්‍ර මූල්‍ය පනත් කෙටුම්පත් සකස් කළ අතර එය 2013 වර්ෂය තුළ දී බලාත්මක කිරීමට අපේක්ෂිතය.

**(iii) අනවසරයෙන් පවත්වාගෙන යන මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශන**

2012 වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් මුදල් ව්‍යාපාර පනතේ 42 වන වගන්තිය යටතේ පුද්ගලයන්/ආයතන හතක් සම්බන්ධව පරීක්ෂණ ආරම්භ කෙරිණ. තවද, විභාග කිරීම් 22 ක් සිදු කරන ලදී. වර්ෂය තුළ දී දෙපාර්තමේන්තුව විසින් එක් ආයතනයක කටයුතු

විධිමත් කළ අතර තවත් ආයතන 3 කට එරෙහිව නීතිමය පියවර ගැනීම සඳහා යොමු කරන ලදී.

අනවසර මුදල් ව්‍යාපාර හා අනවසර තැන්පතු රැස් කිරීම සම්බන්ධ විමර්ශනයන් ශක්තිමත් කිරීම උදෙසා දෙපාර්තමේන්තුව විසින් විමර්ශන කටයුතු නිර්ණය කිරීම් හා චෝදනා ගොනු කිරීමේ දී පිළිපැදිය යුතු පුළුල් හා ඒකීය ක්‍රියා පටිපාටියක් හඳුන්වා දෙන ලදී.

**(iv) බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා වූ ශිල්පීය සැසිවාර**

දෙපාර්තමේන්තුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සඳහා අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (IFRS) හා අවදානම් කළමනාකරණය සම්බන්ධ පුහුණු වැඩමුළු දෙකක් පවත්වන ලදී. තවද, බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ මධ්‍යම මට්ටමේ කළමනාකරණ නිලධාරීන් සඳහා තොරතුරු පද්ධති ආරක්ෂණය හා උකස් ගැනීමේ ව්‍යාපාරය හා රන් ණය සම්බන්ධ වැඩමුළු දෙකක් සංවිධානය කෙරිණි.

**(v) අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් (IFRS) භාවිතය.**

බැංකු නොවන මූල්‍ය අංශය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති භාවිත කිරීම ඇගයීමට හා පහසුකම් සැලසීම සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය, ශ්‍රී ලංකා කල්බදු මූල්‍යකරණ සංගමය, ශ්‍රී ලංකා මුදල් ආයතන නිවස්න සංගමය හා ශ්‍රී ලංකා මහ බැංකුවේ නියෝජිතයන්ගෙන් සමන්විත උප කමිටුවක් පත් කෙරිණ. ශ්‍රී ලංකා මුදල් ආයතන නිවස්න සංගමය හා ශ්‍රී ලංකා කල්බදු මූල්‍යකරණ ආයතන සංගමය විසින් බැංකු නොවන මූල්‍ය ආයතන සඳහා සකසන ලද විශේෂිත ගිණුම්කරණ භාවිතයන් සම්බන්ධයෙන් දැනුම් දී ඇති අතර දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විධානයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අතර පවතින වෙනස්කම් පිළිබඳ උපදෙස් නිකුත් කිරීමට අපේක්ෂා කරයි.

## 27.3 මහජනතාවට සිදු කළ දයකත්වය

**(අ) බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ වර්ධනය හා ස්ථාවරත්වය**

බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ස්ථාවරත්වය තහවුරු කිරීමට දෙපාර්තමේන්තුව විසින් ගනු ලබන ක්‍රියාමාර්ග එලෙසම පවත්වාගෙන යන ලදී. තවද, විධිමත් මූල්‍ය පද්ධතිය සමඟ මහජන සම්බන්ධතාවය ඉහළ නංවමින් දෙපාර්තමේන්තුව විසින් සියලුම ප්‍රදේශයන් ආවරණය වන පරිදි නව ශාඛා සඳහා අනුමැතීන් ලබා දෙන ලදී. තැන්පතු හා ණය ගැනීම් පිළිවෙළින් සියයට 37 ක හා සියයට 3 ක වර්ධනයක් අත්කර ගනිමින් අරමුදල් මූලාශ්‍රයන් දැක්වූ යහපත් වර්ධනය හේතුවෙන් මෙම අංශයේ වත්කම් ප්‍රමාණය සියයට 22 කින් වර්ධනය විය. ණය ලබාදීම් සියයට 21 කින් වර්ධනය විය. 2012.12.31 දිනෙන් අවසන් වන මාස 12 සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අංශය විසින් රුපියල් බිලියන 15 ක බදු පසු ලාභයක් (විගණනය නොකළ) වාර්තා කෙරිණ. මුළු ප්‍රාග්ධන ප්‍රමාණත්ව අනුපාතය සියයට 16 ක යහපත් මට්ටමක පැවතිණ. අක්‍රිය ණය අනුපාතය සියයට 5.1 සිට 5.0 දක්වා සුළු වශයෙන් පහත යෑමක් දක්නට ලැබිණි. තවද, දෙපාර්තමේන්තුව විසින් මහජනතාවගේ තැන්පතුවල ආරක්ෂාව තහවුරු කිරීම සඳහා අර්බුදයට ලක්වූ ලියාපදිංචි මුදල් සමාගම් විධිමත් කිරීමේ උත්සාහය එලෙසම පවත්වාගෙන යන ලදී.

**(ආ) මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්**

**(i) දැනුම්වත් කිරීමේ වැඩසටහන්:** මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් අනවසර මුදල් ව්‍යාපාරවල ආයෝජනය කිරීමේ ඇති අවදානම පිළිබඳව මහජනතාවට අධ්‍යාපනයක් ලබා දෙනු ලැබේ. ග්‍රාමීය ප්‍රදේශ ඉලක්ක කර ගනිමින් මහනුවර, මාතලේ, නුවරඑළිය, ත්‍රිකුණාමලය, පුත්තලම, බදුල්ල සහ මාතර දිස්ත්‍රික්කවල මහජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 26 ක් පවත්වන ලදී.

**(ii) ගුවන් විදුලි හා රූපවාහිනී වැඩසටහන්:** ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවය මගින් කරනු ලබන "සුභාරතිය" වැඩසටහන් 4 කට සහභාගි වූ අතර නුවර "ඇසළ පෙරහැර" හා සමගාමීව ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ කඳුරට සේවාව මගින් සිදු කරන ලද විශේෂ විකාශය මගින් විකාශය කරනු ලැබූ විශේෂ පණිවිඩ මගින් මහජනතාව දැනුවත් කරන ලදී. තෝරාගත් රූපවාහිනී නාලිකා මගින් සිංහල සහ දෙමළ මාධ්‍ය දෙකෙන්ම රූපවාහිනී දැන්වීම් දෙකක් විකාශය කෙරිණි.

**(iii) පත්‍රිකා හා පුවත්පත් දැන්වීම්:** පුත්තලම හා බදුල්ල දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරීන් අතර බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම්වල ලැයිස්තු ඇතුළත් දැන්වීම් 1,550 ක් බෙදා දෙන ලදී. බලපත්‍රලාභී බැංකු හා මුදල් සමාගම්වල ලැයිස්තු හා වෙනත් ප්‍රයෝජනවත් තොරතුරු ඇතුළත් පත්‍රිකා 33,000 ක් මහජනයා අතර බෙදා හරින ලදී. තැන්පතු රැස්කිරීමට අවසර ලත් ආයතනවල ලැයිස්තුවක් කාර්තුවකට වරක් භාෂා ත්‍රිත්වයෙන්ම පුවත්පත්වල පළ කරන ලදී. ඉහත සියලුම ක්‍රියාකාරකම් මහජනතාව අතර මූල්‍යමය සාක්ෂරතාව ඉහළ නැංවීමට උපකාරී වේ.

**(ඇ) මහජනතාවගෙන් නැගෙන චෝදනා සඳහා යොමුවීම**

බැංකු නොවන මූල්‍ය ආයතන සම්බන්ධව මහජනතාවගෙන් නැගෙන චෝදනා විසඳීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාමාර්ග ගැනීම ආරම්භ කර ඇත. එවැනි චෝදනා අදාළ බැංකු නොවන මූල්‍ය ආයතන වෙත යොමු කෙරෙන අතර ඒ පිළිබඳ ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳ අවධානයෙන් පසු වේ.

ඇමුණුම II-3

## ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී මූල්‍ය සමාගම්

**නීති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ බලපත්‍රලාභී ආයතන (2012 වසර අවසාන වන විට)**

### බලපත්‍රලාභී මුදල් සමාගම්

1. අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී
2. අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්
3. ආර්පිකෝ ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
4. ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
5. ඊ ටී අයි ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර, එදිරිසිංහ ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්)
6. එම් සී එස් එල් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ් (පෙර, මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා ලිමිටඩ්)
7. එල් බී ෆිනෑන්ස් පීඑල්සී
8. එලායන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
9. ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, ඒ එම් ඩබ්ලිව් කැපිටල් ලීසිං පීඑල්සී)
10. ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් ලිමිටඩ්)
11. ඒෂියන් ෆිනෑන්ස් ලිමිටඩ්
12. ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, ඔරියන්ට් ෆිනෑන්ෂියල් සර්විසස් කෝපරේෂන් ලිමිටඩ්)
13. කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ්
14. කැපිටල් එලායන්ස් ෆිනෑන්ස් පීඑල්සී
15. කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, කොමර්ෂල් ක්‍රෙඩිට් පීඑල්සී)
16. කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්)
17. පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, පීපල්ස් මර්චන්ට් පීඑල්සී)
18. පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, පීපල්ස් ලීසිං කම්පැනි පීඑල්සී)
19. ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
20. පීපල්ස් ෆිනෑන්ස් පීඑල්සී
21. විලච් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, විලච් ෆිනෑන්ස් ලිමිටඩ්)
22. ජෝර්ජ් ස්ටුවර්ට් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර, දිවස ෆිනෑන්ස් ලිමිටඩ්)
23. ටී කේ එස් ෆිනෑන්ස් ලිමිටඩ්
24. ට්‍රේඩ් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී
25. ද ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
26. ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆිනෑන්ස් ලිමිටඩ් (පෙර, ද ස්ටෑන්ඩර්ඩ් ක්‍රෙඩිට් ලංකා ලිමිටඩ්)

### ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

**(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු**

1. අමානා බැන්ක් ලිමිටඩ්
2. එම් සී බී බැන්ක් ලිමිටඩ්
3. කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී
4. ඩී එෆ් සී සී වර්ධන බැන්ක් පීඑල්සී
5. නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී
6. නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී
7. පැන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පීඑල්සී
8.. මහජන බැංකුව
9. යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පීඑල්සී
10. ලංකා බැංකුව
11. සම්පත් බැන්ක් පීඑල්සී
12. සෙලාන් බැන්ක් පීඑල්සී
13. හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී

**(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු**

1. එම්බීඑස්එල් සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
2. ඩීඑෆ්සීසී බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. ලංකාපුත්‍ර ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
5. ශ්‍රී ලංකා සේවින්ග්ස් බැන්ක් ලිමිටඩ්
6. සණස ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

**(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්**

1. ඇසෙට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ්
2. සීලීස් ලිමිටඩ් (පෙර, සීලිස් ෆිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්)
3. කෝපරේටිව් ලීසිං කම්පනි ලිමිටඩ්
4. ඉන්ද්‍රා ෆිනෑන්ස් ලිමිටඩ්
5. ඉසුරු ලීසිං කම්පැනි ලිමිටඩ් (පෙර, ඉසුරු ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්)
6. කොෂිබා ලීසිං කම්පැනි ලිමිටඩ්
7. ලිස්වින් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
8. එල් ඕ එල් සී මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්
9. මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා පීඑල්සී

27. දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
28. නන්දා ඉන්වෙස්ටන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, නන්දා ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් ලිමිටඩ්)
29. නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී
30. බාර්ට්ලිට් ෆිනෑන්ස් පීඑල්සී
31. බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, බිම්පුත් ලංකා ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී)
32. මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (පෙර, මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් පීඑල්සී)
33. මල්ටි ෆිනෑන්ස් පීඑල්සී
34. මෙල්ස්ටා රීගල් ෆිනෑන්ස් ලිමිටඩ්
35. යූ බී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් (පෙර, ද ෆිනෑන්ස් ඇන්ඩ් ගැරන්ටි කම්පැනි ලිමිටඩ්)
36. රිචඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ්
37. ලංකා ඔරික්ස් ෆිනෑන්ස් පීඑල්සී
38. වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
39. ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී
40. සිටි ෆිනෑන්ස් කෝපරේෂන් ලිමිටඩ්
41. සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
42. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී
43. සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
44. සෙංකඩගල ෆිනෑන්ස් පීඑල්සී
45. සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
46. සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පනි පීඑල්සී
47. සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී

10. නිවෙස්ට් කැපිටල් ලිමිටඩ්
11. සම්පත් ලීසිං ඇන්ඩ් ෆැක්ටරින් ලිමිටඩ්
12. එස් එම් බී ලීසිං පීඑල්සී
13. සොෆ්ට්ලොජික් ක්‍රෙඩිට් ලිමිටඩ්

**(ඇ) ප්‍රයිම් ග්‍රාමීන් මයික්‍රො ෆිනෑන්ස් ලිමිටඩ්, රිචඩ් පීරිස් ආර්පිකෝ ෆිනෑන්ස් ලිමිටඩ් සහ දේශෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ් යන සමාගම් හැර ඉහත සඳහන් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් කල්බදු මූල්‍යකරණ කටයුතු සඳහා බලපත්‍ර ලබා ගෙන ඇත.**

## 28. සුභසාධන

සුභසාධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිලාභීන් වෙත සුභසාධන පහසුකම් කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස මෙම වසර තුළ දී ද සපයන ලදී. සුභසාධන දෙපාර්තමේන්තුවේ කාර්යයන් තුළ කාර්ය මණ්ඩල නිවාස (උකස්) ණය ක්‍රමය, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ ණය ලබාදීම, වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය කිරීම සහ ආපනශාලා පහසුකම් සැපයීම ඇතුළත් වේ. සේවානියුක්තිකයන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් හා ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත මුළු ලියාපදිංචි ප්‍රතිලාභීන් සංඛ්‍යාව 11,000 ක් පමණ වේ.

2012 වසර තුළ දී, සුභසාධන දෙපාර්තමේන්තුව විසින් අර්ථසාධක අරමුදල් ණය, කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය යටතේ වාහන ණය, පරිගණක ණය හා වෙනත් ණය සහ නිවාස ණය ඇතුළු මුළු ණය 2,008 ක් ප්‍රදානය කරන ලදී. සියලුම ලියකියවිලි සහිතව ඉදිරිපත් කරනු ලැබූ අයදුම්පත් සඳහා නියමිත දින ගණනක් ඇතුළත ණය නිකුත් කිරීමට දෙපාර්තමේන්තුවට හැකි විය. වසර අග භාගයේ දී සුභසාධන ණය ක්‍රම සරල කිරීම තුළින් ණය ලබාදීමේ දී මතුවන පරිපාලන අපහසුතා සහ මෙහෙයුම් වියදම් අවම කර ගැනීමට හැකිවිය. තවද, ණය අධීක්ෂණ ක්‍රමය මගින් වඩාත් නිවැරදිව සහ කඩිනමින් සේවානියුක්තිකයන්ට ණය ලබාදීමට හැකි වී ඇත.

මහ බැංකු ආපනශාලාව මගින් බැංකු කාර්ය මණ්ඩලයට සහ බැංකු පරිශ්‍රය තුළ පිහිටි අනෙකුත් ආයතනවල කාර්ය මණ්ඩලයන්ට ද උදෑසන සහ දිවා ආහාර සැපයීම තවදුරටත් සිදු කරන ලදී. සතියකට දෙවතාවක් සවස ඔසු පැන් ලබාදීම

තුළින්, සුභසාධන දෙපාර්තමේන්තුවේ තේ ලබාදීමේ සේවය විවිධාංගීකරණය කරනු ලැබීය. ආපනශාලා තුළ වඩාත් ප්‍රසන්න පරිසරයක් ගොඩනැංවීමට පියවර ගන්නා ලද අතර, ඉදිරි 2013 වසර තුළ දී ආපනශාලා පහසුකම් තවත් වැඩි දියුණු කිරීමට අවශ්‍ය සියලු මූලික විධිවිධාන සකස් කරන ලදී.

සියලුම ලියාපදිංචි ප්‍රතිලාභීන් සඳහා වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය වියදම් ප්‍රතිපූරණය සුභසාධන දෙපාර්තමේන්තුව විසින් නොකඩවා ක්‍රියාත්මක කරන ලදී. 2012 ජනවාරි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමයේ හිමිකම් සීමාවන් වැඩි කිරීම තුළින් පසුගිය වසරට සාපේක්ෂව ප්‍රතිපූරණය කරන ලද වෛද්‍ය වියදම් ප්‍රමාණය සියයට 33 කින් ඉහළ ගොස් ඇත. පිළිගත් පෞද්ගලික ආරෝග්‍යශාලාවක් මගින් වෛද්‍ය සේවාවන් ලබාගැනීම තුළින් සේවානියුක්තිකයන් සඳහා කාර්යාල වේලාවන් තුළ දී අවශ්‍ය වූ වෛද්‍ය පහසුකම් සපයන ලද අතර, සාධාරණ මිලකට රසායනාගාර පරීක්ෂණ පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් සිදු කෙරිණි. තවද, සේවානියුක්තිකයන්ගේ ප්‍රයෝජනය සඳහා අක්ෂි සායනයක් පවත්වන ලද අතර, සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් 6 ක් ද, සලකා බලන වර්ෂය තුළ දී සුභසාධන දෙපාර්තමේන්තුව මගින් සංවිධානය කරන ලදී. සුභසාධන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන සේවාවන් ඉහළ නැංවීම අරමුණු කොට මහ බැංකු සේවා නියුක්තිකයන්ගේ ප්‍රතිචාර ලබාගැනීම සඳහා සමීක්ෂණයක් ද සිදු කරන ලදී.